

Sasanka
Wandana
ඔබ තුලින් මම දෙවියන්
රත්තරු
සුජීව ප්‍රසන්න ආරච්චි

# රන්තරු

SUJEEWA PRASANNA ARACHCHI

Ran Taru
A Sinhala Novel

© සුජීව ප්‍රසන්න ආරච්චි

| | | |
|---|---|---|
| ප්‍රකාශන අධ්‍යක්ෂිකා | - | මධාරා වඩුගේ |
| සැලසුම නිර්මාණය | - | තරින්ද වීරසේකර |
| පරිගණක අකුරු සංයෝජනය | - | තලින් රණවීර |
| ප්‍රකාශනය | - | මධාරා පොත්, තැ.පෙ. අංක 70, නුගේගොඩ. |
| මුද්‍රණය | - | මධාරා ප්‍රින්ටර්ස් |
| විද්‍යුත් තැපැල | - | books@madhara.com |
| දුරකථන | - | 0114 806941 |



## සුජීව ප්‍රසන්න ආරච්චිගේ ආදරණීය නිර්මාණ යාය...

- සොඳ මීදුම
- සොඳ මීදුම 2
- සොඳ මීදුම 3
- ආත්මීය තරංගා
- ආත්මීය තරංගා 2
- සාවිත්‍රී ඇයි විජිතාවම් ඔබේ
- සාවිත්‍රී ඇයි විජිතාවම් ඔබේ 2
- විශා
- විශා 2
- විශා 3
- විශා 4
- මල් පිපියාවිල
- මල් පිපියාවිල 2
- සිත්තරි
- සිත්තරි 2
- සිත්තරි 3
- සිත්තරි 4
- නීලම්බරී
- නීලම්බරී 2
- නීලම්බරී 3
- නීලම්බරී 4
- ජීවිතයට ජයවේවා
- ඇසුම් අංජනා
- ඇසුම් අංජනා 2
- සඳ වාසනා
- සඳ වාසනා 2
- වර්ෂා
- වර්ෂා 2
- වර්ෂා 3
- වර්ෂා 4
- වර්ෂා 5
- වර්ෂා 6
- වර්ෂා 7
- වර්ෂා 8
- වර්ෂා 9
- වර්ෂා 10
- වර්ෂා 11
- සීතගිම්හාන
- සත්සිඹි චන්ද්‍රා
- සත්සිඹි චන්ද්‍රා 2
- සත්සිඹි චන්ද්‍රා 3
- සත්සිඹි චන්ද්‍රා 4
- සෙනෙහස දුනක්
- සෙනෙහස දුනක් 2
- සෙනෙහස දුනක් 3
- මල් යහන්
- උතුම් පැතුම්
- උතුම් පැතුම් 2
- උතුම් පැතුම් 3
- උතුම් පැතුම් 4
- උතුම් පැතුම් 5
- උතුම් පැතුම් 6
- සොඳුරු සහසක්
- සඳුන සැහැන්
- සුදු
- සුදු 2
- සුදු 3
- සුදු 4
- සුදු 5
- සුදු 6
- උත්සාහ වැරදිලා (මුද්‍රණයේ)
- සොඳුරු සසර (මුද්‍රණයේ)
- English ගුරු
- English ගුරු 2
- English ගුරු 3
- English ගුරු 4
- English ගුරු 5
- English ගුරු 6
- English ගුරු 7
- English ගුරු 8
- English ගුරු 9
- English ගුරු 10

SIHINA

"මේ හැම කතාවකම
දුකක් තියෙනවා...
ඒත් ඔයාගේ කතාවක්
කියවලා ඉවර වුණාම වැටෙන්නේ
සීතල කඳුළු නෙමේ.
ඒ කඳුළු හරි රස්නෙයි..."



# 01

චන්දනා කාර්යාලයට දුවගෙන ආවේ සාරි පොට අතේ ගහගෙනමයි. අද ඇයට කරන්නට වැඩ ගොඩාක් තිබුණා. ජීවිතේ ප්‍රශ්න කොච්චර තිබ්බත් ඇය මේ පුංචි රැකියාවට අප්‍රමාණ ලෙස ආදරය කළා. ඒ නිසාම ඇගේ අතින් මේ රැකියාවට වරදක් උනේම නෑ..

අද ඇයට ආයතනයට එන්නට ප්‍රමාද උනේ අප්පච්චිගේ දවල් කෑමත් හදාම එන්න සිද්ධ උන නිසා. අසනීප වෙන්න කලින් චන්දනාගේ අප්පච්චි වැඩ කළේ කම්බලපිටියේ සාප්පුවක ලියන මහත්තයෙකු ලෙසයි. ඒත් හිටපු ගමන් ඔහු අසනීප වුණා. චන්දනා ගොඩාක් බය උනේ තාත්තාටත් පපුවේ අමාරුවක්ම ආපු නිසා. මීට අවුරුදු පහකට කලින් ඇගේ අම්මා ජීවිතයෙන් සමුගත්තෙත් පපුවේ අමාරුවකින්...



SIHINA

ඒ නිසාම චන්දනා හරියට අප්පච්චිව පරිස්සම් කළා. කඩෙන් මොනාහරි ගෙනත් කන්න පුළුවන් කියලා අප්පච්චි දිගින් දිගටම කියද්දීත් චන්දනා පාන්දරම නැගිටලා අප්පච්චිගේ කෑම එක හැදුවා.

"මට මොනා හරි හදාගන්න පුළුවන් පුතේ... ඔයා යන්න..."

"මං ගෙදර හිටි මේ අසනීපත් තියාගෙන පාන් කෑවාම... මං

"ගෙදට හිටි මේ අසනීපත් තියාගෙන පාන් කැවාම...

"ගෙදට හිටි මේ අසනීපත් තියාගෙන පාන් කෑවාම... මං බත් කෑලි දෙකක් හැදුවා... ලුණු අප්පච්චිට උදේට කුරක්කන් පිට්ටු කෑලි දෙකක් හැදුවා... ලුණු මිරිසකුත් ඇති.. ඒක එක්ක කන්න... දවල්ට පරිප්පු හදලා සුදු මැල්ලුම් ටිකකුත් හැදුවා... දවල් වෙද්දී සීතල වෙලා තිබ්බොත් ටිකක් රත්කරගන්න... මං එනකොට රට කන්න රතු කැකුළු ඉඳි ආප්ප ටිකක් අරන් එන්නම්..."

අප්පච්චිගේ පපුව දන්න ගත්තේ පපුවේ ලෙඩට නෙමේ. මේ කෙල්ල විඳින දුකට. දළදා හාමුදුරුවන්ගේ පිහිටෙන් මේ ඇස්දෙක පියවෙන්න කලින් මේ කෙල්ලගේ ජීවිතේට හොඳක් වෙනවා දකින්න ලැබෙන්න කියලයි අප්පච්චි නිතරම පැතුවේ.

චන්දනා සේවය කළේ කේක් නිෂ්පාදන ආයතනයක. සාමාන්‍ය ලිපිකාරිනියක් ලෙස එහි සේවයට බැඳුණු ඇය තමාගේ වගකීම් ටික හරියට කරන්නට නිතරම උත්සාහ කළා. කේක් නිෂ්පාදනාගාරය පිහිටි ගොඩනැගිල්ලේ පහළ තට්ටුවේ. දවසකට සිය ගණනක් විතර ඇයට උඩට පහළට යන්න උනා. ඒත් ඇයට ඒක වදයක් කියලා හිතුනේ නෑ.

"මොකෝ බං සාරි පොටත් ඉනේ ගහගෙනම්... උඹද අද කේක් හදන්නේ..."

චන්දනා එද්දී කාර්යාලයේ තවත් සේවිකාවක් ඇහුවේ ඔච්චමට වගේ. මහන්සිවෙලා ආයතනයට වැඩ කරනවට සමහරු කැමති නෑ. ඒත් චන්දනා හිතුවේ ඉන්න තැනක දියුණුව ගැන හිතන්නැති කෙනෙකුට කවදාවත් හරියන්නේ නෑ කියලයි.

"අද පරක්කු උනා නිසා... කරන්න වැඩ ගොඩාක් තියෙනවා..."

"මේ ෆැක්ටරි එක උඹේ තාත්තගෙද මච්චර නැහෙන්නේ..."





නිශාගේ කතාවට චන්දනා මොනවත් කියන්න ගියේ නෑ.

"මං යනවා කන්න... එනවද..."

"එන්නේ අටට... තමය වෙනකල් කනවා... තමයයි තින වෙනකල් කතාව... ඉඳගන්නේ දහයට... ආයෙත් පැය බාගයක් විතර නැගිටිනවා තේ බොන්න..." චන්දනා හිතුවේ තරහින්.

"මං අද කාලම ආවේ..."

ඒත් ඇය උන්නේ බඩගින්නේ. හදිස්සියට කෑම ටික පවා ගෙනත් තිබ්බෙ නෑ... ඒත් ඇය ඒ ගැන හිතුවේ නෑ.

"මොකෝ මගදී කොල්ලා එක්ක තේ එකක් බීලද ආවේ..."

නිශා අහද්දී චන්දනා දිග සුසුමක් හෙළුවා.

"ම්... එයා මට ලොකු ගල් බනිස් එකක් අරන් දුන්නා..."

"ආතාමාලු දුන්නා..."

"ම්..ශා..."

"හරි හරි... අපි ගියා... උඹ වැඩ කරපන්..."

චන්දනා අද යැවීමට නියමිත කේක් ඇණවුම් ටික අතට ගත්තේ ඒ සඳහා ඉන්වොයිස් එක සකස් කරන්න.

"චන්දනා අද ලොක්කා නැද්ද..."

ගිණුම් අංශයේ නිහාල් ඇවිත් ඇහුවා.

"නෑ නිහාල්... මං හිතන්නේ සර් සතියකට විතර එන්නෑ..."

"ඒ මොකද ඒ..."

"මං හිතන්නේ සර්ගේ පුතා රට ඉඳලා ඇවිල්ලද කොහෙද..."

"නෑ... එහෙනම් මේ සතියේම ෆුල් ආතල් එකක් ගන්න පුළුවන්..."

චන්දනාට මේ මිනිස්සු ගැන හරි පුදුමයි. තමන් කරන කියන දේට බොරුවක් කරනවා කියන්නේ තමන්ට බොරුවක් කරන එකට නේද කියලා ඇයි මේ මිනිස්සුන්ට තේරුම් ගන්න බැරි...

එකවරම පාළු කාර්යාල කාමරයේ කාගෙදෝ දෙපා ගැටෙන හඬක් ඇහිලා චන්දනා හැරිලා බැලුවා. කාර්යාලයේ වීදුරු දොර



SIHINA

අසල සුදු කමිසයක් ඇඳගත් අහිංසක පාට තරුණයෙක් ෆයිල් කවරයක් අතැතිව බලා උන්නා. තේත් ඇණවුමක් දෙන්න ඇවිත් ඇති කියලා හිතලා ඇය දොර ඇරියා.

"ඇ..යි.."

ඒ දෑස්වල ආලෝකයක් මවත් තිබ්බා. ඔහු තමා දෙසම බලා ඉන්නේ ඇයි...

"මි..ස් මේ ම..ම.."

මේ ආයතනයේ තමාට මිස් කියා කියන්න තරම් තමා කෙනෙක් නොවන බව ඔහුට මේ වෙලාවේදී කියන්න අමාරුයි.

"මොනාද කෙරෙන්න ඕන කියන්න..."

"මි..ස් ම..ම අසංක..."

"ඉතින්..."

"මි..ස් මං ගිය මාසේ ඉන්ටවිව් ආවා..."

ගිය මාසයේ අලෙවි නිලධාරීන් ගැනීමට සම්මුඛ පරීක්ෂණයක් වුණ බව නම් ඇයට මතකයි.

"ඔව්.. ඉතින්..."

"ම..ට මිස් ලොකු සර් අද එන්න කිව්වා.."

"වැඩට..."

"ඔව් මිස්.."

ඔහු වගේ කෙනෙක් මේ ආයතනයට අහිංසක වැඩියි කියලා ඇයට හිතුණා.

"අනේ හරි ප්‍රශ්නෙනෙ... සර් සතියක්ම ඔෆිස් එන්නෑ..නේ... දැ..න් මොකද කරන්නේ..."

ඇය ඔහුගේ මුහුණ දිහා බලාගෙන දුකෙන් වගේ උන්නා. ඔහුව හරවා යවන්න බැරි ගතියක් ඇයට දැනුණා.

"අ..නේ මිස් මං ආවේ කුරුණෑගල ඉඳලා... සර් අද මට එන්නමයි කියලා කිව්වා... වරද්දන්නෙපා කියලත් කිව්වා..."



සර් කාලයකට පස්සේ හොඳ කෙනෙක්ව තෝරලා කියලා චන්ද්‍රනාට හිතුණා.

"අ..නේ එකනේ... මාර වැඩේනේ... සර්ට මේ වෙලාවේ කතා කරන එකත් හරි නෑ... ඒ..ත්.. ඉන්නකෝ ටිකක්... මෙතන ඉඳගන්න.."

අසංක හරි ගෞරව සම්ප්‍රයුක්තව ඇය පෙන්වූ පුටුවේ වාඩි උනා. "තැලිලා පොඩි නොවෙච්ච ළමයෙක්... මෙහෙත් ඉන්න උන් මේ කොල්ලව මරවයි... පව්..." ඇය මුදුන්කොටුව මහතාට ඇමතුමක් ගන්නට ගියේ එසේ සිතමිනුයි. අසංක වීදුරු කාමරය තුළට ගිය ඇය දෙස කළු වීදුරු අතරින් හොරැහ පාටින් බලා උන්නා.

"ස..ර් මං චන්ද්‍රනා..."

"ඈ..ව් දරුවෝ... මට නිදහසේ ටික දවසක් ඉන්න දෙන්නෑද්ද... මගේ පුතා ඇවිල්ලා ඉන්නෙ ළමයෝ... ඔව් වැඩ... බලල කරන දෙයක් කරන්න... පොඩි ළමයි එහෙන..."

ඔහු කිව්වේ තරහින්ම නොවේ. තරමක ආදරයකින්.

"අ..නේ ස..ර් මං දන්නවා... කරදර කළාට සමාවෙන්න.. නොගෙනම බැරි නිසා ගත්තේ..."

"මොකද අදත් පිටි හොඳ නැද්ද... නැත්නම් චෙක් ටිකක්ද.. චෙක් කරවෙලා වැඩිද..."

චන්ද්‍රනා තනියම හිනාඋනා.

"අනේ ඒ මොනාත් නෙමේ සර්... මේ සර් එන්න කියපු කෙනෙක් ඇවිත්... සේල්ස් වලට..."

"මං එන්න කියපු කෙනෙක්.."

"ඔව්... අසංක කියලා කුරුණෑගල ළමයෙක්.."

"ම.. දෙතුන් දෙනෙකුට කිව්වා ළමයෝ... ඔය පොඩි ළමයා..."

"මේ සර්.. මේ ටිකක් අහිංසක පාට.."

"ඔයා කොහොමද දන්නේ එයා අහිංසකයි කියලා... [illegible]

තමයි එක අලුත් අයව නවවලා නරක් කරන්නේ...”

චන්දනා ඔහුත් සමග කට ගෙගෙන යන්නේ නෑ.

“ආ හරි හරි.. මට දැන් මතකයි... කුරුණෑගල ළමයෙක්ට කිව්ව තමයි.. චන්දනාට පුළුවන්ද එයාට බලලා වැඩක් දෙන්න... එයාට අර අස් වෙච්ච ජයන්තගේ රූට් එක දෙන්න... ජයන්තට දීපු පඩිය එහෙම කියන්නෙපා... ඒ පාර ඒක එයත් ඉල්ලයි...”

“ජයන්ත වගේ කෙනෙක් නෙමේ සර්...”

“ම්.. මං එතකොට නරක් කරලා තියන්නකෝ..”

චන්දනා දුරකතනය තබලා ආවේ තරමක සතුටකින්. කෙල්ල සාරි පොටත් අතින් අරගෙන ටොක ටොකජ් හඬ නංවමින් එද්දී අසංක එහෙමම පුටුවෙන් නැගිට්ටා.

“මි..ස් මො..නා..ද ස..ර් කිව්..වෙ...”

ඔහුට විහිළුවක් කරන්න තරම් දඟකාර කමක් ඇගේ හිතට ආවා. ඒත් ඒ මුහුණ දැක්කනම් එහෙම කරන්න ඇයට ලොබ හිතුණා.

“ම්..”

“අ..නේ මි..ස් කො..හොම හරි ස..ර්ට කියලා...”

ඔහුත් ජීවත් වෙන්නේ තමා වැනිම අමාරු තත්වයක වෙන්න ඇති කියලා චන්දනාට හිතුණා.

“මං දැන් මොනවත් කිව්වෙ නැහැනේ... එ..න්..න..කෝ...”

ඇය ඔහුට පිටුපාගෙනම දොර ඇරගෙන ඇතුළට ගියා. චන්දනා අද ඇඳගෙන ඇවිත් තිබුනේ ලා ගුරු පාටට හුරු රතු සාරියක්. ඒ පැහැයට කෙල්ලගේ යොවුන් පෙනුම පූර්ණාකාර විදිහට මතු කරලා පෙන්නුවා.

“ඉ..ඳ..ග..න්..න...”

චන්දනා ඇගේ පුංචි මේසය ඉදිරිපස වූ පුටුවේ ඔහුව වාඩි කරවා ගත්තා.

“මං සර්ට කතා කළා... ඔයා ගැන අහන්න ගිහින් සර් මට



බැන්නත් එක්ක... එහෙනම් අද ඉඳලා ඉන්න... හැබැයි මම නෙමේ වැඩ දෙන්නේ සර්රුයි මිස්ටර් සැමිසනුයි... අද සර්රුත් නෑ මිස්ටර් සැමිසනුත් නෑ... එයත් අවුට්ස්ටේෂන් ගිහින්...”

“මං එතකොට මි..ස්...”

“අස්වෙච්ච කෙනෙකුගේ සේල්ස් රූට් එක තමා මට ඔයාට දෙන්න කිව්වෙ... මං ඔයාට ඒ රූට් එකේ බිල් ටික දෙන්නම්... අද ඒක බලන්න... සර් ආවම බලමු...”

ඒ ඇස් දැකලා චන්දනා හිමිහිට බිම බලාගත්තා. ඔහුත් එතැන්දී හරියට අපහසුතාවයකට පත් උනා.

“සේල්ස් කරන අයට ටේබල් නෑ...”

“මං මිස් බිල් ටික බලන්නම්...”

“ම්... මතන ඉඳගෙන බලන්න... හැබැයි මට වැඩ...”

තාච්චි එක අදින ගමන් ඇය එහෙමම නැවීලා බැලුවා. එවරත් ඔහුගේ දෑස් තිබුනේ තමා දෙස. එවර නම් ඇයට හිනාවක් ඇඳ ගන්න පුළුවන් උනා.

“න..ම මොකක්ද කිව්වෙ...”

“මං..ද මිස්...”

“ම්...”

“මං මිස් අසංක... අසංක රත්නායක...”

“මං චන්දනා... මිස් නෙමේ...”

කෙල්ලගේ කට ලස්සනට පොඩියට තිබ්බට ටිකක් සැරයි. ඇය ඔහුට දෙන්නට නියමිත වූ රූට් එකේ බිල්පත් ටික ගෙන ආයෙත් මේසයට ආවා.

“මෙතන අසංක බිල් තුන්සිය ගාණක් ඇති... මක්කොම නෙමේ... ඔයා දැනට මේ ටික බලන්න...”

“හා මිස්...”

SIHINA

"මං පොඩි දෙයක් කියන්නද... තරහ නැත්නම් විතරක්..."

එවර අසංක ගැස්සිලා වගේ හිස එසෙව්වා. ඔහු ඇය දෙස බලාගෙනම උන්නා.

"කියන්න මිස්.."

"ඔයා ඉතින්.."

ඇය ආයෙත් සැර කළා.

"මං මේ කියන දේ පස්සේ ඔයාම මගේ මූණට කියලා මාව පාච්චල් කරයි... ඒත් කමක් නෑ... ඔයාට අක්කනම් කියන්න හිතුණ නිසා කියන්නේ.."

"හා.."

"අපේ සර් අපිට ගොඩාක් හොඳයි... ගොඩාක් හොඳයි... මට නම් හිතෙන්නේ අපේ සර් වගේ කෙනෙක් ළඟ වැඩ කරන්න ලැබීම එක ලොකු පිනක් කියලා... ඒත්.."

ආයෙත් අසංක පුදුමයෙන් වගේ ඇය දෙස බලා උන්නා.

"මේ කවුරුවත් අපේ සර්ටවත් මේ ආයතනයටවත් ආදරේ නෑ... ඔයාට මේ සර් දෙන රූට් එක ජයන්ත කියලා කෙනෙක් කළේ... ලක්ෂ ගණන් වංචා කරලා ගියේ... එහෙම කරන්න හිතෙන්නවත් හිතන්නෙපා... හොඳට හිටියොත් සර් සලකයි... ඒත් සේල්ස් වලත් වංචා කරන්නෙපා... කේක් පරණවෙලා විසික් කරලා කියලා බිල්වල බොරුවට දාලා සල්ලි ගන්නෙපා... ඒ සල්ලි අරන් ගිහින් ඔයා ආදරේ කරන කෙනෙකුට මිනිස් ගෙඩියක් වත් අරන් දෙන්න එපා... පව්... ඔය රූට් එකේ සේල්ස් හොඳටම බැහැලා තියෙන්නේ... සර් පුදුමයි ඔය රූට් එක ඔයාට දුන්නා... ඒ වගකීම හොඳට ඉෂ්ට කරන්න... තරහ නැතේ මෙහෙම කිව්වට..."

"නෑ මිස්..."



"ඔයා තරහ උනත් මට කමක් නෑ..."

අසංක ඇය දිහා සැහෙන වෙලාවක් බලා උන්නා.

"මං පුටුවකට කහලට යනවා... පැකින් ලිස්ට් එක ගන්න.. ඉඳගෙන බලන්න... අසංක උදේට කාලද..."

එහෙම අහද්දී අසංකගේ හදවතම ඇතිලිලා වගේ ගියා. ඔහු නැඟිට්ටේ කෙළ පොදක් ගිලිමින්මයි.

"ඔව්.. පිටකොටුවෙන් කාලා ආවේ මිස්..."

"හා.. එහෙනම් ඉඳගෙන බලන්න..."

චන්ද්‍රිකා යන දෙස අසංක ටික වෙලාවක් බලා උන්නා. තාත්තා මේ කොල්ලව මේ ආයතනයට කොහෙන් සොයා ගත්තාද කියලා සසංක හිතුවා.

සසංක එහෙමම ඔහුගේ සාක්කුවේ දමාගෙන තිබූ ජංගම දුරකතනය ගෙන එය ඇමතුවා.

"හා...[illegible]..."

"ආ.. පොඩි පුතේ... ෆැක්ටරි එකට ගියාද..."

"ඔව් තාත්තේ... එහේ ඉඳන් තමා කතා කරන්නේ..."

සසංක කතා කළේ වටපිට බලමින්මයි.

"ඇයි පුතා ප්‍රශ්නයක්ද..."

"නෑ තාත්තේ... ඒත් දැන්මම තාත්තා මාව මේ ෆැක්ටරි එකට පුතා කියලා හඳුන්වලා දෙන්නෙපා... මේ කවුරුවත් මාව දන්නෑනේ.."

"ඔව්... කවුරුවත් දන්නෑ තමයි... ඔයා අවුරුදු අටක් පිටරටනේ පුතේ... ෆැක්ටරියේ මිනිස්සුන්ට තියා ඔයාගේ නැන්දට වත් ඔයාව අඳුනගන්න බැරි වෙයි..."

"මං තාත්තේ අද තාත්තාගේ කේක් ෆැක්ටරි එකේ සේල්ස්මන් කෙනෙක් විදිහට වැඩට බැඳුනා... අද ඉඳලා මෙතන ඇතුළේදී මම සසංක නෙමේ... අසංක රත්නායක... මට මේකට අවස්ථාවක් දෙන්න

තාත්තේ.."

සමරනායක මහතා දුරකතනයෙන් හයියෙන් හිනාඋනා.

"එහෙදී මිස්ටර් මැනේජ්මන්ට් වලට ඔයත් ඉගෙන ගත්තද පුතේ.."

සසංක හිනා උනා විතරයි. ඇය කාර්යාලයට ඇතුල් වෙනවා දැකලා සසංක ඔහුගේ ජංගම දුරකතනය එහෙමම සාක්කුවේ දාගත්තා.





SIHINA

# 02

සසංක චන්ද්‍රනාගේ මේසය ඉදිරිපිට වූ කුඩා මේසයේ ඉඳගෙන කොළඹ නුවර මාර්ගයට අදාල බිල්පත් පරීක්ෂා කරන්න ගත්තා. ඇය කාමරයට ආවේ ඇයට පුරුදු කඩිසර ගමනින්මයි. මුළු ආයතනය පුරාම ඉන්නේ මේ කෙල්ල විතරද... තාත්තාට අයත් කේක් නිෂ්පාදන ආයතනයේ සේවකයන් සිය දෙනෙකුට වඩා සේවය කරන බව ඔහු දන්නවා. දැන් වේලාව නමයත් පහුවෙලා. ඒත් වැඩ කරන අය කෝ... ඇයි කිසිවෙක් නැති පාළු කාර්යාලයට වී මේ කෙල්ල පමණක් වැඩ කරන්නේ.

ඇය කාමරයට එද්දීම මෘදු සුවඳක් කාමරය පුරා විසිරෙනවා. එය ගාඩිනියා මල් සුවඳට සමාන සුවඳක්. කාලාන්තරයක් විදේශ

රටවල පැර විලසුන් සුවඳට පුරුදු වෙලා උන් සසංකට මේ මාදු මල් සුවඳ ගෙන ආවේ අභිංසක සතුටක්.

'අංසක කාලා ආවා කියලා මොරු නේද කිව්වේ... ඇත්ත කියන්න...'

සසංකට මේ කෙල්ලගේ ගැහැණුකම අභියස දැනෙන්නේ පුදුමාකාර හැඟීමක්.

'මං... තේ එ..කක් බීලා ආවේ...'

'ෂ... මාත් උදේට කාලා නෙමේ උන්නේ... අද මෙන්න මං ඔයාටත් එක්කම බිත්තර පාන් එකක් ගෙනාවා... ඔන නම් පහළ ලන්ච් රූම් එකට ගිහින් කන්න... හැබැයි එතනට ගියාම ඔයාට තව පැය දෙකකටවත් එන්න ලැබෙන්නෑ... ඒතරම් ඔපදූප... ඔයාගේ අම්මගේ ආච්චිගේ ආච්චි ගැනත් අහයි...'

'මං මෙහෙම ඉඳලා කන්නම්...'

'ආ කිරි පැකට් එකකුත් මං අරන් ආවා... බොන්න...'

පිටරට ඉඳගෙන ගනිද්දී විදේශීය ප්‍රවාසියන් දුන් කොච්චරම් දේවල් කා බී තියෙනවාද... එහෙත් අද ඇය මේ කන්නට දුන් බිත්තර පාන් එකත් කිරි පැකට් එකත් තමාට දුන්නේ තමා මේ ආයතනයේ හිමිකාරුගේ පුතා බව දැනගෙන නොවේයි. කුරුණෑගලින් ආ දුප්පත් කොල්ලෙක් ලෙස සළකායි. සසංකට ප්‍රථම වරට මිනිස්කමේ සුවඳක් දැනුණා. ඒ සුවඳ මින් පෙර කෙදිනකවත් ඔහුට දැනී තිබුණේ නෑ.

'කෑ..ටි..ටි..ය අද නිවාඩුද මි..ස්...'

'ෂ..ම..යෝ.. මට මිස් කියන්නෙපා... ඔයා මිස් කියනවා ඇහුණොත් මේතන මිනිස්සු මට හිනාවෙයි... මං මෙතන පුංචි ක්ලාක් වැඩක් කරන කෙල්ලෙක්.. පේනවා නේද දැන් නවයයි හතලිස් පහයි... එක්කෙනෙක් වත් නෑ... තව පැයකටවත් එන්නේ නෑ... හම්බ කරන් කන දේට මෙහෙම කරන්න හොඳ නෑ... මේවා හදන්න සර් කොච්චර දුක් විඳින්න ඇත්ද...'





මේවා ටික වෙප් කරගෙන ගිහින් තාත්තාට අහන්න දෙන්න ඔහුට සිතුණා. මේ තරම් කැක්කුමකින් මේ ආයතනය ගැන කවදාවත් හිතිලා නෑ. සසංක චන්දනාගේ කතාවෙන් මේ ආයතනය ගැන ගොඩක් දේවල් තේරුම් ගත්තා. තාත්තාට දැන් ඉස්සර වගේම කැපවෙන්න අමාරුයි. මිනිස්සු මේ තරම් අල්ල පනල්ලේ ඉන්නේ ඒකයි.

චන්දනා ඉන්වොයිස් මිටියක් රැගෙන ගොස් අනිත් කුඩා මේසයේ තිබූ දුරකතනය අතට ගත්තා. කෙල්ලගේ සිහින් ඇඟිලි තුඩ දුරකතන බටන් හරහා ගියේ වේගයෙන්.

'හෙලෝ... මිස්ටර් වෙත්තසිංහ... අද නැහැ... දැන් දවස් විස්සක් විතර ගත්තනේ... ඇයි හැමදාම නැහැ කියන්නේ... මැනේජර්ට දෙන්න... එයත් නැහැ... එතකොට ඔතන කවුරුවත්ම නැද්ද... අර්ටරීලා ටික විතරද වැඩ කරන්නේ...'

ඇය කෝන්තියෙන් එසේ කියා දුරකතනය තැබුවා. ආයතනයේ ප්‍රශ්න රැසක් ඇති බව ඔහු තේරුම් ගත්තා.

'මේ ගත්තාවා නේද... මේ සේල්ස් කරන අයගේ වැරදි... මාස ගානක් තේත් නැති හෝටලයක්... බිල රුපියල් අසූදාස් ගානක්... අද වෙනකුරු සතයක් වත් දීලා නෑ... මං සර්ට දහ පාරක් විතර කිව්වා... මෙහේ අය වැන් අරගෙන යනවා එතනට... ඔයා දන්නවද අසංක එතන හෝටල් අයිතිකාරයා හරි කපටියෙක්... මෙහෙන් යන්නේ මේ ආයතනයට ආදරේ නැති අය කියලා දන්නවනේ... ඉතින් මේ අය ගියාම එයා හොඳට කන්න දෙනවා... එතකොට අරන් එන්න මුදියානිත් දෙනවා... මෙහෙන් කතා කළාම අයිතිකාරයත් නැහැ මැනේජරුත් නෑ... කාට කියන්නද...'

ඇය මේ කියන්නේ තමාටද... නැත්නම් තමාටම කියවාගන්නවද කියා සසංක දන්නේ නෑ. ඒත් ඇගේ ඇස්වල දුකත් කෝන්තියත් අවංකවම දිලිසුණා.

'ඇ..යි එහෙම මේ අය කරන්..නේ...'



SHINA

"හැක්කුම කියලා දෙයක් එන්න අසංක එක්කෝ මිනිහෙක්ට අම්මා තාත්තා ඉන්න ඕන.. හැක්කුම හොඳ ගෑනියෙක් ඉන්න ඕන... එහෙම හැක්කුම දරුවෝ ඉන්න ඕනා... මේ ඉන්නේ මිනිස්සු නෙමෙයි... මේ කම්පනි එකේ ටෙලිෆෝන් බිල අනූදාහක්... විශ්වාස කරන්න පුළුවන්ද... ඒත් ඇත්තටම ෆෝන් බිල යන්නේ හයදාහයි... ඉතුරු අනූදාහම යන්නේ මේ ඉන්න අයගේ මළමලට වලට... දැන් මෙවා ඔයා උනත් ටික දවසකින් මටම කියයි... කමක් නෑ... අනේ රස්සාව කරන්න බැරිනම් අසංක ගෙදරට වෙලා ඉඳිආප්ප තම්බනවා... මෙහෙම ඒවා කරන්න හොඳ නෑ..."

අවුරුදු හයක් විදේශ රටකදී ඉගෙන ගත් ව්‍යාපාර කළමණාකරණය මොකක්ද කියලා සසංකට හිතුණා. ඔහු ඇත්තටම දෙයක් ඉගෙන ගන්නේ අද මේ කෙල්ලගෙන්.

"මං.. මේ රූට් එක ම..ට පුළුවන් උපරිමයෙන් හදන්නම්..."

ප්‍රථම වරට ඔහු දෙස බලාගෙන ඇය ලස්සනට හිනා උනා. ඒ හිනාවේ හැම රේඛාවක් දිගේම ඔහුගේ දෑස් විහිදී ගියා.

"ඔයා හොඳට කරන්න... ඒ හොඳකමට මේ ආයතනය [illegible] නැළකුවේ නැතත් අසංක උඩ ඉන්න කෙනෙක් ඔයා ගැන බලයි..."

එපමණයි ඇය කිව්වේ. සසංකගේ ඇතුළු හදවතම ඇකිලී ගියා. මොනවද ඇය මේ කිව්වේ. අවංක තමට යමක් නොදෙන ආයතනයක් වෙනුවෙන් ඇයි මේ කෙල්ල මේ තරම් කැක්කුමකින් කතා කරන්නේ...

"වන්දනා..."

නිශාන්ති කට්ටිය එක්කම කෑගසාගෙන ඇවිත් පිස්සියෙක් වගේ දොර ඇරියේ කෑගහගෙනමයි. නිශාන්ති ඇස් කරකව කරකව මැලුවේ ඔහු දෙස බව වන්දනා දන්නවා. "පුළුවන් නම් පිරිමියෙක්ව ඇස් දෙකෙන් දූෂණය කරයි මුන්" ඇයට සිතුණේ එහෙමයි.

ඒත් සමඟම නිශාන්ති පිටුපසින් කාර්යාලයේ තුන් හතර දෙනෙක්ම කාමරයට කඩාගෙන ආවා.





"මේ සර් ගන්න අලුත් කෙනෙක්... සර් අද එන්නෙයි කියලා..."

ඔහුව ඔක්කොමල්ලටම ප්‍රශ්නයක් බව තේරුම් ගත්ත වන්දනා කියලා දැම්මා.

"ආ ඇත්තද... ඉතින් මොකද උඹ ළඟ තියාගෙන..."

වන්දනා බිම බලාගත්තේ නිශාන්ති කියූ දේට ඇයට දැනුණු අසීමිත ලැජ්ජාව නිසයි. සසංකත් ඒ බව දුටුවා. මේ අහිංසක කෙල්ලගේ මිනිස්කම පාවල් කරන්නට තරම් මේ කාර්ය මණ්ඩලය මිනිස්කමින් පිරිහිලා උන්නේ.

"මෙයා ළඟට වෙලා හිටියොත් මටං උඹටත් ඔය [illegible] නමා වෙන්නේ..."

නිශාලි කියූ ඒ කතාවෙන් සසංක මොනතරම් දේවල් තේරුම් ගන්නා.

"නම මොකක්ද ඔයාගේ..."

නිශාන්ති ඇසුවේ ඇද්දීගෙන...

"මං... අසංක..."

"මොනාවද ආවේ සේල්ස් වලටද ප්‍රචාරක වලටද..."

වන්දනා කතා කළේම නෑ. තමන්ගේ රාජකාරිය නිසි ලෙස ඉටු නොකර අනුන්ගේ කිල්ලෝට සොයන මේ මිනිස්සු ගැන ඇයට පුදුමයි.

"මං සේල්ස් වලට ආවේ..."

"රූට් එකක් දුන්නද..."

"ඔ..ව් සර් ජයන්ත කියලා කෙනෙක්ගේ රූට් එකක් දුන්නා..."

"පව්... ජයන්ත හොඳ එකා... මේතන කට්ටිය රුදාවට බිල් චෙක් කරලා ඌව අල්ලලා දුන්නේ... අපරාදේ කියන්න බෑ කන්න ගියත් උගේ ගාණේ කන්න අරන් දෙන්නේ..."

"මචි ආයතනයට වංචා කරන මිනිස්සු සේවකයන්ට වීරයෝ වෙනවනේ..." සසංක සිතුවේ තරමක කෝන්තියෙන්. ඇය එහෙත්

මතෝලෙන් "මෙතන කට්ටිය" කියලා කිව්වේ තමාට බව චන්දනා දන්නවා.

ඇය එහෙමම උයිල් දෙකකුත් රැගෙන කාමරයෙන් පිට උනා.

"දැන්නා නේද දකිනකොට විඳෙනවා... රයිට මචං අපි ලන්ච් එකේදී සෙට් වෙමු..."

"හොඳයි..."

නිහාල් ගිය පසු නිශාන්ති සසංක ළඟට ආවා.

"මං නිශාන්ති..."

ඇඟටම හැඩවූ රතු පැහැ ගත් බ්ලවුස් එකක් ඇඳ උන් ඇය එහෙම කිව්වේ සසංක ළඟටම ඇවිත් වගේ... ඇගේ පපුව තමාගේ මුහුණේ වැදෙයි කියලත් සසංකට බය හිතුණා. ඒ තරමට ඇය ළඟට ආවා.

"මේ.. මොනාද අරයා කියන්නේ..."

මේ අහන්නේ චන්දනා ගැන කියලා ඔහු දන්නවා.

"ම..ට..."

"ඔව්..."

"මොනාත් නෑ..."

"මෙතනට එහෙම නැගිටලා කරන්න යන්නෙපා... මේ ඔයාට ආදරේට කියන්නේ.."

තමාට ඒ තරම් ආදරේ කරන්නේ ඇයි කියලා ඔහුට අහන්නම හිතුණා.

"කේක් දහයක් විත්තත් දහස් විත්තත් ඔයාගේ පඩිය එකයි..."

මේ ආයතනයට ගොඩවූ පසු ආයතනයේම දෙදෙනෙක් කියූ කතා දෙකක ඇත්තේ මොන තරම් වෙනසක්ද... සසංකට පුදුම හිතුණා. "එහෙම වංචා කරලා හම්බ කරන සල්ලි වලින් ඔයාට ආදරේ කරන කෙනෙකුට බනිස් ගෙඩියක් වත් ගිහින් දෙන්නෙපා... සහතිකවා..." චන්දනා නැඟීම්බරව කියූ කතාව ඔහුට සිහිඋනා.



පහතට ගිය චන්දනා උඩු මහලට ආවේ සැහෙන වේලාවකට පස්සේ. ඇගේ මුහුණ ඒ තරම්ම හොඳ නෑ. ඇය හිස නමාගෙන ඇවිත් පුටුවෙන් වාඩිවෙලා පැයක් පමණ යතුරු වැඩ කළා... සසංක දෙසවත් බැලුවේ නැහැ... ඒත් ඔහු නොසිතූ මොහොතක ඇය හිස ඔසවා ඔහු දෙස බැලුවා.

"ඇ..යි..."

ඇයට එහෙම ඇහුණා. ඒ ඔහුගේ දෑස්වල මුහුලේ නිසා.

"නෑ... ච..න්..ද..නා මු..කුත් නෑ..."

"ආ මගේ කෝප්පේ... අද මෙතෙක් මොනා..."

"එතකොට ඔයාට..."

"මේ අද තේ බිබන නෑ... පල්ලෙහාදී වතුර බිව්වා..."

ජීවිතයේ ප්‍රථම වරට තමුන් අති විශේෂ හැඟීමකට බලසම්පන්න බව ඉදිරිපිට සසංකට විශාල හැඟීමක් දැනුණා. ඔහු ඇගේ ළඟ තිබූ පැහැ ගත් කුඩා කෝප්පය අතට ගත්තේ විශාල හැඟීමකින්.

සසංක තමුන් ලංකාවට පැමිණ දවස් හතරයි... ඒ වෙද්දී ඔහුට කරන්නට බොහෝ ගොඩක් තිබුණා. එහෙත් ඔහු දහවල් වන තුරු චන්දනාගේ මේසය ඉදිරිපිට වූ කුඩා ප්ලාස්ටික් පුටුවට වී උන්නා. ජීවිතයේ ප්‍රථම වරට කෙල්ලෙක් ගැන පැයකට වඩා හිතුණා කියලා සසංකට හිතුණා... දෙතුන් වරක්ම එළියට යන්න හිතුණත් පුටුවටම තමාව අලවා තබන මොකක්දෝ හැඟීමක්... ලෝබකමක් ඔහුට දැනුණා...

"ම..ම චන්දනා අද ටිකක්..."

"ආව ගමන් නිවාඩු ගන්න නේද හදන්නේ... මං ඔයාට කිව්වේ ඇවිත් පැය දෙක තුනක් යන්න කලින් ඔයාට වසංගතේ බෝ උනා..."

චන්දනා කීවේ මෘදු හඬකින් උනත් ඇගේ වචනවල මොකක්දෝ ශක්තියකුත් තිබ්බා. ඇය ඔහුට උදේ ඉඳන් එක එක දේවල් කිව්වේ ලොකු හැඟීමකින්, කැක්කුමකින්. මේ ආපු තරුණයා ගැන ඇගේ

SIHINA

ඔහේ මොකක්දෝ ප්‍රසාදයක් හටගෙන තිබුණා... ඇය ඒවා ඔහුට කිව්වෙත් ඒ හැඟීම නිසයි.

“මං... තෙ..මේ ෆෝම් ලීව් බලන්නේ.. කුමාරි... එයා තමයි පර්සනල් ෆයිල් වල වැඩ කරන්නේ.. ගිහින් කියන්න...”

චන්ද්‍රනා එහෙම කියලා අහක බලාගත්තා. ඔහුගේ මුහුණ බලා ඉඳිද්දී අසරණ පාටට හැරුණා.. කාලයකට පස්සේ හමුවූ පුංචි අවංක මිතුරියක් තරහ වෙද්දී හිතට දුකයි.

“මං.. ෆෝම් ලීව් අන්න තෙ..මේ හිතුවේ චන්ද්‍රනා...”

“එහෙනම්...”

“ම..ම මේ රූට් එකේ බිල් ටිකත් අරගෙන අදම යන්න ආසයි.. මේ බිල් වල බැලන්සස් ගොඩක් තියෙනවා... මං.. මුදලාලිලත් එක්ක කතා කරලා එ..හෙම...”

“ඕ.. සොරි... මං හිතුවේ...”

ඇගේ දෙතොල් පට හරහා තුනී එහෙත් සුහද සිනාවක් සටහන්ව තිබුණා...

“ඕ..ය රූට් එක පටන් ගන්නේ කැලණියෙන් මං හිතන්නේ...”

“ඔ..ව් චන්ද්‍රනා...”

“එ..හෙ..න..ම් යන්න... කැමති කන්නැතුවද ය..න්..නේ...”

මේ ජීවිතයේ එහෙම කවුරුවත් අහලා නෑ. ඒ නිසාම ඇය එහෙම අහන අහන වාරයක් වාරයක් පාසා ඔහුගේ හිතට මොකක්දෝ වෙනවා...

“මං... මගින් කන්නම් චන්ද්‍රනා... මං මේ බිල් ටික ගන්නම්...”

“ඕ.. හැබැයි හවස ඇවිත් පොත අත්සන් කරන්න... ආපු පළවෙනි දවසනේ...”

“හොඳයි චන්ද්‍රනා... මං.. ගිහින් එන්නම්...”

යමක් කියන්නට වගේ ඇය ඔහු දෙස බැලුවා. ඊටත් පස්සේ





ඇය හාත්පස කාර්යාලය පුරා දෙනෙත් රැගෙන ගියා. මුළු කාර්යාලයම පාළුයි. සියල්ලන් දවල් කෑමට ගිහින්... මේ යන කට්ටිය දවල් තුනටවත් තමන්ගේ පුටුවට එන්නේ නෑ...

“ඇත්තටම මොනවත් හිතන්නෙපා අසංක... මං මෙහෙම රස්සාවට ආපු දවසෙත් මගේ අතේ තිබ්බෙ රුපියල් සීයයි... අ..තේ සල්ලි තියෙනවද...”

ඇස් දෙක දිගාම බලාගෙන චන්ද්‍රනා එහෙම ඇහුවා. මිනිස්කම රනින් පෙරා ඇගේ හදවතට දෙවියන් වත් කරන්නට ඇති. එහෙමයි අසංකට හිතුණේ.

“රු..රුපියල් සීයක් ති..යෙනවා ඇතිවෙයි...”

අසංකට ඉබේම කියවුණා. ඒත් මේ මොහොතේ ඔහුගේ සාක්කුවේ රුපියල් විසිපන්දාහකට වඩා මුදල් තිබුණා... ඊට අමතරව බැංකු කිහිපයකින් නිකුත් කළ ක්‍රෙඩිට් කාඩ් පත් තිබුණා.

“අ..නේ..න..කෝ.. කැලණියට යන්නම රුපියල් පනහක් යයි.. ආයිත් එන්නත් එපැයි.. එතකොට කන්නැද්ද...”

චන්ද්‍රනා පුටුවෙන් නැඟිටලා ගියේ සාරි පොට හදාගෙනමයි. ඒ සාරිය ඇගේ සුන්දර වතේ පැටලිලාද නැත්නම් ඇලිලාද කියලා හිතාගන්නට ඔහුට අමාරුයි. මේ ඇස් මීට කලින් ගැහැණු දිහා මෙච්චර [illegible] බලලා නැහැ.

චන්ද්‍රනා යළිත් මේසයට ආවේ ඇගේ සුදු පැහැගත් කුඩා හෑන්ඩ් බෑග් එක අරගෙනමයි. කෙල්ලන්ට මොනවා නැතත් පුංචි පුංචි ලස්සන අඩුම කුඩුම නම් තියෙනවා. එහෙත් මෙහෙන් ලස්සනට සුදු පටි එල්ලෙන ඇගේ අත් බෑගයත් එවැනි ලස්සන කොරොම්බල් බඩුවක්,

“මා ළඟත් ගොඩක් සල්ලි නම් නෑ අසංක... අප්පච්චිගේ බෙහෙත් ගන්න තමයි සල්ලි ටික තියන් හිටියේ...”

“අප්පච්චිට මක් වෙලාද...”

එවර නම් ඇය ඔහු දෙස බැලුවේ අසරණ පාටට.

"මං පස්සෙ කියන්නම්කෝ.. ආ.. මේ රුපියල් දෙසීය පනහත් අරන් තියාගන්න.."

චන්දනා ඔහු දෙසට ඒ රුපියල් සීයේ කොළ දෙකයි පනහේ කොළයයි දිගු කරද්දී ඔහුගේ හදවතම හෝස් ගාලා පත්තු උනා.

"අප්පච්චිට මෙහෙත් ග..න්..න මදි වෙනවා නේ..ද..."

"මං පිරිමහගන්නම්... අසංක යන්නකෝ.."

"මං හවස ඇවිත් පොතේ අත්සන් කරන්නම්..."

"ම්.. ප..රි..ස්..ස..මින්.."

ඒ වචනයට ඔහුගේ දෑස් නැවතත් ඇය දෙසට හැරුණා. "පරිස්සමින්" එහෙම කිව්ව ඒ පුංචි කට දිහා තව එක පාරක් බලන්න ආසාවක් ඔහුට ඇතිඋනා..

සසංක පාළුව ඇවිත් පුරවන් තරම් ඉක්මනට ෆැක්ටරියෙන් පිට උනා... ඔහු කාර්යාලයෙන් පිට වෙද්දී ආයතනයේ ගේට්ටුව අසළ උන් ආරක්ෂක නිලධාරියෙකු සේක් නිෂ්පාදන සේවකයෙකු සමග අඹ ගස යට ඉඳගෙන සිගරට් බොනවා. සසංක ඒ සියල්ලම බලාගෙනම ආයතනයෙන් පිට උනා.

"අර කෙල්ල කියන්නේ ඇත්ත... මේ මන්තකොම පිස්සු නටන්නේ... මං දැන් ෆැක්ටරි එකෙන් පිට උනා... මාව දන්නෙත් නෑ... ඒත් සිකියුරිටි පැත්තකට වෙලා සිගරට් බොනවා..." සසංක සිතුවේ ඇඩි වේදනාවකින්..

ඔහු ආවේ වාහනයෙන් නෙවෙයි... ඒ නිසා පාරේ සැහෙන දුරක් පයින් ආ ඔහු ත්‍රීවීලරයක් අල්ලා ගත්තා.

"කොහාටද සර්.."

"දෙහිවලට.."

ත්‍රීවීලරයට ගොඩ වූ වහාම සසංකගේ අත ගියේ ඔහුගේ කමිස සාක්කුවට.. එහි තිබුණේ චන්දනා ගුලි කර ඔහුට දුන් රුපියල් එකසිය පනහ.. ඒ දෙස සැහෙන වේලාවක් ඔහු බලා උන්නා... සල්ලි වල මිනුස්සකම් ගැවෙන්නේ නෑ... ඒත් ඇගේ අතින් දුන් මේ පුංචි නෝට්ටු



දෙකේ කොතරම් මිනිස්කමක් ගෑවිලා තියෙනවද... මේ ටික ඇය දුන්නේ තමා මේ ආයතනයේ හිමිකරුගේ පුතා බව දැනගෙන නොවෙයි. දුප්පත් කුරුණෑගල කොල්ලෙක් බව සිතලයි. මිනිස්කම අඩි අගල් කෝදුවෙන් කොමනින ඇගේ හදවත කොතරම් විසාලද...

සසංකට දිග සුසුමක් පිටඋනා... ලංකාවට එන්නට සිතුවේ මීට ගොඩාක් කලින් සියලා ඔහුට සිතුණා.

SIHINA

# 03

වන්දනා හැමදාමත් ෆැක්ටරි එකෙන් පිටවෙන්නෙත් සියල්ලන්ම කාර්යාලයෙන් පිට වූ පසුවයි. බොහෝ විට ඇයට කරමින් ඉන්නා වැඩක් අතරමග දමා යන්නට සිත් දෙන්නේ නෑ. ඇය බිල්පත් තිහක් පමණ සකස් කරන්නට ගත්තේ හතරට පමණයි. මේ ටික හෙට උදේ කරන්නත් පුළුවන්... ඒත් කාර්යාල වේලාවෙන් පැය බාගයක් වැඩිපුර ඉඳලා හරි මේක ඉවර කරලා දාන්නට ඇයට ආසයි. ඒත් එහෙම කරන්න තියෙන කැක්කුම මොකක්ද කියලා ඇයටම තේරෙන්නේ නෑ.

කාර්යාලයම නිහඬයි... නිසලයි... වන්දනා හිස ඔබාගෙන වේගයෙන් බිල්පත් සකසමින් උන්නා... සැන්දෑවෙගෙන එන බවක්...



අඳුර වැටීගෙන එන බවක් මේ විශාල කාර්යාලය තුළ තමා තනිවූ බවක් ඒ කිසිවක් වන්දනාට හිතෙන්නේ නෑ.

"මි..ස් දොරවල් වහන්න දැන්ම යනවද..."

ආයතනයේ ආරක්ෂක නිලධාරියා ඇවිත් අහද්දී වන්දනා හිස එසෙව්වේවත් නෑ.

"දැන්ම වහන්නෑ..."

"දැන් හයයි දහයයි මිස්..."

"ඉතින්..."

"කට්ටිය ඕෆ්වෙලා ගිහින්..."

"ඉතින්..."

"මිසුත් ගියා නම් ඉවරනේ..."

එකවරම වන්දනා හිස ඔසවලා ඔහු දෙස බැලුවා. වන්දනාගේ බැල්මෙන් ඔහුව දැවිලා වගේ ගියා.

"ඇයි වහන්න හදිස්සිය..."

"නෑ.. මි..ස් මේ.. මි..ට ටවුමට යන්න ඕ..න..."

"ඔයාට පඩි දෙන්නේ මෙතන ආරක්ෂාව දෙන්නනේ... නේද.. මං දැන්ම යන්නෑ..."

මේ සියළු දේවල් යළින් කාර්යාලයට ආ සසංක අසාගෙන උන්නා. ඔහු දොරකඩට මුවාවී මේ සියල්ල අසාගෙන බලාගෙන උන්නා. ආරක්ෂක නිලධාරියා යන්නේ ඇයට බනිමින් බව සසංක දැක්කා. ආයතනය විශාල ලෙස පිරිහී ඇති බව පමණක් සසංක දැන උන්නා. රන්තරු කේක් සමාගමෙන් හදන කේක් කොච්චර රස උනත් ඒ කේක් හදන සමාගම හරි නීරස තැනක් බව දැන් ඔහුට වැටහෙනවා.

සසංක මහන්සි පාටින් කාමරයට ඇතුල් උනා... වන්දනා ඔහු දෙස එක බැල්මක් හෙලලා ආයෙත් කරන්න ගිය වැඩේ කරගෙන ගියා.

"කඩ වලට ගියාද අසංක..."

SIHINA

වන්දනා ඇනුමේ බිල්පත් ලියන ගමන්මයි.

"ඇ..ඩි.. ප්‍රශ්න ගොඩක් තියෙනවා..."

"ප්‍රශ්න නැත්නම් තමයි පුදුම..."

"අනිත් අය ගිහින් වෙලාද වන්දනා..."

"ඔ.."

"අද වන්දනා ඕ.ටී.ද..."

ඒ සභාවට නම් කෙල්ල හිස වනලා හිනාඋනා.

"ඕවර් ටයිම් නම් තමා... ඒත් සල්ලි වලට නෙමේ... මේ වැඩේ ඉවර කරලාම යනවා අසංක..."

ඒත් ඇයි ඇය මෙහෙම කරන්නේ...

"එළියේ මේසෙ උඩ ඇති පොත අත්සන් කරලා යන්න..."

"ව..න්..දනා දැන්මම යන්නැද්ද..."

"ම්... තව විනාඩි පහකින් ඉවරයි..."

"මං එනකල් ඉ..න්..නම්..."

ඇය ලාච්චුව ඇරලා ඔහුට පුංචි ටොෆියක් දිගු කලා.

"ආ.. මේක කකා එහෙනම් ඉන්න..."

ඒ චූටි ටොෆිය ඔහු ඇගේ අතින් ගත්තේ හරි ආසාවෙන්.

"හ..රි.. මගේ වැඩ ඉවරයි..."

කෙල්ල ෆයිල් එක පිළිවෙලට සකසලා නැගිට්ටේ ඇගේ කුඩා වතුර බෝතලය කටේ තියාගෙනමයි.

"මං මූස් ගාලා එන්නම්..."

ඇය ටොයිලට් එකට දුවගෙන ගියේ පුංචි හෑන්ඩ් බෑගය අරගෙනමයි. ඇයත් ගිය පසු සසංක මුළු කාර්යාලය පුරාම රවුමක් කැරකී බැලුවා.

"තාත්තා මට මේක බාරගන්නලු... ඒත් මේක ආයතනයක් නෙමේ... වාට්ටුවක්... ලෙඩ්ඩු විතරයි ඉන්නේ... නැත්නම් සත්තු...



මෙතන ඉන්න එකම මනුස්සයා මේ කෙල්ල විතරයි..."

සසංක දිග සුසුමක් හෙලමින් හිතුවා.

ඒත් සමගම ඇය පුංචි මේක් අප් එකක් දාගෙන ලස්සනට සාරි පොට හදාගෙන ටොක ටොකස් හඬ නංවමින් ඔහු දෙසට ආවා. ඔහු මොහොතක් තමා දෙසට එන මේ සුන්දර යුවතිය දෙස බලා උන්නා.

හදවත ඇතුලෙන් ගැඹුරෙන් ගැන මොනවදෝ හැඟීමක් කඩාගෙන එනවා කියලා සසංකට දැනුණා. විශේෂයෙන්ම අර නිරුවත් ගැණු සිය ගණින් දැක තිබූ ඔහුට මේ සුන්දර කෙල්ල ගැන මෙහෙම හිතෙන්නේ ඇයි කියලා ඔහුටම තේරෙන්නේ නෑ. ගැඹුරෙන්ම ශරීරය එකක්... ඒ ගැඹුරෙන් එන ගැණු සුවඳ තව එකක්. ඔහුට දැනෙමයි හිතුණේ.

වන්දනා ඔහු වෙතට ආවේ සිනාසීගෙනමයි. යන්නට ගිය වන්දනා ආයෙත් නැවතුණා.

"බලන්නකෝ... තමන් වැඩ කරන කම්පියුටරේ හවසට යද්දි ඔෆ් ඩවුන් කරලා යන්නෙත් නැහැ... මුළු රෑම ඉතින් ඒක ඔන් එකේ... ඉන්නවා විතරයි අසංක..."

වන්දනා ආයෙත් හෑන්ඩ් බෑගයක් දමාගෙන කම්පියුටරය ළඟට ගියා. ඇගේ අත වේගයෙන් පුංචි සුදු බටන් දිගේ ගියා. ඔහු ඇය දෙස බලා උන්නේ පුදුමයෙන්.

"හවස් වරුවෙම වැඩ කරලා නෑ... ගේම් ගහලා තියෙන්නේ.. ඒ ගේම් එක වහන්නෙවත් නැතුව ගිහින්.. හරි පුදුමයි නේද අසංක... රත්තරු ෆැක්ටරියෙන් මෙයාලට පඩි දෙන්නේ ගේම් ගහන්න..."

"කවුරුවත් මේවා බලන්නේ නැද්ද වන්දනා..."

"ඒක තමයි මටත් තියෙන ප්‍රශ්නෙ අසංක... අපටත් දෙයක් ලැබෙන්නේ මේවා දියුණුවෙලා ආදායමක් යනමින් ලැබුණොත්.. සර් ඉස්සර මේ බිස්නස් එක ලස්සනට කළා... ඒත් දැන් සර්ටත් අමාරුයි... ඉඳලා හිටලා අසනීපත් වෙනවනේ..."

SIHINA

ඒ බව අසන්ම සසංකගේ හදවත වේගයෙන් කඩා වැටුණා. තාත්තා තමාට අසනීප වූ බවක් කවදාවත් කියලා නෑ.

"සර්ට මොකද අසනීප වෙන්නේ..."

"සර්ට ප්‍රෙෂර් ටිකක් තියෙනවා මං හිතන්නේ අසංක... ඩයබිටීසුත් ඇවිත් කොහෙද... දවසක් ඔෆිස් එකේ කලන්තෙත් දැම්මා... එදා මට ඇහුණේ එක්ක..."

මෙවා කියන්නේ සර්ගේ පුතාට කියලා කෙල්ල දන්නේ නෑ. සසංකට තාත්තා ගැන විශාල දුකක් හටගත්තා.

"ලො..කු පුතෙක් ඉන්නවා... එයාවත් ඇවිත් මෙවා බලන්නෙපායැ... තාත්තලා පුත්තු හදන්නේ පුත්තු ලොකු උනාම මේ දුක කරට ගනී කියලා හිතාගෙන... එයාලට ගාණක් නෑ... පිටරට වලට වෙලා ඉන්නවා... සර් මැරෙනවා..."

සසංකගේ දෑස් එහෙමම බිමට බරවුනා. අවශ්‍ය කාලයටත් වඩා වසරක් පිටරට හිටපු තමා ගැන ඔහුට විශාල ලැජ්ජාවක් ආවා. මේ කෙල්ල තමාට බනින්නේ බොරුවට නෙමේ කියලා ඔහු දන්නවා. ඇත්තටම විය යුතුව තිබුණේ එයම තමා. තාත්තට දැන් අමාරුයි. ඔහු මේ කේක් ව්‍යාපාරය සමග අවුරුදු ගණනක් පිච්චුණා.

"ස..ර්..ගේ පු..තා ලංකාවට ආව කිව්වා නේ..ද..."

"ම්... ආවට ආපහු යයි... ඔය ආවා. නිකමට තාත්තගේ බිස්නස් ටික බලන්න ආවද... මොකෝ මේ සර් අරගෙන යනවද... ගෙවල් හදලා බිස්නස් හදලා වාහන අරගෙන කොච්චර සැප සම්පත් සර් හදලා තියෙනවද... ඒත් සර් තාම උදේට කන්නේ රතු කැකුළු ඉඳි ආප්ප පහකුයි කිරි හොදි ටිකකුයි... දවල්ට බොන්නේ නිකම් තේ එකකුයි ක්‍රීම් ක්‍රැකර් බිස්කට් එකකුයි... කොටින්ම කියනවා නම් අසංක සර්ගේ කොම්පැනියේ හදන කේක් කෑල්ලක වත් රහ බලන්න සර්ට අද බෑ... ඩොක්ටර්ස්ලා එපා කියලා තියෙන්නේ... ඒවා කරලා තියෙන්නේ කා වෙනුවෙන්ද..."



සසංකගේ දෑස් තෙමී යන තරමට ඔහුට දුක හිතුණා. තමා අහින් මේ තරමට පුතුකම පැහැර හැරිලා ඇති කියලා ඔහු හිතුවේ නෑ. මේ දුප්පත් කෙල්ල මාසේ පඩියෙන් සල්ලි ටික ටික හරි එකතු කරන්නේ අප්පච්චිගේ බෙහෙත් ටික ගන්න. ඒත් මෙච්චර දේවල් තමාට කරපු තාත්තා වෙනුවෙන් මොනාද කළේ.

"ඒ සර් එයි වන්දනා..."

"එයි නම් තමා... ඒත් අසංක කොච්චර පිටරට ඉඳගෙන ගත්තත් සමහර දේවල් එයාලට තේරෙන්නේ නෑ..."

"ඒ කිව්වේ..."

"පොත් වල දැනුමෙන් විතරක් බිස්නස් කරන්න බෑ... ඒකට ඉවක් කියලා දෙයක් තියෙන්න ඕන..."

"මං ළඟ ඒ ඉව නැතත් උණ ගාව තියෙනවමනේ... මට ඒ ඇති..." සසංක කීවුවේ තරමක සතුටකින්.

ඔවුන් ආයතනයෙන් පිටවෙද්දී ආයතනයේ ආරක්ෂක නිලධාරියා ගේට්ටුව අසළ උන්නේ නෑ... සසංකට බිල්ලුනා.

"මං මේ මනුස්සයාට කිව්වා යන්නෙපා කියලා... හවසට බීගෙන ඉන්නේ අසංක... කෝටි ගාණක බඩු ඇතුලේ... රෑට වැඩ කරන මිනිස්සු මොනවා පන්නනවා ඇත්ද... ඒත් මේ මිනිහා දන්නෑ... නැත්නම් එයා දැනුවත්ව ඒවා වෙන්නේ..."

මේ ව්‍යාපාරය ගැන තීරණ ගොඩක් ගන්න ඕන කියලා ඔහුට හිතුණා. අලුත් ව්‍යාපාරයක් කරනා ආසාවෙන් උන්නත් මේ ව්‍යාපාරයම මීට වඩා හොඳට කරනවා කියලා ඔහු හිතාගත්තා.

"ම..න්න ඔය ගේට් පලුව වහගෙන එන්න අසංක... අපිවත් වහලා දාලා යන්..."

වන්දනා විශාල ගේට්ටු පලු දෙකෙන් එක පලුවක් අල්ලාගෙන වැහුවා. ඔහු අනෙක් පලුව වැහුවා. වන්දනාත් සසංකත් පාරට එද්දී කළුවර වැටිලා ඉවරයි.

"අන් යද්දී ඒ වෙනුවෙන් චන්දනා..."

"ඉතින්.."

එවර නම් කෙල්ලගේ මුහුණට ආවේ සම වයසේ කෙල්ලෙක්ගේ මුහුණින් පෙනෙන දුකකාර බව...

"ඒ වෙලා මේ පාරවල් වල..."

"ඉතින් මොනා කරන්නද... තාටනරි කියන්නායෑ මාව ගිහින් ගෙදරින් ඔස්සන්න කියලා... තනියම එපායෑ ඔක්කොම කරගන්න අසංක..."

"එහෙනම් ඔයාව එක්කරගෙන යන්න කෙනෙක් නෑ... ඒක හොඳයි..." සසංක සිතුවේ සතුටින්.

"කොහෙද ගෙවල් චන්දනා..."

"මං ඉන්නේ අත්තිඩියේ... ඔයාගේ බෝඩිම තියෙන්නේ කොහෙද..."

"මේ ම..හ..ර..ග..ම..."

"එහෙනම් අපිට එකටම මහරගම ඉන්න පුළුවන්... අද මාත් මහරගම පොළට යනවා... බඩු ටිකක් ගන්න... අප්පච්චිට ගෙදර කෑම ටික හදලා දෙන්නෙපායෑ..."

"අප්පච්චිට මොකක්ද තියෙන අසනීපේ චන්දනා..."

"පපුවේ කැක්කුමක්... ඩොක්ටර් නම් කිව්වා බයවෙන්න දෙයක් නෑ කියලා... ඒත් මට බයයි..."

"ඇයි..."

"මගේ අම්මා නැති උනෙත් පපුවේ අමාරුවකින් අසංක... ඒ නිසා මට බයයි..."

මේ තරම් අවංක කෙල්ලෙක්ට දෛවය මේ තරම් නපුරු විදිහට සැළකුවේ කොහොමද... ඔහුට හිතාගන්නවත් බෑ.

"එහෙම වෙන්නෑ චන්දනා..."



"වෙන්නත් එපා කියලා මං හෝඩිපුත්ත් තියනවා අසංක... මට ඉන්නේ අප්පච්චි විතරයි..."

"මට ඉන්නේ අප්පච්චි විතරයි..." ඒ වැකිය ඔහුගේ හදවතේ ගැඹුරුම පතුලක එහෙමම ලියවුණා.

"මේ බස් එකේ යන් අසංක... සෙනග වැඩිය නෑ..."

කෝටි ගාණක වත්කම් හිමි රත්තරු කෝප් නිෂ්පාදන ආයතනයේ හිමිකරුගේ එකම පුතා ඒ ආයතනයේම සේවිකාවක් සමඟ බස් එකට ගොඩ උනා... ඔහු මෙසේ ලංකාවේ බස් එකකින් යන්නේ පාසල් වියෙන් පසුවයි. සසංකට ඒ අත්දැකීම ඒ තරම් පුදුමයක් උනේ නෑ. ඔහු හදවතිනුත් මානසිකවත් අර පුරුණුගල දුප්පත් සේල්ස්මන්ගේ තැනට බැස්වෙලා ඉන්නා.

"මං ටිකට් ගන්නම් චන්දනා..."

ඔහු පර්ස් එක ගන්නට යද්දී කෙල්ල වේගයෙන් ඒ අතට ඇනුවා... "හරි පුදුම කෙල්ලෙක්..." ඔහුට සිතුණා.

"මං ගන්නම් මහරගමට දෙකක්..."

ජීවිතයේ පතුලේ ඉන්නා ඇය මෙසේ ජීවිතය බෙදා ගන්නට පුරුදු උනේ කොහොමද කියලා ඔහුට හිතාගන්නටවත් බෑ.

ඔවුන් දෙදෙනාව පිළිගන්නට වගේ එක ළඟ පුංචි අසුනක් හිස්ව තිබුණා. මුලින්ම චන්දනාත් පසුව සසංකත් ඒ අසුනෙන් වාඩි උනා. ඇයගේ සුවඳ ළඟින් ළඟින් දැනෙන තරම් සමීපව ඇය ළඟින්ම ඉඳගත් ඔහුට හදවතේ විශාල වෙනසක් ඇතිවෙමින් තිබෙනා බව දැනුණා.

"අසංකලගේ ගෙදර තත්වේ කොහොමද..."

"අ..මා..රු..යි චන්දනා..."

ඔහුට බොරුවක් කියන්නට හිතෙන්නේ නෑ. ජීවිතය මේ තරම් අවංකව අවසාව කියපු කෙල්ලෙක්ට මේ පට්ට පල් බොරුව කරගෙන යන්නේ කොහොමද... ඒත් තමා මේ රත්තරු ආයතනයේ හිමිකරුගේ පුතා කියූ ගමන් මේ බැඳීම මේ හාදයාංගම බව මෙතනින් නිමා වන

SIHINA

මට ඔහු දන්නවා.

"මං රස්සාවක් කළේ නැත්නම් මොකෝයි..."

"එහෙම තමයි.. මටත් එහෙමයි... අප්පච්චිටත් දැන් රස්සාවල යන්න බැහැනේ.. එච්චර කියලා හිතෙනවා ගෙදරට වෙලා ඉන්නකොට.. දැන් මග මං එනකල් පාර බලන් ඉන්නේ..."

අසංකට තමා ඉගෙන ගන්නේ මොනාද කියලා හිතුණා. රට රටවල ගිහින් ඉගෙන ගන්න මිනිස්කම මොකක්ද... මේ කෙල්ල ළඟ ඇති මිනිස්කමින් කාලක් අටක්කාලක් තමා ළඟ තියෙනවද...

"ඔයා සේල්ස් එක හොඳට කරගෙන යන්න... එහෙම කළොත් මන් සර්ට කියන්නම්..."

"මොකක්ද..."

"ඔයාගේ රූට් එකේ ප්‍රශ්න එහෙම නෑ... බැලන්සස් අඩුයි... සේල්ස් වැඩියි කියලා... ඒත් රෙප් එහෙම නොකර මට බොරු කරන්න නම් බෑ..."

"ඔයා කළොත් සර් කරනවද..."

"සර් මං ගැන චූ..ටි..ට..ක් දන්නවා... සමහර දවස්වලට ඇවිත් මගේ ඔළුව අතගාගෙනම යනවා... අනේ මට බෝනස් දෙනවට වඩා ඒ ටික ඇති..."

ඒක කියද්දී කෙල්ලගේ දෑස් රතු වෙනවා.

"ම් සිහිනු..."

දෙන්නම මහරගමින් බැසගන්නවා.

"පොඩ්ඩක් ඉන්න අසංක... මෙතනින් රතු ඉඳි ආප්ප ටිකක් අරන් යන්න ඕන.. මෙතන ඉඳි ආප්ප පිරිසිදුයි..."

"ඊට කන්නද..."

"ම්... කන්නට සුදු ඉඳි ආප්ප හොඳ නෑ අසංක... පුළුවන් නම් ගෙදර ඉඳි ආප්ප ටිකක් හදලා දෙන්න ආසයි... ඒත් දැන් යද්දී අට





වෙනවා... නමය වෙන්න කලින් තාත්තට මෙහෙන් ටික දෙන්න ඕන..."

අසංක කෙල්ලත් එක්කම කුඩා ටේක් අවේ කඩයට ගොඩ උනා.

"මට රතු ඉඳිආප්ප තිහක් දෙන්න..."

එහෙම කියලා ඇය ඔහු දෙස බැලුවා.

"දැන් බෝඩිමට ගිහින් අසංක මොනාද කන්නේ..."

අද ගෙදර ඩිනර් එකක්. [illegible] තමා ආපු සතුටට [illegible] මිතුරන් හතර පස් දෙනෙකුට රෑ කෑමකට ගෙදරට ආරාධනා [illegible]. අවුම ගානේ අද ගෙදර කෑම ව්‍යංජන තිහක් විතර හැදෙනවා. අතුරුපස තුන හතරක් විතර හැදෙනවා.

"හ්ම්.. ගිහින් මොනා හරි කනවා මන්දනා..."

"ඊට බෝඩිමෙන් කෑම නෑ..."

"නෑ.. රෑම එක විතරයි.."

"අනේ පව්.. මං කියන්නම් අද රෑට ඉඳි ආප්ප ගන්න... මේ මට තව ඉඳි ආප්ප විස්සකුයි මේ මාළු කරියකුයි පරිප්පු එකකුයි වෙනම පාර්සල් කරලා දෙන්න..."

අසංකගේ පපුව පිච්චෙනවා. ඇවිලෙනවා. ඔහු වටපිට බැලුවේ ලොකු අපහසුතාවයකින්. හරියට මේ පිච්චෙන පපුව නිවාගන්න වතුර හොයන්න වගේ.

"මේ මටද..."

"ම්.. ගිහින් කන්න..."

"මට උදෙත් දුන්නා..."

ඔහු අසරණව කිව්වා.

"ඉතින්.. දවසක මටත් අරන් දෙන්න..."

"ඔව්.. ඔයාට මං ගොඩාක් දේවල් අරන් දෙනවා..." ඔහු කිව්වේ ටේක් අවේ කඩෙන් එළියට එන ගමන්.

"එහෙනම් ළමයෝ... මං යනවා... පොලටත් ගිහින් යන්න තියෙන්..."

"හොඳයි..."

දෙන්නගෙම දැස් එකම මොහොතක ඇලී තිබ්බා.

"උදෙන්ම එනවා නේද..."

"බලං..."

"ඔව්..."

"ම්... යන්නම්... බුදු සරණයි... කෑම ටික කන්න හොඳේ..."

"හා..."

සසංක ගල් කණුවක් වගේ මහරගම නගරය මැද බලා උන්නා. ඇය ගොඩක් දුර ගිහින් හැරිලා බැලුවා. ඔහු අත වැනුවා. ඇයත් අත වැනුවා.

ජීවත් වන ගතියක් ඔහුට දැනුණා. සසංක මහරගම නගරයේ ඉඳලා දෙහිවල දෙසට යන බස් රථයකට ගොඩ උනා. ඔහුට ඕනා නම් තිබ්බා ත්‍රීවීලරයෙන් නැත්නම් කැබ් එකක් අරගෙන යන්න. නැත්නම් ගෙදරටම කතා කරලා වාහනේ මෙතනට ගෙන්න ගන්න... ඒත් ඔහු එය කළේ නෑ. දෙහිවලට යන බස් එකට නැගලා සසංක පිටුපසම අසුනට බර උනා.



SIHINA



# 04

සසංකට ජීවිතය ගැන එක එක දේවල් හිතෙන්න ගත්තා. මෙච්චර කාලයක් තමා ජීවිතය ගැන මොනවත් හිතලා නෑ කියලා සසංකට දැනුණා. අවුරුදු හත අටකට ආසන්න කාලයක් විදේශ රටක හොඳම විශ්ව විද්‍යාලයක ඉගෙන ගෙනත් අද සසංකට හිතෙන්නේ ජීවිතය ගැන තමා මොනවත්ම ඉගෙන ගෙන නෑ කියලා. "ඒත් අසංක කොච්චර පිටරට ඉගෙන ගත්තත් සමහර දේවල් එයාලට තේරෙන්නේ නෑ... පොත් වල දැනුමෙන් විතරක් ව්‍යාපාර කරන්න බෑ... ඒකට ඉවක් කියලා දෙයකුත් තියෙන්න ඕන..." චන්දනා එද්දී කියූ දේවල් ඔහුගේ දෙසවන් අතර දෝංකාර දෙනවා... "මෙච්චර බිස්නස් හදපු සර් තාම කන්නේ රතු කැකුළු ඉඳි ආප්ප පහකුයි කිරි හොදි ටිකකුයි... කොටින්ම සර්ගේ කේක් කොම්පැනියේ හදන කේක්

කැල්ලක වත් රස බලන්න සර්ට නෑ.." සසංකට පුදුම හිතුණා. තමාව හදපු තමාගෙම කන්නා ගැන මේ තරම් දේවල් තමා දන්නේ නෑ නේද කියලා සසංකට හිතුණා. ජීවිතයෙන් කොච්චර ඈත් වෙලාද දුරස් වෙලාද කියලා සසංකට හිතුණා.

අද ඒ කෙල්ල තමාව තමා උන් අහසින් බොල් පොළොවට දවස් ගාලා ඇදලා දැම්මා කියලා සසංකට හිතුණා. ඒත් ඒ පුටුව ඒ කෙල්ල කළේ කොච්චර ආදරයකින්ද... ඒ ලෙන්ගතුකම සසංකගේ හදවතට පසුව ඇතුළේ කෙවිච්චියක් යනවා වගේ දැනෙනවා. "අනේ සර්... මං කියන්නද... අද රට ඉඳි ආප්ප කන්න... ආ මේ මාළු හොදියි පරිප්පුයි ඉඳි ආප්පයි තියෙනවා... ගිහින් කන්න..." සසංකට ඒ වචන ඇසීමෙත්ම ඔහුට බැලුනේ ඔහු අතේ තිබ්බ නිල් පාට ෆොයිල් බෑගය දිහා.. ඒ කෙල්ල මේ ඉඳි ආප්ප මුල තමාට දුන්නේ කොච්චර පිච්චුරු පිරිසිදු හැඟීමකින්ද කියලා සසංක දන්නවා... ඒත් ඇය දන්නේ නෑ අද මේ පුංචි ඉඳි ආප්ප මුල දුන්නේ මේ රන්තරු කේක් නිෂ්පාදන ආයතනයේ හිමිකරුගේ එකම පුතාට කියලා... ඔහුට මේ ඉඳි ආප්ප මුල වඩාත් වටින්නේ ඒකයි. මේ ජීවිතයේ ඔහුට බොහෝ දේවල් ලැබී තියෙනවා. දස දහස් ගණන් වටිනා තෑගි ලැබී තියෙනවා. ඒත් ඒ සියල්ල ලැබුනේ සල්ලිකාරයෙකුගේ පුතෙකුට... සසංක කියන කොල්ලට නෙමෙ. ඒත් අද චන්ද්‍රා පුංචි මිරිස් මාළු හොදි බැදි එකතුයි පරිප්පු බැදි එකතුයි එක්ක ඉඳි ආප්ප මුලක් දුන්නේ ඒ සල්ලිකාරයෙක්ගේ පුතාට නෙමෙ... ඔහුට මේ ඉඳි ආප්ප මුල මේ තරම් වටින්නේ ඒ නිසයි.

සසංකට දැන් බයක් දැනෙන්නේ එක් දෙයක් ගැන පමණයි. ඒ තමා රන්තරු කේක් නිෂ්පාදන ආයතනයේ අනාගත උරුමක්කාරයා බව මේ කෙල්ල දැනගනී කියලා. එහෙම උනොත් මේ අහිංසක පිච්චුරු යාළුකම නැතිවෙන්න පුළුවන් කියලා ඔහුට දැනෙනවා. සමහර ගෑණු සල්ලි වලට පෙරේතයි. ඒත් අවංක ගෑණු සල්ලි වලට බයයි.

සසංක බස් රියෙන් බැහැලා අන්ධකාර වී තිබූ පාසල් මාවත දිගේ ඇවිදගෙන ආවේ සැහෙන කල්පනාවකින්... අද ඔහුට ඔහු ගැනම ලොකු සැනසීමක් දැනෙනවා... ඒ සැනසීම ආවේ කොහොමද



කියලා ඔහුම දන්නේ නෑ.

පාසැල් පටුමග දිගේ ඇවිදගෙන ආ සසංක විශාල ගේට්ටු දෙකක් දැමූ සුදු කුළුණු දෙක මැදින් විසල් ගෙමිදුලට පිවිසුනේ තමාටම සිනාසෙමින්. ජීවිතයක් උඩ සල්ලි තියෙන එකයි... සල්ලි උඩ ජීවිතයක් තියෙන එකයි දෙකක් කියලා ඔහුට හිතුණා.

පා ගමනින්ම ගෙමිදුලට පිවිසි අයියා දිහා සසංකා බලා උන්නේ හරි පුදුමයෙන්. ඇය එතෙක් වෙලා ඇය අත තිබූ ජංගම දුරකතනය ක්‍රියා විරහිත කරලා මිදුලට බැස්සේ ලොකු පුදුමයකින්.

"අයියේ... ඇ..යි මේ..."

තරමක කොට සායට සැහැල්ලු ටී ෂර්ට් එකක් ඇඳි පුංචි කෙල්ලව දකිද්දී සසංක ඇගේ කම්මුල අතක් දාගත්තා...

"ඇයි බබා... මුකුත් නෑ..."

සසංක කිව්වේ හරි සතුටින්... තමා පයින් ආපු එක නංගිට ප්‍රශ්නයක් කියලා ඔහු දන්නවා.

"මුකුත් නැති වෙන්නේ කොහොමද... ඔයා ආවේ මොකේද..."

"මගේ පරණම වාහනයෙන්..."

"මේ තියෙන්නේ... මටෝ ගියර්... පැට්‍රල් ඕනම නෑ..."

ඔහු තම දෙපා වලට අත තියලා සිනාසෙමින්ම කිව්වා. සසංකා සංසකගේ බඩට ගැහුවේ සිනාසෙමින්මයි.

"ඇත්තටම අයියේ මොකේද ආවේ..."

"මහරගම ඉඳලා බස් එකේ ආවා... හෝල්ට් එකේ ඉඳලා පයින් ආවා..."

"ඇ..යි එහෙම කළේ..."

"අපි ජීවිතේ හැම දේකටම පුරුදු වෙන්න ඕන බබා... එතකොට ජීවිතේ ලේසියි..."

"අද මොනවා වෙලාද මන්දා... මේ රට ඉඳලා ආවේ ඊයේ පෙරේදා... ඇවිත් මෙහේ බස්වල යනවා..."

"මං ඔයාගෙන් බඩුවක් ගන්නද..."

"හා අහන්න..."

සසංකයි සසංකායි මිදුලේ තිබූ බංකුව උඩම වාඩි උනා.

"පුංචි මහත්තයා මොනාද බොන්නේ..."

"ම්.. අපි පියදාස මාමේ ප්ලේන්ටියක් බොමු..."

"පුංචි මහත්තයා දොඩම් හදලා තියෙනවා..."

"එපා පියදාස මාමේ... ප්ලේන්ටියක් හොඳයි..."

ලංකාවට ආවට පස්සේ අයියට මොනවා හරි වෙලා කියලා සසංකාට හිතුණා. ඒත් මේ දවස් ටිකට මොනවා වෙන්නද...

"මොනවද මගෙන් බඩුවක් අහනවා කිව්වේ..."

"ආ... ඒකත් අමතක උනා... දැන් බබා හිතන්න බබාට කෙල්ලෙක් ඉන්නවා කියලා..."

සසංක එහෙම කියද්දී නම් කෙල්ලගේ මූණ තොරණක් වගේ පත්තු උනා.

"දැනටමත් ඉන්නවද දන්නෑ... මෙකි පොඩිකාලේට සෙට් කරගෙන ඇති..."

"අ..නේ නෑ... අපි හරි අහිංසකයි..."

"අහිංසක කෙල්ලන්ට තමා කොල්ලෝ කැමති..."

"අයියා එහෙනම් අහිංසක කෙල්ලෙක්ව අල්ලගෙන ඇති..."

සසංකට විදුලියක් කෙටුවා වගේ සිහි උනේ වන්දනාගේ මුහුණ. ගෑණියෙක්ගේ මූණේ තියෙන්න ඕන තරම් පිවිතුරු බවක්ම ඒ මුහුණේ තිබුණා.

"මොකද ඒක කිව්ව ගමන් චිම උනේ..."

"නෑ මුකුත් නෑ..."

"ඔට හිටපු කෙල්ලට මොකක් උනාද..."

"ඔට නම් කෙල්ලෝ හිටියා බබා... ඒත් මට හිටියේ නෑ..."





"ඉතින්..."

"දැන් ඔයාගේ කොල්ලා යන්නේ බස් එකේ... එතකොට ඔයා එයා එක්ක බස් එකේ යනවද නැත්නම් එයාව ඔයාගේ කාර් එකේ දාගෙන යනවද..."

සසංකාට එකවර පිළිතුරු දෙන්න තරම් එය අමාරු ප්‍රශ්නයක් උනා. ඇය එවැනි දෙයක් ගැන කවදාවත් හිතලා තිබ්බේ නෑ.

"ඒ..යා ක..නා ක..ළොත් ය..න්..න වෙනවා තමා..."

"කතා කළත් නොකළත් බස් එකට යන්න වෙනවා... ආදරේ කරන කෙනාව කණෙන් අල්ලලා අපි ගාවට ගන්න බෑ... අපිමයි එයා ළඟට යන්න ඕනෑවා..."

"ම්..."

සසංකා හරි හැඟීම්බරව හුම්ට තිබ්බා.

"ඇයි අයියා එහෙම දෙයක් කිව්වේ..."

"ඒක හිතන්නෙපා... මං නෙමෙ කිව්වේ... තෝ තාත්තා..."

"ඇතුළේ ඉන්නවා... ඔයා වොෂ් එකක් දාගෙන චේන්ජ් එකක් දාගන්න... අද පාටියක්නේ..."

සසංකා එවිටයි දැක්කේ මෙතෙක් වෙලා සසංකගේ අතේ තිබුණ පුංචි පාර්සලය.

"මේ.. මොනාද අ..යියේ..."

කෙල්ල අරගෙන දුන්න ඉඳි ආප්ප පාර්සලය දිහා ඔහු බලා උන්නා.

"මේ පොඩි බඩුවක් බබා... මං යනවා චේන්ජ් එකක් දාගන්න..."

"ම්..."

සසංක කාමරයට ගිය ගමන් මේසය උඩ තබාගෙන ඉඳි ආප්ප පාර්සලය දිග ඇරියා. ඔහු පුටුවක් ඇදගෙන ඉඳි ආප්ප ටික උඩින් මිරිස් මාළු හොදි ටිකකුයි පරිප්පු ටිකකුයි දමා ගත්තා. මේ ඉඳි ආප්ප



SIHINA

සිට විසි කරන්න ඔහුට හිතුණේ නෑ. ජීවිතේ පුරාම වරට කෙල්ලෙක් ආදරයෙන් තරුණයෙක් තමාට පිරිසිදුව දුන් දෙයකට එහෙම කරන්න ඔහුගේ හිත ඔහුට ඉඩ දෙන්නේ නෑ.

අද සාදය නිසා සාන්තාගේ රත්න ව්‍යාපාරය ගැන කතා කරන්න බෑ... ඒත් හෙට පාන්දරම ඒ ගැන කතා කරන්නට ඕන කියලා සසංක හිතාගත්තා. ටික දවසක් යනකල් සාන්තාටත් ෆැක්ටරියට එන්නෙපා කියන්නටත් ඔහු සිතාගත්තා.

මේ හැම දෙයක්ම මැදින් සසංකට සිහි වන්නේ කෙල්ලගේ මූණ... "පව්... දැන් ගිහින් ඉඳී අප්ප කනවා ඇති..." ඔහු ඇය ගැන එහෙමයි හිතුණේ.

# 05

චන්දනා ගෙදර ආපු ගමන්ම අප්පච්චී ළඟට වෙලා ටික වෙලාවක් ඉන්නවා. දවස පුරාම ඔහු ඉන්නේ කොතරම් තදබල පාළුවකින්ද කියලා ඇය දන්නවා.

"දවල් බෙහෙත් ටික බිව්වා නේද අප්පච්චී..."

"ඔව් මැණිකෙ... යන්න ගිහින් ඔයා ඇඟ සෝදගන්න... බස්වල ඇවිත් මහන්සියිනේ පුතේ..."

මේ ජීවිතයේදී ඒ මහන්සිය ගැන ඇය ඕනාවට වඩා හිතෙන්නේ නෑ. ජීවිතයේ උරුමය මේක නම් ඒ උරුමය කරුමයක් ලෙස නොසිතා බාරගන්නවා කියලයි කෙල්ල හැම වෙලේම සිතා උන්නේ.

චන්දනා සාරිය ගලවලා සරල ගවුමක් දාගෙන කුස්සියට ආවා.

ඇවිත් හිටියේ. ඒත් ඒ නිමිම අමාරුවත් ගැන ඇය අප්පච්චිට කියන්න යන්නේ නෑ. රෑට නිදාගන්නකොට සිද්ධාලේප ටිකක් ගාගන්නවා කියලා ඇය හිතාගත්තා.

චන්ද්‍රා මෙහෙන් ගෙනාපු ඉඳි ආප්ප ටික දිග ඇරලා බෝල් එකකට දාලා වැසුවා. ඉඳි ආප්ප ටික දකිද්දි ඇයට සිහි උනේ අසංකව...

"පව් දැන් ඉඳි ආප්ප ටික බෝඩිමට වෙලා කනවා ඇති..." ඇයට ඔහු ගැන එහෙමයි හිතුණේ.

ඒ මුහුණ දැක්ක වෙලේ ඉඳලා ඔහුගෙන් මොකක්දෝ ලෙන්ගතු බවක් ඇයට දැනෙනවා. ඒ හැඟීම ඒ දැනීම මොකක්ද කියලා ඇයට තේරුම් ගන්න බෑ. ඒත් ඒ වගේ හැඟීමක් සා නිසාවත් කවරදාවත් ඇතිවෙලා නැති බව නම් ඇයට විශ්වාසයි.

"පව් අන්වෙලුම් කඩෙන් කනවා ඇත්තේ... මොනාහරි හොඳට හදපු දවසක බත් එකක් හිමින් දෙනවා..." එහෙම කලොත් ඔහු මොනවා හරි හිතයිද.. ඒත් එහෙම හිතන ගුණමකු බවක් ඔහුගේ මුහුණින් පේන්නට නෑ...

ජීවිතය ගැන තීරණයක් ගන්නෙයි කියලා අප්පච්චි නිතරම කියන කතාව චන්ද්‍රාට සිහිඋනා. එහෙම තීරණයක් ගන්නේ කොහොමද කියලාවත් ඇයට තේරෙන්නෙත් නෑ...

අසංක ගැන හිත හිතා ඉද්දි ජීවිතය ගැන ගන්න තීරණ ගැන හිතුනේ මොකද කියලා චන්ද්‍රාට තේරෙන්නෙත් නෑ.

ඇය දිග සුසුමක් හෙලලා මහරගම පොළෙන් ගෙනාපු පොඩි පරා පැටව් මාළු දෙසීයපනහ අරගෙන අන් කිරි මාළු හොද්දක් හදන්න පටන් ගත්තා. මේක හදලා පොඩි පොල් මැල්ලුමක් හැදුවාම ඉඳි ආප්ප ටික රෑට අප්පච්චිට කන්න දෙන්න පුළුවන්. සෙනසුරාදා ඉරිදා දවස් දෙකේවත් අප්පච්චිට රෑට සුප් එකක් හදලා දෙනවයි කියලා ඇය හිතාගත්තා.

පසුදා පාන්දරම චන්ද්‍රාට ඇහැරුණා... යාංතමට වත් ඉර පායලා නැති හිමිදිරි කළුවර තියෙද්දි නැගිටින්න තෙල්ල ආසයි. ඒ වෙලාවට පරිසරයේ තියෙන නිහඬ බවට... තුනී සිසිලසට... ඇගේ හිතේ මොකක්දෝ ලොකු කැමැත්තක් තිබුණා.

පාන්දර ඇහැරුණ එකේ මොනවා හරි හදන්න ඕන කියලා ඇයට හිතුණා. ඇය පුංචි කනපාට කෝප්පයට කෝපි ටිකක් හදාගෙන මොහොතකට කුස්සියේ පුංචි පුටුවට බරවුනා. එතන ඉඳලා බැලුවාම ඈතින් පෙනෙන්නේ බෙල්ලන්විල අත්තිඩිය කුරුළු අභය භූමියේ සුන්දර දර්ශනයක්. මේ කුරුළු අභයභූමියට එන නානාප්‍රකාර කුරුල්ලෝ නිතර නිතර චන්ද්‍රාලාගේ ගෙදරටත් එනවා. ඒ නිසාම චන්ද්‍රා කුස්සිය පැත්තේ කොහොඹ ගහ යට කුරුල්ලන්ට කෑම දාන්න පුංචි කුරුළු කෑම මේසයකුත් තියලා තියනවා. සමහර වෙලාවට ඇය ලාඅඹට තියෙන කෙසෙල් ගෙඩි ටිකක් නැත්නම් ඇඹුල් පැපොල් දෙකක් ගෙනවිත් කපලා මේසෙතින් දානවා.

චන්ද්‍රා හදන්න දෙයක් හිතුවා. දැන් ඉඳි ආප්ප හදන්න ගත්තොත් පැය අට වෙනකල් වත් හදන්න වෙනවා. ඇයට කිරිබත් ටිකක් හදන්න හිතුණා. පසුගිය දවසක ඇයට හොඳ රතු කැකුළු හාලකුත් හම්බ උනා. ඒකෙන් බත් උයලා කද්දි සීනි එනවයි. ඒ හාලෙන් කිරිබත් ටිකක් හැදුවොත් හොඳයි කියලා ඇයට හිතුණා.

"අප්පච්චිත් ආසයෙන් කිරිබත් කන්න... හදනවා දැක්කොත් දවල්ටත් තියන්න කියයි..."

චන්ද්‍රා හිනැහුවේ හරි ආශාවෙන්... ඊටත් වඩා දුකෙන්. අප්පච්චිගෙයි තමාගෙයි ජීවිත දෙක ගැන හිතද්දි ඇයට පුදුමයි. මේ වගේ දුවෙකුයි තාත්තෙකුයි තනිඋනේ කොහොමද කියලා ඇයට හිතාගන්නවත් බැහැ. ජීවිතය දෙන්නේ මේ ටික නම් ඊට වඩා මොනවා කියලා ඉල්ලන්නද... කාගෙන් කියලා ඉල්ලන්නද... සතියකට වතාවක් විතර චන්ද්‍රා ගිලන්පස ටිකකුත් හදාගෙන පිල්ලෑව පන්සලට යනවා. කුඹුරක් මැද්දේ තියෙන නිසා එතන හරි නිස්කලංකයි. මෙහෙම ගියත් ඇය දෙයියන්ගෙන් බුදුන්ගෙන් මොනවත් ඉල්ලන්නේ නෑ. මොනවා කියලා ඉල්ලන්නද...

හාල් ටික ලිපේ තියලා ඇය පොල් ටික ගාන්න ගත්තා. මොකක්දෝ හේතුවකට ඇය අද හාල් හුණ්ඩු තුනක්ම කිරිබතට තිබ්බා. දෙපාරක්ම කෑවත් හාල් හුණ්ඩු තුනක කිරිබත් කාලා ඉවර කරන්න බෑ. ඒත් එහෙම තිබ්බේ ඇයි...

"අසංකටත් කිරිබත් කෑලි දෙකක් අරන් යනවා... පව් උදේට බාප්පාත් එකත් වගේ කාලා එනවා ඇත්තේ..." ඇයට එහෙමයි හිතෙන්නේ.. ජීවිතේ මුලම වරට හඳුනාගත් පිරිමියෙක් ගැන මෙහෙම හිතෙන්නේ ඇයි කියලා ඇයට තේරෙන්නේ නෑ. ඒත් කවදාවත් නැති විදිහට හිත තමාටත් නොකියා ඔහුගේ මුහුණේ ගොස් ඇලෙනවා. ඊයේ රෑ නිදාගන්න යද්දීත් ඇයට අසංකගේ මුහුණ මැවී පෙනුණා.

කා ගැනවත් හිතේ ගත්ත මං දන්නෑ. ඒත් එයාව දැකපු වෙලේ ඉඳලා එයා ගොඩාක් හොඳ කෙනෙක් වෙන්න ඇති කියලා හිතෙනවා. ඇයි දන්නෑ... චන්දනා පොල් ටික ගාන ගමන් දහඅතේ කල්පනා කළා.. කවදාක්වත් පිරිමියෙකු ගැන සිතුවිල්ලකින්වත් ඉඳුල් වී නොතිබූ ඇගේ හදවතට මේ දැනෙන හැඟීම අමුතුයි.

කිරිබතෙන් ආවේ අලුත් හාලේ කිරි සුවඳක්... කිරිබතක් හදන හැම වෙලාවකම චන්දනාට හිතෙන්නේ අද ජීවිතයේ මොකක් හරි විශේෂ දවසක් කියලයි. ඒත් දන්නා කාලයක පටන් ජීවිතයේ කිසිම දවසක් විශේෂ දවසක් උනේ නෑ. හැම දවසක්ම හරිම [illegible] ගෙවිලා ගියා.

හොඳ වෙලාවට ගෙදර ගෙනාපු උම්බලකඩ තිබුණා. චන්දනා උම්බලකඩ කෑල්ලම් ගලට අලා කට්ට සම්බල් හදන්න ගත්තා. දෙහි වැඩියෙන් දාලා රේණු නැතෙන්න කට්ට සම්බෝලෙ හැදුවාම හරි රහයි.

"අ..නේ පුතේ ඔයා මටත් නැගිට්ටවන්න තිබ්බනේ..."

අප්පච්චී ආවේ චන්දනා කට්ට සම්බෝලේ හදද්දි.

"අද ටිකක් පාන්දර ඇහැරුණා අප්පච්චී... ඉතින් කිරිබත් හදන්න ගත්තා..."

"අ..නේ කෝ දෙන්න ඒක මං කොටන්නම්..."

"අප්පච්චී ඔහොම ඉන්නකෝ... මං කොටන්නම්..."

අප්පච්චී කෙල්ල දිහා බලා උන්නේ හරි දුකකින්. මේ ජීවිතය මේ කෙල්ලට මොනවත්ම දෙන්නේ නැත්තේ ඇයි...



"ඇයි පුතේ අද කිරිබත් හදන්න හිතුනේ..."

එවර තමා චන්දනා හැරිලා අසරණ පාටින් හිනාවුනා.

"එ..හෙම විශේෂ දෙයක් නැතේ අප්පච්චී..."

"ඒකම තමා තරක පුතේ... ජීවිතේ විශේෂ දේවල් නැත්නම් විශේෂ දේවල් හදාගන්න ඕන..."

"ම්..."

අප්පච්චී මේ වගෙන් [illegible] එන්න හදන්නේ [illegible] කියලා කෙල්ලට තේරෙනවා.

"අප්පච්චී... මට කොහොල් කොළයක් කපලා ගෙනත් දෙනවද... දල්ලකුත් කපන් එන්න මුලක් බඳින්න..."

"හා... මටත් මුලක්ම බැඳලා දෙන්න [illegible]..."

චන්දනා අප්පච්චී දිහා බැලුවේ හරි පුදුමයෙන්.

"මුලක් අප්පච්චී කොහේ යන්නද..."

"කොහෙවත් යන්න නෙමේ පුතේ... ඉස්සර ඔයාගේ අම්මා එහෙමයි... කිරිබත් හැදුවාම මුල් වලට බෙදලා තියෙනවා... දහවල් එළුකොළනට ඒ මුල් ලිහන් කන්නේ... ඔයා පුංචි දවස්වල ඔයාටත් මෙහෙන් මෙච්චර සයිස් පුංචි මුලක් බැඳලා තියෙනවා... ඔයා කකුල් දෙක දෙපැත්තට දාගෙන බිම ඒ මුල ලෙහාගෙන හරි ආසාවෙන් කනවා..."

අප්පච්චීගෙයි දුගෙයි දෙන්නගේම දෑස් තෙමී ගිහින් තිබුණා. දෙන්නම සෑහෙන වෙලාවක් කතා නොකර උන්නා.

"මං කොහොල් කොළේ කපන් එන්නම්..."

"ම්..."

අනේ මිරිස් නිසා ඇස්වල කඳුළු අතින් පිහිදා ගන්න බෑ. චන්දනා උරහිසේ දෑස් අතුල්ලා ඇස් පිසදා ගත්තා. නොපෙන්නුවාට අප්පච්චී ඉන්නෙ පුදුමාකාර තනිකමක් පාළුවක් හිතේ හිර කරගෙන කියලා

SIHINA

චන්දනාට හිතුණා..

චන්දනා අප්පච්චි ගොනු කෙසෙල් කොළේ තවලා අරගෙන කිරිබත් ටික අලා කැට්ටා... අම්මගේ අත්ගුණේ කෙල්ලගේ අතට හොඳට ඇවිත් කියලා අප්පච්චිට හිතුණා.

"කිරිබත් වැඩියි වගේ නේද පුතේ..."

"නෑ..ම..ත් නෑ..."

"මං දවල්ටත් කිරිබත්ම කන්නම්..."

"මං හිතුවා..."

චන්දනා කිව්වේ හිනාවෙවී. ඇය කිරිබත් තවලා ඉවරවෙලා මුල් තුනක් හදන්න ගත්තා.

"දෙකක් කාටද පුතේ.."

අප්පච්චි අහද්දී එකපාරටම කෙල්ලගේ මූණට මහා අමුතු සිනාවක් ආවා.

"ම.. ම..ගේ යාළුවෙක්ට අප්පච්චි..."

චන්දනාට ඒක කියවුනේ ගොත ගැහි ගැහී වගේ..

"යාළුවන්ට මොද මොද ඉන්නේ... හරියකට අන්න ඒක යාළුවෙක්ව හොයාගන්න එපැයි... එතකොට ගෙදරටම එයිනේ කාලා යන්න..."

"එ..යි එ..යි..."

කෙල්ල කට හද කරගෙන කියනවා... ඒත් සමගම ඇයට මොන හේතුවකටද මන්දා අසංකව සිහි උනා. ඇයි එහෙම වෙන්නේ... මොකක්ද මේ වගේ මනුවම සිහිවන්නට හේතුව... ඇයට ඒක හිතාගන්නට බැහැ...





# 06

## "තාත්තේ..."

සසංක උදේන්ම තාත්තාගේ කාමරයටම ගියා. ඔහු තාත්තාගේ ඇඳ උඩින්ම ඉඳගත්තේ හරි සෙනෙහසකින්. ඊයේ අර කෙල්ල කියපු දේවල් ඊයේ රාත්‍රිය පුරාම ඔහුගේ හදවතේ දෝංකාර දුන්නා.

"අදත් ඔෆිස් එකට යන්නද ලොකු පුතේ..."

"ඔ..ව් තාත්තේ..."

මුදුන්කොට්ටුව මහතා තම පුතා දිහා ටික වේලාවක් බලාගෙනම උන්නා.

"තාත්තා අසනීපෙන් ඉන්නවා මට කිව්වේ වත් නෑ..."

ඔහු කියන්නේ හරි දුකකින්. තාත්තා සසංක දිහා බලා උන්නේ

පුංචි කොලු ගැටයෙක් දිහා බලා ඉන්නවා වගේ.

“ඒ හැටි අසනීපයක් නෑ පුතා...”

“නැත්තේ මොකද... තාත්තා ඔෆිස් එකේ වැටිලත් තියෙනවා..”

“අර ඔෆිස් එකේ පොඩි කෙල්ල ඔයාව බය කරලා...”

තාත්තා කියන්නේ චන්ද්‍රනා ගැන කියලා සසංක දන්නවා.

“ඒ කෙල්ල කියන්නේ ඉතින් ඇත්තනේ... අනික ඒ කෙල්ල මං තාත්තාගේ පුතා කියලා අනාගෙන කිව්වත් නෙමෙයිනේ...”

මුදන්තොටුව මහතා කතා කළේ නෑ.

“අපි තාත්තේ අපේ කේක් ෆැක්ටරි එක රැකගන්න ඕන...”

“ඔයාට එහෙම හිතෙනව නම් කොච්චර දෙයක්ද ලොකු පුතා... මං හිතුවේ ඔයා මේ පරණ බිස්නස් එක කරන එකක් නෑ කියලා...”

“නෑ තාත්තේ අපි ඉගෙන ගත්තේ කෑවේ බිව්වේ මේ බිස්නස් එකෙන්... මං අදින් පස්සේ වෙන කාගෙවත් කේක් කෑල්ලක් කන්නෙවත් නෑ... කෑවොත් කන්නේ රත්තරං කේක් කෑල්ලක් විතරයි...”

ඔහුට පුතා ගැන ලොකු ආඩම්බරයක් දැනුණා. පුතෙක් හදන හැම තාත්තා කෙනෙකුටම ඒ ආඩම්බරය උරුම නෑ.

“තාත්තා දැන් ටිකක් රෙස්ට් කරන්න... ඒත් ඔයා තමයි දිගටම මගේ බොස්...”

“මං කවදහරි ඔයා යටතේ වැඩ කරනවා... එතකොට තමයි මේ තාත්තට ආස හිතෙන්නේ...”

“දෙවියන්ට එහෙම ජීවත් වෙන්න බෑ තාත්තේ... මං යනවා... බිස්නස් එකේ පොඩි පොඩි ප්‍රශ්න ටිකක් තියෙනවා... මං ඒවා බලන්නම්... තාත්තා ටික දවසක් ගෙදර ඉන්න...”

“හොඳයි පුතා... මට පොඩි වැඩ වගයකට කැන්ඩි යන්නත්



තියෙනවා...”

“ඔෆිස් එකේ කාටවත් මං ගැන කියන්නෙපා තාත්තේ...”

“ඔයා කැමති විදිහකට කරන්න පුතේ... මේක හැදුවේ ඔයාට තමයි...”

තාත්තා කිව්වේ හරි සැහැල්ලුවෙන්. තම පුතා තමාටත් වඩා හොඳින් රත්තරං කේක් නිෂ්පාදන ආයතනය කරගෙන යන බව ඔහු දන්නවා.

විසිත්ත කාමරය කෙළවරක වූ පුටු දොළහේ දිග කෑම මේසයේ කෑම ලැස්ති කරලා තිබුණා. ලා අළුපාට කමිසයකිනුයි තද කළු පාට කලිසමකිනුත් සැරසී පහළ මාලයට ආ සසංක මොහොතක් කෑම මේසය දිහා බලා උන්නා. තවමත් පාන්දර නිසා ඔහුට බඩගින්නක් දැනෙන්නේ නෑ.

සසංක කෑම මේසයෙන් චාම් [illegible] තේ එක පමණක් අතට ගත්තා. ලංකාවට ආවට පස්සේ ඔහු ආසා කළේම නිකම් තේ බොන්න. පිටරටදී ඔහුට හොස්කැගේ කෝපි බීලා එපා වෙලා තිබුණේ... ගානට රත්තරන් පාටට කහට වුණ්න හදලා ඉඟුරු කෑල්ලක් දාපු තේ එකක තියෙන සතුට පිටරට කෝපි දහයකවත් නෑ කියලා ඔහුට හිතුණා.

“අනේ පුංචි මහත්තයා කෑම කන්නේ නෑ...”

කුසුමා ඇවිත් ඇහුවේ හරි ආදරෙන්... ඇය සසංකත් සසංකගේ පුංචි කාලයේ ඉඳලා මේ ගෙදර ඉන්නා සේවිකාවක්...

“අනේ කුසුමා... අද වැඩ ගොඩක් තියෙනවා... දැන්මම බඩගිනිත් නෑ...”

“පුංචි මහත්තයා ආසවෙයි කියලා මං කුඩිල්ලුත් හැදුවා...”

කුසුමා කියද්දී සසංකට දුකක් හිතුණා. කෙනෙක්ගේ හිතක් මොන හේතුවක් නිසාවත් රිදවන්න ඔහුට හිතෙන්නේ නෑ... එහෙම රිදෙව්වොත් ඒ පසුතැවීම ඊට වඩා තදබල විදිහට ඔහුව රිදවනවා.

“මං දවල් වෙලා ඇවිත් කන්නම් කුසුමා... පිටරටදී උදේට කන්නේ දහයත් පහුවෙලානේ... ඒ පුරුද්දට වේලාසන බඩගිනි නෑ...”

SIHINA

සසංකා නැම මේසය ළඟට ආවේ ඒ ඇඳුම පිටින්මයි. නංගී එහෙම ඉන්නවා දැක්කාම ඔහුට සිහිවුණේ දෙන්නාගෙම ළමා කාලය... ඉස්සර නංගියි ඔහුටයි දෙන්නටම ඒට අඳින්න තිබ්බේ එකම පාට පිජාමා සූට් එකක්..

"ඇයි හිනාවෙන්නේ මාව දැකලා..."

කෙල්ල පුදුමයෙන් වගේ ඇහුවා. කුසුමා එතනින් ගියේ කට හද කරගෙන.

"මට අපේ පරණ පිජාමා සූට් දෙක මතක් උනා..."

"මං ගාව ඒ සූට් දෙක තාම තියෙනවා..."

සසංක කෙල්ලගේ කරට අතක් දාගත්තේ හරි ආදරෙන්..

"සූට් දෙක නැති උනත් කමක් නෑ චූටි... ඒ කාලේ මතකනම්..."

"අනේ එහෙම වෙන්නෑ..."

සසංක දොරකඩ දක්වාම ආවේ කෙල්ලගේ කරට අතක් දාගෙනමයි.

"චූටි..."

"ම්..."

"ඇත්තටම කොල්ලෙක් නැද්ද..."

"හිතන්නේ මං බොරු කියනවා කියලනේ... උන්න නම් මං ඔයාට කියන්නැද්ද..."

"ඒකත් ඇත්ත..."

"මගෙන් කොල්ලෝ ගැන අහන්නේ ඇයි... මට හරි සැකයි ඔයාව... එහේ හිටපු කෙල්ලව මතක් වෙනවද..."

"එහේ කෙල්ලෙක් හිටියේ නෑ චූටි... උන්නනම් ලංකාවට එද්දී අලා එන්න වෙනවා... එතකොට දුකයි..."

"එතකොට මෙහේ..."

සසංකා අහද්දී ඔහු හිනාඋණේ ශෙලයනේ මැද්දූ පුංචි සුදු වීතක්

ප්‍රතිමාව දිහා බලාගෙන... සසංකා හිස කරකවලා සොහොයුරා දෙස බැලුවා.

"ආ..ටි..ස් අප්පා මූණේ ලස්සන... මොකක් හරි ඇති ලාවට වගේ... මේ ඒලියට එනේදි වත් එයා හොස්ටල් කෙනෙක් සෙට් උනාද..."

"චූටිට පිස්සු... දැක්ක වෙලාවේ ඉඳලා ආයින් පුවර් සීට බෙල්ට ගගා කියෝනවා..."

"හරි... හරි... අද කොහෙද යන්නේ..."

"ම්... වැඩ ගොඩක් තියෙනවා... මං ඉන්නේ පුටි අපේ තේස් ෆැක්ටරි එකේ වැඩ ටික බලාගන්න..."

"ඒක හොඳයි... තාත්තටත් අමාරුයි... අසනීප උන දවස්වල මං හරියට බය උනා... ඔයත් ළඟ නැනේ..."

"ආයෙත් මං කොහේවත් යන්නෑ චූටි... දිගටම මං ඔයාලා ගාව ඉන්නවා..."

සසංක කෙල්ලගේ හිසට අත තියලා පාත්වෙලා ඒ නළල සිඹිට සිඹගත්තා.

"ඈ..යි අර ගෙනාපු ලස්සන ෂර්ට් එහෙම අඳින්නේ නැත්තේ... මං දැක්ක හරි ලස්සනයි..."

ඒ තරම් වටිනා කමිස ඇඳගෙන කාර්යාලයට යන්න බෑ... එහෙම ගියොත් මේ කරන රඟපෑම් බොහොම ඉක්මනට හැමෝම දැනගන්නවා.

"මේක සැහැල්ලුයි චූටි... ආ... නමයෙන් පස්සේ මගේ ෆෝන් එක මම ඕෆ් කරනවා..."

කාර්යාලයේ සිටිද්දී සෙලියුලර් දුරකතන පාවිච්චි කරන්න බැහැ...

"කෙල්ල ගාව ඉන්නකොටද ෆෝන් එක ඕෆ් කරන්නේ..."

සසංක කිසිවක් නොකියා හිනා උනා. ඔහු වාහනයට ගොඩවෙලා

SIHINA

තවත් මොහොතක් කල්පනා කළා...
“රෑවන්ට ඇවිත් වාහනේ ගන්න කියනවා...”

සසංක එහෙම සිතුවේ වාහනයෙන් කාර්යාලයට යන්න බැරි නිසයි. මෙහින් බැහැලා වාහනය මිතුරෙකුට දීලා බස් එකේ කාර්යාලයට යන්න ඔහු සිතාගත්තා.. මේ කරන රඟපෑම කොතරම් කාලයක් කරන්නට වෙයිද කියලා ඔහුට තේරෙන්නේ නෑ... ඒත් ඒ රංගනය සැහෙන කාලයක් කරන්න වෙයි කියලා සසංකට හිතුණා... තමා රන්තිලිනී ජයවර්ධනගේ එකම පුතා බව දැනගත් මොහොතේම කෙල්ල තමාගෙන් ගව් ගාණක් දුරස් වෙන බව සසංක දන්නවා.

කවදාවත් නැති තරමට ඔහුගේ දෑස්වල පුදුමාකාර දැවිල්ලක් නැවෙමින් තිබුණා. විදේශ රට වලදී මොන තරම් ලස්සන ගෑණු රූප දැක තිබෙනවාද... විදේශ සරසවියේදී දේශනයක් පැවැත්වෙද්දී බොහෝ විට යුවතියන් පැමිණ ඔහු ළඟ ඉඳගන්නවා. මල් පෙතිවල පැහැයට සමාන පාටින් යුත් ඒ ගැහැණු රුවක් දිහා ඔහාකමින් බැලූ වවක් ඔහුට මතක නැහැ... ලෝකයේ ඇති මිල අධිකම විලවුන් ගල්වා පැමිණි ඔවුන් ගාවින් ආ සුවඳට වල්මත් නොවූ තමාගේ හිත අර කෙල්ලගේ ගාවින් ආ අතිශය අසාමාන්‍ය සුවඳට වශී උනේ කොහොමද... මේ එකකටවත් සසංක් ගාව පිළිතුරු නැහැ... ඒත් ඔහු මේ උදේ පාන්දර දුවන්නේ ඒ මුහුණ මොහොතකට බලා ගැනීමේ විශාල ආශාවකින්...

* * * * * * * * * * * *

වන්දනා කාර්යාලයට ගොඩ වෙද්දී උදෑසන හතයි විසි දෙකයි. උදේ පාන්දර කාර්යාලයට ඇවිත් වැඩ පටන් ගන්නාම ඇගේ හිතට මොකක්දෝ සැනසීමක් දැනෙනවා... පාන්දර තියෙන මේ පාළුවට නිස්කලංක මිහිරියාවට ඇය ගොඩක් කැමතියි. ඉස්සර පාසැල් යන කාලයේත් වන්දනා එහෙමයි. සමහර දවස්වලට මුළු පාසැලෙන්ම මුලින්ම පාසැලට ඇවිත් තිබ්බේ ඇය...

ඇය අද ඇන්දේ ගොඩාක් කාලයක් තිස්සේ ඇන්දේ නැති



සාරියක්. තද කළු පාටට නුරු මෙරූන් පාට මේ සාරිය ගත්තේ ගොඩාක් කලින් උනත් ඇය ඒක ඇන්දේ නැහැ... ඒත් අද මොකක්දෝ හේතුවක් නිසා ඇයට ඒ සාරිය අඳින්න හිතුණා... සාරිය අලුත් එකට වැඩිද කියලත් ඇයට හිතුනේ ඒක ඇඳලා කැඩපත ළඟට ආවට පස්සේ...

කාර්යාලයේ දොර ඇරගෙන එද්දී ඩිව් රුවෙන් ඇගේ ඇතුළු හදවත පුරා මොකක්දෝ මිහිරියාවක් පැතිරිලා ගියා. ඇය එද්දී සසංක ඇගේ මේසය ඉදිරිපිට වූ පුටුවේ වාඩිවෙලා උන්නා. වන්දනා කාර්යාලයට ඇතුල් වන්නටත් පෙර ඇගේ සුවඳ පවා කාමරය තුළට කඩාගෙන ආවා. ඔහු හැරී බැලුවේ ඒ සුවඳට පිබිදුන හැඟීමකින්.

දෙදෙනාගේම දෙනෙත් එක සැප්පර සිහියකින් එක තැන නතර උනා... වන්දනාගේ තීන් තොල් සඟල හරි දයාබර විදිහට දෙපසට විහිදුනා.

“ගුඩ් මෝනින් අසංක... අද උදෙන්ම ඇවිත්...”

“ගුඩ් මෝනින් වන්දනා... පාන්දරම ඇහැරුණා ඉතින් ඇඳගෙන ආවා...”

තමාටත් උනේ ඒ දේම කියලා කියන්න ඇයට හිතුණත් කෙල්ල මුව ගොළු කරගත්තා. ඔහුගේ දෙනෙත් හරි පුදුම විදිහට ඇගේ රුව පුරා ඇලෙනවා... ඊයේ දැක්කාටත් වඩා අද කෙල්ල ලස්සනට ඔහුට පෙනුණා. කලිසම් සාක්කුවේ තියෙන ජංගම දුරකතනය ඇරගෙන එහි ඇති කුඩා කැමරාවෙන් ඇගේ මේ රුව ඡායාරූප ගත කරගන්න තරම් ආසාවක් ඔහුට ඇතිඋනා.

“ඊයේ ඉඳි ආප්ප කැවද අසංක...”

ජීවිතේ මින් පෙර කවුරුවත් මෙහෙම අහලා නෑ...

“අනේ ඔව්... කද්දී වන්දනාවත් මතක් උනා...”

“මටත් කද්දී ඔයාව මතක් උනා...” එහෙම හිතුණත් ඇයට ඒක කියන්න බෑ... මේසයට ආපු වන්දනා ඇය ගෙනා ඉටි බෑග් එකට අත දාගෙන ගියේ ඔහු දෙස බලාගෙනමයි. කාලාන්තරයක් තිස්සේ දැක පුරුදු මුහුණක සිරියාව මේ මුහුණේ තියෙනවයි කියලා වන්දනාට

SIHINA

හිතුණා. බෑගයට අත දාපු ඇය ඉන් පිටතට ගත්තේ හරි පරිස්සමින් කෙහෙල් කොළේ ඔතාගෙන ආපු ඔහුගේ කිරිබත් පරිසලය.

"අද මටත් ටිකක් පාන්දර ඇහැරුණා... පස්සේ උදේ කිරිබත් හැදුවා... ඉතින් කිරිබත් හ..දු..දී.. ම..ට අස..නෙවින් මතක් උ..නා.. අ.."

අවසාන වචන ටික කියද්දී ඇගේ තඩ බාල උනා... කවදාවත් ඇය මෙහෙම දේවල් කරලා නෑ. ඒ නුපුරුදු බව කෙල්ලගේ හඬේ තිබුණා.

"ම..ට..ද ගෙ..නාවේ..."

සසංක ඇහුවේ ආධුනික නළුවෙක් පුරම වරට දෙබසක් කියනවා වගේ... කිරිබත් හදද්දී තමාව මතක් උනේ කොහොමද කියලා අහන්න තරම් ඔහුට ආසයි.

"ම්... ගන්න... හැබැයි වැඩිය දෙයක් නම් නෑ....... කිරිබතුයි කට්ට සම්බෝලයි..."

"හා... මං හරි ආසයි... එහේ ඉද්දිදී කිරිබත් කියන නම ඇහුවත් කටට කෙළ උනනවා..."

නොහිතපු විදිහට ඔහුගේ මුවින් ඒ වචන පිට උනා. තමා අතින් වැරදි දෙයක් පිටඋනා කියලා මොහොතකින් ඔහුට වැටහුණා... වන්දනාත් ඔහු දෙස බලා උන්නේ පුදුමයෙන් වගේ.

"එ..හේ ඉ..දි..ද්..දී කිව්වේ... ගෙදර කිරිබත් හ..ද..න..ව..නේ..."

"නෑ.. මේ.. මං කිව්වේ අපේ ගෙදර වැඩිය කිරිබත් හදන්නෑ..."

"හරි පුදුමයිනේ... අපේ ගෙදර නම් සතියකට වතාවක් හරි කිරිබත් හදනවා..."

"මං මේ..ක..ක ඉදගෙනම කන්නද..."

ඔහු බැබලෙන දෑස් වලින් ඇය දිහා බලලා ඇහුවා.

"ම්..."

ඔහු ආසාවෙන් කිරිබත් මුල [illegible]



අම්මා කෙනෙක් වගේ... ඔහු වෙනුවෙන් කිරිබත් මුලක් රැගෙන ආපු එක කොච්චර හොඳද කියලා ඇයට හිතුණා.

කිරිබත් මුල දිග හරිද්දීම අලුත් කැකුළු හාල් වල කිරි සුවඳ හරි මිහිරි විදිහට ඔහුට දැනුණා... එකටම හරියන කට්ට සම්බෝලයකුත් පැත්තක දාලා තිබ්බා. කන්න කලින් ඔහු ඇය දිහා බැලුවා.

"කිරිබත් හරි සුවඳයි..."

ඔහු කියූ කතාවට ඇය කිසිවක් කීවේ නෑ... මේ පුංචි කිරිබත් කෑලි හතරේ මුලට ඔහු මේ තරම් පෙරේත කමක් දක්වන්නේ ඇයි...

"වන්දනා කන්නේ නෑ..."

සසංක කිරිබත් මුල දිග ඇරගෙන ආයෙත් ඇහුවා.

"මං ටිකකින් කනවා... උඹලාගොල්ලොටත් කෑල්ලක් තියා..."

"එ..හෙනම් මං කනවා..."

"කන්..න ළමයෝ..."

ඒ අතින් හැදූ දෙයක් මේ තරම්ම රහට තියෙයි කියලා ඔහුට හිතුණේ නෑ. ඒක දෙහි ඇඹුල් යනමින් ලුණු උම්බලකඩ හැපෙන කට්ට සම්බෝලයත් එක්ක මුසුවූ කිරිබත් වලින් ආවේ පුදුමාකාර රසයක්.

"මගේ අම්මේ තියෙන රහ... වන්දනාමද හැදුවේ..."

"ම්..."

ඇගේ හිත පුරා පුදුමාකාර සතුටක් ඉතිරීගෙන යනවා... ඔහු කියූ වචන මොන තරම් අව්‍යාජද... "මගේ අම්මේ තියෙන රහ..." කෙනෙකුට ඒ වගේ දෙයක් බොරුවට කියන්න අමාරුයි.

"ක..න්..න..කෝ..."

වන්දනා නැගිටලා ගිහින් ඇගේ පුංචි වතුර බෝතලයට වතුර එකක් පුරවාගත්තා. මේ වගේ දේවල් තමා අතින් කෙරෙන්නේ ඇයි කියලා ඇයටම තේරෙන්නේ නෑ. වතුර එක පුරවද්දී ඇය නිකමට වගේ එතන තිබූ කවුළුවෙන් පහළ තේත් නිෂ්පාදන ආයතනයේ [illegible]

නියා.

"අසං..ක.. අසංක..."

කෙල්ල වැල් එක ළඟ ඉඳලම කෑ ගැහුවා. සසංක දුවගෙන ආවේ වේගයෙන්.

"ආ.. ඇයි චන්දනා..."

"මෙතනට එන්න.."

ඈය ඇගේ ළඟටම ඔහුව ගෙන්නා ගත්තා.

"අර බලන්..න..."

ඒ වැඩ මුරයට උන් සේවකයෙක් තරමක් ලොකු බෑගයකට ස්ටෝරුවේ සීනි ගෝනියෙන් සීනි දමාගන්නවා. අවම වශයෙන් ඔහු බෑගයට සීනි කිලෝ පහක් වත් දමාගන්නට ඇති... තාත්තා දුක් මහන්සියෙන් ගොඩ නැගූ ව්‍යාපාරයට අද ඇතිවී තිබෙන්නේ දුක්ඛිත තත්වයක් බව සසංක තේරුණා...

"තමන් හම්බ කරන් කන තැනට මෙහෙම වංචා කරන්නේ ඇයි.. නේද අසංක... අනේ සර් මේ මිනිස්සුන්ට කොච්චර හොඳට සළකනවද... එයාලගේ දරුවන්ට පවා පොත්පත් අරන් දීලා උදව් කරනවනේ..."

සේවකයා කිසිදු බියක් සැකක් නොමැතිව සීනි ටික පුරවාගෙන ඔහුගේ තව ගමන් මල්ලේ දමා ගත්තා. සසංක එහෙමම ජනේලය අල්ලාගෙන බිල්ලුවා... ඇය උන්නේ ඔහු ළඟම වගේ... ඔහුගේ මුහුණේ පුදුමාකාර දුකක් සටහන්ව තිබෙනු ඇය දැක්කා.

"අසංක..."

"චන්දනා..."

"ම..ට දැන් පහළට ගිහින් මේ හොරකම අල්ලන්න පුළුවන්... ඒත්.. ම..ට බලයක් නෑ..නේ... එහෙම කළාම මිනිස්සු මට විරුද්ධව සර්ට කේලම් කියනවා... ජරා කතා කියනවා..."

"එහෙම උනාද ඉස්සර..."



"ම... ඔය රෑට වල හොර අල්ලලා දුන්නාම මට හරි නරක විදිහට බැනලා තියෙනවා..."

"එතකොට සර්..."

"මං එහෙම කියන්නෑ... මිනිස්සුන්ගේ වැරදි වලට ඒ මනුස්සයා මොනවා කරන්නද..."

මේ ව්‍යාපාරය හදන්නට කොහෙන් පටන් ගන්නද කියලා සසංකට තේරුම් ගන්න අමාරුයි. ඒකට උපදෙසක් ගන්නවනම් එක ගත යුතු හොඳම කෙනා මේ කෙල්ල. ඒත් මේ ඇත්ත දැන්මම ඔහුට කියන්න බයයි.

"මෙහෙම කොච්චර බඩු පිටට යනවා ඇත්ද... කවුද බලන්න ඉන්නේ... සර්ට පුළුවන්ද අසංක මහ ඒ ඇවිත් මේවා බලන්න... ඒවා කරන්න ඕන සර්ගේ පුතා... එයා තරුණ කෙනෙක්නේ... මේවා බලලා කරලා හදාගන්න පුළුවන්... කොච්චර ලස්සනට දියුණු කරන්න පුළුවන් ආයතනයක්ද..."

"ම..."

සසංකගේ හිතේ හරි දුකක් ඇතිවුනා.

"කේක් හොඳට යන තැන් හරියට තියෙනවා... ඒත් ඒ තැන්වල රත්තරු කේක් නෑ..."

"ඇයි..."

"හොයන්න බලන්න කෙනෙක් නෑ..."

"කොහෙද කේක් වැඩිපුර යන්නේ චන්දනා..."

"මං කියන්නේ මට හිතෙන දේ... ලංකාවේ වැඩියෙන්ම කේක් යන්නේ ප්‍රධාන බස් හෝල්ට් ගාව තියෙන කඩවල..."

"ඒ ඇයි..."

සසංක ඇසුවේ පුදුමයෙන්.

"කෙනෙක් නැද්ද ගේකට හරි හිතවත් ගේකට හරි යන්න

SIHINA

නිහයගෙන මිනිහාවගේ අසංක... එතකොට ලාබෙටම ගන්න පුළුවන් ලේබිම දේ තමා ගන්න් එකක්... ඉතින් ඒකටත් දුර යන්න බැහැනේ.. ඔක් එකෙන් බැහැපු ගමන් ඒ ළඟ තියෙන කඩේකට ගිහින් කේක් එකක් ගන්නවා... එහෙම වැඩිපුරම කේක් යන්නේ පිටකොටුවේ ස්ටැන්ඩ් එකේ..."

කෙල්ලගේ සිටුම් ව්‍යාපාරික බුද්ධිය ගැන ඔහුට පුදුම හිතුණා. මේ ව්‍යාපාරය ගැන ඉගෙන ගන්නවා නම් ඉගෙන ගන්න හොඳම කෙනා දැන් තමාට හමුවී ඇති බැව් ඔහු දන්නවා. ඒත් ඒක කරන්නේ කොහොමද. දැනටමත් තමා ඇයව රවට්ටලා. ඒ ගැන ඔහුට දුකයි.

"අනේ සොරි... කිරිබත් ටික කාලා ඉවරත් නෑ... කන්න..."

කන්න ඉඳගන්නත් සසංකගේ හිතට හරි නෑ...

"ඇ..යි අසංක..."

ඔහුගේ මුහුණේ වූ දුක්බර පෙනුම දැක චන්දනා ඇහුවේ හරි දුකකින්.

"නෑ චන්දනා මුකුත් නෑ..."

"මිනිස්සු ගැන හරියට කළකිරෙනවා නේද අසංක..."

"ඒ..ක..නේ චන්දනා... මෙහෙම හොරකම් කරලා කොහොමද මේවා අරන් ගිහින් දරුවන්ට කන්න දෙන්නේ..."

"හැමෝම අපි වගේ හිතන්නෑ අසංක..."

ඇය වතුර බෝතලය ඔහු ළඟින් තිබ්බා. ඒත් සමගම ඔහු හිස ඔසවලා ඇය දිහා බලලා හිනාඋනා.

"ඔක්කොම කන්න..."

"අනේ කනවා... තව තිබ්බානම් තව කනවා..."

"අ..නේ මගේ එකෙන් දෙන්නද..."

"එපා... ආයේ දවසක කිරිබත් හැදුවොත් කියන්න... මං ගෙදරටම එනවා කන්න..."



ඔහු කියන්න චන්දනාගේ හිතට ගිවිස් ගාලා සිහිවුනේ උදේ අප්පච්චි කියපු කතාව. "හොඳ කෙනෙක්ව හොයා ගත්තනම් ගෙදරටම ගෙනත් කන්න දෙන්න පුළුවන්නේ පුතේ.." චන්දනාගේ මුවගට සුනී හසරැල්ලක් වැගුණා.

"එන්න දවසක... උදේ කන්න නෙමේ දවල්ලකට එන්න... බත් ටිකක්ම කාලා යන්න..."

"ඇත්තටම එන්නද..."

"ඒකනේ ඉතින් මං කිව්වේ... එන ඉරිදා එන්න... ඒදාට අපේ අප්පච්චිගේ උපන් දිනේ..."

"සුවර් එකටම එනවා..."

සසංක ඇගේ සුන්දර මුහුණ දෙස බලාගෙන කිව්වේ ඒ මුහුණේ හැම තිතක් දිහාම බලනා ගමන්.

"අදත් සර් එන්නැද්ද චන්දනා..."

"ඒකනේ... චෙක්ස් ගොඩකුත් තියෙනවා අත්සන් ගන්න... මොනා කරන්නද හෙම ගෙදරටවත් ගිහින් අත්සන් ගන්නවා... පිටිකාරයා කතා කරන්නේ ගහගන්න වගේ..."

කෙල්ල ගෙදරට ආවොත් හැම දෙයක්ම අහුවෙනවා...

"මට දෙන්න චන්දනා මං හවස ගිහින් සර්ට කියලා අත්සන් ගන්නම්... මට හවස වැඩක් නෑනේ..."

"පුළුවන් නම් ලොකු දෙයක්... සර්මයි කියලා තියෙන්නේ පේමන්ට් පරක්කු කරන්නෙපා කියලා..."

සසංකගේ හිතට සහනයක් දැනුණා. ඒත් මේ බොරුව කවදා වෙනතුරු හංගන්නද...

SIHINA

# 07

ලංකාවට ආවට පස්සේ කාපු රසවත්ම කෑම තමි අද කෑවා කියලා ඔහුට හිතුණා. ඇත්තටම ඔහුට තව කිරිබත් තිබ්බානම් තවත් කනවා. තෙල්ලගේ කිරිබත් ටික ඒ තරම් රසයි. ඒ වගේමයි කිරිබතට කියලා තිබ්බ කට්ට සම්බෝලයත්... උම්බලකඩ කෑලි හැපෙන දෙහි රේණු හැපෙන ඒ කට්ට සම්බෝල ටික ඔහුගේ මුවේ කාලාන්තරයක් තිස්සේ තිබ්බ ආසාවක් ඉෂ්ට කළා.

"දැන් අවටත් කිට්ටුයිනේ චන්දනා ඇයි තාම කවුරුවත් නැත්තේ..."

සසංක ඇසුවේ වටපිට බලමින්. චන්දනා දිග සුසුමක් හෙළලා ලියමින් උන් පැන දිග සී. ආර්. පොත උඩින් දැම්මා.

"සර් නෑ කියලා දන්නවනේ... අනික අසංක මෙතන ඉන්න



මැනේජර්ස්ලා දෙන්නා... දෙන්නම හොරු... සර් ළඟ ඉන්නේ මේ ව්‍යාපාරේ බංඩි බොක්කේ බැඳගෙන ඉන්නවා වගේ... වෙලාවකට හිතෙනවා මෙයාලා වෙන ජොබ් හොයාගත්තොත් එතකොට අපි අසාදු කියලා..."

"ඒ ඇයි..."

"හැත්තම් ඉතින් මෙහෙම වැඩ කරයිද... මේ ළඟ උදාහරණයක් අසංක... ඔන්න මීට මාස තුනකට කලින් මේ ප්‍රින්ටර් කියන මැනේජර් බදුල්ල අම්පාර ගෙයින් සති දෙකක් ගියා... මං ළඟ තියෙනවා ඔක්කොම ගිය වියදම්... ගියේ එයි කරපු වගකෙනෙ... හිටියේ හොඳම හෝටලේක..."

"මොකටද ගියේ..."

"ඒ පැත්තේ අලුතෙන් සේල්ස් පවත් ගන්න කියලා... මය දැනුත් කොළඹ නෑ..."

"ඉතින්..."

"කොහොමහරි රුපියල් ලක්ෂයක් විතර වියදම් කරලා හොඳට සෙල්ලි කරලා පවුලේ කට්ටියත් එක්කම ගිහින් විනෝද වෙලා රුපියල් ලක්ෂයක විතර බිලක් දැම්මා... මං බැලුවා ඒ බිල් චෙක් කරලා බියර් බෝතල්ම පනස් ගාණක් අරගෙන තිබ්බා... පනස් හතක්ද කොහෙද..."

සසංක ලොකු අවධානයකින් අසා උන්නා. මේ ව්‍යාපාරය මෙහෙමවත් තිබීම පුදුමයක් කියලා ඔහුට හිතුණා.

"ඉතින්..."

"දැන් එයා ගිහින් මාස හතර පහක් වෙනවා... එක ඔර්ඩර් කේස් එකක් නුවරින් එහාට ගිහින් නෑ... එක වොකල්ට් රෝල් එකක් නිකං රෝල් වෙලාවත් ඒ පැත්තට ගිහින් නෑ... එතකොට අසංක මොනවද මෙයා සති දෙකක් බදුලු බණ්ඩාරවෙල ගිහින් කළේ.... සැප ගත්තා..."



SIHINA

කෙල්ල අන්තිම වචන ටික කීවේ මූණ පසුවම හිස් කරමින් වගේ දිග සුසුමක් හෙළලා. ඇය මේවා හොයන්නට ඇත්තේ මොන තරම් කැක්කුමකින්ද...

"ඉතින් තාත්තට කිව්වේ නැත්තේ..."

සසංකගේ මුවින් එකපාරටම පිටඋනා. ඒත් සමඟම ඔහුට වැරදීමකින් දෙයක් පිට වූ බව සිහිඋනා.

ඇය ඔහු දෙස බැලුවේ පුදුමයෙන්.

"තාත්තට කිව්වේ නැත්තේ කියලා ඇහුවේ ඇයි..."

වන්දනා අහද්දී සසංකට එකවර පිළිතුරක් පවා සොයාගන්නට බැරි උනා. ඔහුට කෙනෙක්ව රවට්ටලා පුරුද්දක් නෑ.

"නෑ වන්දනා මං කිව්වේ ඔයාගේ අප්පච්චිට වත් මේවා කියන්න තිබ්බනේ..."

"ඒ ඇයි..."

"නෑ එහෙම කිව්වනම් වෙන රස්සාවක් හරි හොයලා දෙයිනේ.. මෙහෙම තැනක ඉඳලා... අන්තිමට ඔයාවත් මේ වලට පැටලෙනවනේ.."

ඔහු වචන ගැට ගසමින් කිව්වා...

"මේ වල ප්‍රශ්න අර ලොකු අප්පච්චිට මං කියන්නෑ අසංක..."

"ඒකත් ඇත්ත.."

මේ ව්‍යාපාරය හදන්න කොහොම පටන් ගන්නද කියලා ඔහුට තේරෙන්නේ නෑ.

"වන්දනා.."

"ම්.."

වැඩ කරන වෙලාවට ඇය කතා කරන්නේ වැඩ කරමින්මයි.

"මගේ රූට් එකේ වැඩ මං කොහොමද පටන් ගන්නේ..."

"ළමයට සර් එන කල්ම ඉන්න වෙනවා..."



"එහෙම කතා කරද්දී නම් ඒ පුංචි කට හරි පුරහල්... ඔහුට බලා ඉන්නට හිතෙනවා.

"මං කියන්නද වැඩක්..."

"හා කියන්න..."

ඔහු අත් දෙකම මේසෙට තියලා වාඩි උනා. මොකක්දෝ හේතුවකට ඇය මොහොතක් කතා නොකර ඔහු දෙස බලා උන්නා.

"කොහෙන්ද පිටරට පර්ෆියුම් එකක් ලැබුණේ.. හරි සුවඳයි..."

එකවරම ඇය කියද්දී ඔහුගේ හිතට මහා බියක් දැනුණා.. කෙල්ලට තියෙන්නේ පුදුමාකාර ඉවක්... "දෙයියනේ බොරු කියනවා කියලා මෙහෙම බොරු කියන්නේ කොහොමද..." ඔහු හිතුවා.

"මේ..ක රට එකක් නෙමේ වන්දනා..."

"ලංකාවේ පර්ෆියුම් වලින් මෙච්චරම සුවඳක් නෑනේ... කවුද ගර්ල්ද දුන්නේ..."

ඒක අහලා ඇය දිගටම බලාගෙන උන්නා.

"දුන්නේ නම් ගර්ල් කෙනෙක් තමා..."

"මං හිතුවා..."

ඇගේ දෑස් එහෙමම බිමට බරඋනා. ඔහුට දැන් පෙනෙන්නේ ඒ නළල් තලය පමණයි.

"ඒ කියන්නේ දුන්නේ ෂොප් එකේ හිටපු ගර්ල් කෙනෙක්.. එයා තමා තෝරලා දුන්නේ..."

කෙල්ලගේ මේසේ උඩ තිබ්බ ෆුට් රූල අරගෙන ඔහුට ගහන්නට හිතුණා. මොහොතකට නැතිවෙලා ගිය ඒ හිනාව යළිත් ආවේ එවිටයි. එයත් ඔහු බලාගෙන.

"ඔය සාරිය අරන් දුන්නේ බෝයි ෆ්‍රෙන්ඩ්ද..."

ඇය ඇහු එකටත් හරියන්නටත් එක්ක ඔහුත් ඇහුවා. එවර නම් කෙල්ල මුහුණ ඔසවලා හිනාඋනා. ඒත් තොල් පට තද කරගෙන.

"ඇයි ලස්සනද..."

SIHINA

"නැති උන්නනයි... අපේ දුන්නේ මොකි ෆොන්වද..."

ආසෙන් ඇය සිනාසෙමින්ම හිම බලාගන්නා.

"දුන්නේ නම් මොකි නොනෙත් නමා..."

"කවුද අප්පේ ඒ වසනාවන්තයා.."

"වැල්ලවත්තේ සාරි එම්පෝරියම් එකේ දෙමළ කොල්ලෙක්..

එයා නමා දුන්නේ.."

ඒ කතාවට දෙන්නම සැහෙන වෙලාවක් යනකල් හිනා උනා.. කෙල්ලට නම් හිනාව නවත්වා ගන්නවත් බැරි උනා. එකිනෙකාගේ දෑස් දෙස බලාගෙන එහෙම හිනාවෙද්දී කාර්යාල කාමරයට කෙනෙක් ඇතුල් වෙනවා වත් දෙන්නම දුටුවේ නෑ.

"අප්පට සිරිගත්... දෙන්නාත් එක්ක හිනාවෙන්නේ මේක බෙඩ් රූම් එක කියලා හිතලා වගේනේ... මොකද මේ..."

ගයනිගේ වාචාල කතාවෙන් කෙල්ලගේ මුව පුරා ඇඳුණු සිනහව එසැණින්ම නැතිවෙලා ගියා. මොන තරම් පිවිතුරුව ජීවත් වෙන්න හැදුවත් මිනිස්සුන්ගේ කටවල් වල තියෙන්නේ පහත් කුණුහරුප නේද කියලා චන්දනා හිතුවා...

සසංක ගයනි දෙස බැලුවේ මේ ආයතනයේ සේවකයෙක් තව සේවකයෙක් දෙස බලනා බැල්මකින් නොවේ. ආයතනයේ අනාගත හිමිකරු නම් සේවකයෙක් දෙස බලන බැලුමෙනුයි ඔහු බැලුවේ. එහෙත් ගයනි පවා සසංකව අඳුනන්නේ නැහැ.

"මයා ආවේ සේල්ස් වලට නේද..."

ගයනි කතා කලේ ඔහුව පහත් කරලා බව චන්දනාට වැටහුණා. එහෙම ඔහුව වෙන්න දෙන්න කෙල්ලට හිතෙන්නේ නැහැ.

"කොහෙට අනවද කියලා සර්නේ තීරණය කරන්නේ..."

ඇය තිවේ අහක බලාගෙනමයි.

"අ..නි..ත් අපටනේ වෙරු ය..න්..නේ..."

ගයනි කාමරයෙන් ගියේ ඒ ටික මුමුණමින් වගෙයි. චන්දනාට තිල්ලුනා. දැන් සසංකට මේ ආයතනයේ තත්වය ගැන හොඳ





අවබෝධයක් තියෙනවා.

"දැන් මය කන්න ගියේ... අසංක බලන්නකෝ එන්නේ කීයටද කියලා... අනුන්ගේ වැඩ ගැන හොයන්න එනවා... මාස තුනකින් එයා කරන වැඩ හරියට කරලා නෑ..."

"එයා මොනාද චන්දනා කරන්නේ..."

"එයා ඩිස්පැච් එකේ... සේල් සිටට යද්දී මෙයා කොයි බලලා ඩිලිවර් ඕඩර් දීලා චෙක් කරලා වෙන්න ඕන... මෙයා මොනාද දන්නවද අසංක කරන්නේ..."

"ම..."

"චැන් එක අරන් පන කොහොම අයින් උඩට කියනවා මේ ගාන අරන් යනවා කියලා... මෙයා නෑ කියනවා... අරයා ඔන්නම් ඔබා කියලා මෙයාගේ මූණෙන් අහගාගෙනම යනවා... හිනාගන්න පුළුවන් නේද මොනවා වෙනවද කියලා..."

සසංකට තාත්තා අම්මලෙවෙන් හැදූ ආයතනය ගැන මහා දුකක් ඇතුණා.

"මං චන්දනා සර්ව හම්බවෙලා චෙක්ස් ටික අත්සන් කරගෙන එන්නද... දැන්ම ගිහින්... එතකොට මගේ රූට් එක ගැනත් අහන්න පුළුවන්නේ..."

ඇය මොහොතක් කල්පනා කළා..

"ඔව් එහෙම හොඳයි... මං කිව්ව ඒවා එහෙම සර්ට කියන්නෙපා... හොඳේ... පව්... මෙවා එකපාර දරාගන්න බෑ..."

"හොඳයි..."

"ම.. මෙන්න චෙක්ස් ටික..."

ඔහු චෙක් පත් ටිකත් රැගෙනම නැගිට්ටා.

"මං එහෙනම් යන්නම් චන්දනා...."

කෙල්ල හිනාවෙනවා. ඒත් ඒ ඇයි... එහෙම හිනාවෙද්දී ඔහුට

SIHINA

බලාගන්න හරි ආසයි.

"දැන් ඔය ටික අරන් ගියාම හරි..."

"ඇයි..."

අත කටට තියලා එහෙම බලද්දී කොච්චර ආදරේ හිතෙනවද...

"උ..ම්..යෝ.. උ..ම්..යෝ.. කළුවා මාරපන ගියා වගේ ගමන් යන්නෙපා... මොව ළමයෙක්.. දැන් යන්නේ සර්ලගේ ගෙවල් තියෙන්නේ කොහෙද කියලා අහගෙනද..."

ඔහුට ඇය ගැන හරි දුකක් හිතුණා. මේ කරන බොරු වලට කවදහරි හරියට විඳවන්න වෙයි කියලත් ඔහුට සිතුණා.

"ඉඳගන්න... මං ලියලා දෙන්නම්..."

ඇය කිව්වේ පුංචි ළමයෙක්ට කියන්නාක් වගේ...

"ම්... බස් එකට සල්ලි තියේද..."

"තියෙනවා... එනකොට චන්ද්‍රනාට මොනාහරි ගේන්න ඕනද..."

ඔහු එහෙම අහපු එක ගැන ඇයට සතුටුයි.

"ම්... ගෙනාවොත් මේ සෙනග මැද්දේ මට දික් කරන්නෙපා... මං කියන්නද අර චූ..ටි කිරි කැටි තියෙන්නේ..."

ඔහුත් කිරි කැටි වලට හරි ආසයි. චොකලට් රසයයි වෙනස් රසයයි එක්වෙලා එන රසය ඔහු මිටයට ඉඳිද්දීත් ආශාවෙන් වින්දා.

"මං අරන් එන්නම්..."

"ම්.. දවල්ට කෑම එකක් ගෙනත් තියන්නද..."

"මටද..."

"ඔව්..."

"හා..."

මේ වගේ සරල ගැහැණියෙක් එක්ක මෙහෙම ජීවත් වෙන්න ඔහු තුළ පුදුමාකාර ආශාවක් ආවා. ඒ ආශාව හදවත පෙරලාගෙන එන්නාක් වගෙයි ඔහුට දැනුණේ.





SIHINA

# 08

**කම්හලෙන්** පිටවූ විගසම ඔහු සාක්කුවේ සඟවාගෙන තිබූ සෙලියුලර් දුරකතනය අතට ගත්තා.

"රුවන්... උඹ කොහෙද මචං..."

"කොහෙන්ද උඹව පික් කරගන්න ඕන කියපන්..."

"අපේ ෆැක්ටරි එක පාරේ වරෙන්..."

"රයිට්... මං මෙතෙ රවුම් ගගහ හිටියේ මචං... එළ පාර..."

"වරෙන්කෝ... මං උඹට තව මරු පාරක් දෙන්නම්..."

ඔහු සිනාසෙමින්ම දුරකතනය විසා දමා දිග සුසුමක් හෙළුවා. කොතනින් පටන් ගන්නද කියලයි ඔහු සිතුවේ.

රුවන් විසින් පදවාගෙන ආ සසංකගේ කාරය ඔහු අද්දරටම

කතාලා රුවන් නැවැත්තුවා. ඔහුට එන්නට කියලා සසංක ඇමතුමක් දුන්නේ දැන් පැය භාගයකට පමණ පෙරයි. ඒත් රුවන් එන්නට පමා වූ නිසා සසංක දිගටම පාරෙහින්ම ඇවිදගෙන ආවා.

"අ..න් මචං සොරි.. මට නාම හරියට කිරාව කරකවන්න තේරෙන්නෑ... වොයියා වගේ ඉන්නකොට හුරගන්නත් බයයි නේ මචං..."

රුවන් වාහනයෙන් බැහැලා ඇවිත් සසංකට වැන්දේ නැති විත විතරයි.

"හරි.. බං... නැගපන් ඉතින්.."

රුවන්ටම වාහනය පදවන්නට දීලා සසංක ඉදිරි අසුනට බර උනා.

"උඹ ඈත එනකොට මං හිතුවේ මේ කමල් අද්දර ආරච්චි එනවා කියලා.. අම්මපා මචං..."

සසංක අත මිට මොළවලා රුවන්ගේ උරහිසට ගැහුවා. මිත්‍රයා මේ වාටු කතා කියන්නේ පමා වූ නිසා කියලා සසංක දන්නවා.

"හරි හරි ඕක හප්පගන්නැතුව පැදපන්.."

"විහිළු නෙමේ සසා... උඹේ මූණේ මොකක් හරි සෙම් රැල්ලක් තියෙනවා... නිකං මල් සරා පවන් සලාගෙන ගියා වගේ..."

සසංකට ලොකු සිනාවක් ගියා. ඒ සිනාව මැදින් ඔහුට සිහිවුණේ කෙල්ලගේ මූණ... "ඔයා රෝස මලත් පිච්ච මලත් අතර මැද තියෙන මලක් වගේ..." සසංකට සිතුණා.

"සසා... උඹ කොහෙද ඉන්නේ..."

"ආ..."

"මොකද උනේ.."

"කොහෙට හරි යං.. මට උඹත් එක්ක කතා කරන්න ඕන..."

"කොහේ හරි කන තැනකට යන්නකෝ මචං... මාර බඩගිනියි..."

"උඹ උදේට කෑවේ නැද්ද..."





"කොහේ උදේට කන්නද... කන්න ගන්නකොටම වගේ උඹ කතා කළේ..."

"යන්... යන්... මං නම් උදේට කාලා ඉන්නේ... මරු සිරිමත් පාරක් ගම්මලනා... නියම ලුණු මිරිසක් එක්ක..."

ඔහුගේ කටට ආයෙත් කෙළ ඉනුවා. දවසක ඇයට කියා තමන් ලුණු මිරිසක් හදා ගන්න තරම් ඔහුට ආසාවක් ආවා. කොහොමත් දැන් ඉතිං ඇගේ ගෙදර යනවනේ..

"මොකක්ද සසා උඹ මේ කරන්නේ.. මෙහෙන් ඇක්ටිවියට පයින් යනවා... හවසට බයිසිල් එනවා... ඇයි, ඒ..."

සසංක සිනා උනා... මේක නැමදුම කරන්න බැරි බවක් ඔහු දන්නවා..

"ඈ..න් මං උඹට කියන්නම්.."

ඔහුගේ හිතේ පුංචි අවුලක් දැන් හටගෙන තියෙනවා. මෙතන ව්‍යාපාරයේ ප්‍රශ්නයකට අමතරව ඔහුගේ පෞද්ගලික ජීවිතයේත් පුංචි ප්‍රශ්නයක් තියෙනවා... මේ රහස දිගටම රකින්නට අවශ්‍ය වෙන්නේ ඒ නිසයි.

අම්මේ උදේට මෙහෙන්ම පෙනුමකින් ආයතනයේ ප්‍රධානියා ලෙස ඔහුට මේ දොරින් ඇතුල් වෙන්නට පුළුවන්... එසේ පැමිණ ඇයගෙන් දැනගත් ආයතනයේ බොහෝ වැරදි දවස් දෙක තුනක් තුළ හදන්නට පටන් ගන්නටත් පුළුවන්... ඒත් එසේ එද්දීම මුලින්ම හමුවන්නේ චන්දනාව... ඇය බොහෝ සේ දයාබර වූ අසංක රන්නරු සේත් ආයතනයේ අනාගත හිමිකරු බව දැනගත් විට ඇතිවන තත්වය.. සසංකගේ පපුව දැවිගෙන ගියා. අසරණ කෙල්ලට ඒ වගේ දෙයක් දරාගන්නට බැහැ කියලා ඔහු දන්නවා.

රුවන් සසංකව රැගෙන ගියේ රාජගිරියේ [illegible] අවන්හලට... එහි එළිමහනේ දැමූ පුටු පෙළේ [illegible] ඉඳගත්තා.

"උඹ මොනාද කරන්නේ මචං... ආ... [illegible]

SIHINA

ජීවිතා නේද..."

"මං නොස්තැලේ එකත් බොන්නම්... උඹ කාපන්..."

රුවන් කෑම ගෙනෙන්නට ගිය පසු සසංක මොහොතක් දෑස් පියාගෙන දිග සුසුමක් පිට කළා... ලංකාවට ආවාට පසු හිතට අලුතෙන් හැදුණු මේ තැවෙන ගතිය කුමක්ද... එක තැනක රැඳෙන්න බැරි... එක දෙයක් ගැන දිගටම හිතන්න බැරි මේ නොසන්සුන් බව ඇතිවුයේ කොහොමද...

"මචං කෝපි එක..."

රුවන් කත අතරතුර මොහොතක් සසංක දෙස බලා උන්නා. ඔහු මොනවදෝ හිතේ හිර කරගෙන ඉන්නා බව රුවන් දන්නවා. ඒත් රුවන්ගේ හිතේ ඔහු ගැන විශාල ගෞරවයක් තියෙනවා. ඒ නිසා සමහර දේවල් අහන්න රුවන්ට බයයි.

"මචං..."

දිග සුසුමක් සමඟ සසංක මේසයට බර උනා.

"මං ඇත්තටම උඹට කියන්නම්... මං ලොකු අවුලක පැටලිලා ඉන්නේ..."

සසංක එදා රන්තරු කේක් ආයතනයට මුලින්ම ආ මොහොතේ සිට හැම දෙයක්ම රුවන්ට කිව්වා.

"මට ඒ කෙල්ලව දැක්ක වෙලේ ඉඳලා මහ අමුත්තක් දැනෙනවා රුවන්..."

වසර ගණනාවක් විදේශයක ජීවත් වූ තම මිතුරා කෙල්ලෙකු ගැන මේ තරම් ලෝබකමකින් කතා කරයි කියලා රුවන් කවදාවත් හිතුවේ නෑ.

"ඒත් මචං... දැන් උඹලගේ කේක් ෆැක්ටරි එකේ තත්වේ එච්චරම දරුණු නම්..."

"මං ඒකට බහින්නම ඕන... තව දවසක් වත් කල් අරින්න බෑ... කෙල්ල මට හොඳක් දේවල් කිව්වා... ඒකි හරි කැක්කුමකින් මේක



ගැන කතා කරන්නේ..."

"වෙන කැක්කුමකුත් ඇති..."

රුවන්ගේ කතාවට සසංක ලැජ්ජාවෙන් බිම බලාගත්තා.

"ඒ කෙල්ල හරි අවංක පිරිසිදු කෙල්ලෙක් රුවන්... මං ගෑණු ආශ්‍රය කරලා නම් නෑ තමයි... ඒත් ගෑණු ගැන හොඳට දන්නවා..."

"මල් කිව්වම කෙහෙල්මල් විතරක් නෙමෙයි බන්... පිච්ච මලුත් තියෙනවනේ..."

"මට උදව් කරපන් රුවන්..."

සසංක එහෙම කියද්දී රුවන්ගේ අත එකෙණෙහිම ඔහුගේ අත මතට ආවා.

"අ..ඉන් මචං... උඹට උදව්වක් කරන එකත් මට ලොකු දෙයක්.. උඹ මට කොච්චර උදව් කරලා තියෙනවද..."

"මට මචං මේකේ අයිතිකාරයා කියලා දැන්ම කියන්න බෑ..."

"උඹව බයයි කෙල්ල බයවෙලා... නේද..."

"ඒකි දුප්පත් කෙල්ලෙක්... හරි අමාරුවෙන් ජීවත් වෙන්නේ..."

ඔහුගේ සිතුවිලි ගැන රුවන් හොඳට දන්නවා... ආශ්‍රය කරන්නට ඕන තරම් සල්ලිකාර මිතුරන් ඉඳිද්දී සසංක තමා වැනි දුප්පත් මිතුරෙක් ආශ්‍රය කරන්නේත් ඒ උතුම් ගතිගුණ නිසයි. ඒ නිසා රුවන් ඔහුට පුදුමාකාර ලෙස ගෞරව කළා...

"දැන් මොකද කරන්නේ... උඹට ඔය රඟපෑම දිගටම කරන්න බැහැ සසා... මේක හරි පුංචි රටක්..."

"මට තේරෙනවා... මාත් කැමති නෑ මෙහෙම කරන්න... ඊටත් අර තරම් අවංක කෙල්ලෙක්ව රවට්ටන්න..."

"හරි... මොනා කරන්නද... දැන් මොකක්ද උඹේ ප්ලෑන් එක..."

සසංක දිග කෝපි උගුරක් බී රුවන් දෙස බලා උන්නා.

"අද තාත්තා එක්ක කතා කරනවා.. තාත්තා කොහොමත් ටික



SIHINA

දවසක් මේ බිස්නස් එකෙන් ඈත්වෙලා ඉන්නේ... ඉන්දියාවේ යන්නත් තියෙනවා කිව්වා..."

"එයත් අන්තිමට දැන් අමාරුයි සසා... ලෙඩත් උනානේ..."

"එහෙනම් ඒක උඹත් දන්නවා..."

"නංගි කතා කළේ මට..."

"උඹවත් බලපු එක නොවිච්ච දෙයක්ද..."

"හරි... මොකක්ද උඹ දැන් කරන්න හදන්නේ සසා..."

"මං මචං දිගටම රන්තරු එකේ සේල්ස් බලනවා... තේරුණාද... උඹව මං තාත්තට කියලා මෙතෙන මැනේජර් කෙනෙක් කරනවා..."

එකවරම ඔහු එසේ කියද්දී රුවන්ගේ ඇස්වල කඳුළු පිරුණා.

"අ..නේ සසා මේ.. මාව..."

"ඔව් ඇයි... උඹ නොවිච්චර හොඳට ඉගෙන ගත්ත දක්ෂ කොල්ලෙක්ද... උඹට මං කරන රස්සාව හරියන්නෑ... උඹ මේක බාරගන්න ඕන..."

"මං... ආසාවෙන් ඒක බාරගන්නවා සසා..."

සසංක මොහොතක් තම මිතුරාගේ දෑස්වල වූ තෙතමනය දෙස බලා උන්නා. ඔහු මිනිස්සුන්ගේ හදවත් වලට ගොඩාක් ආදරය කරන මනුස්සයෙක්.

"මං ටික දවසක් මෙහෙම ඉන්නම්... දැනටමත් මං මේ බිස්නස් එකේ ගොඩාක් ප්‍රශ්න අඳුනගෙන තියෙන්නේ... ඇත්තටම මං හොඳම අර කෙල්ල අඳුනගත්තා... ඒ කෙල්ල මං කවුද කියලා නොදැන මට ඔක්කොම කිව්වා... මටත් හැබැයි බැන්නා..."

"ඇයි..."

"සර්ගේ පුතාලා රටවල් වලට වෙලා පිස්සු නටනවලු... තාත්තා දුක් විඳලා හදපු බිස්නස් එක ගැන පුතාලා හොයන්නැලු..."



"ඇත්තනේ බන්..."

"මං ආයෙත් මෙච්චර ඇලා යන්නෑ රුවන්... එතකොට උඹ හෙට ඉඳලා වැඩ බාරගන්නවා... උඹට සැහෙන ප්‍රශ්න එයි... මොනවා උනත් උඹ මගේ තීරණ දවස ගානේ ක්‍රියාත්මක කරනවා... තේරුණාද..."

"ඕ..ව්..."

"එතනදී මම සසා නෙමෙයි... අසංක... ඒ වගේම උඹ මං වෙනුවෙන් අර කෙල්ලවත් බේරගන්න ඕන... ඒ කෙල්ල ඔෆිස් එකේ කනිවෙලා ඉන්නේ..."

"ඔව් තේරෙනවා සසා... උඹ වෙනුවෙන් මට කරන්න බැරි මොනවාද..."

රුවන් කිව්වේ ලොකු ආදරයකින්. ඔහුගේ හිතට ලොකු සැනසීමක් දැනුණා.

සසංක ගෙදර එද්දී තාත්තා හරි ආසාවෙන් ඔහුගේ ප්‍රියතම ගායකයා වූ ජෝතිපාලගේ සී.ඩී. පටයක් දමාගෙන රස විඳිනවා. බැල්කනියේ දිග හාන්සි පුටුවේ වාඩිවී දෑස් පියාගෙන ඔහු එය රස විඳිනා දෙස සසංක මොහොතක් බලා උන්නා. ජීවිත කාලය පුරාම කේක් එක්ක ජීවත් උනත් තාත්තාගේ ජීවිතය කේක් තරම් මිහිරි නොවන බව සසංක දැන උන්නා. ඇත්තටම කිව්වොත් ඔහු කේක් එක්කම පෝරණුවේ පිච්චිච්ච මිනිහෙක්.

"තාත්තේ..."

සසංක පුංචි පුටුව අරගෙන තාත්තා ළඟම වාඩිඋනා. ඔහු ප්ලේයරයේ හඬ අඩු කරලා තම ලොකු පුතා දෙස මොහොතක් ආදරයෙන් බලා උන්නා.

"පුතා ඔෆිස් එකට ගියාද..."

"ඔව් තාත්තේ මේ ගිහින් එන ගමන්..."

"තාම ඔයාගේ රහස් පරීක්ෂක වැඩ සටහන යනවද..."

SIHINA

මිහු ඇසුවේ සිනාසෙමින්.

"මං ඒකෙන් ගොඩාක් දේවල් හොයාගත්තා තාත්තේ..."

"ඉගෙන ගන්න ගොඩක් තියෙනවා සමයි පුතා.. මං ඒවා නොදැන උන්නා නොවේ... මගේ පටන් ගන්න හැකියාවක් නැතුව හිටියේ..."

"නෑ තාත්තේ.. තාත්තා තාත්තට පුළුවන් උපරිමය කළා... දැන් මං මෙහෙ ඉඳලා මේක බලාගන්නම්... මට තාත්තේ අවුරුද්දක් දෙන්න... මං ලංකාවටම රත්තරං ගේන්න සවනාවා..."

මේ තාත්තට සියල්ලටම වඩා මිහුගේ ලේ ගැන විශ්වාසයි. තම පුතාගේ ගතේ දුවන්නෙත් තමාගේම ලේ... ඒ නිසා තමා කරපු දේටත් වඩා දෙයක් පුතාට කරන්න පුළුවන් කියලා මිහුට ලොකු විශ්වාසයක් තියෙනවා.

"තාත්තා අපේ රුවන් ගැන මොකද හිතන්නේ..."

"ඌ හොඳ කොල්ලෙක් පුතා.. ඔයා ඌව ආශ්‍රය කළේ ඔයා පොඩි කොල්ලා කාලේ.. ඊත් මේකා පහුගිය අවුරුදු හත අටේම මෙහෙට ඇවිත් අපිත් එක්ක කතා බහ කරලනේ ගියේ... නංගිත් මොන දේටත් ඌට තමා කතා කළේ..."

"අපිට තාත්තේ ගොඩාක් දේවල් තියෙනවා... එහෙම එකේ අපි අපිත් එක්ක ඉන්න මිනිස්සුන්ව කොහොම හරි සලකන්න ඕන නේද තාත්තේ.."

"අනිවාර්යයෙන්ම..."

"තාත්තේ මට පුළුවන් නම් එක උදව්වක් කරන්න..."

තම එකම පුතා තමාගෙන් උනත් දෙයක් ඉල්ලන ඉවසිලිවන්ත තම ගැන මිහුට විශාල පැහැදීමක් ඇතිඋනා... සල්ලිකාර පැලැන්තියේ පුත්තු හැසිරෙන නාස්තිකාර ස්වභාවය ගැන මේ තාත්තා හොඳට දැන උන්නා...

"කියන්න පුතා..."



"මං කැමතියි තාත්තේ රුවන්ව අපේ ෆැක්ටරි එකට ගන්න.. හොඳ වගකීමකුත් දීලා... ඒ රුවන් අපට ලැදි හිතවතෙක් නෙමේ... ඌ ඉගෙන ගත්ත කොල්ලෙක්..."

"ඉගෙන ගැනීම කොහොමත් වෙනත් පුතා වැඩියෙන්ම වටින්නේ අපිට ලැදි එක... ඉගෙන ගත්ත උන් දාහක් හොයාගන්න පුළුවන්.. ඒත් අපිට ආදරේ මිනිස්සු එහෙම හම්බවෙන්නෑ..."

"ඒක ඇත්ත තාත්තේ... ඒත් කලාතුරකින් කෙනෙක් දෙන්නෙක් අපට හම්බවෙනවා..." සසංකට එහෙම හිතුණා. ඒ මොහොතේදී මිහුගේ හිත පුරා ඇඳුණේ නන්දනාව...

"තාත්තා සඳුදා ෆැක්ටරි එකට එනවනේ.. ඒ දවසෙම එහෙනම් රුවන්ව සෙට් කරන්න... මං රුවන්ගේ පිටිපස්සේ ඉඳන් මේ ආයතනය හදන්නම් තාත්තේ..."

සසංක මිහුට හිමි ලහාන්නාසුළු සිනාවකින් සිනාසුණා...

"මේ චෙක් ටික මට අත්සන් කරලා දෙන්න තාත්තේ... අර කෙල්ල මේ ටික නැතුව හිරවෙලා ඉන්නේ..."

"ඒ කෙල්ලගෙන් පඩි ටිකක් වැඩි කරන්න ඕන... අනික් උන් වගේ නෙමේ ඒ කෙල්ල..."

සසංක කිසිවක් කීවේ නෑ. තමාට වගේම තාත්තාටත් හොඳ මිනිසුන් ගැන ඉවක් තියෙනවා. ඒ ගැන සසංකට ලොකු සතුටක් දැනුණා.

"මං තාත්තාගෙන් තව දෙයක් අහන්න හිටියේ..."

සසංක තරමක් හෙමින් කිව්වා. චෙක්පත් වලට අත්සන් දමන ගමන් මුදුන්කොටුව මහතා තම ලොකු පුතා දෙස බැලුවා.

"ඇයි පුතා..."

"තාත්තා නංගී ගැන මොනා හරි හිතාගෙන ඉන්නවද....."

පළමුකොටම මුදුන්කොටුව මහතාට සැනසීමක් ආවා.. ඒ මේ පවුලේ බර දරාගන්න දැන් කෙනෙක් ඉන්න නිසා... රට ඉඳලා ආපු

කොල්ලා මෙච්චර ඉක්මනට මේ තරම් ඔක්කොම සපට ගනී කියලා මනු හිතුවේ නෑ.

"නෑ..ම් පොඩි කොල්ල නිසා මං හිතං හිටියේ..."

"තාත්තට මොනා හරි අපොයා එකක් ගැන එහෙම..."

"මං.. හිතන්නා... ඇයි පුතා හදිස්සියේ එහෙම ඇහුවේ..."

"නෑ තාත්තේ... එයා ගැනත් බලන්න ඕනනේ.. අම්මා කෙනෙක් හිටියනම් එයා ගැන බලයි කියලා හිතනවත් ඇති..."

සසංක කියූ දේවල් මත්තේ මුදුන්කොටුව මහතාට ගොඩාක් දේවල් හිතුණා. සිරිද මිය යද්දී ලොක්කට නවයයි. කෙල්ලට හතරයි. ඒ දා සිට මේ වනතුරු මේ ජීවිත තුළෙන් විශාල අඩුවක් තිබුණා. ඒ අඩුව නාම එහෙමමයි. ඒ අඩුව එහෙමම පුරවන්න කෙනෙක්ට බැරි උනත් කවදාහරි ඒ අඩුව පිරවිය යුත්තේ තම ලොකු පුතා ගෙනෙනා මනාලියම බව මුදුන්කොටුව මහතාට හිතුණා.

"අපි මේ පාර අම්මගේ දානේ හොඳට දෙමු නේද තාත්තේ..."

"පුතාට ඒක හිතිච්ච එක හොඳයි... මං අම්මා වෙනුවෙන් දුප්පත් පවුලකට ගේකුත් හදලා දෙන්න පටන් අරගෙන තියෙනවනේ... නිවටවුනේ... දවසක් අපි එහේ යමු..."

"මං නංගි එක්කත් කතා කරන්නම් තාත්තේ... තාත්තා ඉන්දියාවේ යන්නේ කවදද..."

"නෙල්සන් අන්කල් එක්කම යන්නයි බැලුවේ පුතේ..."

"මං ටිකට් එක ගෙනත් දෙන්නම් තාත්තේ..."

මුදුන්කොටුව මහතා කරුණාබරව සිනාසුණා. පුතෙක් ඉන්නා එක කොච්චර සම්පතක්ද කියලා මුදුන්කොටුව මහතාට හිතුණා... පහුගිය කාලයේ ඔහු රන්තරු කේක් ෆැක්ටරිය ගැන උන්නේ විශාල කලකිරීමකින්. මිනිස්සු තමාට පෙනි පෙනී වංචා කළා... ඒ වගේ දේවල් දකිද්දී ඔහු හරියට කම්පා උනා. එදා ඒ දේවල් වලට එරෙහිව කිසිම දෙයක් කරගන්න තමාට නොහැකි උනේ ව්‍යාපාරය තුළ තමා





තනිවෙලා හිටපු නිසා කියලා අද ඔහුට හිතෙනවා. ඒත් රන්තරු කේක් සමාගම වැඩි කලක් යන්නට පෙරම ලංකාවේ කරගතකාරී කේක් නිෂ්පාදන ආයතනයක් වන බව සිරිලුමින මහතාට ඉවෙන් මෙන් දැනුණා.

මුදුන්කොටුව මහතා ඉන්දියාවට යන්නේත් තම දරු දෙදෙනා වෙනුවෙන් භාරයක් වෙන්නට. හිය වර අසනීප වූ මොහොතේ ඔහුට මේ දරු දෙදෙනාගේ ජීවිත දෙක ගැන විශාල බියක් දැනුණා. යාන වාහන ගෙවල් දොරවල් දරුවන් වෙනුවෙන් හදලා තිබ්බත් උන්ට දුකක් කරදරයක් වූ වෙලාවට අහන්න බලන්න කෙනෙක් නෑ නේද කියලා මුදුන්කොටුව මහතාට හිතුණා.

# 09

**සසිංකා** චෙක්පත් ටික රැගෙන ෆැක්ටරියට ගියේ හිතාමතාම පරක්කු වෙලයි. මේ මොහොත වෙද්දී කාර්යාලයේ බොහෝ විට ඒ ඉන්නේ ඇය පමණක් බව ඔහු දන්නවා. සසංකා ගෙදරින් එද්දීම ඇය කියූ කිරි කැටි කතාව සිහිඋනා. ඔහු ඔහුගේ බෑගයේ තිබූ කිරි කැටි පැකට් පහක්ම කුඩා බෑගයක දමාගත්තා. විදේශ විශ්ව විද්‍යාලයේ ඉගෙන ගනිද්දී බොහෝ විට ඔහුට රෑ පාඩම් කරද්දී බඩගිනි එනවා. එවැනි අවස්ථාවලට කිරි කැටි එකක් සහ නෙස්කැෆේ එකක් බොන එක ඔහුට පුරුදු වෙලයි තිබුණේ.

ඔහු එද්දී ඇගේ වැඩ නිමා වෙලා තිබුණේ. ඒත් ඇයට





කාර්යාලයෙන් යන්නට බැරි ගතියක් දැනුණා... ඒ ඇයි කියලා කියන්න චන්ද්‍රනාටත් තේරෙන්නේ නෑ. ඇය වැඩ සියල්ල නිමා කරලා පුංචි මේක් අප් එකකුත් දාගෙන බෑග් එකත් උකුලේ තියාගෙනම පරිගණකය ළඟට වෙලා ඔහේ උන්නා.

මේ බලා සිටින්නේ කා එනතුරුද කියලා කෙල්ලගේ හදවත දන්නවා. ඒත් ඇයි මෙහෙම ඉන්නේ... මෙහෙම පමාවෙච්චි හදවත ඉල්ලන්නේ මොනවාද...

කෙල්ල වැඩත් නිමා කරලා බලාගෙන ඉන්නවා දකිද්දී ඔහුගේ හදවත පිපිරිලා වගේ ගියා... ඇය ගෙදර නොගොස් කාර්යාලයේ පමා උනේ තමා වෙනුවෙන් කියලා හිතමට ඔහුට සිතුණා.

"ච..න්..දනා..."

කාලාන්තරයක් නොදැක හිටපු කෙනෙක් දිහා බලන්නාක් වගේ චන්ද්‍රනා හැරී ඔහු දෙස බැලුවා. ඇයට එහෙමම ලොකු සුසුමක් පපුවට වැටුණා. ඔහුට නොදැක ගෙවී ගියේ පැය හතර පහක් විතරයි. ඒත් මේ දැස් වලට එච්චරම දුවිල්ලක් ආවේ කොහොමද...

"ඇ..යි පරක්කු උ..නේ..."

ඒ හඬ තුළ ලොකු වේදනාවක් තිබුණා.

"මං.. මේ සර්ලගේ ගෙදර ගියාම..."

"ඉතින්..."

"ස..ර් ම..ට තව වැඩක් දුන්නා... බඩු වගයක් ගේන්න... ඒක..යි පරක්කු උනේ..."

"හරි ළමයෝ... ඉතින් කෝල් එකක් දීලා කියන්නෙපැයි... දන්නැද්ද මං බ..ලං..."

කියාගෙන යද්දී ඔහේ කියවෙන්නට ගිය දෙයක් ඇය අමාරුවෙන් ගිල ගත්තා. ඊට පස්සේ ඇය ලැජ්ජාවෙන් බර වූ දෙනෙත් බිමට බර කරගෙනම හැන්ඩ් බෑගය කරේ එල්ලගත්තා.

"ම... ඉ..නි..න් යන්.."

"මේ.. කිරි කැටි..."

ඔහු කිට් සැට් පත ඇයට දිගු කරද්දී මොකක්දෝ හේතුවකට ඇගේ දෙතොල් සෙලවී ගියා.

"ඈ..තේ ම..ට..ද ගෙනාවේ..."

"ඔ..ව්..."

කෙල්ල තැන්කියු කිව්වේ නෑ. ඒත් ඔහු දෙස මහ පුදුමාකාර බැල්මක් හෙළුවා.

මොන තරම් හදිස්සියක් තිබුණත් ඇය කාර්යාලයේ හැම විදුලි පහනක්ම පංකාවක්ම ඇගේ අතින්ම වහලයි යන්න සූදානම් උනේ... එන ගමනුත් ඇය ඇගේ ඇඟිල්ලක් හරි පරිගණක යතුරු පුවරුවට තබාගෙනයි ආවේ. කෙල්ල එහෙම කරලා බලන්නේ වසා නොතැබූ පරිගණකයක් ඇත්නම් හොයාගන්න කියලා ඔහු දන්නවා. මේ කැක්කුම් ගැන සසංකට ඇත්තටම පුදුමයි. තමන්ගේ කියලා ලේබල් ගහපු දේවල් පමණක් කිට් කිට්යේ බදාගෙන අනුන්ගේ දේවල් කුණු කූඩයට විසි කරන දුර්ජන ආත්මාර්ථකාමී මිනිසුන් ඉන්නා ලෝකයක මේ කෙල්ල ඉතුරු උනේ කොහොමද...

"අසංක පාරට යන්න... මම එන්නම්..."

පිරිමි ළමයෙක් එක්ක එකට රැකියා ස්ථානයෙන් පිටවෙද්දී කෙල්ලෙක් දහක් දේවල් හිතන්න ඕන... සසංක හිමින් හිමින් පියගැට පෙළ බැහැගෙන පහළ නිෂ්පාදන අංශය හරහා පිටවෙන්නට හැදුවා.

[illegible] මුද්‍රණ අංශයේ රාත්‍රී සේවා මුරයට ඉන්නා සේවකයන් දෙදෙනෙක් වැඩ සියල්ල පසෙක දමා චිත්‍රකතා පත්තරයක් බලනවා. මේ වෙලාවේ ඇතුලේ තව මොනවද වෙන්නේ කියලා හොයන්න ඔහුට සිතුණා. ඒත් එහෙම කරන්න ගියොත් ඒක මේ කරගෙන යන දේට බාධාවක්. සේවකයන් දෙදෙනා සසංකව ගණනකට ගත්තේ නෑ.. ඔවුන් පිටි පුටුව උඩ ඉඳගෙන නිදාගෙන ඔහේ පත්තර බලමින්ම උන්නා.

මේ ව්‍යාපාරය ගොඩ ගන්න පටන් ගත යුත්තේ කොතනින්ද කියලා තවමත් සසංකට සිතාගන්නට බැහැ. මෙතනදී වන්දනාත් සමඟ විවෘතව කතා කරන්නට පුළුවන්කමක් තිබ්බ නම් ඇගෙන් බොහෝ දේවල් ඉගෙන ගන්න තිබ්බා.. ඒත් දැන්මම ඒකත් කරන්න





අමාරුයි.

ඇය කිව්වා හරි... නවය හයෙන් පස්සේ ආයතනයේ ආරක්ෂක නිලධාරියා පේන්නවත් නැහැ. ලක්ෂ ගණනක බඩු ස්ටෝරුවේ තියෙනවා. සසංක ගේට්ටුව ළඟ සිටිද්දීම ත්‍රීවිලයක් වේගයෙන් ඇවිත් ආයතනයේ මිදුලට දැම්මා. එහි උන්නේ රස්තියාදු කාර කොල්ලන් දෙදෙනෙක්. ඔවුන් ත්‍රීවිලරයෙන් බැස එහෙමම ෆැක්ටරිය පැත්තට යන්න ගත්තා.

"මේ.. මේ.. පොඩ්ඩක් ඉන්න..."

සසංක දුවගෙන මෙන් ගොස් ඔවුන්ට කතා කළා.. වන්දනා පියගැට පෙළ බසිනා ගමන් මේ සිදුවීම බලාගෙන...

"ඇයි..."

ඔවුන් ඇසුවේ කිසිදු ගණනකට නොගෙන. ආයතනයේ අනවසරයෙන් ඇතුල් වෙලත් ඔවුන්ගේ කිසිදු බියක් සැකක් නැහැ.

"කොහෙද යන්නේ..."

සසංක අසද්දී ත්‍රීවිලරයේ ආ දෙදෙනා ඔහුට ගහන්නට මෙන් මුහුණ දිහා බලා උන්නා.

"අපේ [illegible] හම්බවෙන්න... ඇයි..."

"අවසර නැතුව මේ වෙලාවේ ඇතුළට යන්න දෙන්න බෑ... කරුණාකරලා එළියට යන්න... අවශ්‍ය කෙනාගේ නම කියන්න... එයා එයි..."

ත්‍රීවිලරයේ ආ දෙදෙනා සමච්චල් සිනාවකින් සසංක දෙස බැලුවා.

"මේ කවුද බං මේ..."

ඒත් සමඟම වන්දනා එතනට ආවා.

"කරුණාකරලා එළියට යන්න... ඔයාලට කවුද අවසර දුන්නේ ෆැක්ටරිය ඇතුළට ත්‍රීවිල් වලින් ඇවිත් පොරවල් හම්බවෙන්න..."

වන්දනා අසද්දී ඔවුන් දෙදෙනා උඩබිම බැලුවා.



SIHINA

"මොනවද බලන් ඉන්නේ යන්න..." දෙවන වරත් ඇය කිව්වා. මේ ආයතනය වෙනුවෙන් ඇය මේ කරන්නේ හරිම භයානක දුෂ්කර දෙයක් කියලා සසංක ඒ වෙලාවේ තේරුම් ගත්තා.

"ආ..ඔව් මිස්... අපි යන්නම් එළියෙදී ඔයාව අපි හම්බ වෙන්නම්..."

දෙදෙනාගෙන් එක් අයෙක් එසේ කියද්දීම සසංකගේ අතමිට මෙළවුණා... මිට තදාගෙන ඔවුන් වෙත යන්නට හදද්දීම චන්දනා ඔහුගේ අතකින් අල්ලා ගත්තා.

"එ..පා අසං..ක මේ හරි පහත් මිනිස්සු... පහත් මිනිස්සු එක්ක කතා කරලා වැඩක් නෑ... අ..පි ටිකක් ඉඳලා ය..න්..."

සසංකට හරි දුකක් දැනුණා. එහෙත් අද මේ ආයතනයට වෙලා තියෙන දේට... අනික මේ ආයතනය වෙනුවෙන් කතා කරන්නටත් ඉන්නේ මේ දුප්පත් කෙල්ල පමණක් වීම...

"ඇයි චන්දනා මේ රජ්තියදු කාරයෝ මේ වෙලාවට එන්නේ..."

චන්දනා දිග සුසුමක් හෙළුවා.

"මේක අයාලේ ගිහින් තියෙන්නේ අසංක... එහෙම රෑට ත්‍රීවීල් වලින් සී පාරක් එනවා ඇත්ද... මෙතන ලබා ගාණක බඩු තියෙනවා... බිරි තියෙනවා... සීනි තියෙනවා... ඒවට මොනා වෙනවා ඇත්ද..."

"මේ ඔක්කොටම මොනා හරි දෙයක් කරන්න ඕන..."

සසංකට නිකම්ම කියවුණා.

"ඕ..යා මොනවද කරන්..නේ... අපි මේ ආයතනයේ පුංචි සේවකයෝ දෙන්නෙක් විතරයි... සර්ගේ මූණ දැක්කහම මේවා කියන්න දුකයි..."

"අ..පි යන්..."

ඒ වෙද්දීත් ආයතනයේ ආරක්ෂක නිලධාරියා ඇවිත් උන්නේ නෑ. සසංක නේවිටු පලු දෙක ඔහුගේ අතින්ම වහලා එහි වූ දම්වැල



එක්කර විශාල ඉබ්බා දැම්මා. චන්දනා මේ සියල්ල බලා උන්නේ සුසුමයෙන්.

"මං ඉබ්බා දැම්මා... දැන් මොකෙක්වත් එන්න බෑ... කා ගාවද චන්දනා මේ ඉබ්බන්ගේ යතුරු තියෙන්නේ..."

"ඇ..තු..ළෙ..නේ තියෙන්..නේ.... ස..ර් ගාව ත..ව එකක් ඇති මං හිතන්..නේ..."

"කමක් නෑ... සිකියුරිටි කාරයා එළියේ ඉඳලුණොත්... මං උදේම සර්ගෙන් යතුර ඉල්ලන් එන්නම්..."

චන්දනා සසංක දෙස මොහොතක් බලා උන්නා. ඇයට නම් මේ ආයතනය ගැන හැඟීමක් ආවේ සැහෙන කල් වැඩ කරලා... සර්ගේ කරුණාවන්තකම දැකලා... ඒත් ඔහුට මේ තරම් හැඟීමක් ආවේ කොහොමද...

"ඇයි චන්දනා..."

"නෑ... මු..කු..ත් නෑ... අසංකට කරදර නම් මං උදේට සර්ලගේ ගෙදර ගිහින්..."

"නෑ මං යන්නම්... මං පාන්දර ඇවිත් අරින්නම්... අපි යන්..."

හන්දියට එන තෙක් ඔවුන් දෙදෙනා අතර කතාබහක් සිදුවුණේ නෑ. සසංකගේ හිත ගොඩාක් බර වෙලා තිබුණේ. අද රෑට රුවන්ව ගෙන්වාගෙන මේවා කතා කළ යුතු යැයි සසංක හිතා ගත්තා.

"අසංක..."

චන්දනා සැහෙන වේලාවක් ගිහින් කතා කළේ.

"ආ.. චන්දනා..."

"කොහෙද ළමයෝ මෙච්චර වෙලා ගිහින් හිටියේ... සැහෙන බර කල්පනාවක හිටියේ..."

ඇගේ සිනහවේ පිදී රේඛා දෙස සසංක බලා උන්නේ ලෝභකමකින්.

"එහෙම නෑ චන්දනා..."

"හරි හරි.. පර්සනල් දේවල් යාළුවෝ එක්ක උනත් කතා කරන්න කැමතියි.."

පොඩි කාලෙ හිටියත් කෙල්ලගේ කට හොඳට තියෙනවා කියලා ඔහුට හිතුණා.

"චන්දනා එහෙමද..."

"ඒ කිව්වෙ..."

"පර්සනල් දේවල් යාළුවෝ එක්ක කියන්නැද්ද..."

"කියන්නවත් මට යාළුවෙක් නැනේ.. හිටියනම් කියනවා.. හිතේ තියෙන ඒවා කාට හරි කියන්න තියෙන එකත් කොච්චර දෙයක්ද..."

ඒ හඬ ආවේ කෙල්ලගේ පපුවේ ගැඹුරුම තැනකින් කියලා ඔහුට හිතුණා. ඇගේ මේ සුන්දර සිනාව පිටුපස ඇති දුක හිතන තරම්ම පුංචි එකක් නෙමේ කියලත් ඔහුට හිතුණා.

"මටත් යාළුවෙක් නෑ..."

සසංක එහෙම කියද්දී චන්දනා බිම බලාගෙන හිනාඋනා.

"යාළුවෝ එහෙම හොයාගන්නත් බෑනේ.. ඉන්ද... ලැබෙන්නෙපැයි..."

"මට නම් හොඳ යාළුවෙක්ව හම්බ උනා.... හැබැයි නාම එයා දන්නෑ මං එයත් එක්ක හරි යාළුයි කියලා..."

ඔහු මේ කියන්නේ කා ගැනද කියලා ඇය දන්නවා.

"එයත් දන්නවා ඇති..."

යන අතරවාරයේම සසංක ඔහුගේ අත ඇය වෙතට පෑවා.

"එහෙනම් යාළුයි..."

ඇය තොල් පට තද කරගෙන වෙනස්ම සිනාවකින් ඔහුගේ මූන දෙස බලා උන්නා.

"යාළුයි..."



"මෙමන්ටෝ..."

"නෙවර් ෆොගෙට්..."

"ඔහ්... නෙවර් එවර් ෆොගෙට්..."

දෙදෙනාම සිනාසෙමින් බලා උන්නා. ඇය සුරත සිටි සිටියේ මුදා හරිද්දී ඔහුට හරියට ලොබ හිතුණා. "අද යාළුවෙක් විදිහට අල්ල ගත්ත මේ අත කවදාහරි ආයෙත් මං අත් නොහරින්නම අල්ල ගන්නවා..."

"අදත් මහරගම යනවද..."

"නෑ... දිගටම යට ඉන්නෙත් නෑ..."

"අද උයනවා..."

"ම්..."

"මොනාද චන්දනා යට උයන්නේ..."

ඔහු එහෙම අහද්දී ඇගේ හිතට හරි සතුටක් දැනුණා. ඇත්තටම මේ ජීවිතයේ මේ වාගේ පුංචි දෙයක් වත් අහන්න කෙනෙක් උන්නේ නෑ.

"අප්පච්චි හරි ආසයි රතුචූණු මාළුව කන්න... ඒ නිසා හිතත් ඉස්සෙල්ලා රතුචූණු මාළුවක් හදලා පරිප්පු තෙම්පරාදුවකුත් හදලා ගොටු කොළ සම්බෝලයක් හදන්න..."

ඔහු එහෙම කෑම වේලක් කවදාවත් කාලා නැහැ... ඒත් ඇය කියපු විදිහට ඔහුගේ කටට කෙළත් ඉනුවා.

"රතුචූණු මාළුව රහද චන්දනා..."

ඔහු එහෙම අහද්දී ඇගේ පපුවම ඇකිලිලා වගේ ගියා.

"රතුචූණු මාළුව කාලා නැද්ද අසං..ක..."

"කවදාවත් කාලා නෑ..."

"අනේ.. මං හෙට ඒවා දාලා බත් එකක් හදන් එන්නම්..."

"හැමදාම මට ගේනවා... මං මොනාද දෙන්නේ..."



SIHINA

“යාළුවෝ එහෙම එකට එක දෙන්න ඕන නෑ... ඒක තමයි යාළුකම කියන්නේ..”

කටපුරා ඇය එහෙම කියද්දී ඔහු හරි අභිමානයෙන් ඇය දිහා බලලා හිනා උනා.

“සොරි..”

“යාළුවෝ සොරි කියන්නෙත් නෑ...”

දෙදෙනාගෙම දෑස් එක උත්සහ හිනාවක් දිගේ සුන්දරව ගලා ගියා..

“හැබැයි දවසක එන්න ඕන මාත් එක්ක කෑමකට...”

“ඔ..ගේ අ..ම්මෙ හරි සල්ලිකාරයෙක් වගේ කතාව...”

ඇත්තටම ඒ කෑමවල් වලට යන්නේ සල්ලිකාරයන් පමණයි. වෙලාවකට දහ දහස් ගණන් වියදම් කරන්න සාමාන්‍ය කෙනෙකුට හරි අමාරුයි.

“මං කිව්වේ වැල්ලවත්තේ තෝසෙ කඩේකට යන් කියලා... තෝසෙ දෙක තුනක් එක්ක වඩයක් දෙකක් කාලා... එන්නම... එහෙම නැත්නම් හොඳ මුස්ලිම් හෝටලයක් අල්ලල ගෝදම්බ රොටි පාරක් කමු...”

“හ..මු... කමු.. මං එන්නම්... මාත් ආසයි එහෙම කන්න...”

චන්දනාගේ ජීවිත ශෛලිය මොනතරම් සරලද... අව්‍යාජද කියලා අසංකට හිතුණා. මෙහෙම කෙනෙක් එක්ක ගෙවන ජීවිතේ මොන තරම් සුන්දර වෙන්න පුළුවන්ද...

“එහෙනම් මං යන්නද අසංක...”

“ප..රිස්සමින් යන්න... මං යනකම් ඉන්..නම්...”

“කමක් නෑ අසංක යන්න...”

“බෑ... ඔයා නගින්නකෝ...”

“අර රස්තියාදුකාරයා කිව්ව කතාවට අසංකට බය හිතුණද...”





ඔහු මොනවත් කිව්වෙ නෑ. ඇය හරි කැලිම්බර දෙනෙතින් ඔහු දිහාම බලා උන්නා.

“මං එහෙනම් යන්නම්... හෙ..ට උදේටත් හො..ඳා..ම එන්න...”

කොල්ල බස් එකට නැග්ගේ අන්තිම වතාවටත් එහෙම කියාගෙනමයි. ඔහු ඇය බස් එකට නැගලා පිහිනුන් සැගෙන වෙලාවක් යනතුරු එතනට වී බලා උන්නා.

# 10

**චන්දනාට** රතුඑළු මාළුව හදද්දී ඔහුව මතක් උනා. කෙනෙක් ගැන මේ තරම් ඇලී ඇලී කවදාවත් හිතලා නෑ කියලා ඈගේ හිත දන්නවා. ඔහු සමඟ කතා කරද්දී... ඔහුත් සමඟ පාරේ බැස එක ළඟින් එද්දී හිතට මහා නිවනක් දැනෙනවා. ඒ අනන්තාපරිමාණ වූ හැඟීම පපුවට ආ මොහොතේ සිට පපුව කිරි බරින් බරවූ පපුවක් වගෙයි.

චන්දනාට ඔහු ගැන හරි පුදුමයි. ඔහු කොහේ ඉඳලා ආපු කෙනෙක්ද... ඔහුගේ පැමිණීමේ මොකක්දෝ විශේෂත්වයක් තියෙනවා. එහි අසාමාන්‍ය බවක් තියෙනවා. ඒත් ඒ අසාමාන්‍ය බව මොකක්ද කියලා හරියාකාරව තේරුම් ගන්නට අමාරුයි.





ඒ අප්පච්චීගේ කෑම එක බෙදලා ඇය ඩිනර් එකත් එක්කම අරගෙන ගියා. වෙනදාවත් වඩා සුවඳට අද රතුඑළු මාළුව ඇවිත් කියලා ඇයට හිතුණා. රතුඑළු මාළුව ටිකක් වැඩිපුර හැදුවේ හෙට ඒකත් එක්ක ඉඳි ආප්ප ටිකක් හදලා අරගෙන යන්න ඕන නිසා.

"ආ අප්පච්චී ආසම දෙයක් හැදුවා..."

"ම්..ට සුවඳ ආවා..."

අප්පච්චී අහිංසකව සිනාසී කියද්දී චන්දනා හරි ආසාවෙන් ඔහු දිහා බලා උන්නා. දුම් දමමින් තිබූ උණු රතු කැකුළු බත් ටික දිහා අප්පච්චී මොහොතක් බලා උන්නේ හරි උනකින්.

"පුතා කන්නෑ..."

"ම්... ඉන්න මාත් බෙදන් එන්නම්..."

"ඒකනේ... දවල් කාපු ගමන්නේ... ඒකත් පුංචි බත් මුලක්..."

කෙල්ල බත් ටික බෙදාගෙන ඇවිත් අප්පච්චී ළඟින්ම වාඩිඋනේ ගොටු කොළ අනුරකුත් කටේ දාගෙන... හොඳට දෙහි ඇඹුල් ටික දාලා ගත්තාම ගොටුකොළ සම්බෝල නියම උනත් කන්න පුළුවන් කියලා ඇයට හිතුණා.

"රතුඑළු මාළුව හොඳට ඇවිත්ද අප්පච්චී..."

"ඒක ඕනරක් ඇති පුතේ බත් ටික කන්න..."

"ගුණ නිසා මං හැදුවේ... හොඳ රතුඑළු ටිකකුත් හම්බ උනා..."

"මේ ඉරිදට මං පොළේ යන්නම්..."

එහෙම කියද්දීම ඇයට සිහිඋනේ ඉරිදා ඔහුට දවල් කෑමට ගෙදර එන්න කිව්වා නේද කියලා.

ඉරිදාට ගෙදර එන්න කියලා ඔහුට කිව්වේ එක් වරක් විතරයි. ඒකත් කතා කර කර ඉන්නා ගමන්... ආරාධනාවක් විදිහට ඒක නොකිව්වත් ඔහු ඉරිදාට ගෙදර එයි කියලා ඇයට හිතුණා...

"අප්පච්චී..."

"පුතේ..."

"මේ සෙනසුරාදා හාල්වේ නේ... මං ආවම අපි දෙන්නම යන් මවු ටිකක් ගේන්න.."

"යන් පුතේ... ඇ..යි මො..ක..ක් හරි.."

අප්පච්චි එහෙම අහද්දී චන්ද්‍රනා හරි පුදුමයෙන් වගේ ඔහු දිහා බලලා හිනා උනා. අප්පච්චි එහෙම හිතුවේ කොහොමද...

"ක්ලාස් එකේ මගේ යාළුවෙක් ඉන්නවා... අලුතෙන් ආපු ළමයෙක්... වෙන අයට වඩා හොඳයි... මංදා මට හොඳයි... නිකං කතා කර කර ඉඳිද්දී මං කිව්වා දවසක අපේ ගෙදර එන්න කෑම ටිකක් කාලා යන්න කියලා... එයා කිව්වා මේ ඉරිදා එන්නම් කියලා... එයිමද දන්නෑ... ඒත් ආවොත්.."

"එහෙනම් තව පාරක් පුතා ඉන්වයිට් කරන්න... කෙනෙක් අපේ ගෙදරට එන එකත් කොච්චර දෙයක්ද... නෑදෑයෙක්වත් එන්නැති එකේ.."

"කාටහරි කෑමක් දෙන්නත් ආසයි.."

"ඉතින් අපි හොඳට දෙමු... එ..යා මේ පු..තේ... ගැ..ණු ළමයෙක්..ද..."

අප්පච්චිට ඇතිවූ පුංචි සැකයක් නිසා ඔහු එහෙම ඇහුවේ. කෙල්ලගේ හිනාව සඳ රැස් දහරක් වගේ බේරිගෙන වැටුණා...

"පි..රි..මි ළ..මයෙක්.."

තතනමින් වගේ කෙල්ල කිව්වේ. කෙල්ල මේ පිරිමි ළමයෙක් ගැන මෙහෙමවත් කතා කළේ ජීවිතේ පළවෙනි වතාවට.

"අපි හොඳට කෑම ටිකක් දෙමු... අල්ල පනල්ලේ දීලා බෑ පුතේ.."

"ඒ..යා එහෙම නෑ... අද ගෙනිච්ච කිරිබත් ටිකත් කෑවේ මහ ලොකු දෙයක් හම්බ උනා වගේ.."

"කො..හොම කෙනෙක්ද..."





"අ..පේ ක්ලාස් වලට ආපු කෙනෙක්... හරි දුප්පත් කෙනෙක්.. ඒත්.."

"ඇයි පුතේ.."

"මංදා අප්පච්චි... එයා හරිම වෙනස්... අප්පච්චි ආවම බලන්නකෝ... මොකක් හරි එයා දිහා බලනකොට තියෙනවා... ඒත් ඒ මොකක්ද කියලා මට තේරෙන්නෑ.."

දරුවන්ට අසාමාන්‍ය ලෙස ආදරය කරන දෙමව්පියන්ට දරුවන් ගැන විශේෂ ඉවක් එනවා... ඒ ඉව මස්සේ අප්පච්චිට ගොඩක් දේවල් හිතුණා...

"ඔයා හොඳ දරුවෙක්වයි ආශ්‍රය කරන්න ඕ..න.."

"එ..හෙම විශේෂ ආශ්‍ර..යක් නෑ... අ..ප්..ප..ච්..චි.. අපි හොඳ යාළුවෝ.."

"පිරිමි ළමයෙක් එක්ක ගැණු ළමයෙකුට තියෙන්නේ විශේෂ යාළුකමක් විතරයි පුතේ.."

අප්පච්චි කිව්ව කතාව මස්සේ ඇය දිගටම හිතාගෙන ගියා. ඒ කතාවට විරුද්ධ වෙන්න තරම් දෙයක් ඇයට හම්බ උනේ නෑ.

"නම මොකක්ද පුතේ ඒ දරුවගේ.."

"අසංක අප්පච්චි... මං අප්පච්චි ගැනත් කියලා තියෙන්නේ.."

ඔහු මේ පුංචි ගෙදරට ඇවිත් ඉන්නවා ඇය මොහොතකට මවා ගත්තා. එහෙම හිතද්දී හිතට මොකක්දෝ සතුටක් දැනෙනවා. ඒ සතුට විස්තර කරගන්න තමාට බැරි ඇයි කියලා ඇයට හිතාගන්නත බෑ.

ගෙදර ආ මොහොතේ සිට චන්ද්‍රනාට සිය පාරක් විතර අසංකව සිහි උනා... එකම කෙනෙක්ව මෙහෙම හොයාවන්වා මතක් වෙන්නේ ඇයි කියලා ඇයටම සිතාගන්නට බැහැ. මේ සිහිවීමේ මොකක්දෝ ලොකු විශේෂත්වයක් ඇයට දැනෙනවා. මොකද ඔහුව සිහිවන සිහිවෙන වතාවට හදවතට මහ මොකක්ද වේගෙන එනවා. හදවතට



SIHINA

එවැනි දෙයක් කවදාවත් සිදුවී නැති බව ඇයට හොඳටම සහතිකයි...

නිදාගන්නට ගියත් නින්ද දෙනෙතට එන්නේ නෑ... ඇස් ඉස්සරහ පෙරහැරක් යනවා වගේ සුනුගේ රුව දැන් පටල ඉදිරියෙන් එහාට මෙහාට යනවා. කවදාවත් මේ පාර නිදි යහන පුරා මේ තරම නොසන්සුන් බවක් ඇයට දැනී නැහැ... ඇඳේ ඒ මේ අතට පෙරළෙමින් ඇය ඒ දොළහ වනතුරු අවදියෙන් උන්නා...

වතුර ටිකක් බොන්නට නැගිටිද්දී වන්දනාට හදිස්සියෙන් වගේ ඔහු හැන්දෑවේ දීපු කිට්කැට් තුන ගැන සිහිවුනා... ඇය මඳ අඳුරේම ඒ කිට්කැට් වලින් එකක් අරගෙන ඇඳට ආවේ මුවේ තුනී මදහසක් ඇඳගෙනමයි. මොනවා උනත් මේ පිරිමි ළමයෙක් සුළුදුළේම දීපු පුංචි තිළිණය... ඒකත් චොකලට් එකක් වෙච්ච එක හරි පුදුමයක් කියලා ඇයට හිතුණා.

වන්දනා ඇඳේ හාන්සි වෙලාම කිට්කැට් එකේ පොලිතීන් කවරය හිමිහිට විවර කළා... එය විවර කරද්දීම ආ අලුත් චොකලට් සුවඳ හරිම මිහිරි ලෙසයි ඇයට දැනුණේ.

කිට්කැට් එක මැද වූ වේෆස් එකෙත් ඒ වටා තැවරුණු චොකලට් වලත් තිබුනේ පුදුම රසයක්.. මීට සති දෙකකට විතර කලිනුත් කිට්කැට් එකක් කාපු බව ඇයට මතකයි. ඒකේ රසත් ඇයට මතකයි. ඒත් ඒ කිට්කැට් එකෙන් ආවේ මේ තරම් කිරි සාර චොකලට් රසයක් නෙමේ...

වන්දනා තිකමට වගේ අතේ තිබූ කිට්කැට් එකේ ඇසුරුම දිහා බැලුවා... ඇසුරුමේ නම් කිසිම වෙනසක් තිබුනේ නෑ... ඒත් ඇසුරුම මත තවත් ලේබලයක් අලවා තිබුණි...

යාන්තමට වගේ එහි තිබූ ඉංග්‍රීසි වචන දෙක තුනක් දැකලා වන්දනා තවත් ඕනෑකමින් ලේබලය ගෙන බැලුවා... පස්සේ ඇය මඳ අඳුරේම නොපෙනෙන නිසා ඇඳෙන් නැඟිට විත් විදුලි පහනද දල්වා බැලුවා.

DUTY FREE SHOP - SINGAPORE

කිට්කැට් එකේ වූ ලේබලයේ සඳහන් වූයේ එවැන්නක්. වන්දනාට හරි පුදුමයක් ආවා.

“මේක සිංගප්පූරුවෙන් ගත්ත කිට්කැට් එකක්... ඒක නම්





මෙච්චර රහ... ඒත්... අසංකට කොහෙන්ද මේක ලැබුණේ... සිංගප්පූරුවේ එයාර් පෝට් එකේ තියෙන කිට්කැට් අපේ කඩවල් වල නෑනේ... හරි පුදුමයි...”

වන්දනාට ලොකු සැකයක් ඇති වුණේ නෑ... ඒත් හෙට ඒ ගැන අහනවා කියලා ඇය හිතාගත්තා. “සමහර විට රට ගිය යාළුවෙක් දීපු එකක් වෙන්න ඇති... ඒත් හදිස්සියේ ඒක හවස අරගෙන ආවේ කොහොමද...” වන්දනා කිට්කැට් එකේ ඉතුරු ටිකත් කාලා සීතල වතුර වීදුරුවක් බිගෙන බිගෙන හිටියේ හරි ආශාවෙන්. චොකලට් කෑවට පස්සේ සීතල වතුර බොද්දි හරි සනීපයක් එනවා... වන්දනා ඒක දැනගත්තේ ගොඩාක් පුංචි කාලේමයි...



SIHINA

# 11

චන්දනා රන්තරු කේක් ෆැක්ටරි එක ගැන කියපු ගොඩාක් දේවල් ගැන සසංක රෑ නිදිමරාගෙන හිතුවා. මේ කේක් ෆැක්ටරි එක ගොඩ ගන්නට නම් පුංචි සැළසුමක් හදාගන්නට ඕන කියලා ඔහු හිතාගත්තා. ආයතනයේ සාමාන්‍ය අලෙවි නිලධාරියෙක් විදිහට රඟපාමින්ම මේ දේවල් කරන්නේ කොහොමද කියන එකයි ඔහුට තිබූ ප්‍රශ්නය...

රුවන්ව ආයතනයේ කළමණාකරුවෙක් විදිහට දාද්දී ප්‍රශ්න ගොඩාක් එන බව සසංක දන්නවා. රුවන්ව දැන් ඉන්නා කළමණාකරුවන්ට පිටින් අපු ගමන් මේ අය තාත්තාව මුණ ගැසෙන්නට එන බවත් ඔහු දන්නවා. ප්‍රශ්න විසඳන්න ගිහිල්ලා තාත්තාගේ ඔළුවට අමතර බරක් පැටවෙනවා දකින්න ඔහු කැමති උණේ නෑ.





මෙතන සිදුවෙන බොහෝ වංචා වලට වැඩියෙන්ම හවුල් වෙන්නේ මේ කළමණාකරුවන් බව සසංක දැන් දන්නවා. ඔවුන් ගැන චන්දනා පවා කතා කළේ පුදුමාකාර කලකිරීමකින්. සති ගණනාවක් පවුල් පිටින් ආයතනයේ මුදල් වලින් මඩුලු බණ්ඩාරවෙල ගොස් සැප ගත් කළමණාකරුවන් ගැන ඇය කීවේ හුල්ලමින් වගේ... අදින් පසු එවැනි දේවල් රන්තරු කේක් ආයතනයේ සිදුවෙන්නට දෙන්නේ නෑ කියා සසංක දැඩිව සිතාගත්තා.

කොහොම උනත් හෙට තාත්තා රුවන්ව රැගෙන ෆැක්ටරියට යනවා. මොන ප්‍රශ්න ආවත් ඔහු රුවන්ව එතන කළමණාකරුවෙක් ලෙස පත් කර එන බව ඔහුට විශ්වාසයි. තාත්තාත් රුවනුත් කාර්යාලයට යන මොහොතේදී තමා එතන රැඳෙන එක හොඳ නෑ කියලා ඔහුට හිතුණා. ඒ නිසා හෙට ෆැක්ටරියට නොයා ඉන්නට ඔහු තීරණය කළා...

ඒත් එකපාරටම වගේ සසංකට චන්දනාගේ මුහුණ මතක් උනා... ඇයව අවසන් වරට දැක්කේ මීට පැය හත අටකට කලින්... ඒත් හෙට ඇයව දකින තුරු හිතට මහා පාළුවක් දැනෙනවා... එහෙම හැඟීමක් හදවතේ ඇති වෙන්නේ ඇයි කියලා ඔහුටම හිතාගන්නට බැහැ.

ඇය උදේන්ම එන නිසා පාන්දරම ගොස් මොනවා හෝ කියා පිටතට එනවා කියා ඔහු හිතාගත්තා. තමා දැක් ඇයව බලාපොරොත්තුවෙන් දැවෙනවා වගේ ඇයත් තමා එනතුරු බලා ඉන්නා බව සසංක දන්නවා.

ජීවිතය ගැන හිතාගෙන උන්නේ මොනතරම් වෙනස් මාවතක ගෙනියන්නද... ඒත් එක දැසක් සියල්ලම වෙනස්ම මාවතකට හැරවුනා... සසංක ලංකාවට එද්දී තාත්තාගේ රන්තරු කේක් ආයතනයම බාර ගන්නවා යැයි අදහසක උන්නේ නෑ. තාත්තා ඒකෙ වැඩ බාරගන්නට කියලා බල කළෙත් නෑ... ඒත් තමා රන්තරු එකේ වැඩ ටික බලාගන්නම් කියද්දී තාත්තාගේ මුහුණේ මතුවූ නිදහස් සිනහව සසංකට ගොඩාක් දේවල් පහදලා දුන්නා. ඔහු කාලාන්තරයක් තිස්සේ මහා දුකක් හිස මත තියාගෙන දුක් විඳලා කියලා දැන් සසංක දන්නවා.

මේ හැම දෙයක්ම යටින් සසංකට මහා විශාල බියක් දැනෙනවා. ඒ හොයි මොහොතක හරි අය නම රන්නරු තේජ් ව්‍යාපාරයේ අනාගත හිමිකරු කියලා දැනගත් විට ඇතිවන තත්වය ගැන... කෙල්ල තමාට ඇසුරු කරන්නේ මොන තරම් නිදහස්වද වචනවද කියලා ඔහු දන්නවා... ගැමි ළමයෙක් ළඟ එහෙම නිදහස් වචන බවත් ඔහු දන්නවා. චන්දනා තියෙන්නේ හරිම කලාතුරකින් කියලා ඔහු දන්නවා. ඒ දුප්පත් තියනවාටත් වඩා දුප්පත් කෙල්ලෙක් බව සසංක දන්නවා... ඒ දුප්පත් කම හිතින් දරාගන්නා හිතට කවදාහරි මේ බොරුව තේරුණොත් කෙල්ල මොන තරම් කම්පනයට පත් වෙයිද කියලා ඔහු හිතුවා.

මේ ජීවිතයේ කවදාවත් දෙවිය කියලා දෙයක් විශ්වාස කරලා නෑ... ඒත් දැන් ඔහු මේ සියල්ලම දෙවියට භාර දුන්නා... "මොනවා උනත් මට මේ කෙල්ල ගැන තියෙන්නේ හරි විශේෂ හැඟීමක්..." සසංක හිතුවා.

පිරිමියෙක්ගේ හිතේ ගෑණියෙක් ගැන එහෙම ඇතිවෙන විශේෂ හැඟීම කුමක්ද...

සසංක උදේන්ම රුවන්ව ගෙදරට ගෙන්නා ගත්තා. කළු කලිසමකුත් ලා කොළ පැහැයට නුරු කමිසයකුත් ඇඳ තද කොළ පැහැගත් ටයි පටියක් පැළඳ උන් රුවන්ව දකිද්දී සසංකට ලොකු ආදරයක් දැනුණා... දෙයක් දෙද්දී... ඒ දේ කැක්කුමකින් ආදරයකින් ගන්නා අයට සසංක හරි ආසයි. එවන් අයට යමක් දෙද්දී හිතට තේරුම් ගන්න බැරි නිරාමිස සතුටක් දැනෙනවා... ඒ සතුට මේ මොහොතේදී සසංකට දැනුණා.

"ගුඩ් මෝනින් මචං... වරෙන් උඩට..."

රුවන් උඩට ආවේ සසංක දිහා බලාගෙනමයි. සසංකත් උඩු මහලේ තරාදි වැටට බර වෙලා රුවන් දිහා බලාගෙනම උන්නා.

"ෂා.. අද නිකං ආක්ෂේ කුමාර් වගේනේ... මාර හැන්ඩ්සම්..."

"තැන්කියු සර්..."

"මේ.. මේ.. සර් කෑලි අරගෙන ආවොත් උඹෙයි මගෙයි සහෝදරකමුත් ඉවරයි කියලා හිතාගනින් කොල්ලෝ..."





රුවන් හරි හැඟීම්බරව ඇවිත් සසංක ගේ දෑතම අල්ල ගත්තා.

"මම.. කියන්න බැරි තරම් ගොඩකින් සසා මිට්ටයේ... මට මෙ..හෙ..ම දෙයක් දැ..න්..නට පින් සිද්ධ වෙනවා..."

රුවන් එහෙම කියද්දී සසංකගේ දෑස් පවා තෙත්වී ගියා.

"මෙච්චර දේවල් කියාගෙන හොඳම යාළුවට දෙයක් දෙන්න මෙච්චර පරක්කු උනාට මට සමාවෙයන්..."

"එහෙම කියන්නෙපා සසා... මං උඹට විතරක් නෙමේ මේ පවුලටම හරි ආදරෙයි..."

"මං දන්නවා... ඒක කාන්තයි නංගියිත් දන්නවා..."

"සසා... අද ෆැක්ටරි එකේ වැඩට යන්න කලින් කාට එක.. දෙයක් කියන්න මට අවසර දෙනවද..."

සසංක රුවන්ගේ උරහිසට තට්ටු කළා.

"කියපන්..."

"මං ම..ගේ ජීවිතේ තියන් මේ බිස්නස් එක..ට වත් මේ පවුලට වත් වරදක් වංචාවක් කරන්නෑ..."

"මේ මොනවද බං උඹ කියන්නේ... උඹට පිස්සුද..."

"නෑ සසා... හදිස්සියේවත් මං අතින් නොදැනුවත්ව හරි වරදක් උනොත් ම..ට ඒක මූණටම කියපන්... මට උ..ඹේ ක..කුල් දෙක අල්ලලා හරි සමාව ගන්න පුළුවන්... මට මේ ඔක්කොටම වඩා මගේ යාළුවව වටිනවා... රස්සාවල් හොයාගන්න පුළුවන්... ඒත් උඹ වගේ කෙනෙක්ව කාටවත් ලැබෙන්නෑ..."

සසංක හැඟීම්බරව රුවන්ගේ පිටට තට්ටු කළා පමණයි. මිනිස්සු අවංක වෙද්දී අව්‍යාජ වෙද්දී සසංකගේ දෑසම තෙත්වන ගතියක් තියෙනවා. ඒක පරම්පරාවෙන් එන පුරුද්දක්.

"උ..ඹ..ව අද පාන්නා එක්ක ය..යි... මං දවල්ට ලන්ච් වලදී උඹව එළියේදී හම්බවෙන්නම්.. ම්..."



SIHINA

"හොඳයි..."

"මං අන්කල්ටත් කතා කරලා එන්නම් සසා..."

එසේ කියූ ඔහු කලිසම් සාක්කුවේ දමාගෙන ආ බ්‍රවුන් පේපර් පාර්සලයක් පිටතට ගත්තා.

"මේ මොනවද..."

"අන්කල්ට දෙන්න... මුලින් අත.. අපිටත් තාත්තලා හිටියා මචං... ඒත් මේ වගේ ලොකු තාත්තා කෙනෙක් නෙමේ..."

"යං තාත්තා පහළ ඇති..."

රුවනුත් සසංකත් පහළට ය තාත්තා බුදුන් වඳිනවා. ඔහු බුදුන් වැඳ නැගී එනවිත් එක්කම වගේ රුවන් ඔහු අභියසට ගියා.

"ආ... අපේ මැනේජර් මහත්තයා උදේන්ම ඇවිත්... එහෙම තමා කොල්ලෝ උනාම වැඩ කරන්න ඕන..."

"අ..න්..කල් ම..ට..."

රුවන් මොනවද කියන්න ගිහින් එය ගිලගෙනම වගේ මුලින් අත ඔහු අත තියලා පුංචි එකෙක් වගේ බිම දණ ඔබා මුදුන්කොටුව මහතාට වැන්දා. මුදුන්කොටුව මහතා සසංකා දිහා බලලා හිනාවුණේ හරි ආදරණීය විදිහට.

"අපේ පවුලේ පුතෙක් කියලා හිතලා වැඩ කරන්න..."

තාත්තා කිව්වේ එපමණයි. කිව්වුණේත් එපමණයි කියලා සසංකට හිතුණා.

"ප්‍රශ්න එන්න පුළුවන්... ලොකු පුතා කියන විදිහට පුතා කරගෙන යන්න..."

"අපි පුළුවන් උනොත් පිටරටවලට කේක් එක්ස්පෝට් කරනවා අන්කල්..."

රුවන් අභිමානයෙන් කිව්වා...

"ඒ..හෙම තමා හිතන්න ඕන... අලුත් වැඩ කරන්න නම් අලුත්





මිනිස්සු එන්න ඕන..."

රුවනුත් සසංකත් බලා සිටිද්දීම මුදුන්කොටුව මහතා ගෙදර වාහන බලා ගන්නා සිරිදාසට කතා කළා.

"සිරිදාස අපේ වැනට් එක තාම මණ්ඩාර මහත්තයගේ ගැරේජ් එකේද..."

"දැන් ඉවර ඇති ලොකු මහත්තයා..."

"අද ගිහින් ඒක බලන්න... ඒක ගෙනත් රුවන් මහත්තයාට දෙන්න ඕන... රුවන් ඒක පාවිච්චි කරන්න..."

රුවන් අදහාගන්න බැරුව වගේ සසංක දිහාත් [illegible] මහතා දිහාත් බැලුවා.

"අ..නේ අන්..කල්.. ම..ට බිලීව්.. එක ඇ..නී..."

මුදුන්කොටුව මහතා ඔහුගේ උරහිසට අතක් තැබුවා.

"ලොකු පුතා එක්ක එකතුවෙලා මේක දියුණු කරන්න... කේක් වලට මාකට් එක අඩුනම් පාන් හදන්න... ඒත් බැරි නම් බත් පැකට් හදන්න... හදලා මේක ගොඩ ගන්න... මේවා ඔයාලට තමයි... ලොකු පුතාවත් පොඩි දුවවත් ඔයාව අමතක කරන්නෑ..."

"ඕකේ අන්කල්..."

"ලොකු පුතා අද ඔෆිස් යනවද... ආ තාම ඔයා හැංගි මුත්තන්නේ.. නේද... කවදද ඕක ඉවර කරන්නේ..."

"තව දේවල් ටිකක් තියෙනවා තාත්තේ හොයාගන්න... ඒක හිතන්නෙපා තාත්තා..."

"ම්... රුවන් යන් මං එක්ක... දැනට ඔයා මගේ කාමරේ ළඟ තියෙන කාමරේ ගන්න... උදව්වට මම හොඳ කොල්ලෙක් දෙන්නම්..."

තාත්තා මේ කියන්නේ චන්දනා ගැන කියලා ඔහු දන්නවා. චන්දනාව රුවන් ළඟට දාන එක හොඳයි කියලා සසංකට හිතුණා.

# 12

**සසංක** ෆැක්ටරියට ගියේ කාන්තා රුවන්වත් කැටුව ෆැක්ටරියට එන්නට කලින් ඉන් පිටවෙන්නට හිතාගෙනයි. ඔහු පාන්දරම යද්දී ඊයේ උන් ආරක්ෂක නිලධාරියා සසංක දෙස කන්නට වගේ බලා උන්නා. පෙරදා සවස ඇතිවූ සිදුවීමෙන් පසු සසංක ආයතනයේ ගේට්ටුව වසා දැම්මා. ආරක්ෂක නිලධාරියා රෑ තාප්පයකින් හෝ පැන ඇවිත් ගේට්ටුව අරින්නට ඇත.

"අනුන්ගේ සීනි කිරන්නැතුව තමන්ගේ වැඩ ටික කළා නම් හරිනේ... අලුතෙන් ඇවිත් සමහරු මෙතන පොරවල් වෙන්න යනවා..."

ආරක්ෂක නිලධාරියා සේත් නිෂ්පාදන අංශයේ සේවකයෙක් හා කියනවා සසංක අසාගෙන. යළිත් හැරී ගොස් ඔහුට යමක් කතා කරන්නට හිතුණත් සසංක උඩට ආවා. දවසින් දවස මේ එක එක ප්‍රශ්නය ගානේ විසඳනවා.

සසංක උඩට ගොස් විනාඩි පහක් යන්නටත් ප්‍රථම ඔහු බලාපොරොත්තුවෙන් උන් හඬ දොරකඩින් ආවා. "එයා එන්න කලින් එයාගේ සද්දේ එනවා... ඊට පස්සේ සුවඳ එනවා... අන්තිමට තමයි කෙල්ල එන්නේ..." සසංක සිතුවේ සිනාබරව ලේඛනයක් බලන ගමන්.

"ගුඩ් මෝනින් අසංක..."

"මෝනින් චන්දනා.. අද..."

කියන්නට තියෙද්දී ඔහු බිල ගත්තා.

"කියන්න..."

කෙල්ලගේ ඇස් කැරකෙනවා.

"මල් වත්තක් හාවින් ඇවිත් වගේ... ඔයත් රෝස පාටයි සාරියත් රෝස පාටයි... හෑන්ඩ් බෑග් එකත් රෝස පාටයි..."

ඔහු කියාගෙන යද්දී කෙල්ලගේ දෑස් ඒ වෙතට සිනාබරව යොමුව තිබුණා.

තවත් රෝස පාට දේවල් ඇඳගෙන එන්න කියලා කියන්න කොල්ලට හිතුණා. සමහර වෙලාවට ඒ වගේ දඟකාර හැඟීම් දැන් දැන් හිතට එනවා.

"රෝස පාට චන්දනාට ලස්සනයි..."

ඔහු අහිතක් නැතුවම කිව්වා. ගෑණු ළමයෙක් ලස්සන නම් ඒ ලස්සන ගැන කියන්න මොහොතක් වත් පමා වෙන්න එපා කියලා බටහිර කියමනක් තියෙනවා. කුහක කමට ඒක හිතේ හංගගෙන ඉන්නේ කුහක පිරිමි කියලත් ඔහුට හිතුණා.

"අද උදේම ආවේ ගේට් එක ඕපන් කරන්න ඕන නිසාද..."

"ම්... එද්දී සිකියුරිටි කාරයා අරව මේවා කියවනවා... මං උඩට ආවා..."

SIHINA

"අනේ මේවා අහන්න බලන්න කෙනෙක් උන්නනම්... කොච්චර ලස්සනට මේවා නැදෙයිද..."

උදේ පාන්දරම කෙල්ල මූණ කළු කරගෙන කියද්දී සසංකට දුක හිතුණා. ඔහු ආසා කළේ මොහොතකට කලින් දැක්ක ලස්සන මුහුණ දිගටම තියෙනවා දකින්න.

"අ..ද විශේෂ කාවහරි හම්බ වෙන්න යන්නත් එක්කද චන්දනා ආවේ..."

ඔහු එහෙම අහද්දී කෙල්ලගේ හිත ගැස්සිලා වගේ ගියා... විශේෂ කෙනෙක් ගැන විශේෂ අදහසක් හිතේ තතියනවා නම් තමයි. ඒත් ඔහු එහෙම ඇහුවේ ඇයි...

"ඇ..යි අසං..ක එහෙම ඇහුවේ..."

"ගැණු ළමයි ලස්සනට ඇඳලා එන්නේ ඉතින්..."

"ඇ..යි..."

කෙල්ල තොල් පට තද කරගෙන ඇහුවා.

"වි..ශේෂ කෙනෙක්ව හම්බවෙන්..න..තේ..."

"ම්.. ඔ..ව්.. එ..හෙ..ම..ත් වෙන්න පුළුවන්..."

"අ..ද ඒ කියන්..නේ... ෂෝට් ලිව් එකක් දානවද..."

"ම්... අහලා බලන්න ඕ..න..."

"කාගෙන්ද..."

"අ..ර කිව්ව විශේෂ කෙනාගෙන්..."

"ඒ.. කියන්නේ එ..හෙම කෙනෙක්..."

"ඇ..ති..."

චන්දනා එහෙම කියලා ඔහු දිහා බලා උන්නා. ඒ මුහුණ දිහා බලාගෙන ඉද්දිදී ඇයට පුදුමාකාර දේවල් හිතෙනවා. එහෙම හිතෙන්නේ ඇයි කියලාවත් ඇයට තේරෙන්නේ නෑ.

"එ..හෙම කෙනෙක් ඇති එහෙනම් නේද..."



SIHINA



"හිටියොත් හොඳයි කියලා නම් දැන් හිතෙනවා..."

ඒ හඬේ නම් තිබුනේ පුදුමාකාර අවංක බවක්. ගැණු ළමයි තමන්ගේ ජීවිතයේ පෞද්ගලික දේවල් කතා කරද්දී වංක වෙන්නේ කලාතුරකින්.

"අසංක කාල තෙමේ නේද ආවේ..."

"උ..දේම නේ ආවේ... කෑවේ නෑ..."

"ඒක හොඳයි... අද උදේන්ම අපි ඉඳි ආප්ප කැදුවා... මං මිටි අනලා දුන්නා... අප්පච්චි මිටිකුමා... ඊයේ රතුළුණු මාළුව ගැන කිව්වම කන්න ආසයි කියලත් කිව්වනේ..."

කෙල්ල ඇස් එහෙට මෙහෙට කරගෙන කියද්දී අසංක බලා උන්නේ පුදුමාකාර ලෙන්ගතු බවකින්...

"ආ.."

හංගාගෙන හිටපු දෑස් හිමිහිට විසාවලා චන්දනා ඉඳිආප්ප පාර්සලය ඔහු වෙනම් පෑවා. එය ගන්නට ප්‍රථම සසංක ඒ කුඩා දෑස් දෙස මොහොතක් බලා උන්නා.

"මා..වි..ක් මතක් උනා..ද..."

"ඔ.. මතක් උනා..."

"අමුතුවෙන් මතක් කරන්න දේකුත් නෑ... ඔයා මගේ මතකය පුරාම ඇවිදිනවා... මට නින්දකුත් නෑ... සැනසීමකුත් නෑ..." චන්දනා කිව්වේ නැතත් ඇගේ දෑස්වල ඒ කතාව ලියවී තිබුණා.

"ආ.. මට බඩුවක් අහන්න අමතක උනා..."

එකපාරටම චන්දනා අහද්දී සසංකව ගැස්සිලා වගේ ගියා.

"ම..ගෙ..න්..."

"ම්..."

"ඊයේ මට ගෙනත් දුන්න නේද කිට්කැට් තහරක්..."

"ඔ..ව්..."

"හ..රි රහයි... පුළුම වොකලට රහත් එන්නේ..."

"ඔක්කොම කෑවද..."

"එක එක තන්නේ.. ඒ තරම් රහයි.. අහන්න හිටියේ ඒක නෙමේ..."

"එහෙනම්..."

"ඒ කිරි කැටි එක ෆ..න්..තේ කොහෙන්ද..."

සසංකගේ බඩ පපුව පත්තු වීගෙන ගියා. ඒ කිරි කැටි රට ඉදන් එද්දී ගෙන ආව ඒවා බව ඔහුට මතක් උනේ පසුවයි...

"මේ.. ටවුමේ කඩේකින් ගත්තේ චන්දනා... ඇ..යි..."

"ඇත්තමද..."

එහෙම අහද්දී සසංකට හරි දුක හිතුණා. ඔහු එහෙම බොරුවක් කරන්න ආස කෙනෙක් නෙමේ. විශේෂයෙන් ඔහු ගොඩාක් ආදරේ කරන අයට එහෙම දෙයක් කරන්න ඔහුට සිත් දෙන්නේ නෑ.

"ඔව්..."

"නෑ අසංක.. ඒ කිරි කැටි එකේ තිබ්බා සිංගප්පෝර් එයාර් පෝර්ට් ඩියුටි ෆ්‍රී කියලා ස්ටිකර් එකක්... මේ..."

ඇය හරි අහිංසකව හෑන්ඩ් බෑගයේ තිබූ කිරි කැටි එකක් ගෙන ඔහුට පෙන්නුවා... මේ කිරි කැටි පාර්සලය ගත්තේ චාංගිට... ඒ සිංගප්පූරු ගුවන් තොටුපලේ තීරුබදු රහිත සාප්පුවකින්. සසංක ඇය ආසයි කියූ නිසා ගෙනාවේ ඒ කිරි කැටි වලින් තුන හතරක්.

"ම..චි..ම..යි..."

"රට ගිහින් ආපු කෙනෙක් කඩේට විකුණන්න දෙන්නැති... ආයේ ඒ පැත්තේ ගියොත් තව හතර පහක් මට ගෙනත් දෙන්න හොඳේ..."

"කිරි කැටි කන්න එච්චරම ආසද..."

"ම්.. රට තනියම ඉද්දී කකා කුල් වතුර බොනවා..."





මේ වගේ සරල කෙල්ලෙක් එක්ක ජීවිතය බෙදා ගන්නට ඔහුගේ හිතට ලොකු ආසාවක් එනවා. ජීවිතයේ විච්ඡූර්ණ ලක්ෂණ නැති සරල ගැහැණියකගෙන් එන සරලත්වය සසංක ඇය වෙතින් දැක්කා.

"මේ... අසං..ක... ඉරි..දා ම..ම..."

"කොහේ හරි යනවා කියලා කියන්නද හදන්නේ... හරි වැඩේ... මට ගෙදර ලන්ච් වලට එන්න කියලා පනින්න නේද හදන්නේ..."

ඇයට දැන ගන්නට ඕන කළෙත් එච්චර තමයි. ඔහුට ඒ පොරොන්දුව තවමත් මතකද කියලා.

"එ..න..ව නා..ම ඉ..න්..නා..වා..."

"හොඳම යාළුවා කියලා මට කව එක දාන්න නේද හිටියේ.."

"ඕං එහෙම කරයි කියලා හිතනවද..."

ඒ ඇස් දිහා බලාගෙනම එහෙම දෙයක් කොහොම කියලා කියන්නද... අසංක කිසිවක් නොකියා ඒ දෑස්වල ගැඹුරටම එබීගෙන උන්නා.

"මං අප්පච්චිටත් කිව්වා එනවා කියලා... අ..පේ ගෙදර හරි පුංචි ගෙයක්නේ.. ඔය ඉතින් අමුත්තෙක් කියල එනවමයි.."

සසංක අඩි දෙක තුනක් ඇය ළඟට ආවා.

"මං අමුත්තෙක්ද..."

හරිම මෘදු හඬකිනුයි ඔහු එහෙම ඇහුවේ.

"මට නිකම් කියවුණේ... මට අමුත්තෙක් නෑ..."

"මං අනිවාර්යෙන් එනවා..."

"මං බලන් ඉන්නවා..."

ඇය එපමණයි කිව්වේ. ඒ වචන තුන සසංකගේ පපුවට බැස්සේ හරි ගැඹුරු විදිහට... "මං බලන් ඉන්නවා..."



SIHINA

# 13

මුදුන්කොටුව මහතා රන්තරු කේක් සමාගමේ නව කළමණාකාරවරයා ලෙස රුවන්ව හඳුන්වා දෙද්දී බොහෝ දෙනාගේ මුහුණුවල් රතු වෙනවා වන්දනා බලාගෙන... ඒ මොහොතේදී වන්දනා මොහොතක් රුවන් දෙස බලා උන්නා... ඔහුට තිබුණේ හරි ලෙන්ගතු පෙනුමක්. ඒ තරම් තැලී පොඩි නොවෙච්ච පෙනුමක් තියෙන ඔහුට මේ ප්‍රශ්න වලට තනියම මුහුණ දෙන්න ශක්තියක් තියේද කියලත් වන්දනා හිතුවා. ඒත් මෙහෙම වත් කෙහෙත් මේ ආයතනයට පත්කළ එක ගොඩාක් හොඳයි කියලා වන්දනාට හිතුණා.

ස්ටාෆ් මීටින් එකෙන් පස්සේ මෙතෙක් හිටපු මැනේජර්ලා තැන තැන සේවකයන් මුළු ගන්වාගෙන කියවනවා වන්දනා බලාගෙන...



මුදුන්කොටුව මහතා වන්දනාට එන්න පණිවිඩයක් එව්වේ ඒ මොහොතේදීයි. ඒ වෙලාවේ කාර්යාල කාමරයේ උන්නේ මුදුන්කොටුව මහතාත් රුවනුත් පමණයි.

කෙල්ල කාමරයට ඇතුල් වෙද්දීම රුවන් ගොඩාක් උනන්දුවෙන් කෙල්ල දිහා බලා උන්නා... "සසංක උඹ හරි... මේ හරි කලාතුරකින් පිපෙන මලක්.." රුවන් හිතුවේ එහෙමයි.

"ස..ර්..."

ඇය කතා කළේ හරි ආදරයකින්. ගෞරවයකින්.

"කේක් හදන එක නවත්තලා දරුවෝ මං ෆිල්ම් එකක් හදන්න හිතුවේ..."

එකපාරටම මුදුන්කොටුව මහතා එසේ කියද්දී වන්දනා විතරක් නෙමෙයි රුවනුත් පුදුමයෙන් ඔහු දෙස බැලුවා.

"මෙ.. අ..පේ ස..ර්.. ෆිල්ම්ස් හදන්න..."

ඇය හරි පුදුමයෙන් වගේ ඇහුවා.

"ඇයි මට බැරිද... මාත් හොඳ ෆිල්ම් කාරයෙක් තමා දන්නවද මං ඉන්දියාවට ගියාම අමිතාබ් බච්චනුත් හම්බවෙලා එන්නේ... ඉතින් මං ෆිල්ම් එකක් හැදුවොත් වන්දනා එනවද..."

"ම්..ම.. ස..ර්... ඒකෙත් එ..කට්‍රන්..ටිස් වලටද සර්..."

"නෑ ළමයෝ... ප්‍රධාන චරිතෙට..."

එහෙම කියූ ගමන්ම කෙල්ල මුහුණ බිමට බර කරගෙන හිනාවෙනවා. ඒ හිනාව හරි පිවිතුරුයි නිර්මලයි කියලා රුවන්ට හිතුණා. මේ හිනාවට අර රට රාජ්‍යවල ගිය කොල්ලාගේ හිත නතර වෙච්ච එක පුදුමයක් නෙමේ...

"ඔය වගේම ලස්සනට සාරි ඇඳලා ඉන්න ඕන... බලන්න රුවන් අද ඉන්න නිළියෝ චිත්‍රපටි වලට ඇඳගෙන ඉන්න සංකර ඇඳුම්... මේ ළඟදී මං දැක්ක ටීවී එකේ එක නිළියක් ලේන්සුවක් තන පටේට ඇඳගෙන හොලව හොලව එනවා... අම්මපා ලැජ්ජ නැතේ මේ

කෙල්ලන්ට..."

චන්ද්‍රනාත් රුවනුත් සිනාසුනේ මුහුණට මුහුණ බලාගෙනයි.

"ඉතින් ළමයෝ.. මෙහේ වැඩ කොහොමද..."

එය අසනවාත් සමගම ඇගේ මුහුණ එහෙමම බිමට බරවුණා. මුදන්කොටුව මහතා මේ කෙල්ල ගැන හොඳට දන්නවා. සියත් පමණ වෙන මේ ස්ටෝර් එකේ සේවකයන්ගෙන් මේ ආයතනයට කැක්කුමකින් ඉන්න එකම සේවිකාව මේ කෙල්ල විතරයි කියලා මුදන්කොටුව මහතා දන්නවා.

"රුවන්... මේ කෙල්ල විතරයි මම මෙතනින් විශ්වාස කරන්නේ... මෙතනට මගේ දරුවෙක් වගේ මේ කෙල්ල ආදරෙයි..."

මුදන්කොටුව මහතා එසේ කියද්දී ඇගේ හිතට මහා සැනසීමක් දැනුණා... ඒ වචන දෙක අහන ඇයට වසරකට වරක් දෙන බෝනස් එකකට වඩා වටිනවා..

"චන්ද්‍රා මේ රුවන්.. මගේ පුතෙක් වගේ... ඇත්තටම කිව්වොත් මගේ පුතාත්ම තමයි... මෙයාට තියෙන ඔක්කොම ප්‍රශ්න මේ කෙල්ලා දන්නෑ... ඒත් ඔයා දන්නවා... රුවන්ට උදව් කරන්න ඕන..."

"ඔ..ව් ස..ර්... මං ඒක කරනවා..."

"දැක්ක නේද රුවන්.. හැම කෙල්ලෙක්ම මෙහෙම නෑ..."

රුවන් ඇය දෙස බලා සිනාසුණේ ගෞරවයකින්.

මුදන්කොටුව මහතා තවත් අවශ්‍ය උපදෙස් වගයක් රුවන්ට ලබාදී ආයතනයෙන් පිටවී ගියා.

"සර් අපිට සර්ව හම්බවෙන්න ඕන..."

මුදන්කොටුව මහතා වාහනයට ගොඩ වූ පසු දැනට කළමණාකරුවන් ලෙස සේවය කරන ක්‍රිස්ටෝපර් හා ප්‍රනාන්දු දුවගෙන පැමිණ කිව්වා.

"තියෙන ප්‍රශ්නයක් ක්‍රිස්ටෝපර් රුවන්ට කියන්න... මං අද හවස ඉන්දියාවේ යනවා... එන්නේ මාසෙකින්... මං අවශ්‍ය උපදෙස් රුවන්ට



දෙන්නම්..."

"ඒත් ස..ර්..."

"ඔහොමත් අපි කරලා බලමු..."

එසේ කියූ මුදන්කොටුව මහතා සිනාමුසුව වාහනයේ දොර වසා ගත්තා.

"බලමුකෝ ඌ කරන හැටි..."

ක්‍රිස්ටෝපර් ප්‍රනාන්දුට කිව්වේ දත් කරගසමින්. මේ සිද්ධියේ කුමක්දැයි ඔවුන්ට පවා සිතාගන්නට බැහැ. ඒත් මේ සියල්ල පිටුපස උන්නේ සසංකයි. ඒ බව කිසිවෙක් දැන උන්නේ නෑ.

මුදන්කොටුව මහතා ගිය පසු කාමරයේ තනි වූයේ රුවනුත් චන්ද්‍රනාත් පමණයි.

"සර්ට සේල්ස් වලයි ප්‍රඩක්ෂන් වලයි රෙකෝඩ්ස් ඕනනම් මං ගෙනත් දෙන්නම්... ඒවා බලන්නට වෙනවා..."

"ඇ..යි..."

"ඒ තරම් සවුත්තුයි... ඒක ටිකක් ස්ටඩි කලාම ගොඩාක් ප්‍රශ්න තේරුම් ගන්න පුළුවන්..."

රුවන් මොහොතක් ඇය දෙස බලා උන්නා. කෙල්ල දෙස බලා ඉද්දදී ඔහුට මතක් වෙන්නෙම සසංකවයි.

"ම..ට නංගි ගොඩක් උදව් කරන්න ඕන..."

රුවන් එසේ සහෝදරියකට මෙන් ඇයට කතා කරද්දී ඒ මුහුණේ මතුවුණේ ප්‍රසන්න සිනහවක්. මොනවා නැතත් ඔහු තුළ හොඳ ගතිගුණ පිහිටා ඇති කියලා ඇයට හිතුණා.

"මං උදව් කරන්නම් ස..ර්... ම..ට..ත් මේවා කියන්න කෙනෙක් නැතුව හිටියේ... මේ ෆැක්ටරියේ අද කතාව මෙහේ හදන කේක් තරම් රසවත් නෑ..."

නෙත් බිමට බර කරගෙන ඇය කියද්දී රුවන් බොහෝ දේවල් තේරුම් ගත්තා.



SIHINA

"අපි මේක හදමු නංගි.. කවුරු නැතත් අපි දෙන්නා පිටිපස්සේ තවත් කෙනෙක් ඉන්නවා..."

"ඒ කවුද..."

වන්දනා ඇසුවේ පුදුමයෙන්. රුවන් ඒට පිළිතුරක් දුන්නේ නෑ.

"එයා කවුද කියලා ඔයා ඉස්සරහට දැනගනී... ඒත් එයා වෙනුවෙන් අපි මේ දේවල් කරමු.."

වන්දනා රුවන් දෙස බලා උන්නේ පුදුමයෙන්. ඔහු මේ කියන්නේ කා ගැනද...

"සර්ට ගොඩාක් ප්‍රශ්න වලට මුණ දෙන්න වෙයි... ඒක් සැලෙන්නෙපා.. මෙතේ ගොඩාක් ප්‍රශ්න තියෙනවා... ඒ ප්‍රශ්න වලින් සියයට අනූවක් මං දන්නවා.. තවත් එක්කෙනෙකුත් දැන් දන්නවා.. මං.ට හිතෙනවා සර් එයත් නරක කෙනෙක් නෙමෙ කියලා..."

කෙල්ල මේ කියන්නේ සසංක ගැන කියලා රුවන් හොඳටම දන්නවා. ඔහු ගැන කතා කරද්දී ඒ මුහුණේ තිබූ ඉරියව් දිහා රුවන් විමසිල්ලෙන් බලා උන්නා. කෙල්ලෙක් එයාගේ හදවතේ අසාමාන්‍ය හැඟීමක් ඉන්න කොල්ලෙක් ගැන කතා කරද්දී මුහුණේ විශාල වෙනසක් දිස්නයක් එනවා. ඒ දිස්නය මේ මොහොතේදී වන්දනාගේ මුහුණෙත් තිබුණා.

"කවුද නං..ගි ඒ..."

"මේ.. සර්... එයා මේ..."

"කමක් නෑ වන්දනා... අපි දෙන්නට විතරක් මේ වැඩේ කරන්න අමාරුයිනේ.. නේද... එතකොට අපි දෙන්නා තනිවෙනවා..."

"ඇ..ත්..ත ස..ර්..."

"ඉතින් කවුද ඒ..."

"එයා මේ සේල්ස් වලට අලුතෙන් ආපු ළමයෙක්... නා..ම අසංක.. උදේ ඇවිත් එළියට ගියා... මං කියන නිසාම නෙමෙ සර්... එයා





එක්ක විකක් කතා කරලා බලන්..න..."

"ඉතින් කතා කලාම මොකද වෙන්නේ..."

රුවන් සැඟැල්ලුවෙන් වගේ අහද්දී කෙල්ලගේ මුණ රතුවුණා.

"කතා කලාම.. ස..ර් මේ හොද කෙනෙක් කියලා තේ..රේ..නා..වා..."

"එහෙනම් ඇත්තටම හොද කෙනෙක් වෙන්න ඇති... අපි කතා කරමු සසංක එක්ක..."

රුවන්ට වැරදිලා මුහුණේ ඇත්ත නම කියවුණා.

"සසංක නෙමෙ සර්... අසංක..."

"සොරි සො..රි.. මගෙත් හොදම යාළුවෙක් ඉන්නවා සසංක කියලා.. ඒකයි.. මට නම් හදක පැටලුණා... හරි නංගි... මට සේල්ස් රෙකෝඩ් වලට කලින් ප්‍රධානම එකේ බිල් ටිකයි වැඩ කරන අයගේ වයිම් කාඩ් ටිකයි එවන්න... අපි එතනින් පටන් ගමු... ඉස්සෙල්ලා පිළිවෙලට බඩු හදමු.. පස්සේ ඒවා හරි විදිහට සේල්ස් කරන්න බලමු..."

වන්දනා ඒය අනුමත කරමින් හිස සැලුවා.

"මං එහෙනම් යන්නම් සර්..."

"හොඳයි නංගී... මං ඕන උනාම කතා කරන්නම්..."

වන්දනා රුවන්ගේ කාමරයෙන් පිටවෙද්දී මුළු ස්ටාෆ් එකම ඇය දෙස බලා උන්නේ කුතුහලයෙන් බැල්මෙන්.

"ආපු ගමන්ම දෙන්න ගිහින්..."

කවුදෝ එහෙම කියනවා වන්දනාට ඇහුණා. ඇගේ මුළු ආත්මය පුරාම ගින්දරක් දුවන්නාක් වගේ උනා.

"මොනාද මිනිහා කියන්නේ..."

කාමරයට ආපු ගමන් ප්‍රියංකා ඇහුවේ කිසිම ගරුසරුවක් නැතුව...

"හූ..කුත් නෑ.."

"එහෙනම් පැයක් විතර කතා කළේ.."

"සර් රිපෝට් වගයක් ඉල්ලුවා.."

"ඒක මිසක්.. කට්ටිය හිතලා තියෙන්නෙ තවත් මොනාහරි ඉල්ලන්න ඇති කියලා.."

වන්දනා ඇගේ අතේ තිබූ පෑන වේගයෙන් මේසයට විසි කළා.. ආත්මාර්ථකාමී මිනිසුන් රොත්තක් මැද තමා සේවය කරන බව ඇය දන්නේ සෑහෙන කාලයකට පෙරයි. ඒත් මේ මිනිසුන් මේ තරම්ම මිනිස්කමින් පහත් කියලා ඇය දැනගෙන උන්නෑ.

"මට ප්‍රඩක්ෂන් එකේ ෆයිල් ටික ඕන.."

ඒවා තිබුණේ නිරූපා භාරයේ.

"ඒ..වා හැඩිල් කරන්නේ ඕ..ම..නේ.."

"ම..ට නිරූ... ඒකනේ මං ඔයාගෙන් ඉල්ලුවේ.."

"ඇ..යි ඒවා ඔයාට.."

"ස..ර් ඉල්ලුවා.."

"මොන සර්ද.."

මේ මිනිස්සු එන්නෙ වැරදි පාරෙන් කියලා වන්දනා හොඳින්ම දැන උන්නා. ඒ නිසාම ගොඩාක් ඉවසිල්ලෙනුයි ඇය කතා කළේ.

"රුවන් සර්... අද අලුතෙන් ආවේ.."

"ආ.. එයත් සර් කෙනෙක්ද... මගෙන් ෆයිල් ඉල්ලුවොත් මං දෙන්නම්... ඒකේ සබ්ජෙක්ට් ක්ලාක් මං නේ වන්දනා.."

"හොඳයි මං කියන්නම්.."

"නෑ.. නෑ... ඔයා කලබල නොවී ඔහොම ඉන්න... මං ඒවා අරන් යන්නම්.."

"ඒක හොඳයි... ඉක්මනට ඕන කිව්වා.."

නිරූපා ෆයිල් ටික එගෙන යද්දී වන්දනා බිම බලාගත්තේ





ගොඩාක් කලකිරුණු සිතින්. ඇය සෑහෙන වෙලාවක් හිත සනසාගෙන පරිගණකයේ වැඩ කරමින් උන්නා... මේ තරම් දුකක් විඳගෙන මෙතන රස්සාව කරන්නේ මොකටද කියලා වන්දනා හිතුවා.

"වන්දනා කෝල්.."

කවුද එහෙම කියද්දී වන්දනා දුරකතනය අසලට ගියේ නෙත් බිමට බර කරගෙනමයි.

"හෙලෝ.."

"වන්දනා මම.."

කතා කරන්නේ අසංක කියලා වන්දනා අඳුන ගත්තා..

"කො..හෙ..ද ඉන්නේ.."

"ඔෆිසද.."

"ඕ..ව්.."

"මම මේ.. මහරගම ඉන්නේ වන්දනා ඇයි.."

"නෑ.. නිකං... අසංක.."

"ඇයි කියන්න.."

"හ..ව..සෑ..ට එනවද.."

"මං.. ටි..ක..ක්.."

"කමක් නෑ..."

"මං එදා හිටපු හෝල්ට් එකට එන්නද.."

කෙල්ලගේ තොල් පට අතර තුනී සිනාවක් සටහන් වුණා.

"හා... මං අද ටිකක් වේලාසන යනවා.."

"ඇ..යි.."

"ඉරිදා අපේ ගෙදරට අමුත්තෙක් එනවා කිව්වා... බඩු ටිකක් ගන්න.."

එහෙම කියද්දී නම් හිතේ තිබ්බ ගොඩාක් දුක් වේදනා තුනී වී ගිය හුරතල් හසරැල්ලක් මතු උනා...

"විශේෂ අමුත්තෙක්ද... ඔච්චර සැරසෙන්නේ..."

"පෙල්ල තරා තොසර මොහොතක් පොල් පට සපාගෙන උන්නා...

"අපිට නම් වි..ශේෂ කෙනෙක් තමා... එ..න කෙනාට නම් ඉතින් එ..හෙම නැතුව ඇති..."

එහෙම කියද්දීත් ඇගේ පොල් පට හරහා තුනී මන්දහාසයක් ඇඳි ඇඳී මැකෙනවා. හිත මේ වන් සතුටක් විඳින්නේ ජීවිතේ ප්‍රථම වතාවටයි.

"එ..න කෙනාටත් එහෙම ඇති ඉතින්..."

"දන්නෑ... අහලා බලන්න ඕන..."

"ඒවා අහලා බලන්න බෑ... මූණ බලලා තේරුම් ගන්නෝනා..."

සසංක කියද්දී ඇගේ හිතේ විශාල ප්‍රමාණයෙන් ඔහුගේ රුව ඇඳුනා...

"එහෙනම් මං හතරට එනවා..."

"මං එහෙනම් ඊට කලින් එන්නම්..."

දුරකතනය තබලා චන්ද්‍රා ඇගේ මේසයට ආපේ දඟකාර ලෙසින්... මොහොතකට කලින් හිතේ තිබ්බ දුක ඇත් හිතේ නෑ... එහෙම උනේ කොහොමද කියලා ඇයටම තේරුම් ගන්නට බෑ...





SIHINA

# 14

සිසිංකා නිවසේ සිට රුවන්ට ඇමතුමක් ගත්තේ අද සිදුවූ දේවල් දැනගන්නයි. ඔහුව කළමණාකරුවෙක් ලෙස පත් කිරීම නිසා රත්තරු ජේක් ආයතනයේ අලුත් තත්වයක් ඇතිවන බව සසංක දැන උන්නා...

"රුවන් මචං මං..."

"සසා... උඹ කොහෙද ඉන්නේ සසා..."

"මහත ඉඳගෙන කෑ ගහන්න එපා බං..."

"සොරි සොරි... තාම ටිකක් කරකවලා අත්ඇරියා වගේ දන්නැද්ද මචං..."

"වැඩේ කොහොමද—"

"සැහෙන්න බරපතලයි.."

"ඇයි.."

"මෙතන ඉන්න උන් උන්ගේ ගනමන්ට් එකට වදිනවට ඇති නැතේ සසා.. බංකර් හදාගෙන ඉන්නේ... මට ඉන්නේ අර කෙල්ල විතරයි.."

"මටත් ඉන්නේ ඒ කෙල්ල විතරයි.."

සසංක කියද්දී රුවන් හිනාවුණේ නෑ...

"ඒ වගේ සිරියාවන්ත කෙල්ලෙක් මං දැකලා නෑ සසා.."

"චන්ද්‍රනාව ආරක්ෂා කර ගනින් රුවන්..."

"මගේ නංගී කියලා හිතලා ඒක කරනවා... උඹ බයවෙන්නෙපා, උඹ නැති කාලේ මං උඹේ නංගිවත් රක්කා..."

"මං දන්නවා... අපි රට කතා කරමු මොනවද අලුතින් කරන්න ඕන කියලා.. උඹ අද හොඳ සිකියුරිටි ෆර්ම් එකකට කතා කරලා අලුත් සිකියුරිටි සර්විස් එකක් ගනින්.. තව කෑමරා එකක් ෆිට් කරපන්.. දෙකක් ෆැක්ටරියට එකක් ගේට් එකට එකක් ෆැක්ටරිය පිටිපස්සට එකක් මගිස් එකට.. තේරුණාද..."

සසංක කියනා උපදෙස් එකින් එක රුවන් පරිස්සමින් ලියා ගත්තා. ඔහු මොනතරම් ලස්සනට මෙවා කරන්න බලාපොරොත්තු වෙනවද කියලා රුවන් ඒ තුළින් දැනගත්තා.

"මං අදම කරනවා සසා... මේ දැන් කතා කරනවා..."

"උඹ කාලද ඉන්නේ.."

එහෙම අහද්දී රුවන්ගේ පපුව උණු උනා. මේ හාත්තල පුතාලගේ තියෙන මනුස්සකම එකයි.

"කා..ම නෑ සසා.."

"ඉතින් බලපන්... උඹ හරියට උදේට කෑවෙත් නෑ... කාලා





ඉඳපන්..."

"දැන් කනවා සසා..."

"කෙල්ල ලස්සනයි නේ මචං..."

සසංක ඇහුවේ පොඩි එකෙක් වගේ...

"හ..රි ල..ස්..ස..නයි ස..සා... ඒත් ලස්සනටත් වඩා ඒ කෙල්ල හරි හොඳයි..."

"උඹට ඒක දැනුණද..."

"කතා කරපු පලවෙනි මොහොතෙම දැනුණා..."

"කාලා හිටපන්.."

සසංක දුරකතනය තබා එහෙමම ඇඳේ මොහොතකට පෙරළුනා... ඔහුගේ හිත පුරා චන්ද්‍රනාගේ රුව සමීපම රුවකින් ඇඳුණා.

"ඔයා ළඟට අසංක වෙලා එනවද සසංක වෙලා එනවද කියලා මට හිතාගන්න බෑ චන්ද්‍රනා..."

දෑස් පියාගෙන සසංක හිතුවා..

සසංක ත්‍රීවීලරයෙන් බැස පාගමනින් බස් නැවතුම කරා ඇවිද්දගෙන ආවේය. ලස්සන වාහන ගෙදර තබාගෙන තමා බස්වලින් යන දුප්පත් කොල්ලෙක් බව පෙන්වමින් මේ කෙල්ලව රවට්ටන්නට සසංකට ඇත්තටම දුකය. එහෙත් දැන්මම ඇයට ඇත්ත කිව නොහැක. පිරිසිදු දෙයක් වෙනුවෙන් බොරුවක් කිරීම පාපයක් නොවේ යැයි බුදු හාමුදුරුවෝ කියා ඇතැයි කවුදෝ කියූ කතාවක් සසංකට සිහිවිය.

ඔහු බස් නැවතුමට මදක් එහා වූ ගස් සෙවණට වී උන්නේය. දෛවය මෙසේ තමාගේ ජීවිතයේ දුප්පත් පින්සලකින් අඳින මේ චිත්‍රයට ඔහු ආසා කළේය.

ඇයට ඇත්තේ මේ කුරිරු කටුක සමාජ ගංගාවේ ගසාගෙන යන මලක් වැනි වූ ජීවිතයකි. තමාට ඇත්තේ ඒ ජීවිතය දැන පොවා ගන්නට පමණී. මඩ ගොඩකින් මලක් ගන්නද ඒ මලේ මඩ පාටත්



SIHINA

නැත. මල මලම්ය. සසංකට හිතෙන්නේ එහෙමය.

කෙල්ල ඇවිදගෙන එන්නේ ඇය ඇඳ උන් සාරියේ වට ප්‍රමාණයට සරිලන කෙටි අඩි තබමිනි. එහෙම එද්දී යුවතියකගේ උකුල මිනාවට වඩා ගැස්සෙයි. ඔහු මේ සියල්ල දෙස ඈත සිට බලාගෙනය.

ඇය ඇත්දීම සිනාසුණාය. ඔහු ඒ තරම් ලස්සන සිනාවක් කෙදිනකවත් දැක නැත. හදවත පිරිසිදු නොවූ කෙනෙකුගේ සිනහව මේ තරමම ලස්සන නැත. මොහෝ කෙල්ලන් සිනාසෙද්දී විරිත්තනවා යැයි පෙනෙන්නේ ඒකය.

"කවුරු එනකල්ද බලන් ඉන්නේ.."

ඇය ඇසුවේ ඔහුට ළං වෙන්නට අඩි දෙක තුනක් තිබියදීය.

"මේ..."

ඔහුට හදිස්සියේ බොරුවක් හදාගන්නට බැරිවිය.

"හ..රි හ..රි.. අපි දන්නවා.. ඇවිත් ගොඩක් වෙලාද..."

ඔහුට මේ තරම් ළංවෙන්නේ ඇයි කියා ඇයට හිතෙන්නේ නැත.

"ටි..ක..ක් වෙලා..."

"අද ටිකක් ඔෆිස් එකේ කලබල... ඒ නිසා තමා ටිකක් පරක්කු උනේ... තරහද..."

එහෙම ඇහෙන්නේ ඇයිද කියාවත් ඇය ඇගේ හදවතින් අහන්නේ නැත.

"ඇයි කලබල..."

"මං පස්සේ කියන්නම්... කොයි පැත්තටද යන්නේ..."

ඔහු පාරේ දෙපැත්ත දෙස බැලුවේය.

"ඔයා කියන පැත්තකට යන්..."

"එහෙම මං කියන පැත්තට යන්න එනවද..."

"ෂුවර්..."





දෙදෙනාම සිනාසුණේ සැහැල්ලුවෙනි.

"මහරගමට යන්න ඕනා කිව්වා නේද... ත්‍රීවීල් එකක් අරගෙනම යන්..."

කෙල්ල ඔහු දෙස බලා රැව්වාය.

"සල්ලි කාරයෙක්ගේ පුතෙක් වගේ කතා කරන්නේ... මෙතන ඉඳලා යන්න රුපියල් තුන්සියක් වත් යයි... මගු ටිකනේ බස් එකේ යන්..."

ඔහුට දුක හිතුනේ කෙල්ලගේ දුප්පත් කම ගැන නොවේ. ජීවිතයේ ඇත්ත අවංකව හෙළි කරන අවංක පිරිසිදු කම ගැනය.

"බස්වල සෙනඟත් එක්ක... මං ගාව සල්ලි ටිකක් තියෙනවා... අදට යන්..."

"ම්.. අදට විතරයි..."

සසංක ත්‍රීවීලරයක් නවත්වා ගත්තේය. ඔහු ඇය නගින තුරු ඉඳ හිස පහත් කර ඇය ළඟින්ම වාඩි වූයේය. ඔහු ළඟින් ආ විලවුන් සුවඳ ඇගේ හිත මොහොතකට චංචල කළේය.

"හ..රි සුවඳ යිනේ..."

"මං... ගාව..."

"ම්..."

කමිස වල නවමින් එහේ සිටියදී ගැල්වූ විලවුන් වල සුවඳ ඇත. ඒවා හොඳම තත්වයේ විලවුන්ය. ඒ නිසා අවුරුද්දක් ඇත්දද සුවඳ යන්නේ නැත.

"ඉස්සර ගාපු පර්ෆියුම් එකක්..."

"ගර්ල් ෆ්‍රෙන්ඩ්ව හම්බවෙන්න යනකොටද ගැවේ..."

කෙල්ලගේ හිතට සැකය. ඔහු සිනාසී හිම බලාගත්තේය.

"එහෙම කෙනෙක් හිටියනම් හොඳයි කියලා දැන් නම් හිතෙනවා..."



SIHINA

"ඇ..යි ඒ.."

එයට ඔහු පිළිතුරක් දුන්නේ නැත. ඇයද පිළිතුරක් බලාපොරොත්තු වූයේ නැත.

"ඇයි ඔෆිස් එකේ කලබල තිබ්බෙ.."

"අද අපේ සර් කාලෙකට පස්සේ ගොඩාක් හොඳ වැඩක් කළා.. මට නම් හරිම සතුටුයි.."

මේ කෙල්ල මෙසේ සතුටු වෙන්නේ ඇගේ හදවත පිරිසිදු නිසාය. ඇය හැර සියල්ලන්ට රුවන්ගේ පැමිණීම ප්‍රශ්නයකි. ඇය උදේ සිට සිදුවූ සියල්ල ඔහුට කීවාය.

"මං රුවන් සර්ට ඔයා ගැනත් කිව්වා... අපි හෙට කතා කරමු හොඳේ.."

"හා.."

"අවංක දේකට උදව් කරමු අසංක... අද නැතත් කවදාහරි එනකොට අපට හරියයි.."

මේ කතාවට මේ කෙල්ලට වඳින්න තරම් ආදරයක් භක්තියක් ඔහුට ඇතිවිය.

"අපි කොහොමත් මේ යන්නේ එකම පාරේ චන්ද්‍රනා.."

සසංක සැහෙන වේලාවකට පසු කීවේය.

"ම්.. ඒක මට ඔයාව ඇත්ත දවසේම හිතුණා... ඇ..යි දන්නෑ.."

"මොනාද හිතුනේ.."

එකවර ඔහු ඇසුවේය.

"වෙන දවසක කියන්නම්... ඒක නෙමෙයි අද අපි නා හෙවණට ගිහින් අයිස් ෂර්බට් බොමු.."

ඇය නුරතල් හඬින් අසද්දී ඔහු දෑස් ලොකු කරගෙන හිස වැනුවේය. මේ ජීවිතය මොන තරම් සුන්දරද...

"නා හෙවණේ අයිස් ෂර්බට් රහද.."





සසංක ඇසුවේය.

"දැ..න්..නෑ.."

ඇය කීවේ උකුලේ තිබූ හෑන්ඩ් බෑගයේ පටිය දඟරයිල්ලේ ඔතා ගනිමිනි. හීන් රන් මුදුවක් පැළඳි ඒ සුරත ඇත්තටම ලස්සන යැයි ඔහුට සිතුණි.

"එහෙනම් කොහොමද අයිස් ෂර්බට් ගැන දන්නේ.."

"යා..ළුවෙක් තමා කිව්වෙ.."

"ඉතින් නා හෙවණට ගිහින් අයිස් ෂර්බට් බොන්න තිබ්බනේ.."

"ත..නි..ය..ම ගිහින් බොන්ඩ බෑනේ.."

කෙල්ල කීවේ ඇස් පියන් බර කරගෙනය. විසකුරු ලෝකයේ ගඳ ගහන දූහුවිලිවලින් අපිරිසිදු නොවූ නිර්මල බවක් ඇගේ දෑස්වල විය.

"හො..ඳ යාළුවෙක් හම්බවෙනකල් උන්නේ.."

"ඉතින් හම්බවුනාද..."

"ම්.."

එවර නම් ඒ දෑස් ලස්සනට ඔහු දෙසට යොමුවිය... සසංකගේ හිත කිව නොහැකි ලෝබකමකින් පිරී ගියේය. මෙහෙම යද්දී හිතට එන දේවල් මෙහෙමම කියාගන්නට තිබ්බා නම් හොඳය. එහෙම වුවා නම් පසුවට මේ තරම් වදයක් නැත. එහෙත් මේ කරන රැවටීම ගැන සසංකට බයය.

"ඇයි අ..සං..ක.."

ඔහුගේ මුහුණේ වූ වෙනස දැක චන්ද්‍රනා ඇසුවාය.

"නෑ... ඔයාගේ අප්පච්චිව බලන්න ආසයි.."

"ම..ට ඉන්නේ හරි අහිංසක දුප්පත් අප්පච්චි කෙනෙක්... මේ ලෝකෙම ඉන්න අහිංසකම මනුස්සයා ම..ගේ අප්පච්චි කියලයි මට හිතෙන්..නේ.."

එහෙම කියද්දීත් ඇගේ දෑස් තෙත් ගොස් තිබුණි.



SIHINA

"අප්පච්චිත් හරි ආසාවෙන් ඉන්නේ නියාට අඳුනගන්න... මට බැණ බැණ හිටියේ යාළුවෙක්වත් ගෙදරට එක්කං එන්නෑ කියලා..."

"ඉතින් ඇත්තනේ..."

"මොකද්ද ඇත්ත..."

"හොඳ යාළුවන්ව ගෙදරට එක්කං එන්න ඕන..."

"හොඳ යාළුවන්ව ගෙදරට එක්කං එන්න ඕන... කෙ..නෙ..ක් උ..න්..නේ නෑ කියලා

"හ..රි ඉතින්.. ම..ට එ..හෙම කෙ..නෙ..ක් ඉ..න්..නේ නෑ කියලා

මං කිව්වේ... නෑමෝ..ම..ම එ..හෙම එ..ක්..කං ය..න්න බැ..නේ..."

ඇය කතා කළේ හන්තිඹන්ව්ය. මේ කෙටි ඇසුර අතරතුර ඇය කිසිම විටක මේ බැඳීම ගැන අඩු තක්සේරුවකින් කතා කර නැත. තවමත් නමක් නැති මේ ඇසුර ගැන ඇය තරමම භක්තියකින් හිතන්නට ඔහුද කැමතිය.

නා හෙවණට කෙල්ල තනියම නොගියේ ඇයිදැයි ඔහු තේරුම් ගත්තේ නා හෙවණ එළිමහන් අවන්හලට ඇතුල් වෙද්දීය. හයිලෙවල් පාර ආසන්නයේ තුරු වියනක් යට ලී බංකු ගසා තනා තිබූ ඒ අවන්හල ඇත්තටම නිස්කලංකය. හැම මේසයකම වූයේ පෙම්වතුන්ය. නැත්නම් කොල්ලන් දෙතුන් දෙනාය.

"අපි අතනට යන්..."

ඔහු කෙළවරේ අසුනක් පෙන්වා ඇගෙ එක්කාගෙන ගියේය.

"බලන්ඩ ටියුෂන් යනවයි කියලා ඇවිත් කොල්ලොත් එක්ක මෙතන..."

නා හෙවණේ උන් පෙම්වතුන් දෙතුන් පලක් දෙස බලා ඇය කීවාය.

"චන්දනා එහෙම ගියේ නෑ..."

"මම.. කොහොමද...."

"ටියුෂන් යන කාලේ..."

"එ..හෙමද මං ගැන හිතන්නේ..."

"මං එහෙම හිතුවේ නෑ..."



කෙල්ල ටික වේලාවක් ඔහු බලාගෙන උන්නාය.

"ම..ගේ ජීවිතේ ගොඩක් වෙනස් අසංක... වෙලාවකට හරි බයක් දැනෙනවා... ගොඩක් බලාපොරොත්තු නැති.. හ..රි පාළු ජීවිතයක් මං හදන් ඉන්..නේ... අප්පච්චි අරුණගම මෙහෙම වත් කතා කළේ අසංක එක්ක විතරයි..."

කෙල්ල අඬනවද කියා ඔහුට බියක් දැනුණි.

"දුක් වෙන්..න..පා.. ජීවිතේ දුක් වෙලා වැඩක් නෑ චන්දනා... අපි ටිකක් හරි සතුටින් ඉන්න බලමු... නේද... අප්පච්චිත් ආස එහෙම ඉන්න නේද..."

"ම්..."

"අර ආප්ප දැක්කහම මට කන්න හිතුණා... කමුද..."

කෙල්ලගේ හිනාව පිපී ආවේය.

"හා... මටත් ආවා සීනි සම්බෝල සුවඳක්..."

"මං අරන් එන්නම්..."

"මෙහොම ඉන්න... කිව්වම ගෙනත් දෙයි..."

ඇගේ අතක් ඔහුගේ අතක ගැටිණ.

"අද ගෙදර යද්දී රෑ වෙයි නේ..."

"බබු ටිකක් අරගෙන සුරුස් ගාලා යනවා... අප්පච්චිත් පව්නේ අසංක... දවාලට එයත් තනියමනේ..."

මේ දුප්පත් කෙල්ල ඇගේ අප්පච්චි ගැන හිතන තරම් තමා තමාගේ පියා ගැන සිතා නැති බව සසංක දනී. එහෙත් තාත්තා තමාගේත් නංගීගේත් ජීවිත වලට මොන තරම් දේවල් කළාද...

"එකපාරට කල්පනාවකට වැටෙනවා..."

"මොදෙ..."

"ම.. ප්‍රශ්නයක් හිතේ තියන් ඉන්නවා වගේ... ඇයි අසංක..."

ඔහු මෝඩ පාටට සිනාසුණේය.



SIHINA

"හිතේ දෙයක් කියන් ඉන්නකොට එහෙමයිනේ.."

"ඒකනේ.. මොනා උනත් හරි අවංකයි.. ඇත්ත කියනවා..."

කෙල්ල ඔහුට ප්‍රසංසා කළාය. "මං කරන බොරුව දන්නවනම් ඔයා මට කොහොම බණීද.. සසංක හිතුවේය...

"හිතේ තියෙන ප්‍රශ්නයක් යාළුවන්ට කියලා හිත නිදහස් කර ගන්න..."

"කි..ය..න්..න ඕ..න.."

"හැ..ම ඇත්තටම යාළුද කියලා හුවර් නෑ... නේද..."

"මටද..."

"ම්..."

"ම..ට ඇස්දෙක දිහා බලලා ඒවා කියන්න පුළුවන්..."

ඔහු එහෙම කියද්දී ඇය ඇස් පුංචි කර බිමට බර කර ගත්තාය. ඇස්වල ඇති යමක් ඔහුට පෙනේ යැයි බියෙන් මෙනි.

සුපර් මාර්කට් එකෙන් බඩු ගනිද්දී සසංක චන්දනා ළඟටම වී උන්නේය. ජීවිතයක් කුඩා වෙද්දී අහිංසක වෙද්දී එය කොතරම් සුරුලුහුටි දැයි සසංක සිතුවේය. ඔහු ආශා කළේ ඇය ජීවත්වන මේ සරල කුඩා ජීවිතයටය. ඒ ගැන හිතද්දීත් සසංකගේ හිතට මහා සැනසීමක් එයි.

ඔහු ඇගේ අතින් එළවළු මල්ල ගන්නට යද්දී ඇය එය දුන්නේ නැත. මොකක්දෝ හේතුවක් නිසා ඔහු ගැන ඇයට හිතෙන්නේ මහා බලසම්පන්න කෙනෙකු ගැන හිතෙන්නාක් බඳුවය. රන්තරු කේක් ආයතනයේ හිමිකරු බව දැන නොඋන්නද ඔහු ළඟ සිටිද්දී ඇයට මහා රැස් මාලාවක් ළඟ ඉන්නාක් වැනි හැඟීමක් දැනෙයි.

"අනේ එපා... මං ගන්නම්... කෙල්ලෝ එහෙම දැක්කොත් කියයි හරි ලස්සන කොල්ලෙක් පව් එළවළු මල්ලකුත් උස්සන් යනවා කියලා..."

ඇය එහෙම කියද්දී ඔහුට ලැජ්ජා සිතුණි.





"මොනා මස්ද කන්න ආස..."

ඇය ඇහුවේ සුපර් මාර්කට් එකේ මස් මාළු තිබූ පැත්තට යද්දීය.

"මමද..."

"ම්..."

"මං මස් මාළු කන්න වැඩිය ආස නෑ..."

"එහෙනම් මොනාද කන්න ආස..."

"කරෝල..."

පුදුමය. ජීවිත දෙකක් හාවෙද්දී මෙවැනි ගැළපීමුත් ඉබේම සිදුවෙනවාද...

"අනේ... මගෙත් ආසම... කරෝල කෑල්ලක් තියෙනව නම් පොල් සම්බෝලයක් තිබ්බත් ඇති..."

"මටත් ඇති... හරි ආසයි කරෝල බැදලා කන්න..."

"ම්... එහෙනම් ඉරිදට කරෝල තෙල්දාලත් කියන්නම්... ඒත් ඉතින් කෑමත් දෙනකොට වීතන් වුට්ටකුත් ඕ..න..නේ... නැත්නම් මට අප්පච්චිත් තනියි..."

ඇය කීවේ කුකුල් මස් කඩය අසළට යද්දීය. මේ ජීවිතය ගැන ඔහුට ඇත්තටම පුදුමය. තමා ලංකාවට ඇවිත් තවම මාස දෙකක් වත් ගත වූයේ නැත. මුළු ජීවිතයම මහා පරිවර්තනයකට ලක් වී ඇත.

එහෙත් ජීවිතයේ මේ වෙනසට සසංක ආශා කළේය. ජීවත් වෙනවා කියා හිතෙන්නේ දැන්ය.

කෙල්ල ඉරිදා තමාට දෙන්නට යන දවල් කෑම කොතරම් [illegible] දෙන්නට යනවාදැයි ඇය මේ ඔසවාගෙන යන බඩු මල්ලෙන්ම කිව හැක.

"අසංක..."

"ම්..."

"ඔය මං හිටියේ... ලො..කු කල්පනාවක..."



SHINA

ඇය කියන්නේ හුරතල් ලෙසිනි.

"සොරි... සොරි..."

"මං මෙතනින් බස් එක ගන්නවා.. ඉරිදා කීයටද එන්නේ..."

ඒ මුහුණ සෙලවෙද්දී කන පැළඳි කුඩා වසල් දෙකත් ඒ අනුව සෙලවෙයි.

"මං කීයටද එන්න ඕන..."

"ම්.. මං උදේ අටහමාර වෙද්දී උයලා ඉවරයි..."

"අනේ පාන්දර ඇහැරෙන්න වෙනවනේ..."

"එහෙමත් හොඳයි ඉඳලා හිටලා... මේ.. බඩුවක් අහන්න හිටියේ..."

"මොකක්ද..."

"මේ..."

"ඉතින් අහන්න..."

හදිස්සිය හිතටය.

"අප්පච්චී එහෙමත් ඉතින් කවුරුහරි ආවාම..."

"කියන්න ළමයෝ..."

"අර තියෙන්නේ තිත්ත කසායක්... ඔව්වා බොන්නත් හොඳ නෑ..."

ඔහු සිනාසුණේ ඒ මුහුණ මත නෙත් තබාගෙනමය.

"බියර්ද..."

"එව්වා හොඳට දන්නවා නේද... බො..න..ව..ද..."

"නොබොන්නෙමත් නෑ..."

"මං හිතුවා හොඳ ළමයෙක් වෙන්න ඇති කියලා...."

ඇය එහෙම කියන්නේ අභිනයින් නොවේ.

"එහෙනම් වෙලාසන එ..න්න හොඳේ.. මං බලන් ඉන්නවා..."





අවසන් වචන ටික ඇය කීවේ තොල් පට සොලවා නඩ නොනැගෙන ලෙසය.

කෙල්ල හැලුවේ බස් එකේ යන්නටය. ඔහු ත්‍රීවීලරයක් නතර කළේය. ඇයව මෙහෙම බස් එකේ යවන්නට ඔහුට දුකය.

"අ..නේ මං බස් එකේ යන්නම්..."

"බෑ... මේවා උස්සගෙන..."

"ඉතින්..."

"නගින්න..."

එහෙම අණ කරද්දී හිතට ආසාවක් දැනෙන්නේ ඇයි.. ඔහු ත්‍රීවීලරයෙන් ගාණ අසා ගෙව්වේය.

"සල්ලි වැඩිනම් මටත් කීයක් හරි දෙන්න අසංක මහත්තයා..."

ඇය අත පා විහිළුවට කීවාය. ඊට පසු ඇඳ කළාය.

"එ..න්..න..."

"පාන්දරම එනවා... මට කිරිබතුත් ඕන..."

ඇයව ඇස් හමුවිය. ඇගේ ඇස් තෙමී ගියේ ඉබේටමය.

ගෙදර යන ටිකේ හත් අට වතාවක් දැස් තෙත් විය. ඔහු ගැන හිතෙන හිතෙන පාරට දරුවෙක් ගැන හිතෙද්දී කිරි දෙන අම්මා කෙනෙකුගේ තනයට කිරි උනන්නාක් මෙන් පපුව බර වෙයි.

චන්දනාට එකක් හරි විශ්වාසය. ඒ පපුව මේ ලෙස බර වෙන්නට ගන්නේ එදා උදෑසනේ ඔහුගේ දෙනෙත් දුටු මොහොතේ සිටය. ඉන් පසු දෑසට මිරිස් කුඩු ඉස්සාක් මෙන් ඒ දෑසම් සොය සොයා දැවිල්ලෙන් කැවුණේය.

රහසින් රහසින් මේ හිතට ගලන්නේ මොනවාදැයි ඇය දැන උන්නාය. මේ පාළු ජීවිතයේ එහෙම කෙනෙක් ගැන හිතන්නට ලැබීමත් ඇයට පුදුමය.

"කවදාවත් කෙනෙක් ගැන හිතුනේ නැත්තේ මයා ගැනම හිතෙන්නේ හිත නොඉඳුල්ව තියා ගන්න ඕන නිසාද..." ඇය හිතන්නේ මෙවාය.



SIHINA

බඩු මලු දෙකත් ඔසවාගෙන ඒ හන්දියට පමණ ත්‍රීවීලරයෙන් කෙල්ල බහිද්දී අප්පච්චි ඇය එන තුරු පාර බලා උන්නේය. දුවගේ මුහුණේ මේ දවස්වල ගලන සිරියාව දෙස අප්පච්චි බලා උන්නේ ආසාවෙනි.

"මං වැඩිම උනොත් තව අවුරුදු තුන හතරක් ජීවත් වෙයි.. ඒකත් ෂුවර් නෑ... එයාගේ ජීවිතේට හොඳ කෙනෙක් එනවනම් හොඳයි... නැත්නම් එයාගේ අම්මත් මට හරියට දොස් කියයි... හැදුවේ එක කෙල්ලයි... ඒකිවත් අනාථ කළා කියලා අම්මා බනී..."

අප්පච්චි සිතුවේ එහෙමය. ඔහු ත්‍රීවීලරය ළඟටම දුව ගියේ දෙනෙත් වල තෙතමනයද සමඟය.

"බඩු ටිකක් ගන්න ගියා අප්පච්චී... පරක්කු උනා..."

කෙල්ල කියන්නේ සාරි පට ඉනේ ගහගෙනය.

"ගෙදර ඇවිල්ලා මාත් එක්කම යන්න තිබ්බනේ පුතේ... බඩුත් උස්සගෙන..."

අප්පච්චි එහෙම කියද්දී චන්දනාට සිහිවූයේ පොළේ බඩු ගනිද්දී ඔහු ළඟින්ම උන් අයුරුය.

"පුතා පොඩි පාටියකට බඩු ගෙනත් වගේ..."

අප්පච්චි බඩු මලු දෙකම අතට ගනිමින් කීවේය. කෙල්ල සිනාසුණේ ලැජ්ජාවෙනි.

"එ..හෙමත් නෑ අප්පච්චී... ටි..ක ටි..ක ගත්තේ... ගෙදර බඩු ගොඩක් ඉවර වෙලා තිබුනේ..."

"අපිත් ඉඳලා හිටලා පොඩි පාටියක් දාන්නෙපැයි නේද පුතේ.."

"අපේ පාටියට කවුරුත් නැතුවනේ අප්පච්චි හිටියේ..."

"දැන් එක්කෙනෙක් එනවනේ..."

අප්පච්චිගේ කතාවට කෙල්ලගේ කතා නැත. "මෙවා කතා කරන්න එයාට ඉන්න තිබ්බේ අම්මා... මාව ඉතුරු කරලා එයා ගියා.. ඒකේ අනිත් පැත්තයි වෙන්න තිබ්බේ..."





"ආ... අප්පච්චි වත්තත් සුද්ද කළාද..."

"ඔව් පුතේ... දැන් හොඳයි නේද..."

චන්දනා දොරකඩ ඉඳ කුඩා මිදුල දෙස බැලුවාය.

"ම්... දැන් හරි පින් පාටයි..."

"මං කුණු කවර ටිකත් තේරුවා..."

එවර නම් කෙල්ල අප්පච්චි දෙසට හැරී ඉනට දෑත් තබාගත්තාය.

"වැඩ කරලා වැඩිපිනේ අප්පච්චි... ඔ..යාට නෑ..ම."

"නෑ පුතේ... කාලෙකට පස්සේ අද තමා ඇඟට පණක් තියෙන්නේ... බලන් ගියාම අපි බලෙන් ලෙඩ හදාගෙන තියෙන්නේ..."

චන්දනා අප්පච්චි දෙස බැලුවේ කරුණාවෙන්ය.

"තේ බිව්වද..."

"නෑ... ඔයා එනකල් උන්නේ.."

"මං අද කූල් සරුවත් බිව්වා අප්පච්චි... තා හෙවකින්..."

"රසද..."

"ම්.. හරි රසයි..."

ගියේ කාගේ සමගදැයි අප්පච්චි ඇසුවේ නැත. කාලයක් තැවෙන් තනුවක් නොමැතිව ගලා ගිය කෙල්ලගේ ජීවිතය ලස්සනට ගලන්නේ දැන්ය.

* * * * * * * * * * * *

රුවන් සසංකගේ කාමරයටම ආවේය. සසංක උන්නේ ඇඳ මත ෆයිල් කවරයක් තබාගෙන මොනවදෝ ලියමිනි.

"එම.. ඩී.. සර් මං එන්නද..."

රුවන් ගරු සරු ඇතුව ඇසුවේය.

"ඉටි හොකා ඉඳගනින්..."



SIHINA

තාමත් ඒ සහෝදරත්වය ඉස්සර වාගේමය.

"මොනාද මිය අනේ.."

"නංගි කුල් ඩ්‍රිල් එකක් දුන්නා.."

සසංක සිනාසුණේය.

"මටත් වීකක් දීපන් මාත් සිබගෙන් හිටියේ.."

"අ..නේ.. හිටපන් මං එකක් අරන් එන්නම්..."

"ඔන්න ඕක දීපන් මං..."

රුවන්ගේ අතින් සසංක උස වීදුරුව උදුරා ගත්තේය.

"අපේ ගෙදර මට නැති සැලකිලි උඹට තියෙන්නේ..."

"මේ වගේ දේව ගෙදරකින් එහෙම සැලකීමක් තියේනම් මං මං තව තව පිං කරනවා... පිනක් නැති කෙනෙක්ට මේ ගෙදර තුන් දෙනාට ළං වෙන්න බෑ..."

සසංක ආදරයෙන් රුවන් දෙස බලා උන්නේය.

"කෙල්වව හම්බ උනාද සසා..."

"ම්... එයත් එක්ක මහරගම එළවළු ගේන්න ගියා..."

රුවන් සිනාසුණේ දුක්මුසු ලෙසිනි.

"ඒකි හරි අහිංසක කෙල්ලෙක් සසා..."

"අහිංසක කෙල්ලෙක්ගේ ජීවිතයක් එක්ක සෙල්ලම් කරන එකෙක් කියලද උඹ කියන්නේ..."

සසංක ඇසුවේ තරමක වේදනාවකිනි.

"ඒ කෙල්ල ගාව තියෙන අවංකකමටයි අහිංසකකමටයි දක්ෂකමටයි ගෙවන්න රන්තරු එකේ සල්ලි මදිවෙයි රුවන්..."

සසංක කීවේ දිග සුසුමක් හෙළමිනි. රුවන් ඇඳේ වාඩිවී ඔහුගේ උරහිසට අතක් තැබුවේය.

"මං ඉරිදා චන්ද්‍රනාලගේ ගෙදර යනවා... උඹත් එනවද..."

"උඹට පිස්සුද සසා... මං රන්තරු එකේ මැනේජර්... ඒකේ





සේල්ස් කරන උඹයි මායි අතර එහෙම සම්බන්ධයක්..."

"ම..ට ඒක අමතක උනා..."

"ළඟදීම උඹට කෙල්ල ළඟදීත් ඕක අමතක වෙයි... ටිට කලින් ඇත්ත කියපන්..."

සසංක එහෙම සිතින් තුන් හතර වතාවක් කියා බැලුවේය. ඒ හැම වරකම ඔහුට දැනුණේ පුදුමාකාර බියකි.

චන්ද්‍රනාගේ ගෙදර යද්දී අරගෙන යන්නේ මොනවාදැයි සසංක සිතුවේ සෙනසුරාදා උදේ සිටය. කෙල්ලෙකුට තෑග්ගක් තේරීම මේ තරම් අමාරු දෙයකැයි සසංක දන්නේ අදය. ඔහු පාන්දර දෙක තුනක ඇවිද්දේය. එහෙත් හිතට අල්ලන තෑග්ගක් ආවේ නැත.

සැහෙන ඇවිද බිය පත්ව ඔහු කුඩා සාප්පුවකට ඇතුල් විය. එහානදී ඔහුගේ හිතට ඇල්ලූ ප්‍රාථමික තෑග්ගක් ඇස ගැටිණ. සසංක ඒ දෙස සැහෙන වෙලාවක් බලා උන්නේය.

"මේ ලේඩීස් වොච් එක පොඩ්ඩක් බලමුද..."

එය ලා රෝස පැහැයක් ඊදී පාටින් මුසු කර තැනූ සුන්දර කාන්තා අත් ඔරලෝසුවකි.

"වැඩියම අඳින්නෙත් පින්ක් කලර් සාරිනේ... මේක හොඳට ගැළපෙවෙයි..."

හදවතේ විශේෂ කෙනෙකුට දෙන තිළිණයක තිබිය යුතු බොහෝ සුන්දර අංගයන් එහි විය. සසංක සැහෙන වෙලාවක් ඒ දෙස බලා උන්නේය.

"මේක කීයක් විතර වෙයිද..."

"පන්දාස් පන්සීයක් වෙනවා..."

අත් ඔරලෝසුවේ ලස්සනේ හැටියට ඒ ගණන වැඩි නැත. දෙවරක් නොසිතා ඔහු එය ගත්තේය.

"අප්පච්චි විතරනේ ගෙදර තව ඉන්නේ... අප්පච්චිට ෂර්ට් එකක් අරන් යනවා... ඒ..ත් සයිස් එක මං දන්නෑ..නේ... හරි සරමක්



SIHINA

ගන්නවා..."

ඔහු තනිවම කියවමින් නගරේ රෙදි සාප්පුවකට ගියේය. එහි තිබුණේ ලස්සන ෂර්ට් කරමිය. සසංක ඉන් තුනක්ම ගත්තේ තාත්තාටත් එකක් දී තමාටත් එකක් ගන්නටය. ඒවා ඒ තරම්ම ලස්සනය.

සසංක ගෙදර ආ පසුත් තුන් හතර වතාවක් ඇයට ගත් මරලෝසුව ගෙන බැලුවේය. ලස්සනම තිළිණයක් තමාට ලැබුණා යැයි ඔහුට සතුටක් දැනුණි.



SIHINA

# 15

ඉරිදා නමයට පමණ රුවන් සසංකව අත්තිඩිය හන්දියෙන් දැම්මේය. ඕනෑ තරම් කෙල්ලන් ගත හැකි නම් මිතුරා මේ දුප්පත් කෙල්ල වෙනුවෙන් පේ වෙන පේවිල්ල රුවන් අගය කළේය. ආදරයක් නම් ඒ තුළ මේ පූජනීය බව තිබිය යුතුය. භක්තිමත් නොවන ආදරවන්තයෙකුගේ හදවත තුළ අවංක බවක් ඉතිරි වන්නේ නැත.

"මං ත්‍රී වීල් එකකම එන්නම් රුවනා... උඹ පලයන්..."

"හා..මක් නැද්ද සසා..."

"මේ සැහැල්ලුවට මං ආසයි බං... හවසට සෙට් වෙමු..."

අත්තිඩිය හන්දියේ ඇවිද ගොස් ත්‍රීවිලරයකට ගොඩ වූ සසංක

දෙස රුවන් ටික වෙලාවක් බලා උන්නේය.

සසංකට චන්ද්‍රනා කියූ මග සලකුණු අනුව ගෙය සොයා ගන්නට වැඩි වෙලාවක් ගියේ නැත. ගහකොළ වලින් මායිම් වූ කුඩා ඉඩමක් කෙළවර තිබූ කුඩා නිවස දකිද්දී සසංකගේ හිතට මොනාවදෝ හැඟීමක් ඇතිවිය. පුංචි වුවත් ඒ නිවස සිරියාවන්ත යැයි ඔහුට සිතුණි.

නිවස දෙසට එන්නට ඇත්තේ එතරම් උස් නොවූ අටපෙතියා මල් පාත්ති අතරිනි. ඔහු එතකුරු විසිතිස් වතාවක් දොරකඩට එබී එබී බලා උන් කෙල්ලගේ ඇස් දෙසට ඔහු ඉඩමට ඇතුල් වෙද්දීම හසුවිය. යළිත් කාමරයට ගොස් කණ්ණාඩිය ඉදිරියේ රවුමක් කැරකුණු ඇය "මේ ඇඳුම ගෙදෙට්ට වැඩිද දන්නෑ" යැයි සිතුවාය.

ඔහු එන අයුරු කහ පැහැ ගත් අටපෙතියා මල් ගස් අතරින් ඇය දොරකඩ ඉඳගෙන රස වින්දාය. තැඹිලි පැහැගත් අත් කොට කමිසයක් ඇඳ උන් ඔහු වෙතින් ආවේ වචනයෙන් විස්තර කළ නොහැකි පුදුමාකාර හැඟීමකි.

චන්ද්‍රනාට දොරකඩට වී ඉන්නට තරම් ඉවසීමක් නැති විය. ඇය මිදුලට බැස්සේ මේ උදෑසනම පිනාමල් පොකුරක් මිදුල මත විසුරුවාගෙනය.

ඇය ඔහු ළඟට එනතෙක් මුවින් නම් කතා කළේ නැත. එහෙත් දෑස් වලින් අනන්ත දේ පිටවෙන්නට ඇත.

හැමදාම කෙල්ලව දැක්කේ සාරි ඇඳගෙන ඉන්නවිටය. අද ඇය ඇඳගෙන ඉන්නේ වෙනිම සායකුත් කහ පැහැ ගත් බ්ලවුස් එකකුත්ය. කෙල්ලගේ දඟකාර බව ඔහු හරියටම දැක්කේ අදය. ඒ ලස්සන දෙස මේ මොහොතේ නිදහසේ බැලිය නොහැක. ඔහු දුක් වූයේ ඒකටය.

"හොයාගන්න අමාරු උනාද..."

ඇගේ කම්මුල් කතා කරගන්නටත් බැරි ලෙස පිරී ඇත.

"ත්‍රීවීල් එකේ කෙනාට නම කිව්වට දන්නෑ... පස්සේ නැඩ රුව කිව්වා... එතකොට කිව්වා අා අර උදේට සාරිය ඇඳගෙන යන ලස්සන සුදු මිස්ද කියලා..."

කෙල්ලගේ පපුව හැරීගෙන ගියේය.





"අ..නේ මං..ගේ ලස්සන... එ..න්..න..."

ආරාධනාය දැසිනි. ඔහු හෙට හොඩ වූයේ ඇයත් සමඟය.

"මේ තමා අපේ දුප්පත් පැළ..."

කෙල්ල දෙනෙත් විහිදා කීවාය.

"මයාගේ පැළට හොඩ වෙච්ච ගමන් හිතට හරි සැනසීමක් ආවා..."

ඔහු කියන්නේ මවැනි කතාය.

"අප්පච්චී..."

ඇගේ අප්පච්චිව දුටු හැටියේම ඔහුගේ හිතට ආවේ ආදරයකි. ඔහු කට පුරා අප්පච්චී කියා කිව හැකි කරුණාබර මිනිස්සුයෙකි.

"අ..නේ පුතා නාම හිටගෙනනේ..."

"මේ දැන් ආපු ගමන් අප්පච්චී..."

ඔහු අප්පච්චී ළඟටම ගොස් ඔහුට වඳින්නට පහත් විය. ඔබ පපුව පත්තු වූයේ අප්පච්චිගේ පමණක් නොවේ. චන්ද්‍රනාගේද පපුව උණු විය.

"තුණුරුවන් සරණයි... ඉඳගන්න පුතේ..."

ඔහු ඇගේ අප්පච්චිට ගෙනා තෑග්ග ඔහු අතට දුන්නේ දැසින්මය.

"මං මේ අප්පච්චිටයි ගත්තේ..."

සමහර විට මේ අප්පච්චිගේ ජීවිත කාලයේම පිට කෙනෙකුගෙන් ලද ප්‍රථම තිළිණය විය යුතුය.

"අ..නේ පුතේ මට තෑගි..."

අප්පච්චිගේ අසරණ නෙත දැක චන්ද්‍රනාගේ ළය තුළ මහා ආදරයක් ඇති කළේය.

ඇයට ගෙනා තෑග්ග ඇත්තේ සාක්කුවේය. "අනේ මට මොනාත් ගෙනත් නෑ..." කෙල්ල එහෙම හිතුවේ දෑසෙන් මෙනි.

"පුතේ ඉඳගන්න... මං විනාඩියෙන් එන්නම්..."

අප්පච්චී ඔවුන්ව තනිකර කුස්සියට දිව්වේය.



SIHINA

"කරුලට් බදින්නේ අප්පච්චී.. ආසයි කියලා ඉල්ලගත්තා... ඉතින් ඇඳගත්තකෝ..."

ඔහු ඇඳගත් පසුව ඇයත් ඔහු ඇඳගත් සැටියෙම ඇඳගත්තාය.

"ඉතින්..."

ඔහුගේ දෑස් ඇගේ වත පුරා යයි. කෙල්ලට ලැජ්ජාවක් ඇතිවිය.

"එකපාරටම මට අඳුරගන්නත් බැරි උනා..."

"මා..ව..."

"මෙහෙම ඇඳලා දැකලා නෑ..නේ..."

"අද තවත් හැඩට පේන්න ඇති..."

"ඒක තමයි..."

"අසං..ක..."

තොල් පට තද කරගෙන කෙල්ල රැව්වාය.

"අප්පච්චිට සරමක් ගෙනාවේ.. මොනාහරි හිතයිද දන්නෑ..."

"ඇයි.. සරමක් ගෙනාවට මොනාද හිතන්නේ... අප්පච්චි අද රෑට අඳියි..."

"ඒකෙන්ම සරමක් මාත් ගත්තා..."

"සරමට ලස්සනට ඇති..."

චන්දනා කීවේ දෑස් නටවමිනි. "අප්පච්චිට මොනා හෝ ගෙනා ඔහු තමාට අමතක කළේ ඇයි..."

"කෝ වම් අත පෙන්නන්න..."

ඔහු කීවේය. චන්දනා වමත දිගු කළේ පුදුමයෙනි. ඒ අත දෙස ඔහු මොහොතක් බලා උන්නේය.

"ඇ..යි අසං..ක අ..ත..."

"නිකං බැලුවේ..."

"නිකං නම් නෙමේ..."





"පො..ඩි බඩුවක් ගෙනා..වා..."

"ම..ට..."

ඇය ඇසුවේ හදිස්සියෙනි.

"ම්..."

"කෝ..."

ඔහු සාක්කුවට සුරත යැව්වේ ඇය දෙස බලාගෙනය. කුඩා ඔරලෝසු පෙට්ටිය පිටතට ගනිද්දී ඇගේ ඇස් බැබළිය.

"මො..නා..ද මට ගෙනාවේ..."

එහෙම ඇසෙන්නේ ඇයි...

"මම මොනාත් ගෙනාවේ නෑ කියලා හිතුවා නේද..."

ඔහු එහෙම අහද්දී ඇගේ ඇස් තෙමී තිබේය. ඇය උන්නේ බිම බලාගෙනමය.

"ම්.. හිතු..ණා..."

"එහෙම අමතක කරනවද... පැය හතරක් ඇවිදලා ගත්ත තෑග්ගනේ... අගේ කරලා දෙන්න ඕන..."

"දැ..න් දෙන්නකෝ..."

ආදරය කළ යුත්තේ මේ කෙල්ලටම යැයි ඔහු අවසාන වරටත් සිතා ගත්තේය.

ඔහු ගෙනා කුඩා ඔරලෝසුව ඔහුගේ අත්ල මත විය. චන්දනා ටික වේලාවක් ඒ දෙස බලා උන්නාය. ජීවිත කාලයේ පිරිමියෙකුගෙන් ලැබෙන ප්‍රථම තිළිණය බාර ගන්නට පෙර යුවතියකගේ හදවතේ මේ ගැස්ම ඇති වෙයි. තමා වෙනුවෙන් ලෝකයේ ඉන්නා කෝටි සංඛ්‍යාත දෙනා අතරින් එක්කෙනෙක් දෙයක් තෝරා ගත්තා නොවේදැයි මෙවැනි මොහොතක යුවතියකට හිතෙයි.

"ම..ට..ම..ද අ..සං..ක ගෙ..නා..වේ..."

ඇගේ වචන ආවේ උගුරෙනි.

"ම..ට වෙන කාටද... ලස්සනද..."



SIHINA

දෑස් පුරා තෙතමනයක් රැඳුනේ ඇයි...

"අ..නේ හරිම ලස්සනයි.. හරිම ලස්සනයි... මං මේ ලෝකේ දැකපු ලස්සනම වොච් එක..."

කෙල්ල කියවනවා ඕනවට වඩා වැඩිය.

"ලස්සන මේක බැන්දම.. ආ.. බැඳලා බලන්න..."

ඇය මරලෝසුව ඔහුගේ අතින් ගත්තේ නැත. ඒ වෙනුවට වමත පෑවාය.

"ගෙනාපු කෙනාම ඉතින් බඳින්න..."

ඔහුත් ආසා කළේ එයටමය. සසංක ඕනවාටත් වඩා වෙලා ගෙන මරලෝසුව බැන්දාය.

"අම්මයි තාත්තයි දුන්නට පස්සේ මේ කෙනෙක් දෙයක් දුන්නමයි..."

"ඉතින්..."

"මා..ව ම..තක් උ..නා..ට..."

වැඩිපුර වචන කියන්නට ගොස් වෙන්නේ අඬන්නටය.

"හරියට මතක් වෙනවා... මේ ඔරලෝසුවේ තත්පර කටුව යන කරමටම මතක් වෙනවා..."

ඔහු සිතේ තවත් මේවා පපුවේ තියාගෙන ඉන්නට බැරි කමටය.

"ම..ට..ත්..."

හැඟීම් එක්කාසු කරගෙන හදවත නිස්කලංක කරගන්නට මොහොතක් ගත විය.

"මං අප්පච්චිට පෙන්නලා එන්නම්..."

කෙල්ල අත උඩට දමාගෙන දුවද්දී ඔහු බලා උන්නේ ආශාවෙනි. ජීවිතයේ කෙල්ලෙකුට දුන් කුළුදුල් තිළිණය හේතුවෙන් හදවතට මේ තරම් රසබර බවක් දැනේ යැයි ඔහු සිතුවේ නැත.

"අප්පච්චී... බ..ඩු..ව..ක් පෙන්නන්නද..."



කෙල්ල කට්ලට බදින අප්පච්චීගේ වටේ ඇවිදිමින් ඇසුවාය.

"මොකක්ද පුතේ..."

"මේ..."

චන්ද්‍රනා ඇගේ වමත අප්පච්චී වෙත පෑවාය. ඔහුගේ මුවේ මඳහුයේ කරුණාබර සිනාවකි.

"ම..ට ගෙනත්... හරි ලස්සනයි නේද..."

අප්පච්චී කෙල්ලගේ අත අල්ලා බැලුවේ සරමින් අත පිහදාගෙනමය.

"ඒක තමයි... හරිම ලස්සනයි..."

"එහෙනම් අප්පච්චී එන්න හොඳේ... ඔය ඇඳුමේ තෙල් ගාගන්න එපා..."

ඇය අප්පච්චිවද අද උදෙන්ම ඇන්දුවාය. උදෙන්ම නාගෙන ආ අප්පච්චිට සරමකුත් අත් කොට කමිසයකුත් මැද දුන්නේ චන්ද්‍රනාමය.

"අප්පච්චිත් කියනවා හරි ලස්සනලු..."

එකවරම චන්ද්‍රනාගේ හිතට දුකක් ඇතිවිය. ඇය එහෙමම පැමිණ සලිත් ඇටියේ ඉඳ ගත්තාය.

"අ..සං..ක..."

"ම්..."

"නාම පඩිවත් ගත්තේ නෑ... ඇයි මෙ..හෙම වියද..ම් කළේ..."

ඔහු බිම බලා ගත්තේ දෙන්නට උත්තරයක් හදාගන්නටය.

"මං ළඟ සල්ලි ටිකක් තිබුණා..."

"ඉතින් ඒකෙන් මෙහෙම..."

ඇය කියාගෙන යද්දී සසංක හිස එසවූවේය.

"සල්ලි වලින් මෙච්චර සතුටක් ගන්න පුළුවන් කියලා මං දැනං උන්නෑ..."

SIHINA

“මාත් එ..හෙ..නා..ම දෙනවා නොවේද... එදාට බනින්න බෑ..”

චන්ද්‍රා කීවේ කුඩා දැරියක මෙනි. ඇය ඔරලෝසුව ගලවන්නට ගියේ වැඩි පරිස්සමටය. ඔහු එය වැළැක්වූවේය.

“දාගෙන ඉන්න...”

“ගෙදරට...”

“ම්...”

“හා... සාරිය ඇඳලා මේක දාගන්නකල් ඉවසුමක් නෑ...”

ඒ වචන රටින් ඔහු දැක්කේ ඇගේ අව්‍යාජ හදවතේ නිහතමානී අහිංසක බවය.

“ඉ..ස්සෙල්ලම කිරිබත් කමු... අප්පච්චිට කියලා මං එළකිරිත් ගෙන්න ගත්තා... කිරිබත් කාලා එළකිරි තේ එකක් බොමු... එ..න්..න..”

ඇය කතා කළේ අතද දිගු කරමිනි. ඔහුටද ඒ අත අල්ලන්නට ගියේය. චන්ද්‍රා හැරුණේ සිනාසීගෙනමය. සුදු රෙද්දකින් වසා තිබූ කුඩා කෑම මේසය දැක ඔහුගේ පපුව උණු විය. ඇය සුදු රෙද්ද ඉවත් කළේ ඔහු මේසය ළඟටම ආ පසුය.

“මෙච්..චර ගොඩ..ක්..”

“ඉ..ද..ග..න්..න..කෝ... මෙලා තිබ්බ නම් තව හදනවා... මං බෙදන්නද...”

ඇය මුලින්ම කිරිබත් කෑලි දෙකක් බෙදුවාය. ඊට මිරිස් මාළුත් ලුණුමිරිසුත් තැබුවාය.

“මං කට්ලට් අරන් එන්නම්...”

යන්නට ගිය ඇය දෙස ඔහු බැලුවේය. චන්ද්‍රාගේ දෙපා නතර විය.

“අප්පච්චිටත් එන්න කියන්න මාත් එක්ක කන්න...”

ඔහුගේ හොඳ ඇත්තේ මෙතනය. චන්ද්‍රා සසංක දෙස බලා සිනාසුණේය.

“මං එන්න කියන්නම්...”



ගෙදරට විෂ්ණු දෙවියන් වැඩියාක් වැනි මිහිරි හැඟීමක් ඇයට දැනුණි.

අප්පච්චි උන්නේ කුස්සියේ උළුවස්සට බර වී කල්පනා කරමිනි. මොකක්දෝ සතුටක් නිසා අද ඔහුගේ සිතටද මහා සහනයක් දැනෙයි.

“ඈ..යි අප්පච්චි...”

අප්පච්චි කල්පනාබරව සිටිද්දී චන්ද්‍රා ඇසුවේ තරමක බියෙන් මෙනි.

“කෝ පුතේ අර දරුවා...”

“කෑම කන්න අප්පච්චිටත් එන්නලු...”

ඔහුගේ දෑස් දීප්තියකින් බැබලෙනවා ඇය බලා උන්නාය.

“අම්මා උන්න කාලෙට පස්සේ අද තමයි ගෙට සිරියාවක් ආවේ... ගෙදරත් එන්න එළියයි...”

තාත්තා මේ කියන්නේ මොහොතකට කලින් තමාට සිතුණ දේය.

“මා..ට..ත් හිතෙනවා තා..ත්..තේ...”

“අපි පස්සේ කතා කරමු... යන් ඒ දරුවට බඩගිනි ඇති...”

ජීවිතයේ දුටු අහිංසකම තාත්තාත් දුවත් මේ දෙන්නා යැයි සසංකට සිතුණි. ජීවිතයේ දුකත් සැපත් තනිකමත් යාළුවෝ දෙන්නෙක් මෙන් එකට ඉඳ විඳින මේ දුවත් තාත්තාත් ගැන ඔහුට දැනෙන්නේ පුදුමාකාර පැහැදීමකි.

“අද චන්ද්‍රා අප්පච්චිව කුස්සියට දාලද...”

ඔහු ඇසුවේ අප්පච්චි එද්දී උන් අසුනෙන් හිටගනිමිනි. අප්පච්චි ආදරයෙන් ඔහුව යළි අසුනේ වාඩි කරවූවේය.

“එයත් එයාගේ අම්මා වගේ තමා... එළු ගෙඩියක් වත් පුද්ද කරලා දෙන්න ඕන නෑ... හැබැයි උයද්දී ළඟට වෙලා ඔපදුප කියවන්න ඕන...”

අප්පච්චිගේ කතාවට කෙල්ල ලැජ්ජාවෙන් බිම බලාගත්තාය.

SIHINA

"ඉතින් තනියම උයන්න කම්මැලියිනේ..."

ඇගේ හඬ තුළ ඥ සොළඳ දියණියගේ නුරහල් බව මීනාවටත් වඩා ගැඹුරු නිවුණි.

"පුතේ මේ දරුවට බෙදන්නකෝ..."

වන්දනා ඔහුගේ පිඟාන ගෙන ඔහුට කිරිබතුත් මාළු ඇඹුල් සියලුත් ලුණුමිරිසුත් බෙදුවාය.

"කට්ලට් පස්සේ කමු..."

මොනා තිබ්බද ඔහු කන්නට ගත්තේ ලුණුමිරිස් සමඟය. ඇය හොරැහින් එය බලාගෙනය.

"ලු..ණු මිරිස් වලටද ආස..."

"ලුණු මිරිස් හරි රසයි..."

"එයත් හරි ආසයි එහෙම කන්න... සමහර දවස්වලට මේ මාළු මස් තියෙද්දී ලුණු මිරිසුයි කිරි හොදියි අම්මගෙන් ඉල්ලනවා..."

ඔහුගේ ඇස් දිලිසෙන්නාක් මෙන්ය. ඇගේ ඇස් ඊටත් වඩා දිලිසෙයි. හදවතක සතුටක් දඟලද්දී එය ඇසින් වසන් කරලීම අමාරුය.

"පුතා මෙහේ බෝඩ් වෙලාලු ඉන්නේ නේද..."

අප්පච්චි එහෙම අහද්දී ඔහුගේ හිත් කිරි ගැහීගෙන ගියේය. මේ අහිංසක මිනිසුන්ට වංචාවක් බොරුවක් කිරීම කොතරම් පාපයක්දැයි ඇයට සිතුණි.

"ඔ..ව් අ..ප්..ප..ච්..චි..."

"ඉතින් දරුවෝ ඔය කඩ කෑම කන්න බෑනේ..."

එවර සසංක බැලුවේ වන්දනා දෙසය. මේ කිරිබත් කන ගමන්ම ඇත්ත කතාව කියන්න ඔහුට සිතුණි.

"පුතේ ඉතින් උදේ බත් එක හදන ගමන් මේ දරුවටත් බත් එකක් ගෙනියන්න පුළුවන්නේ... උයන ටික අපි දෙන්නට වැඩියි පුතේ..."

සසංකගේ පපුව උණු විය.





"මං වන්දනා ගේන එකෙන් කටක් දෙකක් කොහොමත් කනවා අප්පච්චි..."

දෙදෙනාගේ ඇස් හමුවී යළිත් මඟ හැරුණි.

"මට ඇති පුතේ... පුතා තව කන්න... පවුබිය කාලේ අසනීපෙට කැව එක එක කෑම නිසා මට එකපාර වැඩිය කන්න බෑ..."

"අප්පච්චිට තවම අසනීප තියෙනවද වන්දනා..."

"නැත්තෙමත් නෑ... පරිස්සම් වෙන තරමට අඩුයි..."

"එයා මාව පරිස්සම් කරන්නේ මලක් වගේ... නැ..රි නම් මායි එයාව ප..රි..ස්..සම් කරන්න ඕ..න... තනියම හැම දෙයක්ම කරගන්නවා... ඒක..යි මට දුක... පුතා කන්න..."

අප්පච්චි ගියේ ඇස් බොඳ වෙද්දීය. වන්දනා ටික වේලාවක් බිම බලාගෙන උන්නේ ඇගේ දෑස්ද පැලෙන තුරුය.

"ඇ..ඩ..න්..නෙ..පා..."

සසංක මෘදු හඬින් කීවේය.

"එයා ඔහොම තමයි... මාව නොයි වෙලෙත් අඬවනවා..."

"දුවෙක්නේ... අප්පච්චිට බයයි..."

"ඇ..යි..."

"අප්පච්චිලා දුවලා හදන්නේ මල් වගේ... එයාට දුකයි ඔයා තනියම දුක් විදිනකොට..."

"මේ.. ජී..වි..තේ..ට..ම දුකක් නෑ අසං..ක.. මං හරි සැනසීමෙන් ඉ..න්..නේ..."

"දු..ක්..ක් ඇත්තටම නැ..ද්ද..."

කෙල්ලගේ දෑස් එසවිණි. එහි අවංක බවක් විය.

"ප..නු..හි..ය කාලේ ටි..ක..ක් පා..එවෙන් හි..ටි..යේ..."

ඇගේ හඬ තුළ අවාසේ බවක් විය.

"හා..ඕ..ක්.."

සසංක හිමිහිට ඇසුවේය. ඇගේ ඇස්වල දිස්නයක් සටහන් විය.

"පා..ස්..සේ ම..ට හොඳ යාළුවෙක් හ..මුබ උ..නා..නේ... ඒට_ පා..ස්සේ..."

ඇයට ගොත ගැසිණ.

"ඒ යාළුවා හැමදාම ඉඳී..."

එහෙම කියාවුණේ ඇයිදැයි සසංක වත් දන්නේ නැත. එහෙත් හදවතට හොරා දෙයක් කිව නොහැක.

"ඒ යා..ළු..කා..ම..ට මා..ත් හරි ආ..ද..රේ..යි..."

ඇය කීවේ එපමණකි.

"අ..නේ අසං..ක තව කන්නකෝ..."

"ගොඩක් කෑවනේ..."

"බෑ බෑ... තා..ව කිරිබත් කෑල්ලක්..."

"එ..හෙනම් එකක්..."

"මාළු ඇඹුල් තියල් එක්ක ගන්න... මං දර ලිපේ මාළු හැදුවේ..."

"ඒක තමා රහ..."

ඇය කිරිබත් කෑලි එකක් වෙනුවට දෙකක්ම බෙදුවාය.

"මෙච්චර කිරිබත් කාල මට නිදිමත එයි..."

ඔහු සිනාසෙමින් කීවේය.

"ඉතින් එතකොට මගේ ඇඳට වෙලා ටිකක් නිදාගෙන නාගෙන එහෙම දවල්ට කමු..."

ඇත්තටම එහෙම ජීවත් වන්නට ඇත්නම් ඒ අහිංසක ජීවිතය වෙනුවෙන් බොහෝ දේ අත් හරින්නට තමා සූදානම් යැයි ඔහුට සිතුණි.

"ම..ය..ත් කන්..න..."



"අද මගේ බඩ පිරිලා..."

"ඇයි..."

එයට පිළිතුරක් නොදී ඇය සිනාබරව ඔහු දෙස බලා උන්නාය. ඒ බැල්මෙ ඇයට කියන්නට ලැජ්ජා සිතෙන බොහෝ දේ සටහන්ව තිබුණි.

වන්දනා කුස්සියට ගොස් කෝපි එකක් හදාගෙන පුංචි කෑම මේසයටම ආවාය. ඇය පුංචි අඩු කෝප්පය ඔහුට ළං කළේ ආශාවෙනි.

"ලස්සන කෝප්පයක්..."

ඇගේ හිතට ආස දැනුණි. අද කෝපි දෙන්නට මේ අඩු කෝප්පයම තෝරා ගත්තේ ඒ කෝප්ප සෙට් එක කාලාන්තරයක් තිස්සේ තියාගෙන උන් නිසාය.

"ඇත්තටම ලස්සනයි නේද..."

"ඒකනේ... හරි... මොකක්ද කියයනවා..."

"මං මිය කෝප්ප සෙට් එක ගත්තේ ගොඩාක් දවසකට කලින්..."

"ම..."

"ඒත් පාවිච්චි කළේ නෑ... අරන් තිබ්බා... පෙට්ටියවත් කැඩුවේ නෑ..."

ඔහු පුංචි පීරිසි කෝප්පයේ දාරය වටා ඇඟිලි තුඩු ගෙන ගියේය. මුතු පැහැ ගත් පෝසිලේන් කෝප්ප වටා තීන් රිදී ඉරක් ගොස් ඇත.

"ඇ..යි ඒ..."

"ම.. ඒ..ක..ට නේ.. ඒ..ක..ක් හ..දලා දෙන්..න තරම්ම හො..ඳ කෙ..නෙ..ක්.. ආ..වේ නෑ..."

ඇස් ඇලෙයි. පපුව කැළතෙයි. සසංකගේ දෑස් පුංචි පීරිසි කෝප්පයෙන් උඩට එසවෙයි. ඔහුට පෙනෙන්නේ මේසය මත දෑත තබාගෙන ඇඟිලි සමග සෙල්ලම් කරන ඇගේ ලස්සන මුහුණය.



SIHINA

"කෝ..පි එක රහයි..."

"නිදිමත එනවා කිව්ව නිසා කෝපි හැදුවේ..."

"නිදාගනී කියලා ඔය හිතුණද..."

"එහෙකොට ඉතින් පාළුයිනේ.. දවසක ඒත් එන්න... මං ඉඳි ආප්ප හම්බන්නම්..."

"මං ආවාම කරදර..."

එහෙම කියද්දී ඇය රැව්වාය.

"එයාට කරදර ඇති.. ඒකනේ කියන්නේ..."

ඔහොම අරෝවට යන්නෙත් හිතේ ඇති ආදර කැක්කුමකටය.

"ඇත්ත කියන්න... කරදරයි නේද... වෙලාවකට වදයක් වගේ නේ..."

ඇය අසන්නේ හිස ඒ පැත්තට මේ පැත්තට ඇල කරමිනි.

"කා..ට..ද..."

"මාට..."

ඔහු බලාගෙනම ඉඳියි. යටි පතුලේ මහපටැඟිල්ලෙන් තුනී තුඩා තුඩා පොතුරක් උඩට කඩාගෙන එන්නාක් මෙනි.

"කෝපි බොන්නැ... බාගයක් ඉතුරුයි..."

ඇය දෑස් එහෙට මෙහෙට කර ඇසුවාය. කාගෙවත් දෑසකට මෙසේ හමු නොවී උන් කෙල්ලට එකවර එය දරාගත නොහැක.

"ඒ ඔයාට ඉතුරු කළේ..."

"දෙන්න..."

ඇය ඔහු බී ඉතිරි කළ කෝපි එක බීගෙන ගියේ ආශාවෙනි.

"සෙනසුරාදා හවසට ගමේ යනවද..."

"කොහෙද..."

"ගමේ ළමයෝ... මට ගමක් තියෙනවයැ... මං ඇහුවේ ඔයාගේ ගමේ... කුරුණෑගල..."

ජීවිතයට මේ තරමට අවංක වූ කෙල්ලෙකුට තවත් බොරු කරන්නේ ඇයි... ඇත්ත කියනවානම් කිව යුත්තේ මෙවැනි නිදහස් සැහැල්ලු මොහොතකය.

"හි..යේ නෑ..."

"ඇයි අසංක... ඉන්නයන්ද..."

"එ..හෙම නෑ චන්දනා..."

"ගමේ දේවල් කතා කරනවට ආස නෑ... ගෙදර එන්න තරහ වෙලාද..."

"අ..නේ නෑ..."

"මං දන්නවා... මාත් එක්ක කියන්න ආස නෑ... නේ..."

එවිට නම් ඔහුගේ දෑස් එකවිණි.

"එ..හෙම හිතන්..නෙපා... ම..යා ගැ..න එ..හෙම නෙ..මේ හිතන්නේ..."

"එ..හෙ..නම් කොහොමද..."

සසංකගේ තොල් සගල පුරා තුනී සිනහවක් පටන් විය. මේ හිතේ තියෙනා දේවල් දැන් කිව හැකි නම්...

"කියන්න තේරෙ..න්..නෑ..."

"ම..ට තේ..රු..ම් ග..න්..න කිය..ල..ද කිය..න්..නේ.. ම්..."

තොල් පට තද කරගෙන කෙල්ල ඇසුවාය.

ඇගේ නාරං බික් දෙකක් වැනි දෑස වටින්නේ තුරුල්ලේ තියාගෙන බලාගෙනම ඉන්නටය. සසංකට හිතෙන්නේ එහෙමය. එවැනි දෙනෙතකින් මහා ආශ්වාදයක් ලැබිය හැකි බව සසංක දන්නේ දැන්ය. ආදරය කරන අය මහා අඳුරු තැන්වල එකිනෙකාගේ මුහුණ දෙස බලාගෙන නිසොල්මනේම ඉන්නේ ඇයි දැයි දැන් සසංක දනී.

ඔහු මොනවාම හෝ කියතැයි ඇය බලා උන්නාය. අද වන් දවසක මේ හිතේ ඇති දෙයක් කියාගන්නට නොලැබුණොත් ඊට මීට වඩා හොඳ දවසක් නොඑන බව ඔහු දැන උන්නේය.

"එන්න... යන් සාලෙට..."

රත්නය වැඩි වී ඇත්තේ හදවතේ ඇති හුස්ම වැඩි නිසාය. දෙදෙනාම ගොස් ඉඳ ගත්තේ අඩි හතරකට වඩා පළල් තොවු මෙරූන් පාට සැටියේය. ඔහු ඉඳගත් වහාම එය අඩි බාගයක් පමණ ගිලා බැස්සේය.

"මං ගෙදර ඉන්න දවසට ඕකෙ තමයි නිදාගන්නේ... ඒකයි යට යන්නේ..."

හංසීත් එහෙමය. ගෙදර කොච්චර පුටු තිබ්බත් කෙල්ල ඉන්නේ සැටියේ ඇලවීගෙනය.

"ඉතින් සැටියට වෙලා මොනාද කරන්නේ..."

"මංද..."

"ඔව්..."

"ම්... නි..කං... ඕ..හේ කල්පනා කර කර ඉන්නවා... සමහරක් දවස් වලට එහෙමම නින්දත් ගිහින්..."

"මොනාද ඔච්චර කල්පනා කරන්නේ..."

ඇගේ තොල් පට සෙලවිණි. කට පියාගෙන හිනා වෙද්දීත් ඒ හිනාව ලස්සනය. චාම්ය.

"ඉ..ස්සර නම් එහෙම කල්පනා කරන්න දෙය..ක් තිබ්..බෙ..ම නෑ... මෙට අඳින්නේ මොනාද... ඊට උයන්නේ මොනාද... ඔච්චා තමා හිතුවේ..."

ඇගේ වචන අහිංසකය. සසංක තුළ ඒ වචන ඇති කළේ එවැනිම වූ අහිංසක හැඟීමකි.

"දැ..න්..."

ඔහු ඇසුවේ ඒ ඇස් දෙස බලාගෙනමය. කෙල්ල මුහුණ එහෙමම තිබියදී දෑස් පියන් පත් පමණක් එසෙව්වාය. ඔහු බලා උන් බැල්මෙන් ඇගේ ගත හිරිවැටීගෙන ගියේය.

"දැ..න් හ..රි..ය..ට..."



"මොනාද හරියට කි..ය..න්..නේ..."

ඔහු අසද්දී ඔහුගේ උගුරද කකියන්නට විය.

"අ..නේ ම..ට කියන්න දන්නෑ..."

ආදරයේ පුංචිම ශී සැර පහර වැද තුවාල වූ හදවතින් ඉන්නා හැම කෙල්ලෙක්ගේම හඬ එහෙමය. ගොතය.

"චන්දනා..."

ඔහු කතා කළේ බිම බලාගෙනය. ඒ තරමට හිත හැස්සී තිබුණි.

"ම්..."

"ම..ට... කි..ය..න්..න දෙ..යක් ති..යෙ..න..වා..."

සසංක කියද්දී සජ්න කතාව කඳු වැටියම ඇගේ ඔළුවට කඩා වැටුණාක් මෙන් විය. මුළු ලෝකයම එකවර නතර වූ බවක් ඇයට දැනුණි.

"ම..ට..ද කියන්න ති..යෙ..න්..නේ..."

"ඔ..ව්..."

"ඉ..කි..න් ඇයි කි..ය..න්..නේ නැ..ත්..තේ..."

තමාට ඇඬෙන්නට එන්නේ ඇයි දැයි චන්දනා සිතුවාය. වචන උඩට එන්නේ ඒ තරමම බරවය. කැඩී කැඩීය.

"කො..හොම කියන්..නද කියලා තේරෙ..න්නෑ..."

"කා..ට..වත් මීට කලින් නොකියපු දෙයක්ද..."

"ඔ..ව්... කාටවත් නොකියපු දෙය..ක්..."

අවට පරිසරයම නිහඬ බවක ගිලී තිබුණි. දෙදෙනාටම ඇසුනේ උඩ ඇති පංකාවේ කැරකෙන හඬ පමණි.

සැටියේ වැටී තිබූ ඇගේ දකුණත දෙස ඔහු මොහොතකට බැලුවේය. ඉතාම අහිංසක යුවතියකගේ දයාබර අතක් ඔහු දැක්කේය. පැටලෙනවා නම් පැටලිය යුත්තේ එවැනි අහිංසක අතක් සමගය. ජීවිත කාලයටම ඒ ඇතිය.

සසංක ඔහුගේ වමතින් ඇගේ දකුණත අල්ලා ගත්තේය. බල



SHINA

සම්පන්න කෙනකු සේ අත අල්ලා ගත් බවක් ඇයට දැනුණි.

"මේ... අත... කා..ට හරි දීලා කි..යෙ..නා..ව..ද..."

පපුව තැවීගෙන උඩට එන්නාක් මෙන් ඇයට දැනුණි. ඇය දෑස් මෙන්ම තොල් පටද මිරිකා ගත්තාය.

"ඔ..ව්..."

ඇය උගුරින් මෙන් කීවාය. සසංකගේ හිත ගැස්සීගෙන ගියේය.

"කා..ට..ද..."

වන්දනාගේ දෑස් වලින් මදටිය ඇටයක් තරම් කඳුළක් වැටිණි.

"දැ..න්... ම..ගේ... අ..ත අ..ල්ලා..ගෙන... ඉ..න්..න... කෙ..නා..ට..."

කෙල්ල කීවේ අඬමිනි. ඒත් සමගම ඇගේ අත අල්ලාගෙන උන් ඔහුගේ සුරත තද විය.

"ම..ට... දැ..න්..නා..."

"ම්..."

"ග..න්..න..ම ග..න්..න දෙ..න..ව..ද..."

"ඔ..ව්... ඔ..යාට තමයි ආ..ත්ම ගානකට ග..න්..න..."

දැන් අලුත් කඳුළු පාරවල් හත අටක්ම ඒ මුහුණේ ඇඳී ඇත.

"ම..ට එක ආත්මයක් මදි..."

"එ..ක..නේ කිව්වේ ඉස්සෙල්ලත් කැ..මති ආත්ම ගානකට ග..න්..න..යි කියලා..."

"ම..ගේ ළ..ඟ..ට එ..න්..න..."

වන්දනා ඔහු ළඟට ආවේ නැත. ඇය සැටියෙන් නැගිට ඔහුගේ දෙපා පාමුල කඳුළු පිරි දෙනෙතින් දණ ගසා ගත්තේය. ඔහුගේ දණට ඇගේ කම්මුල් වැසෙන්නට විය. ඔහුගේ ඇඟිලි කරු අතරින් ඇගේ කඳුළු ගලා යන්නට විය.

"මං අ..ද..ම ම..ගේ පුංචි නෝනව අප්පච්චිගෙන් ඉ..ල්ලි ගන්..නද..."



තොල් පට සපාගෙන ඇය බලාගෙනම උන්නාය.

"මේ... දුප්ප..ත් කෙ..ල්ලව එ..ච්චර..ටම ව..ටි..නා..ව..ද..."

"ම..ට ත..ර..ම් කාටවත් වටින්..නේ නෑ..."

වන්දනා ඔහුගේ දෑත් අල්ලාගෙන දෑස් පිස ගත්තාය.

"මං... කො..ච්..ච..ර වාසනාවන්තද..."

"මායි වාසනාවන්ත..."

ඔහු කීවේය. මේ සතුට කොහොම පලුවේ කියාගන්න දැයි ඇය සිතුවාය.

"මං... ව..ගේ ම..හ..න්..තයක් හො..ද..ද දන්නෑ..."

ඔහු ඇසුවේ ඇගේ හිස පිරිමදිමිනි. යළිත් ඇගේ ඇස්වල කඳුළු පිරුණි.

"මේ... ව..ගේ ම..හ..න්..ත..යෙක් ලෝකේ වෙ..න කා..ට..ව..ත් ලැ..බෙ..න්..නෑ..."

ඔහුගේ අත මිඳුව සිඹිමින් ඇය කීවාය.

ඇය අද මේ තරම් බැතිබරව ආදරය කරන්නේ තමා රන්තරු කේක් සමාගමේ අනාගත හිමිකරු බව නොදැනය. මේ ආදරය ඔහුට වටින්නේ ඒකය. ඇය ආදරය කළේ පුංචි පේල්ස් රස්සාවක් කරන දුප්පත් අසංකටය. රන්තරු කේක් ආයතනයේ සසංක මුදන්කොටුවට නොවේ.

"ම..ට හි..තෙ..න දෙ..ය..ක් මං කි..ය..න්..න..ද..."

වන්දනා ඔහුගේ මුහුණ දෙස බලාගෙනම ඇසුවාය. ඔහු උන්නේ තවමත් ඒ මුහුණ රස විඳිමිනි.

"කියන්..න..."

"ම..ට හි..තෙ..නවා ඔ..යා ඇත්ත කෙනෙක් නෙ..මේ කියලත්..."

සසංකගේ ඇතුළත දැවී ගියේය. ආදරය කරන කෙනෙකුට ඇරෙන්නට ලොව අන් කෙනෙකුට මේ වාගේ ඉවක් එන්නේ නැත.

"මං... ඇ..ත්..ත කෙ..නෙක්නේ බබා..."

SIHINA

"නෑ.. ජීවිතේ ගොඩාක් තනිවෙච්ච මේ දුප්පත් කෙල්ල ගැන දුක හිතිලා දෙයියෝ කෙනෙක් එවලා.. මට හිතෙන්නේ එහෙමයි..."

"ඇ..යි එ..හෙ..ම කිය..න්..නේ.."

"ම..යා.. අ..ස..ං..ක නෙ..මේ.."

ගල් බෝරයක් පපුව ඇතුළෙ පුපුරන්නාක් මෙන් ඔහුට දැනුණි. තමා සසංක මුදුන්කොටුව බව ඇය දන්නේ නැත. එහෙත් ඇය තමා අසංක නොවන බව මේ තරම් විශ්වාසයෙන් කියන්නේ ඇයි...

"ම..ගේ හිතට මහ මොකක්ද දැනෙනවා... හ..රි..යට අර දේවාලෙකට ඇතුල් උනාම එන හැඟීම වගේ.. මං ළඟ... මං ළඟ හ..රි බලගතු කෙනෙක් ඉන්නවා වගේ.."

ඔහුගේ පුරන ඇගේ හිස් මුදුන මතට ආවේය. මියගිය අම්මාට පසුව තමාට මේ ලෝකයේ වඩාත්ම ගැඹුරින් තේරුම් ගත් ගැහැණිය දැන් තමාගේ දෙපතුළ ළඟ ඉන්නා බව ඔහුට ඉවෙන් මෙන් දැනෙයි.

"මං ක..වු..රු උ..න..ත් ම..ට ආ..දරෙයි නේ..ද..."

"ම.. දෙයියන්ගෙන් ජීවිතේට මොනා හරි ඉල්ලුවා... ඒ..ත් ම..ට මො..නා..ත් දු..න්..නෑ.. දෙයක් දෙන්න මෙ..ච..ර කල් ගත්තේ දෙන්න තියෙන හොඳම දේ දෙන්න ඕන නිසා වෙන්න ඇතිනේ... දැන් දෙ..යියෝ ඇවිත් ඉල්ලුවත් මං.. ම..ගේ ම..හ..ත්..යට දෙ..න්..නෑ..."

ඔහුගේ ඇඟිලි තුඩු අග ඇගේ වටකුරු කඳුළු තැවරෙයි. අප්පච්චී එන හඬ ඇසී ඇය ඔහුගේ දෙපා පාමුලින් නැගිට්ටාය. එසේ නැගිටිද්දී ඇය ඔහුගේ දණ මඬල මහා ආදරයකින් දෙතොල් පට තද කර සිපාගත්තාය.

"මං.. අ..ප්..ප..ච්..චිට කිය..න..වා..."

ඔහු කීවේය. ඔහුගේ විවෘත හදවත ගැන ඇයට ආඩම්බරයක් දැනුණි. හැම පිරිමියෙක්ම එහෙම නැත.

"ම..ගේ ජීවිතේ ඉ..න්නේ අප්පච්චි විතරයි... ම..ටත් එයාට බොරුවක් කරන්න බෑ..."



"කරන්නත් එපා.."

දෙන්නා අතර යමක් සිදුවෙන බව අප්පච්චිට දැන් දවස් තුන හතරක සිටම දැනෙමින් තිබුණි. ඔහු උදේ මුදු පහන තියා පැතුවේත් කෙල්ලගේ ජීවිතයට හොඳක්ම කරන්න කියාය. තාත්තා කෙනෙකුට දුවෙක්ගේ ජීවිතය හැමදාම බලා ගත නොහැක. ඊටත් දැන් කෙල්ලට සිදු වී ඇත්තේ ලෙඩ ගාණට වැටුණු තමාව බලා ගන්නටය.

"පුතාට තේ දුන්නෑ නැතිද.."

අප්පච්චි සාලයට ඇතුල් වූයේම එහෙම අසාගෙනය.

"මං මේ හ..දන්න හැ..දිටවේ අ..ප්පච්චී.. මං හදන් එන්නම්.."

චන්දනා ඔහුවත් අප්පච්චිවත් සාලයේ තනිකර කුස්සියට ගියාය. ඒ යද්දී ඇය කාමරයට දුව ගොස් එහි වූ කැඩපතින් ඇගේ රූප දෙකම බලා උන්නාය. "ඔයා මේ දුප්පත් කෙල්ලටනේ රත්තරන් ආදරේ කළේ... ඔයා කොච්චර හොඳ කෙනෙක් වෙන්න ඇත්ද..." චන්දනා ඇගේම රුව දෙස බලාගෙන මිමිණුවාය.

# 16

**සසංක** හිතේ තියෙනා දේ කියාගන්නට බැරුව සැහෙන වේලාවක් අප්පච්චි සමඟ වල්පල් දෙඩුවේය. දුවෙක් ගැන තාත්තා කෙනෙක් සමඟ කතා කිරීම මේ තරම් අමාරු දෙයකැයි ඔහු දැන උන්නේ නැත.

"අප්පච්චි ම..ම... අප්පච්චි එක්ක කතා කරන්නමයි උන්නේ..."

ඔහුගේ ඇස්වල පිච්චුරු පාටක් අප්පච්චි දැක්කේය. කිලිටි නොවූ පිරිසිදු පාටක් ඔහු ඒ දෑස් වලින් දැක්කේය.

"මො..කක්ද පු..තේ..."

"මං අ..ප්පච්චි මේ.. වන්දනා ගැන කතා කරන්න උන්නේ..."

ඔහු මේ තරම් ඉක්මනට දුව ගැන කතා කරතැයි අප්පච්චි



හිතුවේ නැත.

"මං අප්පච්චි වන්දනාව බඳින්න කැ..ම..ති..යි..."

අප්පච්චිගේ දෑස් තෙමීගෙන ගියේය. නැවතුම මේ බව පසුව දැවේ ඇය ගැන හිතමිනි.

"ඇ..යි අ..ප්පච්..චි..."

"මං.. දන්නවා පු..තේ.. එයා ඇවිත් මයා ගැන කියද්දීම මං දන්නවා... ඔයා පිරිමි ළමයෙක් ගැන මං..ට ඇවිත් කිව්වමයි... එයා කියනකොටම මං දන්නවා එයා..."

අප්පච්චිගේ හඬ බිඳුණි. ඔහු තම දුවට කොතරම් ආදරය කරනවාදැයි සසංක ඒ දෑස් වල තෙතමනයෙන්ම තේරුම් ගත්තේය.

"අ..ම්..මා කෙනෙක් නැති මේ ගෙදර මගේ කෙල්ල තනිවෙලා හිටියේ පුතේ... එයාට කියන්න යාලුවෙක් වත් නෑ... මාවත් බලාගෙන එයා හරි පාළු ජීවිතයක් ගත කළේ..."

"මං දන්නවා අප්පච්චි..."

"මං පුතා ගැන මොනවත් දැ..න්නෑ... ඒත්... මයා මේ ගෙදරට අඩිය තියද්දීම ම..ගේ හිතට මහ අමුත්තක් දැනුණා... හ..රියට ම..ගේ පුතෙක් ආවා ව..ගේ..."

"අප්පච්චි එයා ගැන දුක් වෙන්නෙපා... මං එයාව බලාගන්නවා..."

ඔහු කීවේ පොඩි දරුවෙකු සේය.

"අ..පේ ජීවිතේ හරියට කරදර තිබ්බා පු..තේ... ඒ නිසා එයාට දෙයක් ඉතුරු කරන්නවත්..."

"එපා අප්පච්චි... එහෙම කියන්නෙපා... එයා වගේ ගුණයහපත් කෙල්ලෙක් හදලා තිබ්බ එකම ඇති..."

අප්පච්චි දෑස් පියාගත්තේ සැනසීමෙනි. කාලාන්තරයක් තිස්සේ පපුව පුරා තිබූ බරක් නිදහස් වූවාක් වැනි හැඟීමක් ඔහුට දැනුණි.

"මට අප්පච්චිට කියන්න තව දෙයක් තියෙනවා... ඒක මං අප්පච්චිට විතරයි කියන්නේ.. චන්දනාට වත් මං ඒක කිව්වේ නෑ... ඒත් මේක අප්පච්චිට නොකියා හිටියොත් මම අප්පච්චිට බොරුවක් කළා වෙනවා..."

"මො..ක..ක්..ද පුතේ.."

"අප්පච්චි මට පොරොන්දු වෙන්න මේ දේ මම චන්දනාට කියනකල් අප්පච්චි කියන්නෑ කියලා..."

"පොරොන්දු වෙන්නම් පුතේ..."

ඔහු ඉඳගෙන උන් පුටුවෙන් නැගිට දොරකඩට ගියේය. අප්පච්චිද ඒ අනුව ඔහු පසුපස ගියේය.

මේ අහිංසක තාත්තාට බොරුවක් කරන්නට ඔහුගේ හිත ඉඩ දුන්නේ නැත. මේ රහස ඇයට නොකීවද අප්පච්චිට වත් කිව යුතුය. සසංක සිතුවේ එහෙමය.

"අප්පච්චි... චන්දනා වැඩ කරන රන්තරු කේක් ෆැක්ටරියේ අයිතිකාර මහත්තයව දැකලා තියෙනවද..."

"මේ අ..පේ මුදුන්කොටුව මහත්තයාව..."

"ඔ..ව්..."

"අ..නේ ඔව් පුතේ.. ඒ මහත්තයා දෙයියෙක් වගේ කෙනෙක් කියලා අපේ කෙල්ල නිතරම කියන්නේ... ඔෆිස් එකේ හරියට කරදර තියෙනවා... ඒත් කෙල්ල තාමත් ඒ රස්සාවට යන්නේ මුදුන්කොටුව මහත්තයා නිසා... දුව කියන්නේ සමහර දවස්වලට වැඩ කර කර ඉද්දී ඇවිත් ඔළුව අතගානවලු... එතකොට හිතන්නේ අප්පච්චි කියලලු..."

"ඒ කේක් ෆැක්ටරියේ අවංක සේවිකාවකට ඉන්නේ චන්දනා විතරයි... මුදුන්කොටුව මහත්තයත් ඒක දන්නවා..."

ඔහු කියන්නට යන්නේ කුමක්දැයි අප්පච්චිට තේරෙන්නේ නැත.



"අප්පච්චි මුදුන්කොටුව මහත්තයාගේ පුතාව දැකලා තියෙනවද..."

"න්..නෑ... පු..තේ ඇ..යි..."

ඔහු අප්පච්චි දෙස බලා අහිංසකව සිනාසුණේය.

"දැ..වසක් අප්පච්චි මුදුන්කොටුව මහත්තයාගේ පුතා රට ඉඳන් ආවා... ඒ ආවාම මුදුන්කොටුව මහත්තයා පුතාට කිව්වා දැන් රන්තරු කේක් එකේ වැඩ බාර ගන්න කියලා... මුදුන්කොටුව මහත්තයා ෆැක්ටරියේ වැඩ කරලා එච්චරටම මහන්සි වෙලා උන්නේ..."

"ඉ..තින්..."

"ෆැක්ටරියේ ඉන්න කවුරුවත් රන්තරු කේක් එකේ අයිති මුදුන්කොටුව මහත්තයාගේ පුතාව දැකලා තිබ්බේ නෑ... මොකද පුතා ඉගෙන ගන්න රට ගියේ අවුරුදු පහළොවෙන් විතර... එතකොට විසි පහක් විතර ඇති..."

"හා..."

"ඉතින් ඒ පුතා දවසක් කාටවත් නොකියා ෆැක්ටරියට ආවා... උදේ හතට විතර... ඒ එද්දී මුළු ෆැක්ටරියටම ඇවිත් උන්නේ එක කෙල්ලයි... ඒ චන්දනා විතරයි..."

සසංක පුදුමාකාර ළෙන්ගතුකමකින් අප්පච්චිගේ උරහිසට සුරත තැබුවේය.

"එදා මුදුන්කොටුව මහත්තයාගේ පුතා මේ ලෝකේ ඉන්න අහිංසකම ගුණ යහපත්ම කෙල්ලව දැකගත්තා.. ඒ අප්පච්චිගේ දුප්පත් කෙල්ල..."

අප්පච්චිට කිසිවක් හිතාගන්නට බැරි විය. ඔහු සසංක දෙස බලාගත්වනම බලා උන්නේය.

"මං අ..ප්..ප..ච්..චි මුදුන්කොටුව මහත්තයාගේ පුතා... සසංක මුදුන්කොටුව... අසංක නෙමේ..."

අප්පච්චිට වෙව්ලන්නට විය. තමා මේ දකින්නේ හීනයක් ද

SIHINA

කියා මනු හිරිවැටී ගිය සිතින් සිතුවේය.

"අ..නේ පු..තා.. ම..හ..ත්..ත..යා.."

"එයා අප්පච්චී.. මගේ අප්පච්චී එහෙම කියන්නෙපා.. මං මේක කියන්න කලින් මට හරි ආදරෙන් පුතා කියලා කතා කළේ.. ඒ වගේම කතා කරන්න.."

"අ..නේ දෙ..යි..ය..නේ.. ම..මගේ කෙ..ල්ල..ට.."

"නෑ අප්පච්චී.. ඔයාගේ කෙල්ල ගැන හිතෙනවත් බයක් හිතන්නෙපා.. ඔයා දන්නවද.. එයා දන්නෑ මං සසංක මුදුන්කොටුව කියලා.. එයා හිතන්නේ මං රන්තරු එකේ සේල්ස් කරන පොඩි මිනිහෙක් කියලා.. ඒත් දන්නවද අප්පච්චී අද ඔයාගේ දුව මගේ මේ කකුල් දෙක ඉඹිමා.. ම..ට මගේ අම්මව මතක් උනා අප්පච්චී.. එයා නැතිවෙලා ගොඩක් කල්.. මම හිතින් මගේ අම්මා මං ගාවට ඇවිත් කියලා.."

අප්පච්චීගේ දෑස් වලින් කඳුළු කඩා හැලෙන්නට විය.

"අප්පච්චීගේ දුප්පත් කෙල්ල මගේ නෝනම තමයි අප්පච්චී.. ඒක කවදාවත් වෙනස් වෙන්නේ නෑ.. එයාට අද මේක නොකියන්නේ අප්පච්චී කෙල්ලව රවට්ටන්න හිතන් නෙමේ.. මාත් අහිංසක කොල්ලෙක් අප්පච්චී.. ම..ට..ත් ආදරේ කරන්න ආසයි.."

අප්පච්චී මනුගේ දෑතින්ම අල්ලා ගත්තේය.

"මේ ගෙදරට පුතා ගොඩවෙද්දී ඔයා කවුද කියලා අහන් උන්නෑ පුතේ.. ඒත් ම..ට ඇහුණ දෙයක් තියෙනවා.. ඒක දැන් පුතා කිව්ව කතාවෙන් ඔප්පු වුණා.. කෙල්ල කියන්නේ ඇත්ත.. එයාව බලාගන්න දෙයියෙක් එවලා.."

"අපි මේක හිමිහිට කෙල්ලට කියමු අප්පච්චී.."

"පුතාගේ කැමැත්තක්.."





"මාව අප්පච්චීට විශ්වාසයි නේද.."

අප්පච්චී මනුගේ හිස අතගෑවේ ආදරයෙනි.

"මං ම..ගේ බෑනට ආදරේ කරනවා විතරක් නෙමේ පුතේ.. ගරුත් කරනවා.."

තේ රැගෙන ආ චන්දනා ඔවුන් දෙදෙනා දෙස බලා උන්නේ පුදුමයෙනි.

තමා සසංක මුදුන්කොටුව බව චන්දනාගේ අප්පච්චීට කියූ පසු මනුට පුදුමාකාර සැනසීමක් දැනුණි. සසංකට මනුගේ ජීවිතයේ බොරුවක් කර පුරුදු නැත. ඒත් වඩා මේ ජීවිතයෙහි මුළු හදවතින්ම කළ ආදරයට බොරුවක් කරන්නට මනුගේ හදවත මනුට ඉඩ දෙන්නේ නැත.

අද නැතත් කවදා හෝ මේ ඇත්ත ඇයට කිව යුතුය.. එදාට කෙල්ල බය වන බව මනු දනී. කෙල්ල මේ ආදරය කළේ කුළුදුලේම බව සසංක දනී.. කුළුදුල් ආදරය පිදුවේ රන්තරු ජෙම් ආයතනයේ අනාගත හිමිකරුට බව දැනගත් විට කෙල්ලගේ පපුව මොහොතකට ගැස්සෙනු ඇත.

හවස පන්සල් යන්නට එන්න යැයි චන්දනා සසංකට කීවේ දවල් ගෙදරින් යද්දිය. ගෙදරින් යද්දී කෙල්ලගේ ඇස්වල කඳුළු පවා විය. ඇය ඇගේ කාමරයේ සිමෙන්ති පොළොවේ දණ ඔබා මනුට වැන්දාය.

"අ..දි..න් පස්සේ මං ජී..වි..ත් වෙ..න්..නේ.. ඔයා වෙනු..වෙ..න්.. මං ජී..වි..තේ ගැන ගොඩ..ක් දැ..න්..න කෙල්ලෙක් නෙමේ.. වරදක් උනොත් හ..රි ම..ට සමාවෙන්න.. ම..ට කියලා දෙ..න්..න.. ඔ..යා වෙනු..වෙන් ම..ට කරන්..න බැ..රි පරිත්‍යාග..යක් නෑ.."

ඇය මේ ටික කීවේ අඬමින් මෙනි. ඔහු ඇයව පපුවට තබා ගත්තේ හිස අතගාය.

"මේ ජීවිතේ කවදාවත් ඔයා අතින් මට වරදක් වෙන්නෑ.. ම..ට ඒක හරි විශ්වාසයි.. මේ අත් දෙකින් මගේ ජීවිතේම ලස්සන වෙයි.."



SIHINA

ඔහු කියද්දී ඇගේ ඇස් වලින් කඳුළු කඩා වැටිණ. ඔහු ඒ කඳුළු ඇගේ මුහුණින් ඉවත් කළේ මහපටැඟිල්ලෙන් මුහුණ අතගාය.

"හ..ට..සට මා එක්ක බු..ට..ටකට ළඟ පන්සලකට ගිහින් එන්න ය..න් හො..ඳේ.."

ආදරයක් ඒ තරම් මින්මරව පටන් ගන්නා ගැහැණියක් සමඟ පටන් ගන්නා ජීවිතය කොතරම් ලස්සන විය හැකිද...

"මං එන්නම්..."

"ම්... පරිස්සමින් යන්න හොඳේ... ම..ට ඉ..න්..නේ ඔයා වි..තරයි.."

අවසන් වතාවට ඇය කියූ පද සසංකගේ හදවතේ තවමත් දෝංකාර දෙයි. කවදා හෝ දවසක ඒ දුප්පත් කෙල්ලව මේ නිවසට කැන්දාගෙන ආ දවසට ජීවිතය මීටත් වඩා ලස්සන වන බව ඔහු දැන උන්නේය. තාත්තා ඔහුගේ හොඳම සේවිකාව තම ලේලිය කරගන්නට කැමති වේදැයි ඔහු දන්නේ නැත. ඔහු එහෙම විරුද්ධ වෙනවා නම් විරුද්ධ වන්නේ කෙල්ලගේ දුප්පත්කම දෙස බලාය. සසංක දන්නා විදිහට තාත්තා යනු එසේ මුදලින් මිනිසුන්ව මනිනා කෙනෙකු නොවේ.

සසංක සරල වෙනිම් කලිසමට උඩින් සුදු ටී ෂර්ට් එකක් දමාගෙන පහළට බැස්සේ හවස පහට විතරය. සැටියේ එහෙමම වැටී නිදා උන් නංගිව දකිද්දී ඔහුගේ ළය මෙළෙක් වී ගෙන ගියේය.

සසංක පුටුවක් ඇදගෙන සැටිය අසළම ඉඳගත්තේය. මුහුණ පැත්තකට හරවාගෙන ඇය උන්නේ හුරතල් ලෙසිනි. අම්මාත් නැති මේ ගෙදර මේ කෙල්ල තනියම කොහොම ඉන්නට ඇත්දැයි සසංක සිතුවේය. ඔහුට වන්දනාව සිහිවිය. ඇයත් අම්මා නැතිව ජීවත් වූ කෙල්ලෙකි.

"පිඞ්..."

ඔහු කතා කළේ ආදරයෙනි.

"ම්... ආ.. අ..යියේ.."

"ඇයි බබා මෙතන නිදි..."



"ෆිල්ම් එකක් බල බල හිටියා එහෙමම නින්ද ගිහින්... අ..යියා මේ.. ගමනක් යන්නද..."

"ඔව්..."

නංගී දෙස බලා සිටිද්දී සසංකගේ සිතට තුනී දුකක් දැනුණි. ඇය ජීවත් වන්නේ මහා පාළුවකින් යැයි ඔහුට සිතුණි.

"හෙට යන් දෙන්නත් එක්ක කොහේ හරි... කොහෙද යන්න ආස..."

"මාව එක්කන්ද යන්නේ..."

"ඔ..ව්..."

"කොහේ හරි කමක් නෑ... මටත් පාළුයි..."

"අද මං... මේ යන්නම ඕන ගමනක්... නැත්නම් අද එක්කන් යනවා..."

කෙල්ලගේ මුහුණ පුරා තුනී මඳහසක් ඇඳුණි.

"කෙල්ලව බලන්නද යන්නේ..."

"පුඩු එහෙමද හිතන්නේ..."

"මා..ත් හරි ආසයි මගේ නෑනව බලාගන්න... එක්කන් එනවකෝ ඉන්න කෙනෙක්ව... ගෙදරට..."

"හරි දු..ප්..ප..ත් කෙ..ල්ලෙක් උ..නො..ත්.. දු..ප්පත්ම කෙල්ලෙක් උනොත්..."

"ම..ගේ නෑනද..."

"ම්..."

ඇය සසංක දෙස බලාගත්වනම බලා උන්නාය.

"දුප්පත් උනත් කමක් නෑ අහිංසක කෙල්ලෙක් නම්... මයාටයි මටයි තාත්තටයි ගොඩක් ආදරේ කෙල්ලෙක්..."

"එ..යා ගොඩක් ආදරේ වෙයි..."

"අ..නේ ම..යා..ට ඇත්තටම ගර්ල් කෙනෙක් ඉන්නවද අයියේ.."

සසංක සිනාසුණා පමණි.

"මං ඔයත් එක්ක තරහම නැහැයි.. ඇ..යි ම..ට කිව්වේ නැත්තේ.."

"ඉක්මනට කියනවා.."

ඔහු යන්නට නැගිට්ටේය. එහෙත් ඇය සසංකගේ අතකින් අල්ලා ගත්තාය.

"නංගීගේ සුබ පැතුම් එපාද..."

කෙල්ල නිදා උන් සැටියෙන් නැගිට විත් ඔහුව වැළඳ ගත්තාය.

"ඔයාගේ ජීවිතේට හොඳක්ම වෙන්න ඕන... මං එච්චරයි පතන්නේ..."

සසංක නැගණියගේ හිස අතගෑවේ ආදරයෙනි. ඔහුගේ පපුවට විශාල සහනයක් දැනුණි. ඇයව හැකි තරම් ඉක්මනට මේ ගෙදරට එක්කාගෙන එන්නට ඇත්නම් යැයි සසංකට පසුව සිතුණි.

සඳුදා වන්දනා කාර්යාලයට යන්නට ඇඳ ගත්තේ ආශාවෙනි. ඇය දම් පැහැගත් සාරිය ඇඳ ඔහු එදා තිළිණ කළ කුඩා අත් ඔරලෝසුව අතට ගත්තේ ලෝභකමිනි. ජීවිතයේ ලද මුල්ම තිළිණය මෙසේ අල්ල පනල්ලේ දාන්නද ඇයට ලෝභය. එහෙත් අද කාර්යාලයේදී ඔහු හමුවූ විටම බලන්නේ තම අත දෙස බව ඇය දනී. "හොඳාගෙන හිටියොත් එයාට දුක හිතෙයි..." ඇය තනිවම සිතුවාය.

වන්දනා කාර්යාලයට යන්නට ඇඳගනිද්දී අප්පච්චි සාලයේ සිට බලා උන්නේ ආදරයෙනි. කෙල්ල ආදරය කරන්නේ ඇය සේවය කරන ආයතනයේ අනාගත හිමිකරුට බව ඇය දන්නේ නැත. එදා ඔහු ඒ ටික තමාට කියා ගිය එක කොතරම් හොඳදැයි අප්පච්චිට වැටහෙන්නේ දැන්ය. ඔහු කලාතුරකින් හමුවන කෙනෙක් බව අප්පච්චි දැන උන්නේය. "අප්පච්චි වන්දනා ගැන හිතන්නෙපා... ජීවිතේ ඉතුරු කාලෙ මං එයාව ආදරෙන් බලා ගන්නම්..." ඔහු කියූ ඒ වචන සිහිවෙද්දී තවමත් පපුව දැවිගෙන යයි.

මේ ඇත්ත දැනගත් විට තමාගේ දුප්පත් කෙල්ලගේ හදවතට මොනවා දැනේවිදැයි අප්පච්චි සිතුවේය. මොනවා වුවද දුප්පත් කෙල්ලගේ ජීවිතයට අහිතක් නොවේනැයි දැඩි විශ්වාසයක් අප්පච්චිට තිබුණි.

ඒ විශ්වාසය ඇති කළේද සසංකය. ඔහු එදා ඒ ඇත්ත තමාට කියා ගියේ මේ බැඳීමේ පිවිසිදු බව රකින්නට බව අප්පච්චි දනී.

"අ..ප්..ප..ච්චි... මොනාද කල්පනා කරන්නේ..."

බුදු පහන තබා ආ වන්දනා අප්පච්චි ළඟ නැවතී ඇසුවාය.

"මුකුත් නෑ පුතේ... අද ඔයා හරි ලස්සනයි..."

කෙල්ල ආශාවෙන් ඇය දෙසම තවත් වරක් බැලුවාය. "ලොකු මහත් උනාට තාම හිතින් පොඩි කෙල්ලෙක් වගේ..."

"හැකුර් බත් හදලා තියෙනවා... උදේට උණුවෙන් කන්න... දවල්ට කනකොට හාල්මැස්සෝ ටික චුට්ටක් රත් කරගන්න හොඳේ... මං යන්නම්..."

කෙල්ල පහත් වී අප්පච්චිට වැන්දාය. කවදාවත් නැතුව අප්පච්චිගේ ඇස් වලට කඳුළු පිරුණි.

"ඇ..යි අප්පච්චි..."

"මුකුත් නෑ පුතේ... බුදු සරණයි... පරිස්සමින් ගිහින් එන්න..."

"බෙහෙත් පෙති ටික කාලා ගන්න... එක පෙත්තක් අඩුයි... මං හවසට ඒක අරන් එන්නම්..."

"මං බලලා ගන්නම් මැණික..."

"එපා... මං ගේන්නම්... හවසට මල් ටිකක් කඩලා තියන්න හොඳේ..."

වන්දනා පාරට බැස්සේ තවත් වරක් අප්පච්චි දෙස බලාය. අද වැනි දවසක අම්මාත් ජීවත්ව උන්නානම් කියා කෙල්ලට සිතුණි. එසේ නම් ඔහු දැක තමාටත් වඩා සතුටු වෙන්නේ ඇයයි.

SHINA

# 17

රන්තරු කේක් ආයතනයට සඳුදා උදේ ගොඩවෙද්දී වන්දනා එක් දෙයක් දැන උන්නේ නැත. ඒ ඇයට අද සිට රන්තරු කේක් ආයතනයේ නිෂ්පාදන අංශයේ කළමණාකාරිය ලෙස පත් කළ බවය. ඒ තීරණය ගත්තේ සසංකය. ඒ ඇගේත් ඔහුගේත් තිබූ බැඳීම ගැන සිතාම නොවේ. ඇය තරම් අවංක ලෙස නිෂ්පාදන කටයුතු ගැන උනන්දු වූ ඒ ගැන දුක් වූ තවත් සේවිකාවක් මේ ආයතනය තුළින් වත් ඉන් පිටතදී වත් සොයා ගන්නට බැරි නිසාය.

මේ වෙනස්කම සමඟ තවත් වෙනස්කම් රැසක්ම අද සිට ක්‍රියාත්මක කරන්නට නියමිතව තිබුණි. සසංක ඒ සියල්ල සම්බන්ධව පෙරදා රාත්‍රියේ රුවන්ව ගෙනවිත් දැනුවත් කළේය.

"සේල්ස් වල තිබ්බ ගොඩාක් හොර වැඩ උඹ දැන් අල්ල





ගත්තනේ... අද ඉඳලා තුන්දෙනෙක්ගේ වැඩ තහනම් කරනවා... එයාලට පරීක්ෂණ ලඟදීම තියෙනවා කියපන්.. දැනට සේල්ස් ගැන මං බලාගන්නම්... අපිට ලොකු මාකට් එකක් අල්ල ගන්න පුළුවන්.."

"සීසන් එක ළඟ එන්නේ... සිංහල අලුත් අවුරුද්ද කියන්නේ කේක් ලක්ෂ ගණන් යන කාලේ.."

"ඔව්.. අලුත් කේක් වර්ග දෙකක් අපි හදනවා... අපේ චොකලට් රෝල් එක මාකට් එක අල්ලගත්ත මදි.. ඒ නිසා අලුත් විදිහක චොකලට් රෝල් එකක් හදන්න ඕන... ඔක්කොම කේක් වර්ග වලට පෙට්ටි වෙනස් කරන්නත් ඕන... මං ඒ වල ආට් වර්ක් කරන්න දීලා තියෙන්නේ..."

"කෙල්ල ප්‍රඩක්ෂන් එක නම් හරියට කරයි... ඒක ෂුවර්.."

"ම..ගේ ගෑණි වෙන්න යන නිසා කියනවා නෙමේ මචං... එයා තරම් පිරිසිදු සේවිකාවක් මං දැකලා නෑ.."

රුවන් සසංක දෙස බලා සිනාසුණේ අවංක ලෙසිනි.

"අපි පළවෙනිදා ඉඳලා අලුත් සේල්ස් වැඩ සටහනක් හදනවා... ඒකට අලුත් සේල්ස්මන්ලා ටිකක් ගන්න ඕන... මං ඇඩ් එක ලියලා තියෙන්නේ... උදෙන්ම ඉරිදා පත්තර දෙකකට ඇරපන්.."

"තව එක ප්‍රශ්නයක් තියෙනවා සසා.."

රුවන් කීවේය.

"මොකක්ද..."

"අපි ප්‍රඩක්ෂන් වලට ගන්න බඩු වල ගාන ඇත්තටම මාකට් ප්‍රයිස් එකද නැත්නම්..."

සසංක රුවන්ගේ උනන්දුව ගැන සතුටු වූවේය.

"ඒක මටත් හිතුණා මචං... උඹ මෙහෙම කරපන්... අපට පිටි සීනි බටර් සප්ලයි කරන අයගේ ප්‍රයිසස් ගෙනින්... පස්සේ අලුත්



SHINA

සප්ලයර් දෙතුන් දෙනෙක්ගෙනුත් කොටේෂන් ගනින්... අපට මේ පාර ලොකු බඩු තොගයක් ඕන වෙනවා.. මිල ටිකක් වැඩි වෙනකොට ප්‍රඩක්ෂන් එකේ සේවකයෝ යන්න බලයි.. ප්‍රශ්නයක් නෑ.. යන්න දීපන්... අපි අලුත් මිනිස්සු අරගෙන අලුත් සෙට් හදමු..."

"ඒක පුළුවන් සසා... උඹ කියන්නේ මං වීක් එන්ඩ් එකේ කඩ දෙපියකට වඩා ගියා... සේල් මාකට් එකේ අපට හොඳ තැනකට එන්න පුළුවන්... ප්ලේන්ටියක් එක්ක කන්න රස කේක් කෑල්ලක් දෙන එක විතරයි තියෙන්නේ..."

"දැන් තියෙන්නේ කේක් නෙමේ... නේද.. ගල්බිනිස්..."

"ඇත්ත සසා... මං පැය විසි හතරෙම උනන් වැඩ කරලා මේක කරනවා... උඹ කෙල්ලව ප්‍රඩක්ෂන් එකට දාලා මට දෙන එක ලොකු දෙයක්.."

"කෙල්ලව බලාගනින්..."

සසංක කීවේ එපමණකි. රුවන් ආදරණීය ලෙස සිනාසුණේය.

"මං උඹට වගේම උඹේ හැම දේකටම ආදරෙයි... කෙල්ලට තාත්තට නංගිට... මේ බිස්නස් එකට..."

සසංකගේ හිතට සැහැල්ලුවක් දැනුණි. ජීවිතයේ බොහෝ දේවල් වෙනස් කරගන්නට හැකි වූයේ ඇගේ ආදරය නිසාය. ඒ ආදරය යන මඟ එළිය කළ පහන් වැටියක් මෙනිය.

චන්දනා උදෙන්ම කාර්යාලයට පිවිසෙද්දී කාර්යාලයේ උන්නේ සසංක නොවේ. රුවන්ය. චන්දනාව දැක රුවන් වීදුරු කාමරයේ සිට අතින් කතා කළේය.

කෙල්ලගේ මුහුණ අද මලක් මෙනි. ආදරවන්තියකගේ මුහුණේ මතුවෙන ප්‍රථම සුන්දරත්වය ඒ මුහුණ මත තැවරී තිබුණි.

"ගු..ඩ් මෝනින් සෑ..ර්..."

ඇය කාමරයට එමින්ම කීවාය.

"මං එදා කිව්වා... මං සර් නෙමේ... අපි එකට වැඩ කරන අය නංගි..."

ඇය සිනාසුණාය.

"ඉඳගන්න නංගිට කියන්න වැදගත් දෙයක් තියෙනවා..."

"මොකක්ද..."

ඇය ඇසුවේ දෙගිඩියාවෙනි.

"මේ දවස්වල නංගිගේ කේන්ද්‍රෙට හොඳයි නේද..."

ඇයට පුදුම සිතුණි. ඇත්තටම මේ දවස්වල තමාගේ දෛවයේ සරන්නේ හොඳම ග්‍රහයන් විය යුතුය. ඔහු වැනි කෙනෙකු ජීවිතයට හමු වූයේ ඒ නිසාය.

"ඇ..යි එ..හෙම ඇහුවේ..."

"නෑ.. මේ දවස්වල නංගිට අහන්න ලැබෙන්නෙම සුබ ආරංචි නේද..."

තමාගේ ජීවිතයේ සිදුවූ දෙයක් ඔහු දන්නේ කෙසේද... චන්දනා සිතුවේ පුදුමයෙනි.

"මං නිකං විහිළුවට කිව්වේ නංගි... හැබැයි මේක නම් හරිම සුබ ආරංචියක්..."

"මො..ක..ක්..ද රුවන් අයියේ..."

රුවන් ඇය දෙස මොහොතක් බලා උන්නේය. සසංකගේ තේරීම ගැන ඔහු හදවතින් තවත් වරක් සතුටු වූයේය.

"නංගි ප්‍රඩක්ෂන් සයිඩ් එක ගැන තියෙන දැනුම කොහොමද..."

ඒ ප්‍රශ්නයට ඇය සිනාසුණාය.

"ඇයි නංගි හිනාවෙන්නේ..."

"මෙතෙක් අයියේ සමහරු ප්‍රඩක්ෂන් ඩිපාට්මන්ට් එක පිලගෙන ඉන්නේ.. ගන්න බඩු වලින් බාගෙට බාගයක් එයාලට කොමිස් යනවා... ඒත්..."

SIHINA

"ඇයි..."

"ප්‍රඩක්ෂන් එක වෙනුවෙන් උන් විඳින්නේ වෙන කට්ටියක්.. මෙහෙට ආපු දවසේ ඉඳලා ප්‍රඩක්ෂන් එකේ ගොඩක් දේවල් මං දැක්කා... අපේ මහන්සිය වතුරේ ගියා.. ඒත් මම මට කරන්න පුළුවන් හැම දේම කළා.. ප්‍රඩක්ෂන් එකට ඕනාවට වඩා අතගහනකොට කට්ටිය කිව්වේ තමන්ට අයිති වැඩේ කරගෙන ඉන්න කියලා..."

"මට තේරෙනවා... නංගි ප්‍රඩක්ෂන් එකේ මොනාද දකින අඩුපාඩු..."

"එකත් නෙමේ... අපිට බඩු එන්නේ තොග ප්‍රයිස් එකට නෙමේ.. සිල්ලර ප්‍රයිස් එකටත් වඩා වැඩියෙන්.. ඒවත් හොඳ බඩු නෙමේ.. අපේ කේක් වල කොලිටි එක අඩු වුණේ බාල බඩු දාපු නිසා.. පිටකොටුවේ පරණ වෙච්ච මිදි කජු ආවේ මෙහෙට... කල් ඉකුත් වෙච්ච බටර් පිටි තොග පිටින් මෙහෙට බෑවා... මං මට පුළුවන් විදිහට සර්ට කිව්වා... ඒත් සර්ටත් ඒවා පාලනය කරන්න අමාරු උනා..."

"හා..ව..."

"ප්‍රඩක්ෂන් එකේ කිසිම තත්ව පාලනයක් නෑ... සමහර කේක් බාගෙට පිච්චෙන්නේ.. සමහර ඒවා වැඩියි අයිසින් ඩිපාට්මන්ට් එකේ මිනිස්සු සිගරට් බිබී අයිසින් දාන්නේ... කේක් වල සිගරට් අළු.. පැකින් කරද්දී අයිසින් බාගයක්ම ගැලවෙනවා... හරියට බඩු නාස්ති වෙනවා... රට සිකියුරිටිලත් අනුවන්ට ක්‍රීවිල් එනවා... ඒවලට බඩු පටවනවා... ප්‍රඩක්ෂන් එකෙයි සේල්ස් එකෙයි කට්ටිය එකතුවෙලා කේක් පන්නනවා... මේ ඔක්කොම මං දැනන් උන්නා... ඒත් ම..ට දු..කයි.. මට ඇරෙන්න වෙන කාටවත් මේ වලට දුක දැනුණේ නෑ.. ඇ..යි ද..න්..නෑ..."



චන්ද්‍රනා සිටියේ බිම බලාගෙනය, සසංක මේ කෙල්ලට නිෂ්පාදන අංශය බාර දෙන්නට සිතුවේ ඇයිදැයි රුවන් හරියටම තේරුම් ගත්තේ දැන්ය.

"අපි මේක රකින්න ඕන නංගි..."

"අ..නේ.. මං කොච්චර ආසද... මේවා දකිද්දී හ..රියට දුකයි.. මං ගෙදර ගිහින් අප්පච්චි එක්කත් කියනවා.. අපේ සර් දැන් වයසයි.. ඇරත් සර්ට ලෙඩ... මූණ බලාගෙන ප්‍රශ්නයක් කියන්න දුකයි..."

මිනිස්කම් වලින් උතුරා ගිය ඈගේ හදවත රුවන් තේරුම් ගත්තේය. ඇය වැනි අවංක සේවිකාවක් පමණක් නොවේ... ඇය වැනි බිරිඳක්ව සොයා ගැනීම අමාරුය.

"ප්‍රඩක්ෂන් එකට මොනාද නංගි කරන්න ඕන..."

"ඒ..ක දෙයයි අයියේ කරන්න ඕන..."

"මොකක්ද..."

"ඒක දරුවෙක් වගේ බලාගන්න හොඳ කෙනෙක්ව එතනට දාන්න ඕ..න... වෙලාවක් අවේලාවක් නොබලා ඒකට කැපවෙන කෙනෙක්... හරි අවංක කෙනෙක්.. ප්‍රශ්න වලට මුහුණ දෙන්න පුළුවන් කෙනෙක්... එහෙම උනොත් හෙට ඉඳලා රත්තරු ප්‍රඩක්ෂන් එකෙන් එළියට එන කේක් ගොඩක් රස වෙයි..."

රුවන් ඇය දෙසම බලා උන්නේය. ඇත්තටම කළ යුත්තේද එයයි... එය දරුවෙක් මෙන් බලා ගන්නා කෙනෙක් එතනට දැමිය යුතුය, කළ යුත්තේ එපමණකි.

"ඒ..හෙනම් නංගි හෙට ඉඳලා රත්තරු එකෙන් එළියට එන කේක් රස වෙයි..."

ඇයට රුවන් කියනා දේ එකවර තේරුම් ගන්නට අමාරු විය.

"ඒ.. කිය..න්..නේ..."

"රත්තරු එකෙන් හෙට ඉඳලා එළියට එන කේක් රස වෙන්න

නම් ඒක දරුවෙක් වගේ බලාගන්න කෙනෙක් ඕන කියලා නංගි කිව්වනේ..."

"ඔව්..."

වන්දනා තවා කළේ කිසිවක් නොදැනය.

"ආ.. එහෙනම් ප්‍රඩක්ෂන් එක නංගි දරුවෙක් වගේ බලාගන්න අද ඉඳලා..."

රුවන් එසෙක් වෙලා අත තබාගෙන උන් ඇගේ නව පත්වීමේ ලිපිය දැමූ සුදු කවරය ඇයට දිගු කළේය.

"ම.. ම..ම.."

ඇය ඇසුවේ වියළී ගිය උගුරිනි.

"ම්... අද ඉඳලා රන්තරු එකේ ප්‍රඩක්ෂන් මැනේජර් නංගි..."

ඇය ඔහු අත තිබූ ලිපිය වත් නොගෙන විශාල කරගත් දෙනෙතින් යුතුව බලා උන්නාය. මේ කියනා කිසිවක් අදහා ගත නොහැක.

"ම..ම..."

"ඔව්... මේ තියෙන්නේ..."

රුවන් ඔහු අත තිබූ පත්වීමේ ලිපිය කියවූවේය.

"ලොකු මහත්තයාගේ අත්සන නංගි දන්නවා ඇතිනේ... මේ බලන්න..."

එහි අත්සන් කර තිබුනේ සසංක නොවේ. මුදුන්කොටුව මහතාය. සසංක මේ පත්වීම ගැන තාත්තාට කියා ඔහු ඉන්දියාවේ යන්නට පෙර එය අනුමත කරවා ගත්තේය.

වන්දනා පත්වීමේ ලිපියේ තිබූ අත්සන දෙසත් ලිපිය දෙසත් බැලුවේ එය අතට වත් නොගෙනය. සැබෑය. එහි තිබුනේ තමාව රන්තරුහි ප්‍රඩක්ෂන් මැනේජර් කළ බවය. අත්සන් කර තිබුණේද ඔහුමය.

"අ..නේ දෙ..යි..ය..නේ ම..ට.. ලො..කු ස..ර් ඇයි එහෙම ක..ළේ..."



SIHINA



"මේක දරුවෙක් වගේ බලාගන්න පුළුවන් ඔයාට විතරයි කියලා සර් දන්නවා... මාත් දන්නවා... ඔයා දැන් මාත් එක්ක කිව්ව ඒවලින් ඒක ඔප්පු උනා..."

"ඒ..ත්... අ..නේ.. මම.. මේ.. ඒ..ලෙවල් විතරයි කරලා..."

රුවන් ඇය කියන්නට ගිය දේ වැළැක්වූවේය.

"උපාධි ගත්ත එවුන් මේකත තොමීස් ගහනවා... පන්නනවා... මිනිහෙක් මනින්නේ මනුස්සකමින්... මේක ගන්නවද දරුවෝ..."

රුවන් ආදරයෙන් කීවේය.

"ඒ..ත් ම..ම..."

"මේ පත්වීම විතරක් නෙමේ නංගි... අද ඉඳලා මිල් එකේ ගොඩාක් දේවල් වෙනස් වෙනවා... මේකත් දැනට ඉන්න මැනේජර්ස්ලා හතර දෙනෙක්ගේ වැඩ අද තහනම් කරනවා... ප්‍රඩක්ෂන් එකට අලුත් නීති මාලාවක් එනවා... ලොකු වෙනස්කම් වගයක් කරනවා... ස්ටාෆ් එක ගොඩක් වෙනස් වෙන්නත් පුළුවන්... ස..ම..හ..ර විට..."

රුවන් එසේ කියා බලා උන්නේය.

"ඇයි අ..යියේ..."

"අ..පි දෙ..න්..නයි න..ව කීප දෙනෙකුයි විතරක් ඉතුරුවෙයි... එහෙම උනොත්..."

වන්දනා පත්වීමේ ලිපිය අතට ගත්තේ එවිටය.

"එහෙම උනොත් රන්තරු එකේ ඇත්තටම රන්තරු පායයි... මං මේක ආසාවෙන් කරන්නම්... ම..ගේ ජීවිතේ කියලා මං ආදරෙන් කරන දෙයක් තියෙනවා.. ඒ දේ වගේම ආදරෙන් මේක කරන්නම්..."

වන්දනා කීවේ ඔහුව සිහිවීය.

"තව මොකක්ද නංගි ඒ තරම් ආදරෙන් කරන්..නේ..."

ඇය සිනාසුණා පමණි. ඒ කුමක්දැයි ඔහු දැන උන්නේය.

"ඇ..ත්..ත..ටම සර්ද මේ පත්වීම ක..ළේ අ..යියේ..."

නැත. ඒ පත්වීම කළේ සසංකය. මුදන්නොටුව මහතා කළේ එය අනුමත කිරීම පමණි.

"නෑ..."

"ඒ..නෙ..න..ම..."

"ලොකු ස..ර්..ගේ පු..තා..."

රුවන් ස්ථිර හඬින් කීවේය. චන්දනා පුදුමයෙන් මෙන් රුවන් දෙස බලා උන්නාය. "ඒ..නකොට එයා ඇවිත්ද... එයා කොහොමද මං ගැන ද..න්..නේ..."

"ලො..කු ස..ර්..ගේ පුතා..."

චන්දනා ඇසුවේ මිදුණු හඬිනි.

"ඔ..ව් චන්දනා... මාව පත් කළෙත් එයාම ත..මා..."

"ලො..කු ස..ර්..ගේ පුතා හිටියේ පිට රටනේ..."

"ඔ..ව්.. එයා ටික දවසකට කලින් ලංකාවට ආවා... රන්තරු එකේ දැන් වැඩ බලන්නේ ලොකු සර් නෙමේ..."

චන්දනා රුවන් දෙස බලා උන්නේ අදහාගත නොහැකිවය. මේ කියනා කිසිවක් ඇයට සිතාගත නොහැක.

"ඒ..ත් ඒ ස..ර් මේ රන්තරු එකේ සිද්ධ වෙච්ච දේවල්... මේ තරම් ඉක්මනට දැනගත්තේ කොහොමද... හ..රි..ය..ට..ම..."

"ඒක අහන්න ඕන සර්ගෙන් තමා..."

"ඒ.. ස..ර් මං ගැ..න දන්නේ කොහොමද... ම..ම.. අ..නේ මන්දා..."

"හැම දෙයක්ම කවදහරි චන්දනාට තේරෙයි... එතකල් අපි මේවා කරගෙන යන්..."

"ඒ..ත් අ..යියේ ඇයි... ඒ සර් මිසිස් එ..ක..ට වත් ආවේ නැත්තේ..."

"එයා ඇවිල්ලා ඇති..."





"නෑ.. මං හැමදාම ආවනේ..."

රුවන් සිනාසුණේ අහක බලාගෙනය. සසංක කාර්යාලයට ආවා පමණක් නොව ඔහු මේ කාර්යාලයේ උන් අමිසෙකම කෙල්ලගේ හදවතද පැහැර ගත්තේය. ඒ කිසිවක් චන්දනා දන්නේ නැත.

"පු..දු..ම..යි..."

"ම්... පුදුම තමයි... තව පුදුම දේවල් ඉස්සරහට වෙයි..."

ඔහු පුදුමාකාර කෙනෙක් යැයි චන්දනාට කීමට සිතුණි. මේ තරම් දේවල් කළ මනුව මොහොතකටවත් බලාගන්නට නොහැකි වූයේ ඇයි...

"අපි ප්‍රඩක්ෂන් එකේ වැඩ කොහොමින්ද චන්දනා පටන් ගන්නේ..."

"මං ඒක කියන්නම් නංගි... දැන් ඔයා ප්‍රඩක්ෂන් එකේ ඉතුරු වෙලා තියෙන බඩු වල ලිස්ට් එකක් යන්න... අපි දවස් දෙකකට ප්‍රඩක්ෂන් නතර කරනවා... නැත්නම් මේක හරියට හදන්න බෑ..."

"ඔ..ව් ඒක ඇත්ත..."

"තව දෙයක්..."

"මො..ක..ක්..ද..."

"ලොකු සර්ගේ පුතා ලංකාවට ඇවිත් කියලා ප්‍රඩක්ෂන් එකේ කට්ටියට කියන්න ඕන නෑ... අපි මේක කරගෙන යන්..."

"ඒ.. ස..ර් මෙහෙට එන්නෙම නැද්ද..."

"එනවා..."

චන්දනා රුවන්ගේ කාමරයෙන් ගියේ එක පැත්තකින් සැනසීමක්ද අනිත් පැත්තෙන් හිතේ බරක්ද රැගෙනය. මේ සිදුවූ දේ පිටුපස කුමක් හෝ රහසක් ඇත.

SIHINA

# 18

**සසංක** රුවන්ගේ කාමරයට එමින් උන්නේ චන්දනා ඉන් පිටට යද්දීය... ඔහුව දැකීමෙන් ඇගේ හිත පුරා තිබූ සතුට දෙගුණ විය. මේ අලුත් පත්වීම ගැන ඔහුට කියන තුරු ඇයට නිවනක් නැත.

"අ..ද හ..රි ලස්සනයි..."

ඔහු ළංවී කීවේය. කාර්යාලය හිස්ව තිබූ නිසා ඇය ඔනාවටත් වඩා ඔහුට ළං වූවාය.

"ම්.. මේ... ලස්සනද..."

ඇය පෙන්වූයේ ඔහු දුන් අත් ඔරලෝසුවය. මේ වෙද්දී රුවන් ඇයට අලුත් පත්වීම ගැන කියා ඇති බව ඔහු දනී. ඒ දේ ඇසූ පසුවත් ඇගේ නිහතමානී බව එහෙමමය.

"උදෙන්ම රුවන් සර් එන්න කිව්වා..."





"ගිහින් ඉක්මනට එනවද දෙයියෝ... මං ඉඳී ආප්පත් හොයාවා..."

"මං ගිහින් එන්නම්..."

"ම්... ඉක්මනට එන්න හොඳේ... කට්ටිය එන්න කලින්..."

සසංක රුවන්ගේ කාමරයට ගියේ චන්දනා කැමින් එකට ගිය බව සහතික කරගෙනය. මේ කතා කරනා දේවල් දැන්ම ඇයට ඇසිය යුතු නැත.

"කෙල්ල මොනාද කියන්නේ මචං..."

රුවන් සසංක එනවා දැක එහෙමම නැගිටවේය.

"ඉඳගනින්... මොකද වුණේ..."

"උඹගේ කෙල්ල නිසා කියනවා නෙමේ සසා... උඹ ගත්ත තීරණේ හරියටම හරි.. කෙල්ල ප්‍රඩක්ෂන් එක හොඳටම කරයි..."

"උඹ තව මොනාවද කිව්වේ..."

"ඒකිට පුදුමයි... කවුද මේ පත්වීම කළේ ඇහුවා..."

"එතකොට උඹ..."

"මං කිව්වා ලොකු සර් නෙමේ කළේ සර්ගේ පුතා කියලා..."

"ඇයි... උඹ.. ඒක කිව්වේ..."

"කවදහරි කෙල්ලගේ පපුව හිර කරන්න වෙනවා... අපි ටික ටික මේ ඇත්ත කෙල්ලට කියන්න ඕන... අනිත උඹට මෙහෙම හැංගි මුත්තන් කරන්නත් බෑ සසා... උඹ මේ ආයතනයේ ඉන්න ඕන..."

"මං තා..ව ටික දවසක් මෙහෙම ඉන්නවා රුවන්..."

"මං මේ පැත්ත බලාගන්නම් සසා..."

"අද කරන වැඩ ටික වේලාසනම කරපන්... වැඩ තහනම් කරන ලියුම ටික උදෙන්ම ගහපන්... ප්‍රඩක්ෂන් එකේ ස්ටාෆ් එකට හවස තුනට මීටින් එකක් කෝල් කරපන්... කෙල්ල අලුත් ප්‍රඩක්ෂන් මැනේජර්



SIHINA

කියලා ස්ටාෆ් එකට අඳුන්නලා දීපන්..."

"මං හැම දෙයක්ම කරන්නම්... එතකොට සසා උඹ මොනවද කරන්නේ..."

"මං අද සේල්ස් පැත්ත බලන්න පොඩ්ඩක් වෙට යනවා... හවස හම්බවෙමු..."

සසංක එහෙමම ආවේ චන්දනා ළඟටය. වේලාව අටටත් ආසන්නය. එහෙත් ආයතනයේ කිසිදු සේවකයෙක් පැමිණ නැත. මේ ක්‍රමයට ආයතනය තිබුණහොත් කිසිම දිනයක රන්තරු ශේප් ආයතනයට රන් කරු පායන්නේ නැත.

සසංක හිමිහිට ගොස් පරිගණකය අසල උන් චන්දනාගේ හිසට අත තැබුවේය. කෙල්ල එහෙමම හැරුණාය.

"ඔ..යා ම..ගේ ජී..වි..තේට එ..න..කො..ට..ම මං දැනගෙන උන්නා ඔ..යා ම..ගේ ජීවිතේට ගොඩක් දේවල් ගෙනෙයි කියලා... ඇත්තමයි ර..ත්තරන්..."

දෑස්වල කඳුළු පුරවාගෙන චන්දනා එසේ කියද්දී සසංක බලා උන්නේ පුදුමයෙනි. "දෙයියනේ ඔයා මම ගැන ඇත්ත දැන ගත්තාවත්ද..." ඔහු සිතුවේ චකිතයෙනි.

"ඇයි මේ කඳුළු... අද ඕ..බා..."

"ඊයේ ඔ..යා ගිය වෙලාවේ ඉඳලා මේ කඳුළු ගලනවා දෙයියෝ... මට ජීවිතේ මොනවා ලැබිච්ච කෙ..ල්..ලෙ..ක්..ද..."

"මොනාද උනේ කියන්න බ..බා..."

ඔහු කාර්යාලය පුරා නෙත් යවා කිසිවෙක් නැති බව දැනගෙන පහත් වී ඇගේ හිස සිඹියේය. ඇගේ හිසින් ආවේ ආයුර්වේද කොහොඹ ෂැම්පු වර්ගයක මෘදු සුවඳය.

"ම.. මා..ව ප්‍ර..ධාන්නේ මැ..නේ..ජ..ර් කරලා..."

ඔහු ඇගේ දෑස් දෙසම බලා උන්නේය. ඊටත් පසු ඔහු ඇගේ අත අල්ලා ගත්තේය.





"මං දන්නවා... ඒක කරන්න පුළුවන් හොඳම කෙනා ඔයා... ලස්සනට කරගෙන යන්න... මා..ත් උදව් කරන්නම්..."

ඔහු ආශිර්වාදයක් කළේය.

"මේ.. වෙ..න දේ..වල් ම..ට හ..රී පු..දුමයි.. ම..ට මො..කක්ද දැනෙ..නවා දෙයියෝ..."

"මො..න ව..ගේ දෙයක්..ද..."

"ජී..වි..තේ කවදාවත් නොදැනිච්ච හැඟීමක්... මං කො..ච්චර පුං..චි ජීවිතයක්ද ගත කළේ.. දැන් දැන්.."

"ඒ ජීවිතේ වෙනස් කරගන්නෙපා..."

"ටි..ක..ක් වෙනස් වෙයි.."

චන්දනා ආදරණීය ලෙස සිනාසී කීවාය.

"ඇ..යි.."

"ම..ගේ ජී..වි..තේට සපුමල් කුමාරයෙක් ඇවිත්නේ... ඉතින්..."

"ඔයා ඔහොම කියන්නේ ඔයාගේ ජීවිතේට මේ රන්තරු එකේ අයිතිකාරයා ඇවිත් කියලා නොදැන... එයා මට මේ තරම් වටිනා හැඟීමක් වෙන්නේ ඒ නිසා..." ඔහු ඇගේ දෑස් දෙසම බලාගෙන සිතුවේය.

"එ..කපාරට ලොකු කල්පනාවකට වැටෙනවා..."

"අද ඉඳලා පත්වීමේ වැඩ බාරගන්නවද..."

"ම..ට ලො..කු සර්ගේ පුතාලු මේ ඔක්කොම කරන්නේ... එයා මට වඩා බුද්ධිමත් කෙනෙක්... මාව පත් කරපු නිසා තමේ... මේ රන්තරු එකේ තිබ්බ හැම ප්‍රශ්නෙකටම එයා උත්තර හොයාගෙන..."

"ඒ උත්තර ටික මට කිව්වේ උඹමයි... නැත්නම් මට කවදාවත් මේ ප්‍රශ්නේ විසඳගන්න ලැබෙන්නේ නෑ..." ඔහු සිතින් කීවේය.

"අද මොනාද කරන්නේ..."

"රුවන් සර් මට සේල්ස් පැත්ත බලාගන්න කිව්වා... අද යනවා



SIHINA

පොඩ්ඩක් මාකට් එකට..."

"අපි කරන්න පුළුවන් හැම දෙයක්ම මේකට අවංකව කරමු.. හවස අපි කොහේ හරි යං..න්..."

"කොහෙ..ද..."

"මංදා..."

ඒ සමගම පරිගණක බිල් අංශයේ නිලන්ති කාමරයට ඇතුළු වූවාය. ඇය කාමරයට ආ විගසම බැලුවේ මීනාවටත් වඩා ළංවී උන් වන්දනාත් සසංකත් දෙසය. ඇය පරිගණක මේසයෙන් හැන්ඩ් බෑගය තැලුමේ නුහුරට බලාගෙනය.

"නිලන්ති අලුට් කරපු බිල් වල ගොඩක් වැරදි තිබුණා.. පරිස්සමින් බිල් ඉෂූ කරන්න වෙයි..."

සසංක එසේ කියද්දී වන්දනා පුදුමයෙන් ඔහු දෙස බැලුවාය.

"ඔයා ඔයාට අයිති වැඩේ කරන්න... මගේ වැරැද්දක් තියෙනවා නම් මිස්ටර් වෝල්ටර් මට කියයි..."

ඇය කේන්තියෙන් කීවාය.

"මිස්ටර් වෝල්ටර්ගේ වැඩ අද ඉඳලා නහනම් කරලා තියෙන්නේ.. බිල් වල තියෙන ප්‍රශ්න අදම විසඳගන්න වෙයි..."

වන්දනාගේ ඇතුළු පපුව සිරවී ගියාක් මෙන් විය. ඔහු කතා කරන්නේ බොහෝ දේවල් අනාගෙනය. එහෙත් ඒවා කෙසේ සිදු වූණිද.

"මි..ස්..ටර් වෝල්ටර්ගේ වැඩ නහනම් කරලා..."

"ඔව්... එයාගේ විතරක් නෙමේ සේල්ස් සෙක්ෂන් එකේ හතර දෙනෙක්ගේ වැඩ නහනම් කරලා තියෙන්නේ... මේ වංචා වලට බිලින් සෙක්ෂන් එකේ අයත් සම්බන්ධ නම් එයාලටත් ඒකම වෙයි..."

සසංක කීවේ තරමක් තදිනි. නිලන්තිද ඔහු දෙස බලා උන්නේ පුදුමයෙනි.



"අප්පට සිරි ගේ... මේ ඊයේ පෙරේදා ආපු අයගේ මෙතන පොරවල් වෙලා තියෙන්නේ.. මගේ වැඩ නහනම් කරන්න ඔයා බොස්ගේ පුතාද..."

"ඔව් මං බොස්ගේ පුතා තමයි..." එසේ කියන්නට සසංකට සිතුණි.

"උදෙන්ම ගිහින් රුවන් සර්ව හම්බවෙන්න... වැරදි බිල් මක්කොම මං රුවන් සර් ළඟ කියලා තියෙන්නේ..."

නිලන්ති කාමරයෙන් පිටතට ගියේ ගස්සාගෙනය. සසංක එය ගණනකට නොගත්තේය. බිල් නිකුත් කිරීමේ අංශයට අලුත් කෙනෙක් ගත යුතු යැයි ඔහු උදෙන්ම තීරණය කළේය.

නිලන්ති ගිය පසු වන්දනා සසංක දෙස බැලුවේ පුදුමයෙනි.

"බි..ලි..න් සෙක්ෂන් එකේ ප්‍රශ්..න ඔයා කොහොමද දන්නේ ර..ත්තරන්..."

ඔහුට දුක සිතුණි. ඒ මේ කෙල්ලට දවසට බොරු අහක් කියන්නට වෙන නිසාය.

"රුවන් සර් කියලා මං බැලුවා..."

"ඒ..ත්.. අනේ මන්දා.."

"ඇයි ඔයාමනේ මට කිව්වේ මේ බිලින් එකේ කට්ටිය සේල්ස් මැනේජර් එක්ක එකතුවෙලා ගහනවා කියලා..."

"ඔව්.. ඒත් ඒ..වා.. කොහොමද සර්ගේ පුතා දැනගත්තේ..."

සසංක බිම බලාගත්තේය.

"මේ වෙන දේවල් ගණන් ගන්නෙපා... හැම දෙයක්ම හරියයි.. ඔය ප්‍රඩක්ෂන් එකේ වැඩ ටික බලාගන්..න ප්‍රඩක්ෂන් එකට අලුත් කට්ටියක් අරගෙන ඔඩු ගන්න නම් හරි නේද..."

"ඔ..ව් ඒක තමා මුලින්ම කරන්න ඕන..."

"මං පිටකොටුවේ සප්ලයර්ස්ලා දෙතුන් දෙනෙක් එක්ක කතා



SIHINA

කළා... රුවන් සර්ට විස්තර දීලා තියෙන්නේ..."

"ඔ..යා බැලුවා..."

"ඔ..ව්..."

"ඔ..ට හරි පුදුමයි..."

"මට පවරපු වැඩනේ... හවස අපි කොහෙද යන්නේ..."

"කො..හේ හරි..."

"මං හවස ඇවිත් හෝල්ට් එකේදී ඔබාව ගන්නම්..."

සසංක කාර්යාලයෙන් පිටව ගියේ ඇගේ හිස අතගාගෙනමය. චන්දනා මෙතෙක් දවසක් ඇය වැඩ කළ කුඩා මේසය දෙස බැලුවේ දුකෙනි. අද මේ මේසය හැරදා අලුත් මේසයකට යන බව ඇය දනී. ජීවිතයේ බොහෝ දේවල් මේ පුංචි මේසය මතදී සිදුවිය. ඒ නිසා ඇය මේ පුංචි මේසයට ඇත්තටම ආදරය කළාය.

SIHINA

# 19

"ඔෆිස් එකේ මගුල් නටනව... මැනේජ්මන්ට් එකට පේළම් කිය කිය... මහ ලොකුවට නම චන්දනාලු... ඒත් කරන්නේ තුට්ටු දෙකේ වැඩ..."

නිලන්තිත් ශ්‍යාමාත් කාමරයට ආවේ මැණගෙනමය. චන්දනා වචනයක් වත් කීවේ නැත.

"අනිත් අයගේ වැරදි හොය හොය මැනේජ්මන්ට් එකට කියන්නේ ඔයා මෙතන මැනේජර් කෙනෙක් කියලද හිතන් ඉන්නේ... රුපියල් පන්සීයකින් පඩිය වැඩි කරගන්න තුට්ටු දෙකේ වැඩ කරන්නෙපා..."

චන්දනා පුටුවෙන් නැගිට්ටේ නොසන්සුන්වයි... ඒත් ඒ සමගම රුවන් කාමරයේ දොර අසළ උන්නේය. කෙල්ල ස්ටාෆ් එක මැද තනිවන බව ඔහු හොඳින් දැන උන්නේය. ඇය කෙදිනකවත් නේලම් කිව්වේ නැත.

"චන්දනා මෙතන මැනේජර් කෙනෙක් තමා නිලන්ති... දන්නැත්නම් දැන් දැනගන්න... චන්දනා තමයි අපේ අලුත් ප්‍රධන්ෂනේ මැනේජර්.."

රුවන්ගේ කතාවෙන් නිලන්තිගේත් ශ්‍යාමාගේත් දෑස් විශාල විය. එසේ සිදු වූයේ කෙසේදැයි ඔවුන්ට හිතාගන්නටත් බැරි විය.

"මේ..යා.."

"මට ඇයි... චන්දනා පහළ ප්‍රධන්ෂනේ එකේ රූම් එකට යන්න ලෑස්ති වෙන්න... දෙකට ස්ටාෆ් මීටින් එකක් තියෙනවා... ඔයාගේ සහයට දීප්තිව මං දානවා..."

දීප්ති අලුතෙන් ආ ගැහැණු ළමයෙකි. ඇය නිහඬ නිස්කලංක චරිතයකි. චන්දනා තමා ළඟට ඇය ඒම ගැන සතුටු වූවාය.

"ඔයාලා දෙන්නා බිල් වල තියෙන හැම ප්‍රශ්නෙකටම උත්තර දෙන්න බලාගෙන ඉන්න... ශෝටේජ් තිබ්බොත් සෑහෙන ප්‍රශ්නයක් වෙයි..."

නිලන්ති ශ්‍යාමා දෙස බැලුවේ ගැහෙමින් මෙනි. රත්තරු ආයතනයේ මේ සිදුවෙමින් පවතින්නේ මොනවාදැයි ඔවුන්ට සිතාගන්නටත් නොහැකි විය. චන්දනා ඇගේ ෆයිල් මිටියත් හෑන්ඩ් බෑගයත් අතින් ගෙන කාමරයෙන් පිටතට යන්නට සැරසී නිලන්තිත් ශ්‍යාමාත් ළඟ නතර වූවාය.

"කවදාවත් ඔයාලා දෙන්නා බිලින් වලින් සත පහක්වත් ගත්තේ නෑ කියලා මං දන්නවා... ඒත් ඔයාලට අසරණකමට සෑහෙන දේවල් කරන්න උනා... මෙතන හිටපු වංචාකාරයන්ගේ දූෂ්‍ය අරමුණු වලට ඔයාලව අහුඋනා.. මං ඒක දන්නවා.. සේල්ස් එකේ කට්ටිය අයිස්



ක්‍රීම් ගෙනල්ලා ඔයාලට පාට් දානකොට ඔයාලා එයාලත් එක්ක උඩ පැන පැන අයිස් ක්‍රීම් කකා හොර බිල් දාලා දුන්නා... දැන්වත් වෙච්ච වැරදි තේරුම් ගන්න... ඔයාලා වෙනුවෙන් මං කතා කරන්නම්... ඒත් ඔයාලා වෙච්ච දේ හරියට කියනවනම්..."

චන්දනා කීවේ මඳ හඬිනි. නිලන්තිගේ දෑස් වල කඳුළු විය.

"ර..ස්..සා..ව නැ..ති වෙ..යිද කෙ..ල්..ලේ..."

ඇය චන්දනාගෙන් ඇසුවේ උගුරෙන් මෙනි.

"එ..හෙම වෙන්නෑ... මේ ආයතනය කඩා වැටුණොත් තමයි එහෙම වෙන්නේ... ඇයි ඒක කඩා වට්ටන්න උදව් කරන්නේ... වෙච්ච ප්‍රශ්න ගැන ඔයාලගෙන් අහන්න කලින් ඔයාලා ඔහින් කියන්න මාත් කියන්නම්... ඔයාලා වංචාකාරයෝ නෙමෙයි.. ඒත් මෝඩයෝ... මං යන්නම්... මේ කාමරේ ඉඳිද්දී මට ඔයාලා දෙන්නා ගැන තිබුණ සිහිවීම එකක් මං හිතේ තියාගන්නම්... ඒත් කදී දුන්න වෙරළ ගෙවිය පවා මට මතකයි... මං යන්නම් කෙල්ලේ..."

චන්දනා දෑස් වල කඳුළු ගලා එද්දී ෆයිල් මිටියද පපුවට තබාගෙන කාමරයෙන් පිට වූවාය.

පසුගිය වසර කිහිපයේ රත්තරු ආයතනයේ වැඩ මෙන්ම එහි හදන කේක්ද රසවත් වූයේ නැත. රත්තරු බටර් කේක් වලින් ආවේ මිහිරි බටර් රසයක් නොවේ. පාන් පිටි පිච්චූ රසය. කපද්දී කේක් එකෙන් බාගයක්ම කුඩු වී වැටෙයි. ඇතැම් කේක් වලට කේක් කියනවාද නැතහොත් ගල් බනිස් කියනවාද කියා සිතා ගැනීමට බැරි විය. මාසයකට වරක් ආයතනයේ සේවකයන්ට නොමිලේ කේක් ගෙඩි තුන හතරක් ලැබෙයි. චන්දනා ඒවා ගෙදර ගෙන ගොස් අහළ පහළ අයට දෙයි. ගෙදර තියාගෙන කේකක් සමඟ කෑල්ලක් කන්නට වත් සිතෙන්නේ නැත.

හොඳ බටර් කේක් කෑල්ලකින් එන රස ඇය දැන උන්නාය. රසයක් මෙන්ම එහි මිහිරි සුවඳක්ද ඇත. පුංචි කාලයේදී කේක් ගෙනා පසු එය දවටා ඇති සව් කොළයද සුරා කන්නට හිතෙනා

තරම් ඒ කේක් රස විය. එහෙත් රත්තරු කේක් එසේ වූයේ නැත.

වන්දනා ඒ ගැන දෙතුන් වරක්ම මුලුන්තොටුව මහතාට කීවාය. ඒ මේ ආයතනයට ඇති ආදරයටය.

"මිනිස්සු සර් තවමත් රත්තරු කේක් කන්නේ ඉස්සර කාපු රහට... ඒත් අද රහ නෑ... අපි මොනවා හරි කළොත් හොඳයි වගේ සර්..."

"මොනවා කරන්නද කියලා මටත් හිතාගන්න බෑ දරුවෝ... අපේ ගෙදරට අමුත්තෙක් ආවම මම අපේ කේක් දෙන්නෑ... දෙන්න මට දුකයි..."

ඔහු එදා කීවේ බලාපොරොත්තු බිඳුණු හඬිනි. එහෙත් දැන් ආයතනය පිටුපස ඉන්නේ ඔහු නොවේ. ඔහුගේ පුතාය. රත්තරු කේක් මිහිරි කරන්නට නම් රත්තරු ආයතනයේ ඇති අමිහිරි දේවල් ඉවත්කළ යුතු බව ඔහු සිතීම කොතරම් පුදුමද... කළ යුතු දේවල් ඔහු හරියටම තේරුම් ගත්තේ කෙසේද...

රත්තරු කේක් රස නොවෙන්නේ අමුද්‍රව්‍ය බාල නිසාය. ඒවාට දාන්නේ පරණ බටර්ය. සීනි දමන්නේම නැත. එහෙත් නිෂ්පාදන අංශය සැමෙන මුදලක් වියදම් කරයි. ඒවා මෙතෙක් කලක් ගියේ නිෂ්පාදන අංශය බලා ගත් අයගේ සාක්කුවටමය.

ගියවර සිංහල අවුරුද්දට වෙළඳ පොළට නිකුත් කළ කේක් වලින් බාගයක්ම නැවත රිටන් වී වෙළඳ පොළෙන් ආවේය. එසේ වූයේ රත්තරු කේක් වලට වඩා රසවත් කේක් වෙළඳ පොළේ ඇති නිසාය.

වසර ගණනකින් රත්තරු කේක් වල ඇසුරුම වත් වෙනස් කර නැත.

වන්දනා ඇගේ ෆයිල් මිටියද පපුවට තබාගෙන නිෂ්පාදන අංශයේ ඇයට වෙන්කර දුන් කාර්යාල කාමරයට ගොඩ වූයේ මේ සියල්ල සිතේ දරාගෙනය.

රත්තරු කේක් හදන්නට ගන්නා බටර් කෑල්ලේ සිට සීනි ඇටයේ සිට වෙනස් කළ යුතුය.





වන්දනා නිෂ්පාදන අංශයේ කළමනාකාරිනිය වී ඇගේ කාමරයට එද්දී නිෂ්පාදන අංශයේ සේවකයන් ඇස් උඩ තබාගෙන බලා උන්නෝය. වන්දනා ආවේ ඔවුන් සියල්ලන් සමඟ සිනාසෙමිනි.

මිනිස්සු වැරදි කරන්නේ වැරැද්දට අනුබල දෙන නිසාය. සියල්ල අලුතින් සැළසුම් කර පටන් ගත් පසු රසවත් කේක් එකක් හදන්නට පටන් ගත හැකිය.

ඇය පුටුවේ ඉඳගත්තේ "බුදු සරණයි" කියාගෙනය. ඇය පුටුවේ ඉඳගෙන මොහොතක් දෑස් පියාගෙන උන්නාය.

කෙල්ල මැරුණු අම්මාව සිහි කළාය. තමා වෙනුවෙන් දුක් විඳි අප්පච්චිව සිහි කළාය. තමාගේ ජීවිතයට සෙවනැල්ලක් මෙන් ඉන්නා අංකලව සිහි කළාය.

ඒ තුන්දෙනාගේ ආශිර්වාදය තමාට ලැබෙනා බව ඇය දැන උන්නාය.

"බ..බා..."

ඔහුගේ හඬ මේසය අද්දරින් එද්දී ඇය ගැස්සී හිස එසෙව්වාය. සසංක ඇගේ මේසය පාමුළ උන්නේය.

"වැ..ඩ බාර ගන්නට එහෙනම් පුංචි තෑග්ගක්..."

ඇගේ ඇස්වල කඳුළු පිරුණි.

"ම..ට දු..න්..න දේ..ව..ල් ම..දිද ර..ත්..ත..ර..න්..."

"ඔයාගේ හිත පිරිසිදුයි... ඒ නිසා මොන ප්‍රශ්නේ ආවත් බයවෙන්නෙපා... ඔයාව දෙයියෝ රකිනවා... හොඳට වැඩ කරගෙන යන්න... මාව මතක් වෙන්න මේක මේසේ උඩ තියාගන්න..."

වන්දනා කිසිවක් නොකියා ඔහු දුන් කුඩා තිළිණය දෙස බලා උන්නාය. එය මේසය මත තබන කුඩා කිරිගරුඬ බුද්ධ ප්‍රතිමාවකි.

"මං යන්නම්..."

"හ..ව..ස එ..න්..න..."

තෙත දෑස් මිරිකා මෙන් ඇය කීවාය. ඉන් පසු ඇය පුටුවේ වාඩිවී ඔහු ගෙනා බටර් පැහැගත් කුඩා සාරනාත් බුදු පිළිමය දෙස

SHINA

බලා උන්නාය. එය අගෝස් ඉතාත පමණ එන්තර පිළිබිඹුයකි. එය දී මතු කිසු දේවල් ඇගේ හිතේ රැව් පිළිරැව් දෙන්නට විය... "ඔයාගේ හිත පිරිසිදුයි... දෙයියෝ ඔයාට බලාගන්නවා..." චන්දනා දෑස් අග පිසදා ගත්තාය. "දෙයියෝ නැතත් ඔයා මාව රකිනවා කියලා මං දන්නවා..."

"මි..ස් වැඩ බාරගන්න කියලා රුවන් සර් කිව්වා... ආයුබෝවන් කියන්න ආවේ..."

නිෂ්පාදන අංශයේ සියළුම සේවකයන් කාමරයේ දොර අසල පොදි ගැසී උන්නෝය. චන්දනා ඔවුන් සියල්ලන් දෙසම බැලුවේ එක බැල්මකිනි.

"ඔයාලා ඔක්කොමගෙන් මං අහන්නේ... මට උදව් කරන්න පුළුවන්ද... මේක ගොඩනගන්න..."

චන්දනා ඒ ප්‍රශ්නය අසා සියල්ලන් දෙස බලා උන්නාය.

"ඔ..ව් මි..ස්..."

"ඔයාලට පුළුවන් නම් මට උදව් කරන්න... මටත් පුළුවන් ඔයාලට උදව් කරන්න... ප්‍රඩක්ෂන් එකේ අයට තියෙන ප්‍රශ්න ඔක්කොම මං දන්නවා... අවුරුදු දෙකකින් පඩි වැඩි වෙලා නෑ... එහෙම නේද..."

"ඔව් මිස්..."

සියල්ලන් කීවේ සතුටිනි.

"යුනිෆෝම් ඔක්කොම පරණයි..."

ඇය කීවාය.

"සමහර ඒවා අඳින්නම බෑ මිස්..."

"මං දන්නවා... ෂිෆ්ට් එකෙන් සමහර සේවකයන්ට අසාධාරණයක් වෙනවා... එහෙම නේද..."

"අනේ ඔව් මිස්.. එකම කට්ටියක් හැමදාම ඕටී ගන්නේ..."

"ඇත්ත... ලෝන් එකක් ගන්න ගියාම ප්‍රඩක්ෂන් එකේ අයට ඒක ලැබෙන්නෑ... ඔෆිස් එකේ අය ලෝන් ඔක්කොම අරගෙන..."



"ඔ..ව් මිස්... මගේ වයිෆ් නැති වෙච්ච වෙලාවේ අවසාන කටයුතු කරන්න රුපියල් දාහක් ගන්න බැරි උනා... මිනිසුන්ගේ විකුණලා අවසන් කටයුතු කළේ..."

නිෂ්පාදන අංශයේ ගුණපාල කීවේය.

"මං දන්නවා... ඒ වගේම ඔයාලා තව එක දෙයක් පිළිගන්න ඕන..."

"මොකක්ද මිස්..."

"අපි හදන කේක් රස නෑ කියලා..."

හැමෝම බිම බලාගත්තෝය.

"ඒවා කේක් නෙමෙයි... ගල් බනිස්... කවුරු පාන් ඊට වඩා රසයි..."

චන්දනා වේගයෙන් සිටතට පැමිණ කීවාය.

"ඇයි අර ඔක්කොම පිළිගන්න ඔයාලා ඒක පිළිගන්නැද්ද..."

"පි..ළි..ග..න්..නා..වා මිස්..."

සේවකයන්ගේ පසුපසට වී ඇයට හොරෙන් මේ කතාව අසා උන් රුවනුත් සසංකත් මුහුණට මුහුණ බලාගෙන සිනාසුණෝය.

"ඉස්සෙල්ලා අපි දෙයක් කරලා පෙන්නමු... අර ඔයාලගේ ප්‍රශ්න ඔක්කොම මං විසඳලා දෙන්නම්... පඩිත් වැඩි කරලා දෙන්නම්... යුනිෆෝම් අලුතින් අරන් දෙන්නම්... ප්‍රඩක්ෂන් එකේ සේවකයන්ටත් මේ ආයතනයේ සම තැන අරන් දෙන්නම්... මි... හැමතිද... මාත් එක්ක අවුරුද්දක් දුක් විඳිමුද... මං දහයට ඇවිත් අටට ගෙදර යන්නෑ... හතට ඇවිත් රෑ දහය වෙනකල් ඉන්නවා... ඔයාලා මට අද උත්තරයක් දෙන්න ඕන... මේ ඔක්කොම වෙනස් කරලා අපි මේක හදමුද... අද ඉඳලා... කේක් මාකට් එකට යවන්න කලින් හදන වෙලාවේදී අපිටම හොරෙන් කන්න හිතෙන තරමට අපි මේ කේක් රසට හදමුද... කියන්න..."

සසංක දෑත් බැඳගෙන පිටුපසට වී අසා උන්නේය. රුවන් මහුගේ

පිටට තට්ටු කළේය.

"අපි පිටරට ගිහින් මොනාද මං අහගෙන ගන්නේ..."

ඔහු කීවේ අවංකවමය.

"මිස් අපිත් එක්ක ඉන්නව නම් අපි ඒක කරන්නම් මිස්... අපිට මිස් බලාගන්න ඕන..."

"හොඳයි... මං ඔයාලව ඔයාලා හිතනවටත් වඩා හොඳට බලාගන්නවා... අපි මේක කරමු... ප්‍රඩක්ෂන් එකට අලුත් අය ගන්න කලින් මං තව එකපාරක් ඔයාලත් එක්ක මේ වැඩේ කරන්න පුළුවන්ද කියලා බලනවා... ම්... මං තව ටිකකින් එන්නම්... අපි අද ෆැක්ටරි එක ඔක්කොම අස් කරමු... අවුරුදු ගාණක් පරණ පිටි බෑල්දි ඔක්කොම වීසි කරමු... තැටි සේරම හෝදමු... අවන් අස්සේ මීයෝ සිය ගාණක් පිච්චිලා ඉන්නවා... ඒවා ඔක්කොම ගළවන්න... මික්සින් මැෂින් වල රෙදි කෑලිත් මික්ස් වෙනවා... ඒවා ඔක්කොම අද ෆැක්ටරියෙන් එළියට ගෙනත් අස් කරන්න... මේ සතියේම අපි මේක අස් කරමු... පේන්ට් බෑල්දි තුන හතරක් ගෙනත් මේ බිත්ති වල ගාමු... බිම හෝදමු... මං මේතන දොරකඩ බුදු පිළිමයක් ගෙනත් තියනවා... ලබන සතියේ අපි එතන බුදුන් වැඳලා වැඩ පටන් ගමු... එහෙම කේක් හැදුවොත් අපේ කේක් තරම් කොහෙවත් කේක් රස වෙන්නෑ... ඒ වගේම මං මැනේජ්මන්ට් එකට එදාට කියනවා මේ කේක් වල තියෙන්නේ ඇත්තටම ඔයාලගේ දාඩිය කඳුළු කියලා... ඔයාලට ඕනා දේවල් අපි ලබාගමු... හැමෝටම ආයුබෝවන්... මං බලාපොරොත්තු වෙනවා මේ සතියේ කවුරුවත් නිවාඩු ගන්න එකක් නෑ කියලා... එහෙනම් යන්න... මං එන්නම් අස් කරන ඒවා කියන්න..."

නිෂ්පාදන අංශයේ සියළුම සේවකයන්ට දෑත් එක් කර ආචාර කර ඇය කීවාය. ඔවුන් සියල්ලන්ම ගියේ ඇය ළඟට පැමිණ ආයුබෝවන් කියාය.





ඇය රුවන්වත් සසංකවත් දැක්කේ අන්තිම සේවකයාත් ගිය පසුය. සසංක ඇය දෙස බලාගත්තවනම බලා උන්නේය.

රත්තරු කේක් ආයතනයේ මේ වෙනස්කම් වෙද්දී මුදන්කොටුව මහතා උන්නේ ඉන්දියාවේ බැංගලෝරයේය... ඔහු විශේෂයෙන් ඉන්දියාවට ගියේ තම දරුවන් දෙදෙනාට බාරයක් වෙන්නටය. තම දරුවන්ට වැරැද්දක් නොවන බව ඔහු දැන උන්නේය. එහෙත් සියළු වගකීම් පැවරී තිබුනේ ඔහුගේ හිස මතය. කෙල්ලාගේත් කොල්ලාගේත් අම්මා උන්නානම් මේ බර වෙන්නේ ඇයය.

දවසක මහ ගෙදරට අලුත් ලේලියෙකුත් ගෙනෙන කෙනෙකුත් ආ දවසට මේ හිතේ ගින්දර අවසානය. තම පුතා ගෙන එන මනමාලියත් දුව රැගෙන එන මනමාලයාත් තම දරුවන් මෙන්ම අභිමාන ගුණයහපත් අය වුවහොත් හොඳ යැයි මුදන්කොටුව මහතාට සිතුනි.

ඉන් පසු ඒ හතර දෙනා එක්ව රත්තරු ආයතනයද පවත්වාගෙන යනු ඇත... මුදන්කොටුව මහතා සිහින දැක්කේ ඒ දවස ගැනය.

සසංක රත්තරු ආයතනයේ කළ හැම වෙනස්කමක් ගැනම තාත්තාට ඉන්දියාවට කතා කර කිව්වේය. තම පුතා මේ කරන්නේ පසුගිය කාලයේ තමාට කරන්නට තරම් ආත්ම ශක්තියක් නොතිබූ දේවල් ගැන බව ඔහු දනී.

"හොඳයි කියලා හිතෙන හැම දෙයක්ම කරන්න ලොකු පුතේ... මං දන්නවා ඔයා ඕක ලස්සනට හදයි..."

"ඔව් තාත්තේ... මං ඒක කරනවා... මං තාත්තේ චන්දනාව ප්‍රඩක්ෂන් මැනේජර් විදිහට පත් කළා... මේ ආයතනයේ ඉතුරු වෙලා හිටපු එකම පිරිසිදු කෙනා එයා විතරයි..."

එය මුදන්කොටුව මහතාත් දැන උන්නේය.

"ඔය ආයතනයේ ප්‍රශ්න ගැන ඔය කෙල්ල තරම් මට කියපු වෙන කෙනෙක් නෑ... දවසක් අඬ අඬ ඇවිත් කිව්වා මට නම් සර් මේවා බලන් ඉන්න බෑ මං අස්වෙනවා කියලා..."

"කෙල්ල ප්‍රඩක්ෂන් එක ලස්සනට කරයි තාත්තේ..."



SIHINA

"උප්පත් කෙල්ල තනිවෙයි... එයා පිටිපස්සෙන් ඉන්න..."

"මං මුළු ජීවිත කාලෙම එයා පිටිපස්සේ ඉන්නවා තාත්තේ..." සසංකා හිනින් කීවේය.

"තාත්තා සනීපෙන්ද තාත්තේ... බෙහෙත් ටික පිළිවෙලට ගන්නවා නේද..."

"මං හරි සනීපෙන් ඉන්නේ... ඔයාලා නැති පාළුව විතරයි... හවස මං බරනැස් කෝවිලටත් යනවා..."

"තාත්තා විවේකයෙන් ඉඳලා එන්න... මෙහේ ගැන හිතන්නෙපා..."

"ඔයා මාව නිදහස් කරපු එක ලොකු දෙයක්... හැමදාම බිස්නස් නිසා ඔයාලා දෙන්නා ගැන හිතන එක පරක්කු උනා... අම්මා හිටියනම් මට බනිනවා..."

"එහෙම කියන්නෙපා තාත්තේ... ඔයා අපි ගැන හිතපු තරම් මේ ලෝකේ කිසිම තාත්තා කෙනෙක් හිතලා නැතුව ඇති..."

සසංකගේ කතාවට මුදුන්කොටුව මහතාගේ දෑස්වල කඳුළු පිරුණි.



# 20

මුදුන්කොටුව මහතා සවස තුනට පමණ ඉන්දියාවේ සිට තම රන්තරු ආයතනයේ නිෂ්පාදන අංශයට කතා කළේය... ඒ මොහොතේ චන්දනා උන්නේ වැඩ මූලික ගුණසේකර සමඟ කතා කරමිනි. ඇය කතා කරන අතරවාරයේම දුරකතනය එසෙව්වාය.

"එහෙනම් ගුණසේකර වැඩ කරන්නේ නැති අච්චු ඔක්කොම අපි හෙටම හදාගමු... මේ අච්චු අද තියෙන අච්චු වලට වඩා ගොඩාක් හොඳ ඒවා... අපි දැන්මම අලුත් අච්චු ගන්නේ නෑ... අනික මේ අච්චු අපේ ලොකු සර් මුලින්ම ගත්ත ඒවා... ඒවල ලොකු වාසනාවක් තියෙනවා... ඒවා අපි හදාගමු... එහෙනම් දැන් යන්න..."



SIHINA

චන්දනා දුරකතනය කනට තබා ගත්තේ ගුණසේකරට බය වීක කිසු පසුය. තම පුතා ගෙන ඇත්තේ කොතරම් හොඳ තීරණයක්දැයි මුදුන්කොටුව මහතා සිතුවේය. ඔහු ප්‍රථම වරට තම කළමණාකරුවෙකු ගැන සතුටින් සිටියේය.

"හෙලෝ.."

චන්දනා කතා කළද එකවර මුදුන්කොටුව මහතාට කතා කරගන්නට බැරි විය. ඔහු උන්නේ ඒ තරම් සතුටිනි.

"හෙලෝ.."

චන්දනා නැවත කතා කළාය.

"පුතේ මම..."

ඔහු කීවේ එපමණකි.

"අ..නේ දෙයියනේ ලො..කු ස..ර්.."

ඇය එහෙමම සිට ගත්තාය.

"ස..ර් සනීපෙන්ද සර්.."

"ඔව් පුතේ.. මං ඔයාට සුබ පතන්න කතා කළේ... ඔයාට ඉක්මනට දාන්න මට බැරි උනා.. ඒත් මගේ පුතා ඒක කළා.... ඔයා ගුණසේකරට කිව්ව කතාව ඇත්ත... ඔය අවන් මං ගත්තේ හරියට දුක් විඳලා... හරියට දුක් විඳලා.. ඒවා තමයි මේ ආයතනයට වාසනාව ගෙනාවේ... ඒක ඔයා තේරුම් ගත්ත එක කොච්චර දෙයක්ද..."

චන්දනාගේ දෑස්වල කඳුළු පිරුණි.

"මං.. ස..ර්..."

"තුණුරුවන් සරණින් වැඩ ටික කරගෙන යන්න දුවේ... ඔයාට වරදින්නේ නෑ..."

ඇයට සිහිවූයේ අසංක කිසු වදන්ය. ඔහු කීවේද මෙහෙමය.

"ස..ර් ලංකාවේ නෑ..නේ.. නැත්නම් මං ස..ර්ට ඇවිත් මුලත් දීලා වැඳලා වැඩ පටන් ගන්නේ..."





"ඔයා මට කොච්චර වැඳලා තියෙනවද දුවේ.. පුතා මට කතා කරලා කිව්වා ඔයා ගැන..."

ඇයට මුදුන්කොටුව මහතා කියනා දේවල් නුහුරුය.

"ඒ..ත් ස..ර්.. මං නා..ම ස..ර්ව.. දැකලවත් නෑ..."

මුදුන්කොටුව මහතා තම පුතාගේ වැඩ ගැන සිතුවේ හුරතලයෙනි.

"එයා ඉක්මනට එයි... ඔයා ගැන සර් හරි විශ්වාසයකින් ඉන්නේ..."

එහෙත් ඒ විශ්වාසය ඇතිවූයේ කෙසේද...

"මං.. ස..ර් මගේ ජීවිතේ කියලා හිතලා වැඩ කරන්නේ ස..ර්.."

"මං ඔය ගැන දන්නවා පුතේ..."

"සර් සනීපෙන් නේද සර් ඉන්නේ..."

"මගේ පුතා මාව වැඩ වලින් නිදහස් කළානේ දරුවෝ... මං මේ ආයතනේ දුවටයි පුතාටයි බාරයක් වෙන්න... මං එනකොට ඔයාටත් ඉන්දියාවෙන් සාරියක් අරන් එන්නම්..."

චන්දනා දෑස් පිසදා ගත්තාය.

"සර් ආවාම මං සර්ට මුලත් දෙන්න එනවා..".

"ම.. කැඩිච්ච අවන් තුන හදාගන්න කෙනෙක් ඉන්නවා... මගේ ටෙලිෆෝන් පොතේ ඇති තේනබඳු කියලා මනුස්සයෙකුගේ නම්බර් එකක් එයා දැන් ටිකක් වයසයි... ඒත් වැඩකාරයා..."

"මං තේනබඳු මහත්තයාට කතා කරන්නම් සර්..."

"එහෙනම් පුතේ රහ කේක් එකක් හදලා මටත් කෑල්ලක් අරන් එන්න.."

"ඇත්තටම ගේනවා සර්... සමහර විට සර් කේක් එකම කාලා මුගරුත් වැඩි වෙයි..."

ඇය විහිළුවක් කළාය.

"කමක් නෑ පුතේ.. මගේ කේක් කාලනේ..."

"සර්ව බුදු සරණයි.."

"ම්.. අනුරුවන් සරණයි.. වැඩ ටික හොඳින් කරගෙන යන්න..."

දුරකතනය තමා වන්දනා සැහෙන වෙලාවක් දෑස් පියාදමමින් උන්නාය.. මේ ගෙවී යන්නේ තමාගේ ජීවිතයේ වාසනාවන්තම දවස් ටික යැයි ඇයට සිතුණි.

ඒ හැම වාසනාවක්ම ඇරඹුනේ ඔහුගේ ආදරයෙනි... මේ සිදුවන දේවලුත් ඔහුත් අතර මොකක්දෝ සම්බන්ධයක් ඇත. එහෙත් ඒ සම්බන්ධය කුමක්දැයි තවමත් කෙල්ලට තේරුම් ගත නොහැක.

සසංක උන්නේ ප්‍රශ්නයකය... ඔහුටම ගොඩ එන්නට බැරි ප්‍රශ්නයකය. මේ ප්‍රශ්නය ව්‍යාපාරික ප්‍රශ්නයක්ම නොවේ. ඔහුගේ ජීවිතයටද අදාල වැදගත්ම ප්‍රශ්නයකි.

රන්තරු ආයතනයට ගොඩ වූ උදෑසන ඔහු යහපත් කළේය. එදා රන්තරු ආයතනයට ගොඩ වූ ඇසිල්ලෙන්ම මහා පුදුමාකාර දෙයක් සිදු විය. ඒ ඇය දෙස මුලින්ම දැක්කේ ඒ උදෑසන රන්තරු කාර්යාල කාමරයේදීය.

ඔහු රන්තරු ආයතනයට එදා හදිස්සියේ ගොඩ වූයේ මෙසේ බොරුවක් කරන්නට සිතාගෙන නොවේ. එහෙත් ඒ දැස වූ මොහොතේ හදවත දඟකාර කමට මෙන් විහිළුවක් කළේය.

අද ඒ පුංචි විහිළුවට සැහෙන දුර ගොසිනි. තව දුරටත් ඇය ඉදිරියේ ඇගේ අසංක ලෙස පෙනී සිටිය නොහැක. එහෙත් ඔහුද පිටරට ගොස් ඉගෙන ගෙන ලංකාවට ආ සසංක මුණුන්නෙහොටුව නම් වූ තමාට වඩා ඇය ඉදිරියේ මැවුණු දුප්පත් අසංකව ආදරය කළේය.

කෙල්ල තමාට ආදරය කළේ රන්තරු ආයතනයේ අනාගත හිමිකරු බව දැනගෙන නොවේ. ඇය ආදරය කළේ රන්තරු කේක් ආයතනයට ආ දුප්පත් සේල්ස් කරුවෙකුටය.

එහෙත් කෙල්ල තමාට ආදරය කළේ රජෙකුට දෙවියෙකුට ආදරය කරන්නාක් බඳුවය. ඔහුට පුදුම ඒකය.





දැන් මේ රහස එළි කරන්නට කාලය පැමිණ ඇතැයි ඔහුට සිතුණි. දුප්පත් කෙල්ල අසංකට පෑ ආදරයම සසංකටත් දක්වයිද... ඔහු කලබලයෙන් උන්නේ ඒ ගැනය.

"අංසක උනත් සසංක උනත් කෙල්ල ආදරේ කළේ උඹට සහා... කෙල්ල ටිකක් ගැස්සෙයි... ඒත් ගැහිරයෙන් ලේසියෙන් පලුවේ තියෙන ආදරයක් නැති කරගන්නේ නෑ..."

"තාත්තත් කෙල්ලට හරි ආදරෙයි රුවන්.. මට හිතෙනවා කෙල්ලව ඉක්මනට ගෙදරට එක්කන් එන්න පුළුවන් කියලා..."

සසංක කියද්දී රුවන් ඔහු දෙස බැලුවේ පුදුමයෙනි.

"ඒ කියන්නේ සසංක මුණුන්නෙහොටුව බඳිනවා..."

"මටත් පුදුමයි මචං... මං ආදරේ කරනවා කියපුවහම..."

"ඉක්මනට බැඳපන්... මං ජීවිතේ දැක්ක ලස්සනම යාළුවා උඹ... ඒ වගේම ලස්සනම ආදරවන්තයත් උඹ.. කවදාහරි උඹ හොඳ තාත්තා කෙනෙකුත් වෙයි... කොහොමත් සහා ඒ ගෙදරට අම්මා කෙනෙක් ඕන..."

සසංක රුවන්ගේ වචන වලින් මහා ධෛර්යයක් ගත්තේය.

"කෙල්ල උඹ ගැන මොනවත් දන්නෑ තමා... මේ වෙන දේවල් කොහොම වෙනවද කියලා කෙල්ලට හිතා ගන්නවත් බෑ තමයි... ඒත් සහා වන්දනාට මොනවා හරි දැනෙනවා..."

"ඒකමයි කෙල්ලට බොරුවක් කරන්න බැරි රුවන්... අත අල්ලගෙන කියනවා ඔයා මහ බලගතු කෙනෙක් කියලා..."

"මිනිහෙක් ගැන එහෙම අවස් එන්නේ මේ ලෝකේ ගෑණු දෙන්නටයි සහා... එක්කෙනෙක් අපේ අම්මට... අනිත් කෙනා අපිට ආදරේ කරන ගෑණිට..."

සසංකා මොහොතකට දෑස් පියාගෙන ඇගේ මුහුණ මවා ගත්තේය. "ඔයාව දැක්කහම මට හිතෙන්නේ මගේ අම්මා මං ගාවට



SIHINA

ආයෙත් ඇවිත් කියලා..."

"පුඩක්ෂන් එකේ වැඩ කොහොමද රුවන්..."

"මා..ර..යි..."

රුවන් ඇඳෙන් නැගිට කීවේය.

"කෙල්ල බාරගන්නකොට අවන් දෙකයි වැඩ කරලා තියෙන්නේ.. අනිත් හතරම නැවිලා... මික්සර් ඔක්කොම වැඩ කරලා නෑ... ඒත් ටිකේ උදේ ඉඳලා පුඩක්ෂන් එකේ ඔක්කොම මැෂින් රෙපෙයාර් කරලා මීයෝ කාලා තිබුණ වයර් අලුතින් වයරින් කරලා.. ලයිට් දාලා.. පේන්ට් කරලා මේස හෝදලා ස්ටෝරු අස් කරලා.. අනේ මචං... උඹ ගන්න යන ගෑණි නිසා කියනවා නෙමේ... පුදුමයි.. ඔක්කොටම වඩා පුදුම සිගරට් බීබී තැන තැන අයිස් ගහපු පුඩක්ෂන් එකේ මිනිස්සු මේ කෙල්ල එක්ක වැඩ කරන හැටි..."

"ගෑණියෙක්ට මහ පුදුම දේවල් කරන්න පුළුවන් රුවන්.."

රුවන් පැමිණ සසංකගේ උරහිස මත සුරත තැබුවේය.

"පිරිමි ඒක හිතන්නෑ... ගෑණියෙක්ගේ ආත්මය ඇතුලේ පාර්වතීගේ අවතාරේ තියෙනවා කියන්නේ ඒකනේ... කෙල්ල දැන් පළවෙනි බටර් කේක් තොගයට මිලු ටික ලියාගෙන ඉන්නවා... කමක් නැත්නම් සඳුදා ඉඳලා පුඩක්ෂන් පටන් ගන්නද කියලා අහනවා..."

"අපි හිතුවේ මාසයක් වත් යයි කියලා.. නේද..."

"සසා... මේ කම්පනි එකේ නම් රන්තරු උනාට මෙච්චර කල් මේ කම්පනි එකට රන්තරුවක් පායලා තිබ්බේ නෑ... ඒත් දැන් පායලා.. මං උඹට කියන්නේ සඳුදා ඉඳලා අර උඹේ අල්මාරියේ තියෙන ලා රෝස පාට ෂර්ට් එකයි තද රතුපාට ටයි එකයි ඇඳගෙන හරියටම රාහු කාලේ පන්නලා රන්තරු එකේ අලුත් මැනේජිං ඩිරෙක්ටර් විදිහට ගොඩ වෙයන්.. ම..ට හරි ආසයි උඹව මේ අත් දෙකින් "සර්" කියලා පිළිගන්න... කෙල්ලට කියලා උඹට මල් මාලයක් දාන්න..."



එසේ කියද්දී රුවන්ගේ දෑස්වල කඳුළු පිරී තිබුණි. සසංක ඇඳෙන් නැගිට රුවන්ගේ පිට හරහා සුරත යැව්වේය.

"අද සිකුරාදා... මට වීක් එන්ඩ් එකේ දවස් දෙක දීපන් කොල්ලෝ... මට ඒ ඇති..."

"මං කෙල්ලටත් කෙට නිවාඩුවක් දෙන්නද..."

රුවන් සිනාසී ඇසුවේය. සසංක සිනාසුණේ ලැජ්ජාවෙනි.

"අයියේ..."

සසංකා උඩු මහලේ අයියාගේ කාමරයට ආවේ තේ දෙකක් හදාගෙනමය.

"කෙල්ල ලස්සන වෙලා නේද රුවන්.."

ඔහු නාම නැගණිය දෙස බලා කීවේය.

"යන්ඩ අයියේ... මින්න ටික් සිරි තේ හැදුවේ... ඒක නෙමේ දෙන්නාත් එක්ක උඩට වෙලා මොනාද කුසු කුසු ගාන්නේ..."

රුවන් සසංකා දෙස බලා සිනාසුණේය.

"ඇයි අයියා නංගා පොඩ්ඩ ගැන කිව්වේ නැද්ද නංගී.."

"මගේ අයියා එච්චරම නරක නෑ..."

"ඒ උනාට නාම මගේ මස්සිනා පොඩ්ඩගේ මූණ බලාගන්න බැරි උනා..."

සසංක කීවේ දුක්බර හඬිනි.

"එයාට නාම මේ සසංකාගේ හාට් එකට එන්න වීසා ලැබිලා නෑ..."

"එන වෙලාවට එයා එන්නේ බබා වීසා නෙමේ පාස්පෝට් වත් නැතුව... අයියාගේ හාට් එකට ආවා වගේ..."

"ඇත්තද..."

ඔහු සිනාසෙමින් රන් පැහැ ගත් පෝසිලේන් කෝප්පයක් මුවට තබා ගත්තේය.



SIHINA

"රුවන් අයියා කැමට ඉන්නවද... අද අපි නූඩ්ල්ස් හදන්න යන්නේ..."

රුවන් ඔළුව සැලුවේය.

"ඌං ඉන්නවා... මමං හදන්න..."

සසංක කාමරයෙන් ගිය තම සොයුරිය දෙස බලා උන්නේ ආදරබර බැල්මෙනි. දවසක චන්දනා මේ ගෙදරට ආ දවසකට තමාටත් තාත්තාටත් වඩා හොඳට ඇය මේ නංගිව බලාගනු ඇත.

SIHINA

# 21

චන්දනා පිල්ලැව පන්සලට ගියේ පාන්දරමය. වීක දවසක ඉඳල පන්සලට ගොස් වැඳ එන්නට ලොකු ඕනකමක් ඇයට ඇතිවිය.

මේ ජීවිතයේ එක දිගට මහා පුදුමාකාර සිදුවීම් මාලාවක් සිදුවිය. ඒවා සිදු වූයේ කාගේ හෝ දේව නියමයක් විලසිනි. මේ දේවල් මේ තරම් ලස්සනට වූයේ කොහොමදැයි තවමත් කෙල්ලට සිතා ගත නොහැක.

මේ හැම දෙයක්ම පිටුපස කුමක් හෝ බලගතු දෙයක් ඇතැයි චන්දනාට හැම වෙලේම සිතෙයි. එහෙත් ඒ කුමක්දැයි තවමත් ඇයට සිතාගත නොහැක.

"අප්පච්චි මං පන්සලට ගිහින් එන්නම්..."

අප්පච්චිගේ ඇඳ ළඟටම ගිය වන්දනා කීවාය. තවම එළිය වත් වැටී නැත.

"මේ පාන්දර මැණිකෙ..."

"තව ටිකකින් ඉර පායයි.. මං තේක ගෙනත් දීලම යන්නද..."

"මං ගන්නම් පුතේ.. මේ මොනාද..."

ඇය අත තිබූ පාර්සලය දැක අප්පච්චි ඇසුවේය.

"මේ ලොකු හාමුදුරුවන්ට වීවා බෝතලයක් ගත්තා... අසනීප පිටිනේ ඉන්නේ.. කතා කරලා පූජ කරලා එන්නම්..."

"කතා කළා නම් මාත් ඇඳගන්නවනේ පුතේ..."

"ම්හ්... අද පින්න වගේ.. මං දුවලා එන්නම්..."

වන්දනා කාමරයෙන් පිට වූයේ මදක් පහත් වී අප්පච්චිට වැඳය.

වන්දනා ගුරු පාරේ ඇවිදගෙන ආවේ නැඟෙනහිර අහස් කුසින් යංතමට මෙන් රත්තරන් පාටක් මෝදු වීගෙන එද්දීය... පාන්දර අඳ අඳුර අතරින් සුදු සායත් බ්ලවුසයත් ඇඳගත් හැඟීම්බර දර්ශනයකි.

ඒ දෙස ඔහු බලා උන්නේ ලෝබකමිනි. සසංක ඔහු ආ කාරය ගුරු පාර මහ පාර එකතු වෙන තැන නවතා බලා උන්නේ ඇය එන දෙසය... වාහනයේ ඉන්නේ ඔහු බව ඇයට පෙනෙන්නේ නැත. ඊටත් මේ මහා පාන්දර ඔහු වාහනයකින් එතැනැයි ඇය හිතුවේද නැත.

මේ දැන් පිපුණු මලක් ඇවිදගෙන එන්නාක් බඳු සුන්දරත්වයක් ඔහු ළං ළංව දැක ගත්තේය. වාහනය අද්දරටම ආ මොහොතේත් ඇය ඔහුව දැක්කේ නැත.

සසංක මිදු සිනහවකින් යුතුව වාහනයේ දොර හැරියේය. ඇය බැලුවේ ගැස්සීගෙනය. ඔහුව දුටුවනම ඇය පුදුමයෙන් සිනාසුණේය.

"අ..නේ දෙ..යි..යෝ... ඔයා..."

"මං තමා බ..බා..."

"අ..නේ මං හිත හි..ත ආ..වෙත් ම..යා ගැනම..නේ..."

"මං දන්නවා..."

"කො..හොමද දන්නේ..."

"මූණෙන් පේනවා..."

ඇය මොහොතක් ඔහු ආ වාහනය දෙස බලා උන්නාය.

"ම..හ..ත්..ත..යෝ.. මේ කාර් එ..ක..."

"මං.. කි..ය..න්..න..ම්... මට කියන්න ඕනේ පුංචි කෙල්ලා කොහෙද යන්නේ කියලා..."

කෙල්ල තොල් පට පෙරළා සිනාසුණේය.

"උදේන්ම පන්සලට ගිහින් එන්න හිතුණා..."

"හිතේ බරකින්ද බබා ඉන්නේ..."

"ම්.. න..රි හිතේ බරකින් ඉන්නේ... අපිට සුදු මහත්තයෙක් හම්බ උනා..නේ... එයා ඇවිත් හිත උඩ සම්බන්ධ කරන්නම් කියලා.. ඉතින් බරයි..."

ඔහු දුක්බර ලෙස ඇගේ අතකින් අල්ලා ගත්තේය.

"නගින්න.. යං මාත් එක්ක පන්සල් යන්න..."

ඇය වාහනයේ ඉදිරිපස අසුනේ ඉන්දවා ඔහු මොහොතක් බලා උන්නේය.

"ඇ..යි..."

"හරි ලස්සනයි..."

ඔහු වාහනය පණ ගන්වා රිවස් කරද්දී ඇය වාහනයේ ආසනයට ඉදිරියෙන් තිබූ ෆයිල් කවර කිහිපයක් දෙස නිකමට බැලුවාය. ඒ සියල්ල රත්තරු ආයතනයේ විවිධ කටයුතු පිළිබඳ ෆයිල් කවරයි... ඒවා ඔහු ළඟ තියෙන්නේ ඇයි...

"මේ.. ෆයිල්ස් ර..ත්තරු.. ඒවා..."

"රත්තරු එකේ ෆයිල්ස්..."

"මං දන්නවා... ඒවා.. ම..යා..."

"නැ..ම දෙ..ය..ක්..ම මං කිය..න්..නා..ම්... පන්සලට ගිහින් ඇවිත් කොහේ හරි යන්.."

ඔහු කීවේ ඇගේ හිස අතගාය. චන්ද්‍රනාගේ හිතට මහා අමුත්තක් දැනුණි. ඇය සසංක දෙස මොහොතක් බලා උන්නාය. ඇය ගියරය මත තිබූ ඔහුගේ වමතට සුරත තැබුවාය.

"අ..ස..ං..ක අයියේ..."

"කියන්න බ..බා..."

"ම..ට මහ මො..ක..ක්ද දැනෙනවා... ඇ..යි ඒ..."

"එ..හෙම දැ..නෙන්නේ දැනෙන්න දෙයක් තියෙන නිසා බබා..."

"මො..න දේ උ..නා..ත් ම..ට ඔ..යා..ව නැ..ති වෙ..න්..නැ නේ..ද..."

සසංකගේ පපුව උණු වීගෙන මෙන් ගියේය. ඔහු වඩාත් සුරක්ෂිත ලෙස ඇගේ සුරත අල්ලා ගත්තේය.

"එ..හෙම උනොත් ඔයාගේ මහත්තයා ජීවත් වෙන්නේ කොහොමද..."

"ම්... ම..ට..ත් බැ..."

ඇය දුක්බර ලෙස මිමිණුවාය.

පිල්ලෑව රජමහා විහාරය පිහිටා ඇත්තේ විශාල වෙල් යායක් මැදි කරගෙනය. කොළඹ හොරණ පාරේ පිහිටි මේ විහාර භූමිය පාන්දරට ලස්සනය. සැහෙන ඈතක් වග කුරු අත්තිඩිය කුරුළු අභය භූමිය පැතිර ඇති නිසා නගරයක පිහිටි මේ පූජා බිමට ලැබෙන්නේ පිටිසරබද පන්සලක පෙනුමය.

ඇය ඔහුට කියා වාහනය ප්‍රධාන පාරේ පසෙක වූ නෙළුම් මල් අලෙවි සැල් අසළ නවත්වා ගත්තාය. මල් කඩයට අලුත්ම මල් ආවේද දැන්ය. පාන්දරම ආ අලුත් සුදු නෙළුම් මල් දකිද්දී ඇගේ හිතම පිරී ගියේය.

"මට මල් ටිකක් දෙන්න..."

මල් කරු සිරියාවන්න ඇගේ මුහුණ දෙස බලා අතට හසුවූ මල්





පොකුරම ඇයට දුන්නේය.

"මෙ..ච..ච..ර..."

"උදේ පාන්දර පළවෙනි බිස්නස් එක කළේ නුඹ නෝනා උන්නහේ... ගන්න නුඹ නෝනා..."

ඇය සසංක දෙසද බලා සිනාසී පර්ස් එකෙන් තවත් රුපියල් පනහක් ගෙන මල්කරුට දුන්නාය.

"අලුත්ම මල්... ඊයේ රෑ කඩාපුවද නොවෙද..."

අලුත් නෙළුම් මලකත් ඇගේ මුහුණ අබියස කිසිදු වෙනසක් නැතැයි ඔහුට සිතුණි.

"මං හිතන් ඉන්නේ ලොකු සර් ලබන සතියේ ආවම එහේ ගිහින් ලොකු සර්ට මුලත් දීලා වැඳලම පන්සලට එන්න..."

කෙල්ල මේ කියන්නේ තාත්තා ගැන බව සසංක දනී.

"හ..දි..ස්..සියේ මුලත් දෙන්න..."

"ස..ර් මං ඉන්ටවිව් ආපු දවසේ මගේ මූණ බලලා ගත්තේ... මං.. ඒ.. දවස්වල හරී ප්‍රශ්න ගොඩක උන්නේ... අප්පච්චි ජයවර්ධනපුර එකේ නවත්තල උන්නේ... අ..තේ සතයක් තිබ්බෙ නෑ... අ..ප්පච්චිට බෙහෙත් ටික ගත්තේ ම..ගේ මාලේ බැංකුවට තියලා... ඒ වෙලාවේ ම..ට ඒ රස්සාව ලොකු දෙයක් උ..නා.. එදා මං හිතා ගත්තා ම..ට මෙච්චර දෙයක් දීපු සර්ට අබමල් රේණුවකින් වත් වරදක් කරන්නේ නෑ කියලා..."

මේ ටික කියද්දී ඇගේ ඇස්වල කඳුළුද විය. තමන්ම ප්‍රතිපත්ති හදාගෙන තමාම ඒ ප්‍රතිපත්ති රකින කෙල්ලන් අද ඉන්නවාද කියා ඔහුට පුදුමය. ඉන්නවානම් ඒ තම අනාගත බිරිඳ පමණක් බව ඔහු දනී.

"එ..දා සර් ක..තා කළානේ..."

"ඉ..තින්... මොනාද කිව්වේ..."

SIHINA

"ම..ට ඇඬුණා.. අනේ තුන් පාරක් මට තුණුරුවන් සරණයි කිව්වා.. මොන එහෙකටද මන්දා ලොකු සර් ඔහොම කරනකොට මට මගේ මහත්තයාව හරියට මතක් වෙනවා.."

ඇය කීවේ ඔහුගේ අත අල්ලාගෙනය. "එහෙම මතක් වෙන්න ලොකු බැඳීමක් තාත්තයි මායි අතර තියෙනවනේ.." සසංක කීවේ සිනෙනි.

"සර් මට ඉන්දියාවේ ඉඳලා එනකොට සාරියකුත් අරන් එනවා කිව්වා.."

තාත්තා ඒ සාරිය රැගෙන එන්නේ ඔහුගේ අනාගත ලේලියට බව දන්නවානම්... ඔහු එතවරම මඟුල් සාරියම රැගෙන එනු ඇත.

වාහනය පිල්ලෑවට යන ගුරු පාරේ ඇදී ගියේය. දෙපස වූයේ කුඹුරුය. තවමත් හිරු හරියට පායා නැත. ඒ නිසා පරිසරය තවමත් නෙළුදල් කුමාරියක් වාගේය.

"එනවද මාත් එක්ක මලක් පූජ කරන්න..."

ඇය වාහනයෙන් බහිමින් ඇසුවාය.

"නැතුව... ජීවිතේ පුරාම වයසට යනකල් මල් පූජ කරන්නේ ඔබා එක්ක තමා..."

"මං දන්නවා... එන්න..."

මුළු පරිසරයම දසසිල් සමාදන් වූවාක් වැන්න.

"මට කිව්වෙවත් නෑ උදේ එනවා කියලා..."

අලුත් නෙළුම් මල් වල පෙති පුබුදුවමින් ඇය කීවාය.

"ඊයේ රෑට නින්ද ගියේ නෑ..."

"ඉතින්... උදේ දුවන් ආවේ මං ළඟට වෙලා දොයියන්නද..."

ඇය ඇසුවේ ඔහුගේ වතට මඳ ලෙස බරවීය.

"දොයි කරනවනම් දොයියනවා..."

"හිත හරි බරයි..."

ඔහු යළිත් කීවේය. ඒ තරම් හිත බර වන්නට තරම් ඇති ප්‍රශ්නය කුමක්ද...

"ටික දවසක ඉඳලා මාත් දැක්කා.. මං හි..ත්..ද.."

ඇය මල් පෙති ඇල්ලූ ඇඟිලි තුඩු ඔහුගේ අත මත තබා ඇසුවාය.

"ම.."

"අ..නේ..."

"දෙයක් හිතේ තියෙනවා... කියනකල් හිතට නිදහසක් නෑ..."

"ඉතින් ර..ත්..ත..ර..න් හිතේ තියෙන දේ.. කි..ව..න්.."

ඇය කෙළ පොදක් ගිලිමින් කීවාය.

"එ..ක දෙයක් කිව්වේ නෑ..."

මල් අල්ලා උන් ඇගේ ඇඟිලි තුඩු වෙව්ලන්නට විය.

"අ..නේ.. මං..ට බ..යයි..."

"එහෙම බය දෙයක් නෙමේ..."

"ඔ..යා ම..හ..ත්..ත..යෝ කා..ට..ව..ත් අ..යිති වෙලා නෑ නේද..."

එවර නම් සසංක කට පුරා සිනාසුණේය. ඊටත් පසු ඔහු ඇගේ හිස් මුදුනට සුරත තබා පිරිමැද්දේය.

"කවුරුවත් කොහොම අල්ලගන්නද... මගේ පුංචි නෝනා මාව තද කරලා අල්ලගෙනනේ..."

"එ..ව..ව..රයි ම..ගේ හිතට සැනසීමක් තියෙන්..නේ..."

ඇය කීවේ සැහැල්ලුවෙනි.

"ඉතින් මොනාද කියන්න තියෙන්නේ..."

"දෙයක් තියෙනවා..."

"ඉතින් කියන්..න..."

ඔහු හිසට ඉහළින් ඇති මහා බෝ ගස දෙස බැලුවේය. මේ සත්‍ය කියන්නට මීට වඩා හොඳ තැනක් නැත. තමා කළ අහිංසක බොරුව මේ බෝ මළුවේ සිටම හෙළි කළ යුතුය. ආදරය වෙනුවෙන්

SIHINA

කළ ඒ වරදට මේ බෝ ගසට අධිගෘහිත දේවතාවුන් වහන්සේ සමාව සමාව දෙනු ඇත.

සසංක ඇගේ අතකින් අල්ලා ගත්තේය. ඇය හිස ඔසවා ඔහු දෙස බැලුවේ තොල් පට තද කරගෙනය.

"ආ... මේ චන්දනා පුංචි නෝනාගේ... පොඩි නම කිව්වට මෙච්චර උදෙන් ඇවිත් කියලා මං හිතුවේ නෑ..."

සසංක කියන්න ගිය දේ මොහොතකට හිර කරගත්තේය. සමහර විට එය කියන්නට හොඳම නැකත මේ නොවන්නට ඇත.

"උ..දෙ..න්.ම ආවා අපේ පොඩි හාමුදුරුවනේ... මේ..."

චන්දනා ඔහු දෙස බලා පසුව ලොකු හාමුදුරුවන් දෙස බැලුවාය.

"මේ මං... බ..දි..න්..න ඉන්න මහත්තයා අපේ හා..මුදුරුවනේ..."

එහෙම කියද්දී ඇගේ මුළු පපුවම මොනවදෝ දෙයකින් පිරී ගියා සේ විය.

"අ..නේ කොච්චර දෙයක්ද... මේ පන්සලට මහත්තයා අනන්තවත් ගෑනු ළමයි එනවා... ඒත් අපේ පුංචි නෝනා තරම් පින්වන්ත ගෑනු ළමයෙක්ව මං දැකලා නෑ... පිනකට ලැබුණා කියලා හිතන්න..."

"ඒක මං දන්නවා අපේ හාමුදුරුවනේ..." ඔහු හිනින් කීවේය.

"මායි අපේ හාමුදුරුවනේ පින් කරලා තියෙන්නේ මහත්තයා වගේ කෙනෙක් ලබන්න..."

චන්දනා කීවේ තව ටිකක් ඔහු ළඟට විය. සසංකගේ දෑස උණුවී ගියාක් මෙන් විය.

"කලාතුරකින් ඔහොම දෙන්නෙක් එකතු වෙන්නේ... වෙඩින් එක දවසට කියන්න මං ඇවිත් පිරිත් ටිකක් කියන්න ඕන..."

"ඔබ වහන්සේ එන්නම ඕන... හෙට අනිද්දට අපි බඳිනවා අපේ හාමුදුරුවනේ..."

එහෙම කීවේ සසංකය. චන්දනා ඔහු දෙස බැලුවේ පුදුමයෙනි.



"දැන් සනීපද අපේ හාමුදුරුවනේ..."

"ටිකක් හොඳයි පුංචි නෝනා... තව ඇගට ටිකක් පණ මදි..."

"මං ඔබ වහන්සේට විතා එකක් ගෙනාවා... ඒට බොන්න අපේ හාමුදුරුවනේ..."

උන් වහන්සේ සිනාසුනේ සසංක දෙස බලාය.

"ලොකු වාහන වලින් මේ පන්සලට එන දායකයෝ ඉන්නවා අපේ හාමුදුරුවනේ... ඒත් මේ වගේ පුංචි දායිකාවක් මං දැක්කෙ නෑ... හරියට පුංචි විශාඛා වගේ..."

ඇය එහෙමම බිම බලා ගත්තාය. සසංක ඔහු දෙස බලා උන්නේ ඒ ප්‍රිය විශාඛාව ලැබුණේ තමාට නොවේදැයි ආඩම්බරයෙනි.

SIHINA

# 22

තාමත් සසංකගේ පපුව බරය. මන්සලේදී අර ඇත්ත කියාගන්නට ලැබුණේ නම් මේ බර නැත. එහෙත් එක අතකට එය කිව යුත්තේ මේ කෙල්ලට හයියෙන් පපුවට තද කරගෙනය. එවිට ඇයට දුරුස් වී යා නොහැක.

ඒ ඇත්ත කියූ පසු කෙල්ලට ඇඬෙන බව ඔහු දනී. එසේ කියූ පසුත් මේ අහිංසක කෙල්ලගේ හදවතට දැනෙන කම්පනයක් ගෙන දෙනු ඇත.

"මො..නා..ද කිය..න්න තියෙනවා කි..ව..වේ..."

ඔහු කතා නොකර කල්පනා බරව වාහනය පදවාගෙන යද්දී ඇය අසරණව ඇසුවාය. අද ඔහු අමුතුය.





"අපි කොහේ හරි යන්..."

"කොහේද..."

"කොහේ හරි... නිස්කලංක තැනකට..."

"ම්... මං අප්පච්චිට කියන්නද... පස්සේ මිසින් එනකල් බලා ඉඳී..."

"හා... මේකෙන් කෝල් එකක් අරන් කියන්න..."

ඔහු ඔහුගේ ජංගම දුරකතනය ඇයට ඇලෙව්ය. එය පුංචි දුරකතනයක් විය. එය වටිනා ජංගම දුරකතනයක් බව ඇයට එය අතට ගත් විට වැටහිණි.

"ෆෝ..න් එ..ක..ක් තියෙනවා කිය..ලා ම..ට කි..ය..වේ නැ..නේ..."

"කි..ව..ව නැ..ති ත..ව ගොඩාක් දේවල් තියෙනවා ම..ට.. අප්පච්චිට කියලා ඉන්..න..."

එහෙත් ඇය ඇමතුම නොගෙන ඔහු දෙස බලා උන්නේය.

"ම..ට හ..රි බ..ය..ක් දැ..නෙ..න..වා... ම..ට ඔ..යා..ව..."

"මේ ලෝකේ අනිත් පැත්තට පෙරළෙන්න පුළුවන්... අපේ ආදරේට මොනාවත් වෙන්නෑ... මං ඔයාගේ... ඔයා මගේ..."

"ම..ට එ..ච..ච..ර..යි ඕ..න..."

ඇය ගෙදරට ඇමතුමක් ගත්තාය.

"අප්පච්චී..."

"පුතේ..."

"අසංකයියව මඟදී හම්බ උනා... අපි චුට්ටක් කතා කරන්න යනවා... ඒක කියන්න කතා කළේ..."

"ඔ..යා..ව දැන් අයිති එයාටනේ මැණික... මට නෙමේ... එයා ඔයාව මටත් වඩා හොඳට බලා ගනී..."

"ම්... මං ඒක දන්නවා අප්පච්චී... එහෙනම් දවල්ට කන්න

හොඳේ... මං අහංකාත් එක්ක යන්නම්..."

වන්දනා දුරකතනය වසා එය එහෙට මෙහෙට කර බැලුවේය.

"වටින ඒ..ක..ක් නේද..."

"ම..."

"හරි තරකයි... ෆෝන් එකක් තියෙනවයි කිව්ව නම් මං දිගට හරහට ඒට කතා කරනවනේ... මං කොච්චර පාළුවෙන්ද හිටියේ..."

"ඊට වඩා තරකද පුංචි හෝරා අපි බැඳලා රූම් එකකට ගියා නම්... මොකටද නිකං ෆෝන් බිල් ගෙවන්නේ..."

ඇය සුන්දර ලෙස සිනාසුනාය.

"ඒකත් හොඳයි තමයි..."

"අපි ඒ..හෙ..න..ම් කොහේද ය..න්..නේ..."

ඔහුට සිහිවුයේ එදා රුවන් සමග ගිය බොල්ගොඩ වැව අද්දර සොඳුරු නිකේතනයයි. බොල්ගොඩ වැවට මුහුණ ලා තිබූ සුන්දර බිමක තනා තිබූ ඒ නිකේතනයට ගිය මොහොතේදීත් ඔහුට ඇයව සිහිවිය.

"ය..න්..."

"හොඳ තැනක් මතක් වුණාද..."

"ම... බොල්ගොඩ වැව අයිනේ... හරි ලස්සන තැනක්..."

"කා..ත් එක්කද එහේ ගියේ..."

ඇය අසද්දී ඔහු සිනාසුනේය.

"හිතුවද කෙල්ලෙක් එක්ක..."

"මං එහෙම හිතනවද... නෙළුම් විලක් ගැන හිතනවා වගේ ම..ම..."

"එහෙනම් පසුවේ තියෙන අන්තිම දේත් කියන්න එක්කං යන්..නේ..."

වන්දනා සැහෙන වෙලාවක් සසංක දෙස බලා උන්නාය. ඇය



ටුපත් පසු ඔහුගේ වත අල්ලා ගත්තාය.

"ඒක කියන්න ඕනම දෙයක්ද..."

"ම.. කැන්දන් යන්න කලින් මේක කියන්නම ඕන..."

"කො..හො..ම..ද මාව කැන්දන් යන්නේ..."

"ඒක තමා කියන්න යන්නේ මැණික..."

ඔහු ඇගේ හිස අතගා කීවේය. ඇය කිසිවක් නොකියා දිගටම බලා උන්නාය.

"ම..ට හිතෙන දෙයක් කරන්නද..."

ඇය කෙඳිරිල්ලක් බඳු ඇසුවාය.

"ම..."

"ම..ගේ ජීවිතේට ම..යා ආපු දවසේ ඉඳලා මහ පුදුම දේවල් වෙන්නේ... හ..රි..ය..ට ඉරක් හඳක් පෑවිලේ නැති ලෝකෙකට එක පාර ඉරයි හඳයි තරුයි ඔක්කොම පෑව්වා වගේ."

කෙල්ල මේ කතා කරන්නේ තමා ගැන කොතරම් භක්තියකින්දැයි ඔහු දැන උන්නේය. ඇයගෙන් තමාට ලැබුණේ නිකම්ම නිකන් ගැහැණියකගේ ආදරයක් නොවේ. භක්තිවන්ත පිවිසිදු ගැහැණියකගේ උතුම් ආදරයකි. මේ ආදරය මේ තරම් ආදරයෙන් රැක බලා ගන්නට ඔහුට හිතෙන්නේ ඒ නිසාය.

"ජීවිතේ එච්චර වෙනසක් වෙන්නේ මහ පුදුම කෙනෙක් ජීවිතේකට ආවොත් විතරයි... හ..රි බ..ල..ග..තු කෙනෙක්..."

ඇයට දැනෙන මේ දේවල් පුදුමාකාරය.

"මේ..හෙ..ම ළඟින් ඉන්නකොටත් මට මහ පුදුම දෙයක් දැනෙනවා... කි..ය..න්..න තේරෙන්නෑ... හරියට රැස් විහිදෙන කෙනෙක් ළඟ ඉන්නවා වගේ... ම..ම මේ ඇත්තමයි කියන්නේ ර..ත්..ත..ර..න්..."

ඔහු අහිංසක ලෙස සිනාසුණේය. ඒ සිනහව නිකම්ම සිනහවක් නොවන බව ඇය දැන උන්නාය.



SIHINA

බොල්ගොඩ ගං ඉවුර වෙත ඇදෙන කෙටි ගුරු පාරකින් ටික දුරක් ගිය කල සසංක පෙළු සොඳුරු නිකේතනය හමුවිය. ගායට අරලියා ගස් වටා තිබූ විශාල ඉඩමේ පහළ කෙළවර මායිම වූයේ බොල්ගොඩ වැවටය.

"හ..රි ලස්සන තැනක්.."

තවමත් ඉර පායා ඇත්තේ යාන්තමටය. තරමක අඳුරු බවක් පරිසරයේ විය.

"එ..න්..න.."

තැන තැන වැටුණු අරලියා මල් නොපාගා ඔවුන් නිකේතනයේ ප්‍රධාන අවන්හල අසළ වූ පිළිගැනීමේ කවුන්ටරයට ගියෝය.

"අපි ගඟ පහළට යනවා.. අපට කෝපි ටිකක් එවනවද..."

සසංක කියද්දී චන්දනා ඇය දෙස බැලුවේ තොල්පට තද කරගෙනය. ඔහුට ඇත්තේ පුදුමාකාර සිතුවිලිය.

"බ්‍රේක්ෆාස්ට් ගන්නවද ස..ර්.."

"දැන්මම එපා... නමයට විතර අපි ගන්නම්..."

"හොඳයි සර්.. අද ටිකක් පොදේ වගේ... සර්ලා පහල කැබින් එකටම යන්න.."

"කොහෙද ඒක..."

"මේ අරලියා ගස් දිගේම ගියාම උඩ අමු කැබින් එක හම්බවෙයි.. මං එතනට කෝපි එවන්නම්..."

ඇය කැබින් එක දෙසට යන අතරවාරයේ බැලුවේ ඔහු දෙසය.

"කෝපි බොන්න ආසද..."

ඇය ඇසුවාය.

"මං හරි ආසයි..."

"අලුත්ම කෝපි කුඩු කරලා දෙන තැනක් තියෙනවා... මං එතනින් කෝපි ගෙනත් තියන්නම්..."

අරලියා ගස් යට වූයේ තුනී සීතලකි. ඒ සීතලට බොල්ගොඩ ගඟ දෙසින් එන සුළඟේ සීතලද එක්වූ කල මේ ඉන්නේ කොළඹ පරිසරයක යැයි හිතෙන්නේ නැත.

"චූටි පොදයක් ගහනව නේද..."

ඇය ඇසුවේ ඔහුගේ බාහුවම දෑතින් බදාගෙනය. ඔහු උන්නේ හිතේ බරිනි. මේ හිතේ ඇති දේ කිව පසු හිතට කොතරම් සහනයක් දැනේදැයි ඔහුම දන්නේ නැත.

පොල් ලීත් සිංහල උළුත් දමා තනා තිබූ කැබින් එක ඇත්තටම සුන්දරය. එයට "තොටුපළ අද්දර නිවහන" ලෙස නමක්ද දමා තිබුණි.

"අපිත් මේ වගේ ගෙයක් හදාගත්ත නම් හරි... එතකොට ඒකට දාන්න පුළුවන් ගඟ අද්දර නිවහන කියලා..."

ඇගේ හිතේ ඇති නිස්කලංක බව තමාගේ හිතෙත් ඇත්නම්..

"ඈ..යි මූ..නූත් කිය..න්..නැත්තේ..."

රතු සිමෙන්තියෙන් නිමවා තිබූ දිග අසුනක වාඩිවෙද්දීම ඇය ඇසුවාය. එතන ඉඳගත් කල බොල්ගොඩ වැවේ ඈත අනන්තය දක්වාම පෙනෙයි.

"සි..යන්න ගොඩාක් දේවල් තියෙනවනේ ඔබා..."

ඔහු නාන්නා කෙනෙකු සේ ඇගේ හිස පිරිමැද්දේය. ඇය තෙත් වූ දෙනෙතින් බලා උන්නාය.

සේවකයෙක් පැමිණ සුන්දර පෝසිලේන් ටී සෙට් එකක කෝපි ගෙනවිත් තැබුවේය.

"සර් තව මොනවා හරි ඕන නම් මේ බටන් එක ඔබන්න..."

"හොඳයි..."

කෝපි සීනි කිරි තබා තිබුනේ වෙන වෙනමය. සුන්දර පෝසිලේන් ටී සෙට් එකක එවා තිබූ කෝපි ට්‍රේ එක ළඟ ඇය දණ ඔබා ගත්තාය.

"මං හදන්නද... නිකං කෝපිද ආස කිරි කෝපිද..."

"ම්.. නිකං කෝපි... ඔබා කිරි කෝපි බොන්න..."

"හ්ශ්.. මාත් ආස අරම තමයි..."

ඇය හැඳවේ කොළි දෙකක් හොව එනනි. ගාණට සිනි දමා ඇය කොළි එක හදා දෝතින්ම ඔහුට පෑවාය.

"හොඳ රහට හදලා... ඔබාට..."

"මගෙන් පුරිටක් දෙන්න..."

ඔහු එහෙමම කොළි එක ඇගේ මුවට ළං කළාය. ඇයට බැලුමෙන් කොළි එක දෙස නොව ඔහුගේ දෑස දෙසය.

"ඕ..හො..ම බල..න්..නේ.. ඇ..යි.. හිතේ කරදරේකින්ද ඉන්නේ..."

"ම්.. කරදරේකින් නෙමේ... හිත හරි බරයි..."

"ඇයි මට කියන්නැත්තේ... මා..ත්.."

සසංක ඇගේ බඳ වටා සුරත යවා ඇයව ගල් බංකුවේ තමා ළඟින්ම ඉන්දවා ගත්තේය.

"ම..ට කො..ච්..චර ආදරේද..."

ඔහු ඇසුවේ බොළඳ ලෙසිනි. ඇය එහෙමම ඔහුගේ දෙපා වලට බරදී ඒ පපුවට හිස තැබුවාය.

"කි..ය..න්..න බැරි තරම් දෙ..යි..යෝ.. ම..ටවත් හිතාගන්න බෑ... මම.. ඔ..යාට මෙ..හෙ..ම මෙ..ච්..චා..ර ආ..දරේ ක..ර..න්..නේ කොහොමද කියලා..."

"මං.. මො..න..වා කි..ව්..ව..ත් ඒ ආදරේ වෙ..නස් වෙ..න් නෑ නේ..ද..."

"නෑ.. මැ..රෙ..න්..නෙත් ඔයාගේ ආදරේ හිතේ තියාගෙන..."

"ම..ට ලො..කු ක..තා..ව..ක් තියෙනවා කිය..න්..න..."

"ම..ම මෙහෙමම ඉන්නද..."

"ම්.. ඔයා ඔහොමම ඉන්න ඕන... මෙක කිව්වට පස්සෙත්..."

"ම..ට තුරුල් වෙන්න වෙන කෙනෙක් නැනේ මහත්තයෝ..."

"මටත් තුරුල් කරගන්න වෙන කෙනෙක් නැනේ..."





ඔහු ඇගේ හිස් මුදුන සිප දිග සුසුමක් පපුවට ගත්තේය. මේ කතාව කොහෙන් පටන් ගන්නද...

ඇගේ දෙපා වලට ඔහුගේ සුසුමේ රස්නය දැනෙයි.

"මං රන්හාරු එකට ආපු උදේ මතකද..."

"ම්... එදා කොහොම අමතක කරන්නද... එදා ඉන් ඉස්සෙල්ලාම දැක්ක දවසේ මට මොනාද උනා..."

"මොනාද උනේ..."

"දන්..නෑ... අසංකයියේ... ක..වියට ආපු කෙනෙක් මේ ආත්මේදී එක පාරටම හ..මු..උනා... වගේ..."

"මා..ම ක..ලි..න් දැකලා ති..බි..බා වගේ හි..තු..ණ..ද..."

"ම් දැ..ක..ලා තිබ්බා වි..ත..ර..ක් නෙ..මේ... එ..ක..ට ජී..ව..ත් වෙ..ලා..න් ති..බි..බා වගේ දැ..නු..ණා..."

ඇගේ උකුලේ උන් ඔහු ඒ පිරිමි ඇස් වල වූ පවිත්‍ර බව හොඳින් බලා උන්නේය.

"ම..ට..ත් ඒ..හෙ..මම හිතුණා කියලා කිව්වොත් ඔයා පිළිග..න්..නා..වා නේ..ද..."

"මං දන්නවා... ඒ..ක..නේ මං ළ..ඟ..ට මෙ..හෙ..ම ආ..වේ..."

"එත් බ..බා..."

ඔහුගේ උගුර අගින් වචන පිටවිය.

"කිය..න්..න..."

"එ..දා ආවේ අසං..ක නෙමේ..."

ඔහු මේ කියන්නේ කුමක්දැයි ඇයට එකවර සිතා ගන්නට බැරි විය.

"ම..ට තේ..රෙ..න්..නෑ ර..ත්..ත..ර..ං... එදා ආවේ අසංකම තමා.. මේ දැ..න් මගේ උකුලේ ඔළුව තියන් ඉන්නෙත් ඒ අසංකම තමා... නේ..ද..."

මොහොතක්දෝ වෙව්ලීමක් ඇගේ වචන වල විය.

"ඒ..ත් මං අසං..ක නෙමේ..."

"අ..නේ දෙ..යි..යෝ..නේ මො..නාද මේ කිය..න්..නේ... මේ ඉ..න්..නෙ මගේ අසංක..නේ.. මගේ වස්තුව නේ..."

"මේ ඉන්නේ ඔයාගේ වස්තුව තමා බ..බා... ඒත් ඔයාගේ වස්තුව අසංක නෙමේ..."

"එ..හෙ..නා..ම්..."

"මං... මං සසංක මු..ධුන්කොටුව... ඔයාගේ ලොකු සර්..ගේ පු..තා..."

කෙල්ලගේ පපුව එහෙමම හිරවිය. මහා සාගර ජල කඳක් පැමිණ එකවර තමාව ගිල්ලවා දැම්මාක් මෙන් පපුව එකවර හිරවී ගියේය. එහෙත් ඒ මොහොතේ ඔහු වඩාත් ශක්තිමත් ලෙස ඇගේ දෑතම අල්ලාගෙන උන්නේය.

"අ..නේ මේ... මො..ක..ද දෙ..යි..යෝ..."

වන්දනා කතා කරන්නට ගියද ඇගේ මුවින් වචන පිට වූයේ නැත.

"මං දිහා බ..ල..න්..න මැණි..කා..."

ඔහු අතකින් ඒ මුහුණ තමා දෙසට හරවා ගන්නට වෙර ගත්තේය. එහෙත් දිය සීරාවක් ලෙසින් ඒ ඇස් වලින් එක දිගට කඳුළු ගලා එන්නට විය.

"මං... බො..රු..ව..ක් ක..ළා නෙමේ බ..බා... මං... එ..දා ඔ..යාව දකිද්දි හ..රි..යට අසරණ උ..නා... ආ..ත්ම ගානක් මං ළඟ හිටපු ගෑණිව දකිද්දි මිනිහෙක්ට එ..හෙ..ම වෙ..නා..වා..."

"මං... මං... කො..හො..ම..ද... මේ..."

"ඇයි බබා බයවෙන්..නේ... සසංක උනත් අසංක උනත් මං ඔයාගේ වස්තුව කිව්වා නේ..ද..."





ඔහු අල්ලාගෙන උන් ඇගේ දෑත් තද සීතලකදී මෙන් වෙව්ලන්නට විය.

ඔහු ඇගේ දෑත් අත්හැර මොහොතකට ඇගේ ඉහ සිපගත්තේය. ඊටත් පසු දෑතින්ම ඇගේ උරහිසට දෑත් තබා ඇයව කැලඹිට්ටුව ගත්තේය.

"මං දිහා බ..ල..න් නැ..ත්තේ ඇ..යි..."

"අ..නේ ම..ම..ම..ට ම..ගේ අසං..කව දෙ..න්..න ස..ර්... ම..ගේ අහිං..සක මහ..ත්ත..යව දෙ..න්..න ස..ර්..."

ඔහුගේ දෑස් බොඳවී යන්නට විය.

"බ..හො..ම ක..තා ක..ර..ද්..දී ඔ..යාගේ මහ..ත්..ත..යට කො..ච්..ච..ර දු..ක හි..තෙ..නවද කියලා බ..බා දන්නවද..? ම..ට..ත් ම..ගේ අහිංසක කෙ..ල්ලව ඕ..න..."

"මං කො..ච්..ච..ර ආ..ද..රේ..ද ම..ගේ මැ..ණි..ක..ය..ට..."

"මං බොරුවක් කළා කියලද බබා කිය..න්..නේ... ආ... පිටරට වල අවුරුදු ගණන් ඉඳලත් කාටවත් දීපු නැති පපුවෙන් ආදරේ කරපු ළට බොරුවක් කළා කියලද මැණික කියන්..නේ... ආත්ම ගානක් නිස්සේ ලැබිච්ච ආදරේට මං වංචාවක් කළා කියලද කියන්..නේ..."

ඔහුගේ ඇස් වලින් කඳුළක් ගිලිහෙනු ඇය බලා උන්නේ පපුව සිඳුරු වී යද්දීය.

"අ..නේ අසං..ක..යියේ... මේ මො..න..ව..ද අ..පට වෙ..න්..නේ..."

සසංක ඇගේ හිරුවත් ගෙල අද්දරට දෑත තැබුවේය.

"මං ම..ගේ නෝනාට හැම්..දාම අ..සංකම වෙ..න්..න..ම්... කියනව නම් අර සසංකව මරලා දාන්නම්... ම..ට ඕන දෙ..යක් කියන්න... ඒත් එක පොල් කෙන්දක් වත් ගහන්න බැරි විදිහට බදාගන්න අපි අතර දුර..ස්..ක..ම්..ක්..."

ඇය හිස ඔසවා සසංක මුධුන්කොටුව යැයි සිතා ඔහු දෙස බැලුවේය. නැත. ඔහු සසංක නොවේ. අසංකය. තමා ප්‍රථම ආදරය

SIHINA

කළ අසංකමය.

"මං බොරුවක් කි..ලේ නෑ... පැ..ළමුවෙනි දි..වසේ ගෙදර ආ..පු දවසේ මං ඔයාගේ අප්පච්චිට මේ.. නෑ..ම දෙ..ය..ක්..ම කිව්වා බ..බා..."

"මේ... දේ..ව..ල්..."

"ම... ඒත් මට ඔයාට කියන්න බය හිතුණා... ම..ට..ත් මගේ ආදරේ ගැන බ..ය..ක් තියෙනවනේ..."

ඇයට ඇඬුණි. වැළඳගත නොහැකිව ඇය දෑතින්ම මුහුණ වසාගෙන ඇඬුවාය. සසංක වඩාත් ශක්තිමත් ලෙස ඇගේ බඳ වටා පුරක යවා ඇයව තමා තුරුලට ගත්තේය.

"මට තුරුල් කරගන්න වෙන කෙනෙක් නෑ කියලා ආයෙත් කියන්න බබා... නැත්නම් මං මේ හැම දෙයක්ම දාලා ආයෙත්..."

ඇගේ පපුව හිරවී ගියේය. ඔහු අසංක වුවද සසංක වුවද හැමදාම තමා සිතුවේ ඔහු උතුම් මිනිසෙකු කියා පමණි.නමින් කවර ඵලයක්ද...

චන්දනාට එක මිනිත්තුවක් තුළ සියල්ල අවබෝධ විය. රත්තරු එක ගැන අසංක සමග මහා සැක්කුමකින් කතා කළ අයුරු ඇයට සිහිවිය. රත්තරු ආයතනය එදා සිට වෙනස් වෙන්නට පටන් ගත් සැටි ඇයට මතකය.

"අ..නේ.. ම..ට ම..ගේ ම..හ..ත්..තෑ..යා..ව නෑ..තී වෙයි... බා..ර කියක් උනා..ද... රුපෙට රුපේ දෙන්නම කියලත් බා..ර උ..නා.. ඇ..යි ම..ට මෙ..හෙ..ම..."

සසංක ඇගේ ගෙල පාමුලින් දෑතම තැබුවේය. කෙල්ලගේ වත උණු ගන්නාක් මෙන් රස්නෙට තිබුණි.

"මං දිහා බලන්..න..."

සසංක කතා කළේ වෙනස්ම කටහඬිනි. දැන් කොහොම බලන්නද... මේ ඉන්නේ අසංක නොවේ. සසංකයි...

"අ..නේ ම..ට..."

"බලන්..න බෑ..."





"ම..ම..ම..."

චන්දනා දෑස් එසවූයේ බියෙන් මෙනි. ඔහු පෙර වූ දෙනෙතින් බලා උන්නේය. ඒ මුහුණමය. ඒ ආදරබර දෑසමය. ඒ සෙනෙහෙබර බැල්මමය. නැත. මේ සසංක නොවේ. අසංකය. හිත සමනල කන්ද මෙන් ආදරය කළ අසංකය.

"අ..සං..ක..යි..යේ..."

"මං අසංක උනත් සසංක උනත් මේ ඇස්වල වෙනසක් පේනවද..."

"අ..නේ එහෙම කියන්නෙපා..."

"ඒත් ඇ..යි ම..ට මෙ..හෙ..ම..."

"බොරුවක් කළේද.."

චන්දනා කතා කළේ නැත.

"මට ආදරේ කරපු නැවි ම..ධි මතකයි... උදේට ඉඳි ආප්ප මුල් හදාගෙන ආවා... කන්න තියෙන ඕන මුල මට දුන්නා... එහෙම ආදරේ කළේ සසංකට නෙමේ... ඔයා ආදරේ කළේ දුප්පත් සේල්ස් වැඩ කරපු අසංකට... කුරුණෑගලින් ආපු කොල්ලට.. නේ..ද..."

"නෑ.."

"එ..හෙ..නා..ම්..."

"ම..ගේ ඇ..ස් දෙ..කෙ..න් මං.. දැ..ක්..ක දෙ..වියට මං ආ..දරේ ක..ළේ..."

චන්දනා ඇඬූ කඳුළින් කීවාය. ඔහුගේ දෑතින් ඇගේ කන් පෙති වැසී ගියේය.

"මේ බලන්..න..."

ඇය දෑස් එසෙව්වාය.

"ඒ දෙ..වි..යා නෙ..මේ..ද මේ ඉන්..නේ.."

ඇය තොල් පට තද කරගෙන ඔව් කියන්නට මෙන් හිස



SIHINA

වැනුවාය.

"ර..ත්..තරු එහෙත් අනංගයා අයිතිකාරයාට ඕනා කෙනෙක් ආදරේ කරයි.. ඒත් දුප්පත් අසංකට ආදරේ කළේ එක්කෙනායි... ලග තියාගෙන තැව්වේ එක කෙල්ලයි.. කඳුළු දෙක අල්ලලා වැන්දේ එක කෙල්ලයි.. ඔයා විතරක් නෙමේ මැණික අසංකට මාත් ආදරෙයි..."

ඔහු චන්ද්‍රනාගේ දෑස් වල තිබූ කඳුළු දෑතින්ම පිස දැම්මේය.

"කි..යා..න්..න ඕ..න නම් මේ එක්කොම දාලා ඇවිත් ඔයා එක්ක අර පොඩි ගෙදර ජීවත් වෙ..න්..නා..මී... කො..හො..ම..ත් අපි ආත්ම ගාණක් එ..හෙම ඉන්..නා..ත් ඇ..ති නේද... පළවෙනි දවසේ හිතුනා කිව්වේ..."

"ම..ට ඕ..න ම..ගේ..."

චන්ද්‍රනා ගොත ගැසුවාය.

"සසංකට බය වෙන්නෙපා මැණික... අසංකටත් වඩා එයා අහිංසක මිනිහෙක්.."

චන්ද්‍රනාගේ ඇතුළ හදවත ගින්දරකින් මෙන් ඇවිලී ගියේය. ඇත්තටම ඔහු මේ තරම් සුන්දර මිනිසෙක් වූයේ කෙසේද...

"ඇ..යි රත්..ත..රු එ..හෙ හි..ඟපු දුප්පත් ම..ට... ආ.."

ඉතිරිය ඇයට කියාගන්නට නොලැබිණි.

"සසංක ආ..ද..රේ කරන්න කෙනෙක් හොයා හොයා හිටපු කෙනෙක් නෙමේ... එයා විශ්වාස කළේ එයාගේ තාත්තාගෙයි මැරිච්ච අම්මගෙයි නංගිගෙයි ආදරේ විතරයි... එයාලා ඇරෙන්න කෙනෙක්ට ආදරේ කරන්න පුළුවන් වෙයි කියලා එයා හිතුවේ නෑ... ඒ..ත්..."

සිදුවූ දේ කෙසේ නම් අදහන්නද... රත්තරු ආයතනයට බැඳුනු දා සිට මොකක්දෝ බැඳීමක් එයට තිබුණි. අද ඒ බැඳීම ඊටත් වඩා දුරට ගොස් ඇත.

"කා..ම..ත් මං දි..හා නො..බ..ලා ඉන්නේ ඇ..යි..."





"ම.. ම..ට නැ..ති වෙ..යි.. නේ..ද.. මෙ..හෙ..ම.."

කෙල්ලගේ ඔහේ හලියන බිය සසංක තෙදින් තේරුම් ගෙන උන්නේය. එවැනි බියක් දැනීම සාධාරණය. සසංක ඇගේ අත් දෙකින්ම අල්ලාගෙන මුහුණට එබුණේය.

"ඉ..ස්..සෙ..ල්ලා කියන්න... මට කවදා දෙනවා නේ..ද.."

ඔහුගේ හඬ ආවේ කෙඳිරිල්ලක් මෙන්ය. ඔහුගේ මුල් වම් කම්මුලට තදින් දැනුණි. දෙවියන් මෙහෙම දෙයක් කරන්නට හිතුවේ ඇයි... අත් දෙක එකතු කරන්නට පුළුවන් වූ දා සිට දෙවියන්ට මල් මිදූ බව ඇත්තය. එහෙත් මේ තරම් දෙයක් මට ලැබෙන්නේ දුන්නේ ඇයි...

"මං... මේ..ක කො..හො..ම හිතා..ග..න්..න..ද..මී.. ලොකු ස..ර ම..ගේ අප්පච්චිට ම..ගේ ආදරෙයි අසං..ක..මී..යේ... මං රු..ත්තරු එකටත් එ..ච්චරටම ආදරෙයි..."

"සසං..ක..ට.."

ඇය කතා නොකර බිම බලාගෙන උන්නාය. චන්ද්‍රනාගේ දෑස් පලාගෙන මෙන් කඳුළු බැගිරෙන්නට විය.

"ඒ..වි..ගේ ආ..දරේ ක..ළේ.. එ..ක දෙ..යි..යෙ..ක්..ට විතරයි... ආ..යේ.. ඒ..ක වෙ..නා..ස් වෙ..න්..නෑ... ඒත්.."

"ඇයි..."

"ම..ට නැ..ති..වෙ..යි..."

පපුව හාරාගෙන මෙන් එහෙම හැඟීමක් එන්නේ ඇයි..

"ම..ගේ නෝනව මට හැමදාම ඕන... කවුද මේ වගේ පින්පාට නෝන කෙනෙක් නැති කර ගන්..නේ.."

මෙහෙම කතා කරන්නේ සසංකමද... රත්තරු ආයතනයේ හිමිකරුද... ප්‍රසිද්ධ ව්‍යාපාරික ප්‍රේමදාස මුදුන්කොටුව මහතාගේ එකම පුතාද... හිතාගන්නට අමාරුම දේ ඒකය...

"ර..ට ඉඳලා ඇවිත් වි..ක දැ..ව..ස..යි නේ..ද..."



SIHINA

ඔහු සිනාසුණේය. එහෙත් ඒ තරම් පැහැල්ලුවක් ඇගේ සිතේ නැත.

"මම ඉඳලා ලංකාවට ඇවිත් සතියකින් තමා පොසොන් උදේ රන්හරු එකට ආවේ..."

එදා නිකමටවත් මේ සසංක මුදුන්කොටුව බව තමාට නොසිතුණේ ඇයි..

"කොච්චර දේවල් තියෙනවද කියන්න.. හැමදාම වගේ විස්තර ඇහුවා.. මං කිව්වේ නැ... ඒත් මාව විශ්වාස කළා..."

"ම.. ම..ට හැ..ම..දාම ළඟ ඉඳිද්දී හ..රි.. බ..ල..ග..තු හැඟීමක් දැනුණා.. ඒත්.. තා..ට කි..ය..න්..න..ද මම.."

කියන්නට හිතනා දෙයක් කියවෙන්නෙ නැත.

"එ..ක පාරක් මට කියන්න සමාව දුන්නා කියලා... වෙනදා වගේ හිනාවෙලා... උදේ පන්සලේදී හිනා උනා වගේ..."

ඔහු අසංක වුව සසංක වුව මේ හදවත ඔහුට කොතරම් ආදරය කරනවාද...

"එ..හෙ..ම කියන්නෙපා... ම..ට හ..රී බ..ය..යි... අසංකයියට ආදරේ කරද්දී එ..හෙ..ම බ..ය..ක් දැ..නු..ණේ නැ..."

සසංක ඇගේ හිස මත සුරත තබාගෙන මහා දුකකින් ඈත බොල්ගොඩ වැවට වැටෙන වැලි පොද දෙස බලා උන්නේය... ඈය ඔහු දෙස බලාගත්වනම බලා උන්නාය... හදවත පුරා උතුලා යන නොහැකි ආදරයක් නහර දිගේ ගලා එන්නාක් මෙන් විය.

"අ..සං..ක..යියේ.."

ඔහුගේ දෑස් බොර පාටට හැරී ඇත්තේ ඇයි... ඈය ඔහුගේ පය පාමුළ ඉඳගෙන ඒ දෙපා වලට දෑත් තැබුවාය.

"අසං..ක..යි..යේ.. අ..නේ ඇයි මා..ත් එ..ක්..ක තරහ වෙලා ව..ගේ..."

චන්දනාගේ කම්මුල් හරහා අලුත් කඳුළු පාරවල් දෙකක් ඇඳී





මුලේ කම්මුල් සපාගෙන මෙනි.

"අ..නේ දෙ..යියෝ ම..යා අසංක උ..න..ත් සසංක උ..න..ත් ම..ගේ.. නේ..ද... ම..ට ම..යා..ව නැ..ති උ..නො..ත් මං කො..හො..ම..ද දැ..රා ග..න්..නේ..."

චන්දනා ඇසුවේ අඬමිනි. ඔහු ඇගේ මුහුණට දෝතම ගත්තේය.

"අපි ඉක්මන..ට..ම බඳිනවා.. මං ම..ගේ නෝ..නා..ව මයාගේ ලොකු සර්ගේ ගෙදරටම කැ..න්දගෙන ය..නවා... ද..නව නේ..ද..."

දෙවියනි... එවැන්නක් සිතාගන්නේ කෙසේද..

"මා..ව එ..ක්..ක..ගෙ..න ය..න්..න.."

"මගේ තාත්තයි නංගියි අහිංසක මිනිස්සු.. කොලා බලං ඉන්නේ මේ මගේ අහිංසක නෝනා කොහෙත් ඒ ගෙදරට එන්කං එතකල් නැ..මා..."

"මං කො..හො..ම..ද මේ..වා කි..ය..න්..නේ..."

"ඔයාගේ ආදරේ ගො..ඩ..ක් වටිනවා... කා..ට..ත් වඩා ම..ට.. තාත්තා ඉන්දියාවේ ඉඳලා ආපු ගමන් මං කා..තා කැ..ර..න්..න..ම.."

"ලො..කු ස..ර් එ..ක්..ක..."

"ම.. එයා එයාගේ ලේලිට හරි ආ..දරේ වෙයි.."

චන්දනා ඔහුගේ දෑස් දෙසම බලා උන්නාය.

"මං අ..ස..ංකයියා කියන්..න..ද සසං..ක..යියා කියන්නද..."

ඔහු හිනාබරව ඇගේ දෙඋරින් අල්ලා ගත්තාය.

"අසංකයියා කියන්න... එයාටනේ ආදරේ.."

ඈය තොල් පට තද කරගෙන බිම බලාගෙන සිනාසුණාය.

"දැ..න් සසං..ක..ට..ත් ආ..දරෙයි..."

"මගේ මූණ දිහා බලාගෙන කියන්..න..."

ඇගේ පටු නිකටෙන් අල්ලා ඔහු දයාබර ලෙස කිවේය. එසවුණු මුහුණේ කඳුළුද තිබුණි.



SIHINA

සසංක ඇගේ මුහුණට නර වූයෙන් ඇය මඳ සිනාහවක් මුවැසිව දැස් අඩවන් කර ගත්තේත් එකම විටය. ඇගේ කම්මුලේ තැවරුණු ඔහුගේ දෙතොලට දැනුණේ ඇගේ කඳුළු වල රසය. ඒ කඳුළු කොතරම් පිරිසිදු කඳුළුදැයි සසංක දැන උන්නේය.

හිනා ගන්නට නොහැකි මොහොතක ඇය දිග හීල්ලුමක් සමඟ ඔහුව දැවීව වැළඳගත්තාය. ඔහුගේ පපුවෙන් එන රස්නය හැරෙන්නට අන් කිසිවක් ඇයට දැනුණේ නැත.

ඔහු ඇගේ හිස මුදුන තුන් හතර වතාවක්ම සිප ගත්තේය.

"අ..සං..ක..යි..ඡේ..."

"ම..."

"මං.. මං.. මෙ..ච..ච..ර වා..ස..නා..ව..න්..ත වු..ණෙ කො..හො..ම..ද..."

ඔහුගේ දෑත් තිබුනේ ඇගේ ගෙල අද්දරය. ඔහු ඒ ඇඟිලි තුඩු දයාබර ලෙස පිරිමැද්දේය.

"ම..ට මේ.. මො..න..ව..ත් හිතාගන්න බෑ..නේ..."

"හිතන්න බැරි ගොඩක් දේවල් ඉස්සරහට වෙනවා... මං තාත්තා ළඟට එක්කගෙන ගියාම..."

"අ..නේ මං කො..හො..ම..ද එනකොට..."

"තාත්ත දන්නවා මං රන්තරු එකේ රඟපෑමක් කළා කියලා... ඒකයි තාත්තා රන්තරු එකට ආවෙවත් නැත්..තේ..."

"මා..ව..."

"ඉ..හින්..."

"පු..ඩ..ක්..ෂ..න් මැ..නේ..ජර් කළේ..."

"ඒ මේ ආදරේ නිසා නෙමේ..."

"මං දන්නවා..."

"ඉස්සරහට මං ළඟටම වෙලා ඉන්න ඕන..."





"ර..න්..ත..රු එ..කේ..."

"ඔ..ව..."

"එතකොට... ම..ම..."

"කාටවත් බෑ මගේ තෝනට මොනවත් කියන්..න..."

ඇය තුන් හතර වතාවක්ම ඔහුගේ පපුව සිඹගත්තාය. මේ පපුව යට ඇති හදවත කොතරම් හොඳ හදවතක්දැයි ඇය දනී... සමහර විට ආත්ම ගණනාවක් ගියද මෙවන් හදවතක් හමු නොවෙනු ඇත.. පුදුමය ඒ හදවත තමා වැනි දුප්පත් කෙල්ලෙකුට ලැබීමය.

"ඇ..යි අ..ප්..ප..ච්..චි..ට ඒ..ක..රන් කි..ව්..වේ..."

ඔහු සිනාසුණේය.

"ඒ වෙලාවට අ..ප්පච්චිගේ ඇස්වලට ක..දු..ළු..ත් ආවා..."

"එ..යා..ට එ..ච්..චර සතුටු හිතුණා ක..ම් ම..ට කො..ච්..ච..ර..ද කියලා හිතන්..න..."

ඇය මුහුණ එක පැත්තකට හරවා එක කම්මුලක් ඔහුගේ පපුවේ සනීපයට සතපවා ගත්තාය. බොල්ගොඩ පරිසරයට වැටෙමින් තිබූ වරුසාව වැඩි වී තිබුණි.

ඒත් සමඟම වාගේ ඔහුගේ කලිසම් සාක්කුවේ තිබූ ජංගම දුරකථනය නාද වෙන්නට විය. එය කලිසම් සාක්කුවට අත යවා ගත්තේ ඇයමය.

"පිටරට කෝල් එකක්..."

ඔහු ජංගම දුරකථනය අතට ගෙන කීවේය. කතා කරන්නේ තාත්තා බව ඔහු දැන උන්නේය.

"තා..ත්..තේ..."

වන්දනා පපුවට අතක් තබාගෙන ඔහු දෙස බලා උන්නාය. ඔහු කතා කළේ ඇගේ උරතලය මත සුරත තබාගෙන ඇත බොල්ගොඩට වැටෙන වැස්ස දෙස බලාගෙනය.

"පුතා මං හෙට එනවා... ඔයාටයි නංගිටයි මං මෙහේ කෝච්චිලේ



SIHINA

කාරෙකුත් වුණා..."

"එහෙනම් තා..ත්තේ මගේ කාරේ ඔප්පු කරලම එන්න.."

ඔහු මේ කියන්නේ මොනවාද... මේ මොහොතේම ඔහු තමා ගැන කියන්නට යනවාද...

"මේ වෙච්ච යමක්.."

"තාත්තා ඉක්මනට ලංකාවට එන්නකෝ... මං එයාර් පෝට් එකට එන්න ඕන කීයටද තාත්තේ..."

ඔහු තාත්තා සමඟ කතා කරද්දී ඇය දිගටම වැස්ස දෙස බලා උන්නාය. මේ සිදුවූයේ කුමක්ද... රන්තරු එකට රැකියාවකට බැඳුණු දවස ඇයට සිහිවිය. සහතික කිසිවක් නොබලා එදා මුදුන්කොටුව මහතා තමාව සේවයට ගත්තේ මුහුණ දෙස බලාය.

"හෙට ඉඳලා වැඩට එන්න දරුවෝ..."

එදා ඔහු සිනාබරව කීවේය. එසේ වූයේ ඇයි... මේ සියල්ල සිදුවූයේ දෛවයේ ලියා තිබූ විදිහකටද... මුදුන්කොටුව මහතා තමාව රැකියාවට ගත් හැටි... එදා අසංක රන්තරු එකට ආ හැටි... ඒ සියල්ල දෙවියන් විසින් කළ ඒවාද...

"හා තාත්තේ බුදු සරණයි..."

ඔහු දුරකථන ඇමතුම නිමා කර කීවේ කරුණාබර ලෙසිනි. ඇය වැස්ස දෙසට යොමු වූ දෙනෙත් ඔහු වෙතට ගෙන ගියේ ඒවා බොඳ වී තිබියදීය.

"ලො..කු ස..ර් මං ගැ..න කො..හො..ම..."

හිතට දැනෙන එකම බය ඒකය. මුදුන්කොටුව මහතා හාම්පුතෙක් ලෙස කොතරම් කරුණාබර කෙනෙක්දැයි චන්ද්‍රනා දනී. එහෙත් මේ හිඟන කෙල්ලව පිටරට යවා උගන්නා ආ තම එකම පුතාගේ ලේලිය ලෙස ඔහු පිළිගනීද...

මේ බැඳුණු දැන් වෙන්වෙනම් ඒ ජීවිතයේද වෙන්වීම විය යුතුය. එතනින් එහාට ජීවිතය ගැන හිතාගන්නටත් නොහැක.

"මගේ තාත්තා ගැන මං දන්..න..වා..."





ඔහු කීවේ විශ්වාසයෙනි. චන්ද්‍රනා පොළොවට එකට ඇලී තිබූ දෑස් එසෙව්වාය.

"ලො..කු ස..ර් ඇ..වි..ත් ම..ට කි..ව්..වො..ත් අසං..ක..ඩිරේ..."

කෙල්ල කියන්නට හදන දේ ඔහු දැන උන්නේය. එහෙම වරදක් නොවන බව ඔහු දැන උන්නේය. තාත්තා අසින්

"ඉන්දියාවේ යන දවසේ තාඹිට කිව්වේත් දුප්පත් කෙල්ලෙක් හරි කමක් නෑ ඔයාට ආදරේ තියෙන කෙල්ලෙක්ව හොයා ගන්න කියලා... එයා එහෙම කෙනෙක් නෙමේ..."

චන්ද්‍රනාගේ හිතට තුනී සැනසීමක් දැනුණි. ඇය ඔහුගේ උරහිසට බරවී ඈත බොල්ගොඩ වැවට යහන දෙස බලා උන්නාය. එකවරම ඇය යමක් සිහිවී මෙන් ඔහු දෙස බැලුවාය.

"ඇ..වි.. මා..ත් එක්ක බස් එලෙත් ඇවිද්දා.. ඒ..දා කොළෙත් ආ..වා..."

"ඉති..න්..."

"රන්තරු එකේ සර් එහෙම යනවා කවුරු හරි දැක්ක නෑ..ම..."

"ඒවත් වෙනවා කියලා දැනුණේ එදා... ඔයා මගේ ජීවිතේ හොඳක් වෙනස් කළා..."

අසංක කීවේ ඇගේ හිස අතගාය. ඇය ඒ අතගෙන සිප ගත්තාය. නැත. වෙනසක් නැත. මේ එදා ඒ අතින් ආ සුවඳමය.



SHINA

# 23

ගෙදර ආ වන්දනා අප්පච්චිගේ දෙඋර බදාගෙන නොසැහෙන්න ඇඬුවාය. දුව අඬන්නේ දුකකට විපාකයට නොවන බව අප්පච්චි හොඳින් දැන උන්නේය. අද ඇය කෙල්ලට ඇත්ත කියන්නට ඇති බව අප්පච්චි නිකමට අනුමාන කළේය.

"ඔ..යා..ගේ හි..ත..න දු..ව මෙ..ච්..චර වා..සැ..නා..ව..න්..න උ..ණේ කොහොමද අ..ප්ප..ච්..චි..."

වන්දනා ඇසුවේ ඉකි බිඳිමිනි. අප්පච්චිගේ උරහලය ඇගේ කඳුළින් තෙතැවිණි.

"ඒ.. ඒ..යා.. ව..ගේ හො..ඳ කෙ..නෙ..ක් මේ.. පුං..චි ගෙ..දැ..ර කෙ..ල්ලට ආ..ද..රේ ක..ළා කිය..න එකත් හ..රි පු..දුමයි නේ..ද



අප්පච්චි..."

අප්පච්චි කිසිවක් නොකියා ඇගේ හිස පිරිමැද්දේය. මිය ගිය අම්මා කොහේ හෝ සිට අසරණ කෙල්ල දෙස බලන්නට ඇත.

"අ..ම්..මා මගේ මැණික දිහා බලන්න ඇති පුතේ... ඒ පුතා ම..ට ඔක කිව්ව දවසේ මං අම්මගේ සොහොනට ගිහින් එයාට මල් දුන්නා... එදා රෑ මම අම්මව හීනෙනුත් දැක්කා..."

"ම..ට හ..රි පුදු..මයි අප්පච්චි... ම..ම ර..ත් කරු එකේ රස්සාවක් කරලා ජීවත් වෙච්ච දුප්පත් කෙල්ලෙක්... එයා... ඕවට ගිහින් ඉගෙන ගෙන රත්තරු එක බාරගන්න ඒක උරුම කරනවා... කො..හො..ම..ද අ..ප්..ප..ච්චි මෙහෙම උ..ණේ..."

පතාගෙන ආ ඒවා වෙනස් කළ නොහැක. දෛවයේ සම්පූර්ණ තීරණ සත්කාරයාවකින් වෙනස් කළ නොහැක.

"ඔයා කොච්චර හොඳ කෙනෙක්ද කියලා පුතාට තේරෙන්න ඇති... දුප්පත්කමට මූ පුතේ ඒලක ලස්සන වෙන්න..."

"ලො..කු සා..ර් ආ..වාම මා..වයි අ..ප්..ප..ච්..චි..වයි ලොකු සර් ගාවට එක්කගෙන යනවලු... නැ..ත්..න..ම් මාව බලන්න මෙහෙට එක්කගෙන එනවලු... හ..රි පු..දු..මයි නේ..ද අ..ප්..ප..ච්..චි..."

අප්පච්චිට හිල්ලින... ගැණු දරුවෙක් ඉන්නා නැම් තාත්තා කෙනෙකුටම මේ බර දැනෙයි. ඒ අතින් ඔහු වන් කෙනෙක් දරුවාගේ ජීවිතයට ආ එන කොතරම් උතුම් දෙයක්ද...

"මින් ම..ත්තට පුතේ ඔයා මං ගැන නෙමේ ඒ පුතා ගැන හිතන්න... ඔයාගේ ජීවිතේ ඒ දරුවා වෙනුවෙන් කැප කරන්න..."

"ඒ..හෙම කියන්නෙපා අප්පච්චි... එයා ඒ..හෙම කෙනෙක් නෙ..මේ... අප්පච්චිට හ..රි ආදරෙයි..."

"ඒ..ක හරි පුතේ... ඊත් දුප්පත් අපි ඒ දරුවට මොන..ව..ද දෙ..න්..නේ... අපේ හිතක තියෙන දෙයක් විතරනේ මැණික දෙන්න

නියෙ..න්.නේ.."

"එ..යා බ..ලා..පො..රො..ත්තු වෙන්නෙත් එ..චචරයි අප්පච්චි.."

"කලාතුරකින් එ..හෙම නො..නෙත් බි..හිවෙනවා... හරිම කලාතුරකින්.."

චන්දනා අප්පච්චිගේ බොඳ වූ දෑස් දෙස බලාගෙනම උන්නාය.

"එ..යා මේ ගෙ..දරට ආපු දා..වස අප්පච්චිට මතකද... අර පුංචි පුටුවට වෙලා බ..න් නැගේ... එ..යා එ..හෙම ඉ..න්න ඕන කෙනෙක් නෙමේ.."

ආදරය ලබා ගන්නට රජවරු පවා වෙස්වලාගෙන පැමිණ ඇත.. එහෙත් අද වැනි යුගයක ආදරය වෙනුවෙන් කෙනෙක් මෙතෙම පරිත්‍යාග කරතැයි අප්පච්චිට පවා හිතන්නට අමාරුය... හැඳි වැඩි නම්නට පවා නොපෙනෙන වටිනාකම තම දරුවාගෙන් ඔහු දකින්නට ඇත.

"දැ..න් පුතේ ඔයා අලුත් ජීවිතේකට යන්න ලෑස්ති වෙන්න.. ඔයාගේ අම්මා හිටියනම් මේ වෙලාවේ එයා දවස් හතක් කිරිබත් උයයි... ඔයා ලොකු ළමයෙක් වෙච්ච දවසේ එයා හිටියේ රැජිණක් වගේ... අම්මා නැති අඩුවත් පුරවාගෙන ඔයා ලෑස්ති වෙන්න..."

චන්දනාගේ ඇස්වල යළිත් කඳුළු පිරුණි.

"හිතට බයක් දැනෙනවා අප්පච්චි... ඒත්... අසං..ක..යියගේ මූණ දැක්කාම ඒ බය නැති වෙ..නවා..."

"ඔයාට බයවෙන්න දෙයක් නෑ... ඔයා ලස්සනට පවුල් ජීවිතයක් ගත කරයි... ඔයා හොඳක් දක්ෂ කෙල්ලෙක්... ලොකු සර් උනත් ඔයා වගේ දුවෙකුට කැමති වෙයි... ඒ ගෙදරත් අම්මා නැහැනේ..."

"ම්... එයත් කියන්නේ ඒකයි... කැන්දන් යන කෙනා ඒ අඩුවත් පුරවන්න ඕනෙලු..."

"ඒකනේ... ඔයාට වරදින් නෑ..."





චන්දනා ජේනලය ලඟින් වූ තේ කොළ දැමූ කෝප්පයට බට වත් කළේ අලුත් තේ කොළ වල සුවඳ විඳිමිනි. ඇය විස්කිරි තේ දෙකක් හදා මහරගමින් එදී ගත් බටර් කේක් එක සමග අප්පච්චිට පිළිගැන්වූවාය.

"අප්පච්චි අපි රෑට ඉඳි ආප්ප හදමුද... පොලොස් තෙම් හදලා..." ඔහු රෑට නිසැක ලෙසම එනවා කියන්නට ඇත.

"පුතත් එනවා කිව්වද..."

"ම්... එයා ඉඳිආප්ප කන්න හරි ආසයි..."

එක අතකට මේ තරම් අහිංසක දරුවෙක් වෙනුවෙන් ඔහු පැලෙන්නට යාම පුදුමයක් නොවේ.

"එහෙනම් පුතේ මං ගිහින් හොඳ මාළු ටිකක් අරන් එන්නම්..."

"නෑ.. පුංචි ඉස්සෝ තිබ්බොත් ගේන්න... පොලොස් ටිකක් නම් තියෙනවා..."

"දැන් පුතේ ලොකු සර් මෙහෙ එනවානම් අපිට ගෙවල් දොරවල් ටිකකුත් අස්පස් කරගන්න වෙනවා නේද..."

චන්දනා එහෙමම දැස් කරකවා තම දුප්පත් නිවස දෙස බැලුවාය. ඔහු තමාට ආදරය කළේ මේ දුප්පත් පැල දැක දැකය.

"අ..පි..ට අපේ තත්වේ ව..හ..ග..න්..න බෑ..නේ..ද අප්පච්චි.."

"තේරෙනවා පුතේ... මං ඒත් හෙට ඉඳලා ගේ අස් කරන්න ගන්නම්..."

ලොකු සර් මේ ප්‍රශ්නය දෙස කෙසේ බලනු ඇත්ද... චන්දනාට අවසන් වරට ඔහු කතා කළ දවස සිහිවිය. එතරම් කරුණාබරව කතා කළ ඔහු ඒ කතා කළේ තම ලේලියට බව දන්නවානම්...

"මේ පාර අ..ම්..ම..ගේ ආ..නේ හො..දට දෙමු.. නේද අප්පච්චි.."

"මාත් කියන්න පුතේ හිටියේ.."

"හරි ආසයි අප්පච්චි හාමුදුරු දහඅට නමක්වත් වඩම්මලා දෙන්න පුළුවන් නම්..."

"අපි එහෙම දෙමු පුතේ..."

"ඕ..."

අම්මා කොහේ හෝ සිට තමාව රකින බව චන්ද්‍රනා දැන උන්නාය. මෙවර දානය ඔහුගේ අතින් පිළිගන්වන්නට පුළුවන් නම්...

නිවසේ දුරකථනය නාද වූයේ ඒ මොහොතේය. චන්ද්‍රනා දුව ගොස් දුරකථනය අතට ගත්තාය.

"හෙලෝ..."

කතා කළද ඔහු එහා පැත්තෙ සිට කතා කළේ නැත.

"අ..සං..ක..යි..යේ..."

චන්ද්‍රනා ඇසුරේ පපුවට අතක් තබාගෙනය.

"අසංකයියා නෙමේ කතා කරන්නේ... සසංක..."

ඇය තොල් පට තද කරගත්තාය. තවමත් මේ ඇත්ත හදවත පිළිගන්නට බිය වන්නේ ඇයි...



SIHINA

# 24

සඳුදා උදේ රත්තරු ආයතනයට පය තබද්දී චන්ද්‍රනාගේ පපුව වෙනස්ම ලෙස ගැහෙමින් තිබුණි. රත්තරු ආයතනයේ ගේට්ටුවෙන් ඇතුල් වූ වහාම ඔහු විශාල ගොඩනැගිලි දෙක දෙස මොහොතක් බැලුවාය. අද වෙනදාටත් වඩා විශාලව රත්තරු ආයතනය තමාට පෙනෙන්නේ ඇයිදැයි චන්ද්‍රනාට සිතාගත නොහැක.

ඊයේ මහ රෑ තමාගේ උකුලේ හිස තබාගෙන උන්නේ මේ රත්තරු ආයතනයේ අනාගත හිමිකරුමද... තමාට කියා ඉස්සෝ බැදුමක් පොලොස් මාළුවක් සමග ඉඳි ආප්ප කවා ගත්තේ මොහුමද... මහ රෑ යන්නට හදද්දී ළඟට ගෙන දෙතුන් වරක් හිස සිප ගත්තේ මොහුමද... සසංක මුදුන් කොටුවමද...

වන්දනාගේ කොල් පටට උඩින් දානිය මල් පොකුරක් සේ මිලි තිබුණි. ඔහුත් තමාත් අතර ඇති මේ සම්බන්ධය මේ රන්තරු ආයතනයේ මේ සේවක සේවිකාවන් දන්නවානම් ඔවුන් පුදුම වෙනු ඇත...

එහෙත් දෛවය එසේ කර ඇත. දෙවියන් එසේ කර ඇත.. එහෙම කළේ ඇයිදැයි හිතාගන්නටවත් බැරි බව ඇත්තය.

එහෙත් එසේ සිදුවී ඇත... දෛවය බොහෝ ලෙස දුක් දුන් පුගයක අධ්‍යාපන සහතික ඒකද රැගෙන හැඟිලි පැහැ ගත් සාරියක් ඇඳ මේ රන්තරු ආයතනයට ආ දවස ඒ උදෑසන ඇයට සිහිවිය. එදා මේ දොරටුවෙන් ඇතුල් වී... මේ පිය ගැට පෙළ දිගේ උඩට නගිද්දී දෛවය එසේ කළේ මෙහෙම දෙයක් කරන්නට බව මොහොතකටවත් සිතුවාද...

වන්දනා අදත් ආවේ වෙනදා මෙන්ම මහා පාන්දරය... ඒ එද්දී ආයතනයේ කිසිවෙක් සේවයට වාර්තා කර තිබුණේ නැත.

නිෂ්පාදන අංශයට යන්නට ඇය උඩු මහලේ කාර්යාලය වෙත ගියේ අවශ්‍ය වාර්තා කිහිපයක් ගන්නටය. ඒ යද්දී රුවන්ගේ කාමරය විවෘතව තිබුණි.

රුවන් මේ සියල්ල දන්නා බව වන්දනා දනී. ඔහු තමාගේ හොඳම මිතුරා බව ඊයේ සසංක කියද්දී ඇයට පුදුම සිතුණි. "හරි දුප්පත් කොල්ලෙක්.. ඒත් ඉස්සර ළා ඉස්කෝලෙට ගේන අම්මගේ බත් එක කන්න මං මඟ බලාගෙන ඉන්නවා... හාල්මැස්සො තෙල් දාලා පරිප්පු වේලලා තියෙන්නේ... පුදුම රහක්..."

ඔහු එහෙම කියද්දී ඇය ඒ මුහුණ දෙසම බලා උන්නාය. ඔහු සතුව ඇති මේ නිරහංකාර ගතිගුණ ඔහුට කොහෙන් ලැබුණාද... රුවන් වැනි දුප්පත් මිතුරෙකු පමණක් නොව ඔහු තමා වැනි දුප්පත් පෙම්වතියක්ද තෝරා ගත්තේය.

වන්දනා රුවන්ගේ කාමරයට ඇතුල් වූයේ දිග හුස්මක් ගෙනය... මේ පපුවේ ඇති බර දන්නේ තමා පමණි.

රුවන් කෙල්ල දෙස බලා ලස්සනට සිනාසුණේය... සසංක කෙල්ලට සියල්ල කිසු බව ඔහු දනී. වන්දනා කාමරයට ඇතුල් වෙද්දීම





රුවන් පුටුවෙන් නැඟිට ගොස් ඇගේ අත අල්ලාගෙනම ඇයව පුටු ඇතුවේ ඒ නිසාය.

"ඒක දේකට නෙමේ නංගී... හැම දේ..ක..ටම සුබ පැතුම්.. ලෝකේ ඉන්න හොඳම දෙන්නාගේ එකතුවීමට සුබ පතන්න මට වචන නෑ..."

රුවන්ගේ වචන වලට වන්දනාගේ දෑස් කඳුළින් පිරුණි. රුවන් ඇගේ හිස මත සුරත තැබුවේ සහෝදරයෙක් අතගාන්නාක් මෙන්ය.

"මේ ලෝ..කේ ඉ..න්..න හොඳම කෙනා ම..යා..ට ලැබුණා කියලා හිතාගන්න නංගී... මං මේ ජීවිතේදී සසංක වගේ හොඳ කෙනෙක්ව දැකලා නෑ..."

"මං... මං... ඒ..ක දැ..න්..නවා අ..යියේ..."

"ඉස්සර අපේ ගෙදර එනවා... අපි මැලෙල් කරන කාලේ.. ඇවිත් අපේ ළිඳෙන් නාලා අපේ අම්මා හදන කොස් මැල්ලුමයි පරෝල හොද්දයි එක්ක බත් කාලා යන්නේ... ජීවිතේ හ..රි පු..දුම හැනකින් ඇ..ල්ල ග..න්..න මිනිහෙක්... අවුරුදු අටකට වඩා මිටට හිටියා... ඒත් හැමදාම රෑට කතා කරලා අහනවා කෑවද මචං කියලා.. සහෝදරයෝ වත් එච්චර හොඳ නෑ නංගී..."

ඔහු ගැන මෙතරම් හොඳ කියද්දී ඇයට වාවාගත නොහැක.

"එ.. එ..යා..ව හො..හො..ම..ද අ..යි..යේ ම..ට ලැ..බු..ණේ.. නා..ම..න් හි..තා..ග..න්..න බෑ... ම..ම..."

අඬමින් කියද්දී රුවන් ඇයව වැළැක්වූවේය.

"සසංකට ජීවිතේ ගොඩාක් දේවල් ලැබුණා.. ඒත් මං මේ ඔයාගේ ඔළුවේ අත තියලා කියන්නේ නංගී... එයාට ජීවිතේ ලැබුණ හොඳම දේ ඔයා... ඒක මං නෙමේ නංගී කියන්නේ ඔයාගේ අසංකයියම තමා..."

වන්දනා කඳුළු පිසදාගෙන ඔහු දෙස බලා සිනාසුණාය.



SHINA

"අ..දු.. ර..න්..ත..රු එකට පය තියද්දී මට මො..හ..න්ද මුණා.."

"මං සසංක එහෙම අන්තලවන් සසාගේ නංගිවත් හොඳටම දන්නවා... ඒ පවුල පන්සලක් වගේ පවුලක්... සසාගේ අම්මා නැතිවෙච්ච දවසේ ඉඳලා ඒ ගෙදරට එළියක් නැතුව තිබ්බෙ... ඔයා ඒ ගෙදරට පහනක් වෙයි... බයවෙන්නෙපා..."

රුවන් කීවේ ස්ථිර හඬිනි.

"මං අ..යියටත් පින් දෙනවා..."

"එහෙම කියන්නෙපා නංගී... සසා මට කරලා තියෙන දේවල් නංගී දන්නෑ... ඒ වෙනුවෙන් මං කරලා තියෙන්නේ මොනවද..."

රුවන්ගේ දෑස් බොඳවී යනු ඇය දුටුවාය.

"අ..යියේ..."

"එයා හොඳක් අහිංසක මිනිහෙක් නංගී... ඒ අහිංසක මිනිහා එක්ක ජීවත් වෙන්න හරි ලේසියි... ජීවත් වෙද්දී ඔයාට තේරෙයි... ජීවිතේ මෙච්චර ලස්සනද කියලා ඔයාට හිතෙයි..."

"ඒ..ක හි..ත..න්න දෙයක් නෑ අ..යියේ... එයා හම්බවෙච්ච දවසේ ඉ..ඳලා ම..ට හිතෙනවා..."

චන්දනා කීවේ උගුරෙන් මෙනි.

එදින රන්තරු ආයතනයට විශේෂ දවසක් විය... විශේෂ කාර්ය මණ්ඩල රැස්වීමක් එදින උදෑසනට නියමිත බව සියල්ලන්ටම දැනුම් දුනි. එය කුමක් විය හැකි දැයි චන්දනා නිෂ්පාදන අංශයේ ඇගේ කාර්යාල කාමරය තුළට වී කල්පනා කළාය. මේ සියල්ල ඔහුගේ වැඩය.

අද උදේ සිට ඔහු ආගිය අතක් නැත... චන්දනා උදේ කාර්යාලයට එන්නට පෙරත් ඔහුගේ ජංගම දුරකතනයට ඇමතුමක් ගත්තාය. එහෙත් එය ක්‍රියා විරහිතව තිබුණි. මුදුන්කොටුව නිවසේ අංකය ඇය හොඳින් දැන උන්නද ඇය කතා නොකළේ හදවතේ වූ තිගැස්ම නිසාය.



SIHINA



තමා ඒ නිවසේ ලේලිය වේ යැයි කෙල්ලට තවම විශ්වාස කරන්නට වත් නොහැක. ඒ ගැන සිතද්දීත් ඇගේ බඩ පපුව දැවිලෙන යයි.

නිෂ්පාදන අංශයෙන් අලුත් වැඩක් සේ සලකා ඇය අතින් නිමවූ අලුත් චොකලට් රෝල් ටික පුළුවන්නේ අදය.

"මිස් අතින්ම අවන් එක ඔන් කරන්න..."

මොහොතකට කලින් නිෂ්පාදන අංශයේ වැඩ පරීක්ෂක පැමිණ කීවේය. හරිනම් මෙවා කළ යුත්තේ ඔහුගේ අතිනි. එහෙත් චන්දනා ඔහුගේ ආයතනයට කිරි ඉතිරේවා යැයි සිතාගෙන අලුත් චොකලට් රෝල් ටික ඇතුළත් අවන් එකේ බොත්තම එබුවාය.

නිෂ්පාදන අංශයේ සේවකයන් එක්ව අත්පොළසන් නැගුවේ අවංකවමයැයි චන්දනාට සිතුණි. අද ආයතනයේ සාර්ථකම අංශය නිෂ්පාදන අංශයයි. ගතවූ දෙසතිය තුළ කිසිදු සේවකයෙක් නිවාඩුවක් ලබාගෙන නැත. ඒ කාලය තුළ නිෂ්පාදනය දෙගුණ කරන්නට ඇයට හැකි විය.

"සසා සතුටු වෙන්නේ එයාට ලස්සන අහිංසක හොඳ ගෑනියෙක් හම්බ වෙච්ච එකටම නෙමේ..."

උදේ රුවන් කීවේය.

"එ..හෙ..නා..ම්..."

"හොඳ දක්ෂ ගෑනියෙක් එයාට ලැබිච්ච එකට... ඔයා ප්‍රඩක්ෂන් එක බාර ගන්නට පස්සේ ඒ පැත්ත හරියට පන්සලක් වගේ... නංගී එහෙම දෙයක් කළා කියන එකත් පුදුමයි..."

"ඒවා මං... නෙමේ ක..ළේ අ..යියේ... ප්‍රඩක්ෂන් එ..කේ ස්ටාෆ් එ..ක..."

රුවන් සිනාසුණේය.

"හොඳ නායකයෙක්ගේ තියෙන හොඳම ලක්ෂණේ ඒක තමා... ප්‍රශ්නයක් තියෙනවනම් ඒක තමන්ගේ පිට අරගන්නවා... ඒත් ප්‍රශංසාවක් තිබ්බොත් ඒක තමන්ගේ යටතේ ඉන්න ස්ටාෆ් එකට

දෙනවා..."

චන්ද්‍රා වීදුරු අතරින් නිෂ්පාදන අංශය දෙස බලා මඳ සිනාවක් නැගුවාය. ඒත් සමගම ඇගේ මේසය මත තිබූ දුරකතනය නාද විය.

මේ කතා කරන්නේ ඔහු යැයි නිතැතට ඇයට සිතුණි.

"ගුඩ් මෝනින් බ..බා..."

ඔහු නැගිටින්නට ඇත්තේ දැන්ය. ඊයේ ගෙදරින් යද්දී රෑ දොළහටත් තිබ්බුය.

"ගු..ඩ් මෝ..නි..න් අසංකයියේ... දැ..න්..ද නැ..ගි..ට..ටේ..."

"මේ.. ඊයේ රෑ කෙල්ලෙක් මාව රෑ වෙනකල් තියාගත්තනේ.."

චන්ද්‍රා තොල් පට තද කර ගත්තාය.

"සාම තේ බිව්වේ නෑ..."

"දැන් මො..න..වා උදේන්ම ආවද..."

"ඔ..ව්.. මං පුරුදු වෙලාවට ආ..වා..."

"උදේට කෑවද..."

ඔහු ඒවා අහන්නේ මොන තරම් පුරුදු ලෙසින්ද... එහෙත් මේ කතා කරන්නේ මේ මහා විශාල ආයතනයේ හිමිකරුය.

"නෑ.. මං.. එ..න..කල් හි..ටි..යේ..."

"මටත් එක්ක කෑම ගෙනාවද..."

"ම්.. කිරිබත් හැදුවා.. සීනි සම්බෝල එ..ක්ක..."

"අ..නේ.."

"අ..ද ස්ටාෆ් මී..ටි..න් එකක් කෝ..ල් කා..ළා..ද අසංකයියේ..."

"ඔ..ව්.."

ඒ ඇයි කියා අහන්නට ඇගේ දිව නැමුනේ නැත.

"අ..ද මං සසංක මුදුන්කොටුව විදිහට රත්තරු එකට එනවා බබා..."

"අ..ද..."



"ම්.. තාත්තත් රෑ ආවනේ.. තාත්තත් එක්කම මං දහයට එනවා.."

චන්ද්‍රාගේ පපුව වේගයෙන් ගැහෙන්නට විය.

"ඇ..යි බ..බා.."

"නෑ මු..කු..ත් නෑ..."

"බයවෙන්නෙපා ම..යාගේ අසංකයියා ඉන්නවා.."

"මං..ට මො..න..ව..ත් හි..තා..ග..න්න බෑ.. දෙ..යි..යෝ.."

"මොනවත් හිතන්නෙපා බබා... අපට වැරදින්නෑ... මගේ සිරිගේ පාර්සලේ තියන්න හොඳේ..."

"දැ..න් කො..හොම ඇ..වි..ත් කෑ..න්..නෑ..ද..."

පපුව හෝස් හෝස් ගා ඇවිලෙද්දී ඇය ඇසුවාය.

"මං එන හැටි බලන්නකෝ... අද ස්ටාෆ් එකට මං ගානේ ලන්ච් එක දෙනවා..."

"ම්..."

"මා..ගේ සුදු මෝනට මං ඊට වඩා දෙයක් අද රෑට දෙනවා.."

"ම්..ට..."

"ම්..."

"මො..නා..ද.."

"රෑට තියන්නම් හොඳේ... මට තස්න බරයි මං වොයිලට් යනවා..."

චන්ද්‍රා කට තද කරගෙන සිහාබරව දුරකතනය තැබුවාය. අද කුමක් වෙයිද... ඇය පපුවට අතක් තබාගෙන සිතුවාය.

# 25

රන්තරු ටෙක් ආයතනයේ සේවක සේවිකා රැස්වීම රුවන් සංවිධානය කළේ රන්තරු ආයතනයේ විශාල මිදුලේය. විශාල මී අඹ ගස් හතරකින් සෙවණ වූ රන්තරු ආයතනයේ ප්‍රධාන පිවිසුම අසළ සියළුම සේවක සේවිකාවන් රැස්වී උන්නෝය.

මේ විශේෂ රැස්වීම පවත්වන්නේ කුමක් සඳහාද අද සිදුවන විශේෂ සිදුවීම කුමක්ද යන්න කිසිවෙක් දැන උන්නේ නැත.

රුවන් ඉහළ මාලයේ තම කාමරයේ සිට සසංකට කතා කළේ ඔහු එන වේලාව දැන ගන්නටය.

"සසා... ගුඩ් මෝනින් ස..ර්..."

"ගුඩ් මෝනින් මචං..."



"කීයටද සසා එන්නේ..."

"දැන් පිටත්වෙනවා මචං..."

"හරි සසා..."

රුවන් දුරකතනය තබා බැලුවේ චන්දනා දෙසය. ඇගේ මුහුණේ තරමක බියක් සටහන් වී තිබුණි. අහිංසක කෙල්ලට එවැනි බියක් දැනීම සාධාරණය.

"නංගී බයෙන් ඉන්නේ.. මං දන්නවා.."

චන්දනා අසරණව සිනාසුණා ඇරෙන්නට කිසිවක් කීවේ නැත.

"බ..ය..වෙ..න්න එපා... හැම දෙයක්ම හොඳින් සිදුවෙයි..."

ඔහු කීවේත් එයමය. එතෙක් ආදරය කරන කෙල්ලෙකුගේ හදවත හාවෙකුගේ හදවතකටත් වඩා අහිංසකය. දෛවය ජීවිතයට කොතෙක් සළකාවිදැයි දන්නේ කවුරුද...

"අද ජ්වෑල් එකම පුදුම වෙයි.. මෙච්චර දවසක් සේල්ස් එකේ වැඩ කරපු අසංක අද හිටපු ගමන් සසංක [illegible] වෙලා එද්දී නේද නංගී..."

"ඒ..ක නා..ව..ම ම..ට..ව..ත් හිතාගන්න බෑ අයියේ.."

රුවන් ඔහුගේ මේසය මත තිබූ දම් පැහැයත් ඔකිඩ් වලින් නිමවූ මල් මාලා දෙක අතට ගත්තේය. ඔහු ඉන් එකක් චන්දනා අතට දුන්නාය.

"ම්... බුදු සරණයි දෙවි පිහිටයි කියලා හිතාගෙන ඔයාගේ අතින් මේක ඔයාගේ මහත්තයට දාන්න..."

"ම..ම..."

චන්දනා රුවන් දෙස පුදුමයෙන් බලා ඇසුවාය.

"ඔ..ව්..."

ඇගේ දෑස් තෙත්වී ගියේය. දෛවය මෙහෙම කරන්නේ ඇයි...

"අපි යන් නංගී පහළට දැන් සසයි අන්කලුයි එනවත් ඇති.."

අද රන්තරු ආයතනයේ අනාගත හිමිකරු ලෙස ඔහු සැරසී

ඉන්නා අසුරු ඇයට බලාගන්නටත් ආසය.

"අපරාදේ... අද වැඩ බාරගන්නවා කියලා දන්නව නම් මං පන්සලටවත් ගිහින් එන්නේ..."

චන්දනා පහළට යන අතරතුර කීවාය. ඒත් අද උදේ කිරිබත් හදන්නට සිතුනේ අද විශේෂ දවසක් බව ඉවෙන් මෙන් දැනීද...

රුවන්ගෙන් චන්දනාගේත් අතේ තිබූ මල් මාලා දැක රන්තරු ආයතනයේ සේවක සේවිකාවන් පුදුමයෙන් ඔවුන් දෙදෙනා දෙස බැලුවෝය.

"කට්ටියම පොඩ්ඩක් අහුම්කන් දෙනවද..."

රුවන් කතා කළේය. චන්දනා බිම බලාගෙන උන්නාය. අද මේ කියන දේ අසා මේ සේවක සේවිකාවන් කොතරම් පුදුම වේවිද...

"අද අපි මෙතනට රැස්වුණේ විශේෂ කටයුත්තකට... මේ අවස්ථාව මීට වඩා හොඳට සංවිධානය කරන්න තමයි අපි හිතාගෙන හිටියේ... ඒත් අපේ සර් ඉන්දියාවේ ඉඳලා ආවේ ඊයේ රෑ... ඒ නිසා අද හදිස්සියේ තමයි මේ පණිවිඩයත් ඔයාලට කියන්න සිද්ධවෙන්නේ..

අද අපි මේ රන්තරු කේන් එක ඉදිරියට රැස් වෙලා ඉන්නේ විශේෂ කෙනෙක්ව පිළිගන්න... ඒ විශේෂ අමුත්තා තව මොහොතකින් අපේ සර් එක්ක මේ ආයතනයට එනවා... ඉතින් අපි මේ මල් මාලා තියාගෙන ඉන්නේ ඒ විශේෂ පුද්ගලයාට පළඳවන්න..."

සියල්ලන් රුවන්ගේ මුහුණ දෙස බලාගෙන උන්නේ ඒ විශේෂ පුද්ගලයා කවුදැයි දැනගන්නටය.

"ඒ විශේෂ අමුත්තා තමයි අපේ නව අධ්‍යක්ෂ තුමා... අපේ අලුත් සර්... ඒ කියන්නේ අපේ මුදුන්කොටුව මැතිතුමාගේ එකම පුතු රත්නය... සසංක මුදුන්කොටුව..."

රුවන් මේ ටික කියද්දී චන්දනාගේ යටි පතුල් පවා ඇවිලීගෙන ගියේය. ඔහුගේ නම කියද්දී පවා හදවතට මේ සිදුවන්නේ කුමක්ද...

"සසංක මුදුන්කොටුව මහතා අද දින සිට අපේ රන්තරු





ආයතනයේ ප්‍රධානියා ලෙස වැඩ බාර ගන්නවා... තව මොහොතකින් එතුමාව දකිද්දී ඔයාලට ඇත්තටම විශාල පුදුමයක් දැනේවි... ඒ මොකක්ද කියා ඔහුව දුටු ගමන්ම ඔයාලට තේරුම් යාවි..."

ඒත් සමගම සියල්ලන්ගේම දෑස් බියේ රන්තරු ආයතනයට එමින් තිබූ විශාල කළු පැහැගත් බෙන්ස් රියටයි.

"නංගී... අපි ඉස්සරහට යන්.."

චන්දනාට ගැහෙන්නට විය... දෙවියනේ මේ මොහොතක කෙසේ නම් මැව්වාද... අද ඔහුව තුරුළුලේ පිළිගන්නට තමාටම ලැබුනේ කෙසේද...

වාහනය රන්තරු ආයතනයට ඇතුල් විය. ඒත් සමගම වාහනයේ උන් මුදුන්කොටුව මහතාත් සසංකත් ඔහුගේ නැගණියත් රන්තරු පියසට පය තැබුවෝය.

සුදු පසුබිමේ නීන් නිල් ඉරි සිය කමිසයට තද නිල් පැහැගත් ටයි පටියක් පැළඳ උන් ඔහුව දකිද්දී චන්දනාගේ දෑස් එහෙමම තෙමීගෙන තෙමීගෙන ගියේය.

ඒ කඳුළු ඇයට කොහොමවත් නවත්වාලන්නට නොහැකි විය. මුදුන්කොටුව මහතාත් සසංකත් නැගණියත් ඉදිරියට එද්දී චන්දනාත් රුවනුත් මල්මාලා දෙකද රැගෙන ඔවුන් අසලට ගියෝය.

චන්දනා කඳුළු පිරි දෙනෙතින් ඔහු දෙස බලාගෙන උන්නේ අමාරුවෙනි. අද ඔහු ඒ තරම් ලස්සනය. තමාට අහිමි වේයැයි බියත් එන තරමට ලස්සනය.

"මු..දු සර..ණ..යි..."

ඇය ඔහුට මල් මාලය පැළඳුවේ රහසින් මෙන් එසේ කියාගෙනය. එහෙත් සසංක ළඟම උන් නැගණිය ඒ වචන දෙක හොඳින් අසා උන්නාය.

"මේ ම..ගේ නංගී..."

සසංක ආදරයෙන් ඇයට නැගණියව හඳුන්වා දුන්නේය. චන්දනා පුදුමාකාර ඇසෙකින් සසංකා දෙස බැලුවාය. පසුව එහෙමම ඇයට මුදුන්කොටුව මහතා ළඟ දණ එබිණ.



SIHINA

"කුළුඹුරුවන් සරණයි පුතේ.. නැගිටින්න..."

සසංකට එහෙමම බැලුනේ නංගී දෙසය. ඇය සිනාසුණාය. අයියාගේ ඇස් වල වෙනස්ම පාටක් ඇය දැක්කාය. එහෙත් සේවක සේවිකාවන්ගේ අත්පොළසන් හඬ මැද එය අමතක විය. ඔවුන් සියල්ලම මෙතෙක් අසංක ලෙස දැන උන්නේ ඔහු බව දැක බලා උන්නේ පුදුමයෙනි.

සුදානම් කර තිබූ පහන දල්වද්දී චන්දනාට කතා කළේ සසංක නොවේ. මුදුන්කොටුව මහතාය. ඇයට පුදුම සිතුණි. එහෙත් මේ මොහොත වෙද්දී මුදුන්කොටුව මහතා මේ තම පුංචි ලේලිය බව දැන උන්නේ නැත.

"ඔයත් පත්තු කරන්න පුතේ..."

චන්දනාගේ දෑතම ගැහෙන්නට විය. තවමත් නොතේරුමකින් තිබූ දෑස ඇය හෙමිහිට පිසදාගෙන පහන අද්දරට ආවාය. පහන ළඟට ආ චන්දනා දෙස කාටත් වඩා බැලුවේ සසංකය. සසංකගේ නැගණිය ඇය මේ යුවතියව දුටු මොහොතේ සිට මොකක්දෝ හුරුපුරුදු බවක් දැනෙයි.

"චූටි මැණික අඳුරනවද මේ කෙල්ලව..."

මුදුන්කොටුව මහතා දුවගෙන් ඇසුවේ චන්දනාව පෙන්වාය. සසංකා සිනාසුණාය.

"අඳුනන්නේ නම් නෑ තාත්තේ... ඒත් අද අඳුනගන්න ආස හිතුණා..."

"මේ මගේ ළඟ ඉන්න හොඳම කෙල්ල... මං ඔයාට වගේම ආදරෙයි මේ කෙල්ලට..."

චන්දනාගේ යටි පතුල් පවා සීතල වීගෙන ගියේය. සසංක බැලුවේ දෙනෙත් ගස්සාගෙන මෙනි. "අනේ රත්තරන් මේ විශ්වාසේ තේද මං කැඩුවේ... දැන් මොනවා කරන්නද..." චන්දනා සිතින් ඔහුට කීවේ ඇවිලෙමිනි.

සියල්ලන්ගේ දෑස් තිබුණේ සසංක වෙතය. ඔවුන්ට තවමත් මේ වෙනස් වීම පුදුමය. මෙතෙක් දවසක් සේල්ස් අංශයේ උන්





සාමාන්‍ය සේල්ස්මන් කෙනෙකු වූ අසංක තම අනාගත අධිපතියා යැයි ඔවුන් සිහිනයකින්වත් සිතුවේ නැත.

"දෙයියනේ මං බැන්නත් එක්ක..." නිලන්ති පවුලට අහක් කරගෙන සිතුවේ දැන් තුමකින් තුමක් වේදැයි සිතමිනි. එහෙත් පොදුවේ රත්තරු ආයතනයේ සේවක සේවිකාවන් තම අලුත් ප්‍රධානියා දෙස බලා උන්නේ තරමක ආදරයෙනි.

"මුලින්ම මං අපේ ලොකු සර්ට ආරාධනා කරනවා මේ අවස්ථාවේ පුංචි කතාවක් කරන ලෙස..."

මුදුන්කොටුව මහතා ආවේ සිනාසෙමිනි. ඇත්තටම සැනසීමෙනි. මෙතෙක් කලක් සිත පත තිබූ විසල බරක් අද නිදහස් විය. ඔහු ඒ තරමටම තම පුතාව විශ්වාස කළේය.

"අද මට හරි සතුටු දවසක්... හරිම සතුටු දවසක්... මේ රත්තරු ෆැක්ටරියට මගේ පුතා අත්තිවාරම ආවේ කොට කලිසමක් ඇඳගෙන ඉස්කෝලේ යන ඇඳුම පිටින්... මෙන් මෙච්චර විතර ඇති... අද මේ රත්තරු එකේ මගේ තැන අද ඉදලා ගන්නේ ඒ මගේ පුතාමද කියලා මට හිතෙනවා..."

මුදුන්කොටුව මහතා කතා කරමින් සිටියදී සසංකා තම සහෝදරයාගේ ළඟට හිමිහිට ආවාය. මේ හිතට දැන් දැනෙන සැකය දුරු කරගත යුතුය.

"අ..යියේ..."

"ම..."

"මං... බඩුවක් අහන්න ඇත්තම කියනවද..."

"කියනවා..."

"මං දන්නවා බොරු කියන්නෑ කියලා..."

එහෙම කියා සසංකා තවත් වරක් තමාට මදක් එහායින් උන් චන්දනා දෙස බැලුවාය.

"දවසක මගෙන් ඇහුවා ඔයා කතාවක්..."

SIHINA

"ඇහුවා..."

"මොනවද..."

"මං උප්පන් කෙල්ලෙක් ගෙදරට එක්කගෙන ආවොත් කැමතිද කියලා..."

සසංකා කීවාය. තම නැගණියගේ අහන්නට යන්නේ කුමක් දැයි ඔහු ඉවෙන් මෙන් දැන උන්නේය.

"මං එහෙනම් දෙයක් අහන්නද..."

"එපා... බබා..."

"ඇයි..."

"මට තව පැය දෙකක් දෙන්න... මං එයාව එක්කගෙන එනවා..."

සසංක කීවේ ආදරයෙනි.

"ම්... හැබැයි හවස් වෙනකල් විතරයි..."

සසංක සිනාසුනේ බිම බලාගෙනය. සසංකා යළිත් වතාවක් චන්ද්‍රනා දෙස බැලුවාය. එවර චන්ද්‍රනා බලා උන්නේ ඈත දෙසය.

"දෙයියනේ සසංකා මිස් මං දිහාම බලන් ඉන්නවා... මේ මො..න..වා..ද වෙන්නේ.." ඇය සිතුවේ උගුර කට වියළී යද්දීය. එහෙත් ඊළඟ තත්පරයේදී සසංකා ඇය හා සුන්දර ලෙස සිනාසුනාය. "මම නිකමට හිතෙනවා ඔයා මේ කෙල්ලව කැන්දගෙන එයි කියලා... බලමුකෝ... ඔයා එයාවමද එක්කගෙන එන්නෙ කියලා..."

"ඉතින් අද මට මගෙ පණ හා සමාන රන්තරු සෙත් ආසනය මගේ පණටත් වඩා මං ආදරේ කරන මගේ පුතාට දෙනවා... එන්න පුතේ.."

සසංක තාත්තා අඩගසද්දී ගියේ දෑතින් දෑස පොඩි කරමිනි. එය ඇත්තටම හැඟීම්බර දර්ශනයක් විය.

ඔහු පහත් වී මුදුන්කොටුව මහතාගේ දෙපා නමද්දී චන්ද්‍රනාගේ දෑසින් මදටිය ඇටයක් තරම් කඳුලක් වැටුණි.

සසංක කතා කළේ සතුටිනි. එහෙත් ඔහු එයට සැහෙන වෙලා





ගත්තේය. මේ මොහොතේ මේ තරම් දුක්බර මොහොතක් වේ යැයි ඔහු සිතුවේ නැත.

"කතා කරන්න රන්තරුන්..."

චන්ද්‍රනා සිහින් කීවේය. තමා කතා කරන්න යද්දී චන්ද්‍රනා අඬන්නේ ඇයි දැයි සසංක ඒ දෙස බලමින් සිතුවාය.

"මීට මා..ස හතකට විතර කලින් එක උදේක මං රන්තරු එකට ආවා... එතකොට මම රට ඉඳලා ඇවිත් සතියයි.. මේ රන්තරු එකට ඇතුල් වෙද්දී මගේ හිතට පුදුම හැඟීමක් දැනුණා. ඒ වගේම එදා උදේ මං.. පුදුම කෙනෙක් හම්බවුණා..."

චන්ද්‍රනාගේ යටි පතුල් පවා සීතල වී යනු විය. "අ..නේ ර..න්..තා..රා..න් ඒවා කියන්නේ ඇයි.." ඇය බිම බලාගෙන උන්නේ තොල් පට තද කරගෙනය.

"එදා ඒ ආපු ගමන මගේ ජීවිතේ මොකක් වෙනස් කළා.. ඒ වෙනස මොකක්ද කියලා කවදාහරි ඔයාලට තේරෙයි.."

සසංක ඉන් එහාට ඒ ගැන කියන්නට ගියේ නැත. "එදා උදේ අයියාව හම්බ උණේ ඔයාද..." සසංකා චන්ද්‍රනා දෙස බලමින් සිතුවාය.

"මගේ තාත්තා ඇස්දෙක වගේ බලාගත්ත තුන් දෙනෙක් හිටියා... එක්කෙනෙක් මම... අනික් කෙනා මගේ නංගී... අනික් කෙනා මේ රන්තරු එක..."

සියල්ලන්ම බැලුවේ මුදුන්කොටුව මහතා දෙසය. ඔහු තෙතමනයක් සහිත දෑසින් සිනාසුණේය.

"තාත්තා උදේට කන්නේ මං කෑවද නංගී කෑවද කියලා අහලා.. රෑට කන්නෙත් එහෙමයි... තාත්තා ඒ තරමටම මේ රන්තරු එකට ආදරේ කළා... අද මං මගේ තාත්තාගේ ඉස්සරහා ඉඳන් කියනවා මගේ ජීවිතෙත් ඒ වගේ ආදරේ කරන හතර දෙනෙක් ඉන්නවා කියලා..."

චන්ද්‍රනා බොඳ වූ දෑස් ඔසවා ඔහු දෙස බැලුවාය.

"මගේ තාත්තට... මගේ නැගණියට... මේ රන්තරු එකට... ඒ වගේම තවත් එක් කෙනෙක්ට මං හරි ආදරෙයි... මං මේ හතර දෙනාවම එක වගේ බලා ගන්නවා..."

සසංකගේ මේ කතාවට කාටත් වඩා ඔහු දෙස බලා සිනාසුණේ මුදුන්කොටුව මහතාය. තම පුතා තමාට තම දුවට රන්තරු එකට ආදරේ බව ඔහු දනී. එහෙත් ඔහු ආදරේ කරන අනිත් කෙනා කවුද... මුදුන්කොටුව මහතා ඔහු දෙස බලා උන්නේ කුතුහලය මුසු ආදරයකිනි.

"මං වැඩිය කතා කරන්නේ නෑ... එක දෙයක් විතරක් මං කියන්න කැමතියි... මං ඔයාලා ඔක්කොටම හරි ආදරෙයි... ඒ ආදරේ නිසා මං කවදාවත් ඔයාලාව රවට්ටන්නේ නෑ... බලා ගන්නවා... ආදරේ කරන කෙනෙක්ව බලා ගන්නවද එයාට වංචාවක් කරනවද කියලා ඔයාලත් හිතන්න... අපට පුළුවන් නම් ආදරෙන් ඉන්න... අවුරුද්දකින් මම මේ රන්තරු එක ලංකාවේ හොඳම කේක් ෆැක්ටරිය කරනවා... නීතියෙන් බලහත්කාර කමෙන් ගොඩක් දේවල් ලබා ගන්න පුළුවන්... ඒත් ආදරෙන් ඕන දෙයක් ලබා ගන්න පුළුවන්... මම... මේ ආයතනයට ආදරේ කරන කෙනෙක් මං ළඟට දෙයක් ඉල්ලගෙන ආවොත් මං එයාව හිස් අතින් යවන්නේ නෑ... එච්චරයි මං ඔයාලට කියන්නේ... ආයුබෝවන්..."

ඔහු දැන් එක්කොට එසේ කතාව නිමා කරද්දී රන්තරු ආයතනයේ සේවක සේවිකාවන් අත්පොලසන් දුන්නේ වේගයෙනි... සියල්ලන්ට වඩා අත් රිදෙන්නට අත්පොලසන් දුන්නේ ඇයය.

සසංක කතාව නිමා කර ආවේ තාත්තා ළඟටය. මුදුන්කොටුව මහතා තම පුතා ගැන බොහෝ සේ ආඩම්බර වී උන්නේය.

"තා..ත්..තේ... අහන්නකෝ..."

සසංකා මුදුන්කොටුව මහතාට කීවාය. මුදුන්කොටුව මහතා සිනාසුණේය.

"මොකක්ද චූටි..."





සසංක ඇසුවේය.

"අර ආදරේ කරන හතරවෙනියා කවුද කියලා..."

සසංකා බබලන දෑසින් ඇසුවාය. ඔහු බිම බලාගත්තේ සිනාසෙමිනි.

"අයියා සිතිච්ච වෙලාවට අපට කියයි..."

මුදුන්කොටුව මහතා ඒ තරමට තම පුතාව විශ්වාස කළේය.

"කියනවා තාත්තේ... අද හවසටම කියනවා..."

"අද නම් පුදුම දවසක්..."

මුදුන්කොටුව මහතා සිතේ සතුටිනි. සසංකා බලා උන්නේ සේවක සේවිකාවන් අතර උන් චන්දනා දෙසය. සසංක බලා උන්නේ ඔහු දෙසය. "මගේ හැකා මෙච්චර අහිංසක කෙල්ලෙක් වෙයි කියලා මං හිතුවේ නෑ..." ඇය පපුවට සුරත තබාගෙන සිතුවාය.

"දැන් රන්තරු එකේ සේවය කරන ඔයාලාට තේරෙනවා ඇති අපට ලැබිලා ඉන්නේ කොච්චර හොඳ අධ්‍යක්ෂ තුමෙක්ද කියලා... එතුමා මේ ආයතනයේ හැම කෙනෙක්වම ආදරෙයි... ඒත් වෙනසක් නෑ.. ඉතින් අපි ඒ ආදරේ හැමදාම රැකගන්න ඕන... එහෙම වුණොත් විතරයි අපට රන්තරු එකත් අපේ වෘත්තියත් රැකගන්න පුළුවන්... ඒ වගේම අපි අපේ ලොකු සර්ට ආදරෙන් කියනවා රන්තරු එක අමතක කරන්නත් එපා කියලා... අපි හදන කේක් වල රස බලන්න ඔබ තුමාට තව චිරාත් කාලයක් නිදුක් නිරෝගී සුව අත්වෙන්න කියලා අපි එක්ව පතනවා..."

රුවන් කියද්දී මුදුන්කොටුව මහතා ආදරබර ලෙස සිනාසුණේය.

"ලබන සතියේ සිට අපි අලුත් කේක් වර්ගයක් වෙළඳ පොලට නිකුත් කරන්නට හිතාගෙන ඉන්නවා... ඒ ෆැමිලි කේක් එක නිර්මාණය කළේ අපේ නව නිෂ්පාදන කළමණාකාරිනිය වූ චන්දනා මෙනෙවිය... අපි හිතනවා ඒ අලුත් කේක් එකට වෙළඳ පොළේ සැහෙන අලෙවියක් ඇති වෙයි කියලා..."

මුදුන්කොටුව මහතා චන්ද්‍රා දෙස බලා හිස වැනුවේ සිනාමුසුවය. ඇය තෙත් වූ දෙනෙත් වලින් ඔහු දෙස බලා අහිංසක ලෙස සිනාසුණේය.

"ඒ වගේම ප්‍රධාන නගර කිහිපයකම අපේ කේක් අලෙවි සැල් විවෘත කරන්නත් මේ වන විට අලුත් අධ්‍යක්ෂ තුමා කටයුතු කරගෙන යනවා... ඒ අලෙවි සැල් හරහා පාරිභෝගිකයන්ගේ උපන් දින හා මංගල කේක් ඇණවුම් භාරගන්නටත් එතුමා සිතාගෙන ඉන්නවා... කොහොම උනත් ඒ සියල්ලට කලින් අපට අපේ අලුත් අධ්‍යක්ෂ තුමාගෙන් වෙඩින් කේක් කෑල්ලක් කන්නට ලැබෙයි කියලා අපි හිතනවා... එහෙම නේද සර්..."

රුවන් අසද්දී සියල්ලන්ම අත්පොළසන් ගැසුවෝය. චන්ද්‍රා දැස් බිමට බර කර ගත්තේ සිනහව තොල් පටින් තද කරගෙනය. සසංක කොල ඔබින් තම පියාත් නැගණියත් දෙස බැලුවේය.

"ඉතින් අපේ අනාගතය ඇත්තටම හරිම සුබයි... වසර තුනක් තුළ රන්තරු කේක් පමණක් නොව අලුත් බිස්කට් වර්ග කිහිපයකුත් පලතුරු යුෂ පානයකුත් වෙළඳ පොළට නිකුත් කරන්නට අපි සැලසුම් කරගෙන යනවා... ඉතින් ඒ සියල්ල කරගෙන යන්නට අපේ නව අධ්‍යක්ෂ තුමාට සියළු දෙවි රැකවරණය ලැබේවායි අපි පතනවා... ඔබට ස්තුතියි..."

රුවන් කතාව නිම කර ආවේ චන්ද්‍රා ළඟටය. [illegible] කෙල්ලගේ ඇස්වල තිබූ නෙත පාට තවමත් එහෙමමය. සේවක සේවිකාවන් සෙමෙන් සෙමෙන් විසිර ගියේ අලුත් අධ්‍යක්ෂ වූ සසංකට ආයුබෝවන් කියමිනි. අවසානයට ඉතිරි වූයේ චන්ද්‍රාත් රුවනුත්ය. මුදුන්කොටුව මහතාත් සසංකත් සසංකාත් උන් තැනට ඔවුන් ගියේ සියල්ලන් ගිය පසුය.

"ඔයාව අද මේකේ මුල් පුටුවට ගෙනාව වගේම මට සතුටුයි මේ කොල්ලවයි කෙල්ලවයි මේකේ තැනකට ගෙනාපු එකට..."





මුදුන්කොටුව මහතා කීවේ රුවනුත් චන්ද්‍රාත් දෙස බලමිනි.

"මේ කෙල්ල මෙහෙට ආපු දවසේ ඉඳලා මං [illegible].. මේකේ වෙච්ච දේවල් දරාගන්න බැරුව.. ඒත් කෙල්ල අඩිය දාලා ගියේ නෑ..."

මුදුන්කොටුව මහතා කීවේය.

"දැන් කොහොමටත් දාලා යන්න බැහැනේ.. නේද චන්ද්‍රා.."

සසංකා කීවේ තේරුම් ගොඩක් සිතාගෙනය. චන්ද්‍රා ඇය දෙස බැලුවේ අසරණවය.

"මං.. මි..ස්.."

"මි..මි.. මං මිස් නෙමේ.."

රුවන් පරිස්සමින් සසංකා දෙස බැලුවේය. "කෙල්ලට බය වැඩිලා ඇති.." ඔහු හිතුවේය.

"අලුත් කේක් එක රසයිද පුතේ.."

මුදුන්කොටුව මහතා ඇසුවේ චන්ද්‍රාගෙනි.

"ස..ර් බ..ල..ලා කි..ව්..වා ර..සයි කියලා..."

අමාරුවෙන් ඇය සසංක දෙස බලා කීවාය.

"සාම්පල් එක හොඳට තිබ්බා තාත්තේ.. එක චොකලට් මික්ස් කේක් එකක්..."

"දැන් මාකට් එකේ තියෙන චොකලට් කේක් වලින් එන පුස් රස ඒකේ නෑ අන්කල්..."

රුවන්ද කීවේය.

"දැන් මට තියෙන්නේ එක ප්‍රශ්නයයි..."

මුදුන්කොටුව මහතා හදිස්සියේ කීවේය.

"ඒ මොකක්ද තාත්ති..."

සසංකා ඇසුවාය.

"ඉස්සරහට මේ කෙල්ලයි කොල්ලයි රන්තරු එක දාලා යයිද

කියලා..."

ඒ කතාවට ඇගේ දෑසින් කඳුළු වැටිණි. ඇය එහෙමම දෑස් ඔහුට බර කළාය.

"මේ දෙන්නටම අලා යන්න දෙන්න බෑ තාත්තේ... දෙන්නම ඕන..."

"ම්..."

"මං තාත්තට හවසට කියන්නම්..."

එසේ කියා සසංක බැලුවේ රුවන් දෙසය. ඒ වන විටත් රුවන් ගැන මිනුවටත් විශ්වාස කළ නොහැකි දෙයක් සසංක හිතාගෙන උන්නේය.



SIHINA

# 26

එදින රන්තරු කේක් ආයතනයේ සියළුම සේවක සේවිකාවන්ට වරුවක නිවාඩුවක් ලැබුණි. සියල්ලන්ම ආයතනයෙන් පිටව ගිය පසු ඉතිරි වූයේ චන්දනාත් සසංකත් රුවනුත් පමණි.

චන්දනා නිෂ්පාදන අංශයේ වූ ඇගේ කුඩා කාමරයට වී දිගටම වැඩ කරමින් උන්නාය. දැන් මේ ආයතනය ඔහුගේය. ඇය මුළු හදවතින්ම ප්‍රාර්ථනා කළේ ඔහුගේ සාර්ථකත්වයය. ඒ නිසාම වෙලාවක් අවේලාවක් නොබලා පෙරටත් වඩා රන්තරු ආයතනය වෙනුවෙන් සේවය කරන්නට ඇය හිතාගෙන උන්නාය. "ඔයා පය තියන තියන තැන මල් පිපෙන්න ඕන..." ඔහු සේවක සේවිකාවන් අමතා කතා කරද්දී ඇය පැතුවේ එසේය.

වෙළඳ පොළට නිකුත් කරන්නට සැළසුම් කළ අලුත් චොකලට් කේක් වර්ගයේ පුංචි ප්‍රශ්න කිහිපයක් විය. ඇය ඇයට තේරෙන ලෙස හිතමින් උන්නේ ඒ ප්‍රශ්න ගැනය.

චොකලට් කේක් එකේ මිල තරමක් වැඩිය. කේක් එකක් ගන්නේ සාමාන්‍ය මිනිසුන්ය. ඔවුන් ඒවා ගන්නේ කාරණා දෙකක් නිසාය. එකක් කාට හෝ තෑගි දෙන්නටය. අනෙක ගෙදරට කිසිවෙකු හෝ එන විටය. නොවේනම් හවසක තේත් සමග කන්නටය.

ඒ සියල්ල සඳහා මේ මිල වැඩිය. මිල අඩු කරන්නට නම් එක්කෝ බාල අමුද්‍රව්‍ය දැමිය යුතුය. නැත්නම් කේක් එක තව ටිකක් පුංචි කළ යුතුය.

චන්දනා කොළයක් තබාගෙන කටු ගාමින් ඒ ගැන සිතමින් සිටියදී ඔහු දොරකඩ ඉඳ බලා උන්නේය. බොහෝ වේලාවකට පසු ඇය හිස ඔසවා බැලුවේ සුසුම් හඬක් නැගෙද්දීය.

"අ..නේ.. ගොඩක් වෙලාද ආවින්..."

ඇය ගෞරව පූර්වකව නැගිට්ටාය. ඔහු කාමරයට ආවේ ඇයට ඉඳගන්නා ලෙස සුරතින් කියමිනි.

"අද නං ඩේ මං නිවාඩුවක් දුන්නා... තාම වැඩ.. ඇ..යි..."

කෙල්ල කතා නොකර හීන් හිනා පට මුව තුළට ගත්තාය. ලා රෝස පැහැ ගත් ඒ දෙතොල් එහෙම හංගාගන්නට එපා යැයි ඔහු සිතින් කීවේය.

"අ..ද ඉඳලා මං අසනීපෙකට වත් නිවාඩු ගන්නෑ... හි..තු..තො..ත් ඉරිදත් වැ..ඩ කරනවා..."

"ඇ..යි..."

"දැ..න්.. මේ.. ර..න්..ත..රු එ..කේ මූ..ල් පු..ටු..වේ ඉ..න්..නේ ම..ගේ..."

කියන්නට ගිය දේ ඇයම ගිලගත්තාය.

"ඉ..තින් කියන්..න ම..ගේ කවුද..."

ඒ ඇස් වලින් පෙම්මනයක් ගලා එයි.



"කියන්න.. මගේ කවුද..."

"ම..ගේ.. ම..හ..ත්..ත..යා..."

එහෙම කියද්දී පවා හදවතට කොතරම් සතුටක් දැනෙනවාද.. හදවත මේ තරම් මේ ආදරයට ලෝබ කමින් පැලෙනවාද..

"ම..ගේ නෝනා බලාගන්න ඕන මාවනේ.. ර..න්..ත..රු එක නෙමෙයිනේ..."

"ඒ..ත් මේ ර..න්..ත..රු එ..ක.. ම..ට එ..හෙම අ..ම..ත..ක කරන්න බෑ..."

"මටත් අමතක කරන්න බෑ.. ඔයා නැතුව මේක එකම දවසින් විනාසයි..."

මේසය මත තිබූ ඇගේ සුන්දර සුරත මතට එහෙමම ඔළුව වැටෙන්නට දී ඔහු කීවේය.

"මො..න..ව..ද කර කර හිටියේ..."

"පො..ඩි වැ..ඩ..ක්.. චූටි ප්‍රශ්නයක්..."

"මොකක්ද..."

"නෑ ඒක හිතන්න එපා... මේ.. චූ..ටි..."

"හ..රි බං.. ඉතින් ප්‍රශ්නෙ කියපන්..."

ඔහු ඇගේ අතට ගසා කීවේය.

"අපේ අලුත් චොකලට් කේක් එක තියෙන්නේ.. ඉතින්..."

"ඒක ටිකක් ගාණ වැඩියිනේ..."

ඇය කියන්නටත් ප්‍රථම ඔහු කීවේය. ඇය ඔහු දෙස බැලුවේ පුදුමයෙනි.

"කොහොමද හිතුවේ..."

"පිටරට ගිහින් බිස්නස් මැනේජ්මන්ට් ඉගෙන ගත්ත මං ඒක හිතපු එක පුදුම නෑ... මගේ නෝනාට ඒක හිතිච්ච එකයි පුදුම..."

ඇය ඔහුගේ අගය කිරීම බාර ගත්තේ ආදරයෙනි.

SIHINA

"මට ඒ..වා හිතෙන්නේ ඇ..යි දන්නවද..."

"ම..."

"රැස් විහිදෙන මහත්තයෙක් ළඟින් ඉන්නේ ඒ..ක..යි..."

රැස් විහිදෙන්නේ තමාගෙන් නොව තම ආදරයෙන් බව ඔහු දනී.

"ඉතින් මොකද ගාණ වැඩි එකට හිතුවේ..."

ඔහු ඇසුවේය.

"කොලිටි එක බාල කරන්න නම් බෑ... එතකොට අපිටත් මාකට් එකේ පුස් කේක් හදන ගොඩට වැටෙනවා..."

"එහෙනම්..."

"සයිස් එ..ක චු..ට්..ට..ක් චූ..ටි ක..ළො..ත්.. පැකින් එක ඒ ගාණටම තියලා..."

සසංක තම අනාගත බිරිඳගේ දෑස් දෙසම බලා උන්නේය. දෙවියන් තමා අසළට ගෙනවිත් ඇරලවා ඇත්තේ නිකමම ලස්සන කෙල්ලෙක් නොවන බව ඔහු දනී.

"මං හිතුවෙත් ඒ..ක..."

"ඇ..ත්..ත..ට..ම හිතුවද..."

"ම..."

"ඒ..ක..ම ඒවා හිතෙන්නේ..."

දෙදෙනාම දෙදෙනාගේ මුහුණු දෙස බලාගෙන සිනාසුණෝය.

"ය..න්.. යන ගමන් කතා කරමු... ලොකු දෙයක් තියෙනවා කියන්න..."

"ම..ට..."

උගුර සිරවී ගියාක් වැනි විය.

"ම.. ය..න්.."



"කා..ම..ත් නැ..ද්..ද මං ආ..ව..ට..."

"වෙ..න කවුරු මා..ත් එක්ක ය..න්..නද..."

ඇය ඔහුත් සමගම ගොස් වාහනයට නැග්ගේ ආසාවෙනි. සසංක වාහනයේ ඉදිරිපසට නැග ඇය දෙස මොහොතක් බලාසිටියේය.

"අ..ද හ..ව..සට මො..ක..ද්ද ඇ..දී..ල්..ගේ..."

"හ..ව..ස..ට... ඇ..යි..."

ටික දුරක් යනතෙක් ඔහු කතා කළේ නැත.

"කිය..න්..න..කෝ..."

"මං.. අ..ද තා..ත්තටයි නැ..න්දටයි පොරොන්දු වුණා..."

"මො..ක..ක්..ද දෙයි..යෝ..."

"අද රෑට ම..ගේ මනමාලිව මං එයාලට පෙන්නන්න එක්ක එනවා කියලා..."

"අ..නේ.. ම..ම.. ම..."

චන්ද්‍රනාගේ දෑසින් කඳුළු වැටිණි. දෙවිය මේ කඳුළු වලට කෙසේ නම් සලකයිද...

එවැනි අභිමත් මොහොතක් තම දුප්පත් ජීවිතයේ තිබිය හැකිද.. දෙවියන් හොඳ අතකට කවදා හෝ දෙයක් දෙන බව ඇය දැන උන්නාය. එහෙත් මේ තරම් දෙයක්.

"මං.. කො..හො..ම..ද ලො..කු ස..ර්..ට..."

ඇගේ හඬ බිඳී යන්නට විය. එවැන්නක් බාර ගැනීම අතිශයින් දුෂ්කරය.

"ඒක හිතන්නෙපා... මගේ තාත්තයි නැ..න්දයි මං වගේ..."

හිතනා දේවල් ඒ ලෙසම වෙන ලෝකයක් ගැන ඇය අසා නොතිබිණි. එහෙත් ඔහුගේ දෑස් වලින් ඇයට විශ්වාසයක් ඇති විය.

"මං හවස හතට එනවා... එතකොට ඇඳගෙන ඉන්න ඕන..."

මේ කිසිවක් සිතාගත නොහැක. දෙවියන් ඒ තරමම සුන්දර ලෙස තම දෛවය විසඳනවාද... මැරිච්ච අම්මාවත් කොහේ හෝ

සිට තමා දෙස බලා ඉන්නවාද...

"මං.. මං.. සා..රිය..ක් අ..දි..න්..නා..ද..."

ඔහු සිනාමුසු මුව වැනුවේය. කෙල්ලගේ ලස්සන වැඩිපුරම පෙනෙන්නේ සාරියටය.

ඔහු වාහනය පදවාගෙන විත් නැවැත්වූයේ මාවතේ නිදහස් තැනකය.

"අපේ අම්මා නැති උනාට පස්සේ ගෙදර තිබ්බේ ලොකු පාළුවක්.. ඒ පාළුව අද වෙන තුරු එහෙමම තියෙනවා... තාත්තා මම නංගී හැමදාම කවුරුහරි එනකල් බලාගෙන උන්නා..."

ඔහු මේ කියන්නට යන්නේ එසේ බලා උන්නේ ඒ ගෙදර ලේලි එනතුරු බවද...

"එයා ගොඩක් හොඳ කෙනෙක් වෙන්න ඕන... හරියට අපේ අම්මා වගේ.. අහිංසක හරියට කරදර වෙන කෙනෙක් වෙන්නත් ඕන..."

ඇගේ දෑස් සිමටම බරවී තිබුණි. මේ හදවත සදාකලයටම කරදර වෙන්නේ ඔහු වෙනුවෙන් නොවේද...

"මං අද හවස ඒ කෙනාව එක්කගෙන එනවා කියලා එයාලට පොරොන්දු වෙලා තියෙන්නේ..."

ඔහු කීවේ ඇගේ උකුල මත වූ පුරන අල්ලාගෙනය. ඇය ඔහු දෙස බැලුවේ තුනී කඳුළු පටලය අතරිනි.

"අ..සං..ක..යි..යේ..."

"කියන්න බබා..."

"හ..දි..ස්..සි..යේ..ව..ත්..."

"තාත්තා අකමැති උනොත් කියලද අහන්නේ..."

"ම..."

"මගේ අම්මා ගොඩක් දුප්පත් ගෑණියෙක්... දුප්පත්



ගොවියෙක්ගේ දුවෙක්... ඒත් ඒ අම්මා තාත්තාව සුදු ආදරයකින් බලා ගත්තේ... ආදරේ කියන්නේ එහෙම දෙයක් කියලා තාත්තා දන්නවා..."

"ඒත්..."

"තාත්තා ගැනවත් නංගී ගැනවත් එහෙම හිතන්නෙපා.."

"අ..නේ.. මං.. එ..හෙ..ම හි..ත..න..ව..ට බෑ..මේ.."

ඔහු දුක්බර ලෙස ඇගේ හිස පිරිමැද්දේය.

"මං දන්නවා බයේ ඉන්නේ කියලා.. ඒ බය නවතට නැතිවෙයි.."

ඔහු කියනා මේ මීතය එකවර නොහොත් පටුමට නන්ද, සසංක සැහෙන වේලාවක් කෙල්ල දෙස බලා උන්නේය. ඇයව ඔහු ගෙදරට එක්කාගෙන ගිය පසු ඒ ගෙදර කොතරම් සිටුවම්න් පිරේදැයි ඔහු මවා ගන්නට උත්සාහ කළේය.

SIHINA

# 27

**සසංක** ඇයව ගෙදරට ඇරලවා කෙළින්ම ගියේ නිවසටය. නිවසට ආ විගසම ඔහු ගියේ සසංකාගේ කාමරයටය. ඇය උන්නේ කාමරයේ ටයිල් බිම වාඩි වී පොත් කිහිපයක් වට කරගෙනය. සසංක තම නැගණිය දෙස ටික වේලාවක් බලාගෙන උන්නේය.

සසංකා අයියාව දැක දැසින් කතා කළාය. ඔහු ගොස් කෙල්ල අසළින්ම බිම වාඩිවිය. නැනලා දෙන්නා යාළුවන් දෙදෙනෙකු මෙන් මේ ගෙදර ජීවත් වනු ඇතැයි ඔහුට සිතුණි.

"මොනාද හිතුවේ..."

ඇය හුරතල් ලෙස ඇහුවාය.

"මුකුත් නෑ... තාත්තා කෝ..."



"ම්.. මං හිතන්නේ මිල්රෝයි අන්කල්ලාගේ ගෙදර ගිහා.. ඩට ඩින වලට එන්න කියන්න.."

"පාටියක්ද..."

"එහෙම තොද බැනේ... අපේ නැනා එනවලුනේ අද.."

කෙල්ල දිස්තිමත් දැසින් තම සොහොයුරා දෙස බැලුවාය.

"නේ..ද.."

"ම්.."

"අ..ම්..මේ එක කියන්නකොට තියෙන පෙම් පාට.. මේ අනාලා අතට ගන්න පුළුවන්.."

සංසකා ඔහුගේ මුහුණ අතගෑවේ ආදරයෙනි.

"චූටී..."

සසංක කතා කළේ වීසාන් මැයිරුම්වය. සසංකාද හිස කරකවා ඔහු දෙසා බැලුවාය.

"අ..යියේ..."

"මෙන්න අත.. අත තියලා කියන්න කා ගැනවත් හිතේ නෑ කියලා..."

සසංකා ඔහු දෙස බලා උන්නේ පුදුමයෙනි.

"ඇ..යි එ..හෙම ඇහුවේ..."

"මං දිහා බලලා කියන්න... කිසිම කෙනෙක් ගැන හිතේ නෑ කියලා..."

සසංකාගේ දෑස්වල කඳුළු පිරුණි. ඒවා ඔහු ඉදිරිපිටදීම ගලා යන්නට විය.

"එ..හෙ..ම නො..හො..ම..ද අ..යියේ කිය..න්..නේ..."

"මොකක්ද..."

"හා.. ගැ..න..ව..ත් හි..තේ නෑ කියලා.."

සසංක කෙල්ල දෙසම බලා උන්නේය. ඊටත් පසු ඇගේ උරහිසට සුරත තබා කෙල්ලව තමාගේ පැත්තට ළං කර ගත්තේය.

"ම..ට කියන්..න.."

"කි..ව..වො..ත් ත..ර..හ වෙයි.."

"මං.. ක..ව..ද්..ද චූටි එක්ක ත..රහ උනේ.."

"ප්‍රොමිස්.."

ඇය ඇගේ සුදු අත පෑවාය. ඔහු එය අල්ලා ගත්තේ ආදරයෙනි.

"ප්‍රොමිස්.."

"කො..නෙ..ක් ගැ..න හි..තේ.."

"හි..යෙ..නවා නේ..ද.."

"ම්.."

සසංක එක එල්ලේම ඇය දෙස බලා උන්නේය. කෙල්ල ඇස් හැංගුවේ නැත.

"රුවන්.. නේද.."

සසංක එසේ කියද්දී ඇය පුදුමයෙන් බැලුවාය. අයියා තම දැස් කියෙව්වේ කෙසේද...

"ම්.. කො..හො..ම..ද අ..යියා.."

"මං දන්නවා.. හිතනවද එයා හොඳයි කියලා.."

"ම්.. ඔයා වගේමනේ.. මං ඒ..කට ආසයි.."

"අහිංසක දුප්පත් කොල්ලෙක්.."

"ඇත්ත.. මගේ නැනත් එහෙමනේ.."

සසංකා කියද්දී ඔහුගේ මුවේ තුනී සිනහවක් නැගුණි. ඔහු හෙමම තම නැගණියව ළයට තුරුල් කරගත්තේය.



SIHINA

අද ජීවිතය කොතරම් දෛවෝපගත දවසක්ද..? මොහොතකින් ඔහු එන්නේ රන්තරු නිවසට තමා එක්කගෙන යන්නටය. රන්තරු ආයතනයේ ඉතාම සුළු සේවිකාවක් වූ රන්තරු නිවසේ ලේලියක ලෙස ඒ නිවසේ පය තැබිය හැකිද..?

එහෙත් දෙවියන් මේ හදන්නේ ඒ දේ කරන්නටය.

චන්දනා ඇන්දේ ඇය ඇගේ ජීවිතයේ අඳින්නට ආසම කළ ලා රෝස පැහැගත් සාරියය. හීන් රිදී නූලකින් මල් වැලක් ගොතා නිමාවට තිබූ ඒ සාරිය මෙතුවක් කලක් නොඇන්දේ එය අඳින්නට තරම් සුදුසු ගමනක් මේ ජීවිතයේ උදා නොවූ නිසාය.

සාරිය ඇඳි ඇය ඇයගේ රුව දෙස තැවසිල්ලෙන් බලා උන්නාය. "මෙච්චරම ලස්සන වෙන්නෙපා.. අද ඇස්වහ වදී කාගෙවී.." හැඩපත් උන් චන්දනා ඇයට කියන්නාක් මෙන් විය.

දෛවයේ තිබුණේ ජීවිත කුසුම කොහේ හෝ පැතක වැටී පරව යන්නටය. ඉතාම දුප්පත් යුවතියකට ඊට වඩා දෙයක් දෛවය දුන්නේද නැත. එය රැක ගන්නවා ඇරෙන්නට යුවතියකට කරන්නට වෙන දෙයක්ද නැත.

එහෙත් රන්තරු ආයතනයේ ගෙවී ගිය එක උදෑසනකදී ඒ දෛවය එහෙමම කණපිට පෙරළින. කොහේ හෝ වැටී පරව යන්නට තිබූ කුසුම ඔහු ගත්තේ දෝතිනි. බැතියෙනි.

පිරිමියෙකුට ඒ තරම් හෘදයාංගම ලෙස ආදරය කළ හැකිද..? එසේ කළ හැකි යැයි දැන් චන්දනා සිතන්නේ ඔහු නිසාය. සමහර විට ඔහුවත් කෙනෙක් තව ලොව නැති වන්නටද පුළුවන.

ආදරයෙන් දුකක් බලාපොරොත්තු වන අය මිසක ආදරයට දුකක් දෙන අය නැත. ඇත්තටම නැත.

චන්දනා ඉතාම මෘදුව රෝස පුයර පිඳුගාගෙන ළපටි කම්මුල් වල තවරා ගෙන පිටතට ආවාය. අප්පච්චි දිලිසෙන ඇස් වලින් කෙල්ල දෙස බලා උන්නාය. දෙදෙනත් හමුවෙද්දී දෙන්නාගේම ඇස්

වල කඳුළු පිරුණි.

"අ..නේ... ම..ගේ අ..ප්ප..ච්චී..."

ඇය පොඩි දැරියක සේ අප්පච්චිගේ ළයට බර වූවාය.

"මා..ට හැ..කි ස..තු..ටු..යි මගේ පු..තේ..."

"හිතා..ග..න්..නා..වත් බෑ නේද ඔයාගේ දුප්පත් දුවට මෙහෙම..."

කියාගෙන ගිය දේ මගදී බිඳී ගියේය. මේ සතුට වාවාගන්නට තරම් විශාල හදවතක් කෙල්ලට නැත.

"අ..ම්මා අත් දෙක එකතු කරලා පූජා කරපු හැම මලක්ම පූජා කළේ ඔයා ගැන හිත හිතා... රෑට පන්සල් ගිහින් පිරිත් නූල් ගෙනත් නිදාගෙන ඉන්න ඔයාගේ අතේ බඳිනවා..."

අ..ම්මා... ඇය අද ජීවත්ව උන්නා නම්... එසේ නම් තමාටත් වඩා සතුටු වන්නේ ඇයය.

"ම..ගේ අම්මා කොහේ හරි ඉඳලා බලන් ඇති අප්පච්චි..."

"ම... ඒ ගෙදරට පය තියද්දී ඒ ගෙදර ඉන්න සතා සිව්පාවුන්ට හොඳක් වෙන්න කියලා හිතාගෙන අඩිය තියන්න... ඔයාව වරදින්නේ නෑ..."

වන්දනා කඳුළු පුරවාගත් මුහුණින් හිස වැනුවාය. ඊටත් පසු ඇය අප්පච්චිට වැන්දාය.

"බුදුණුවන් සරණයි..."

වන්දනා ඊට පසු ගියේ අම්මාගේ පින්තූරය ගාවටය. ඇය අම්මා වෙනුවෙන් හවස සූදානම් කළ පහන දල්වා ඇය ජීවමානව ඒ තැන ඉන්නවා කියා හිතාගෙන බිම දණ ඔබා ඇයට වැන්දාය.

සසංක මේ සියල්ල බලාගෙනය. ඔහු ඈත වාහනය නවතා ඇවිදගෙන ආවේය. කෙල්ල මේ තරම් බැතියෙන් පේ වෙන්නේ තමා සමඟ යන්නටය.

අප්පච්චී සසංක දෙස බලා බොඳ වූ දෙනෙත් පොඩි කළේ



"ලෙන්න" කියන්නාක් මෙන්ය. ඇය හැරී [illegible] මලු දෙස බලාගෙනම උන් ඇය පසින් අම්මා දෙස [illegible] "බලාගන්න" කියන්නාක් මෙන්ය.

"අප්පච්චී..."

"පුතේ..."

"අප්පච්චිත් එන්න..."

"මං පුතේ වෙන දවසක එන්නම්... අද [illegible] මගේ කෙල්ලව බලාගන්නූ දෙන්නෝ..."

සසංක දණ ඔබා අප්පච්චිට වැන්දේය.

"මො..න..වා කිය..න්..න..ද කියලා ම..ට [illegible] ම..ගේ පු..තේ..."

සසංක අප්පච්චිගේ උරහිස් පුරා [illegible] සලුවේ උරහිස පිරිමැද්දේය.

"අ..පි ගිහින් එන්නම් අප්පච්චි... වි..කක් රෑවෙයි... මං වන්දනාව ගෙනත් බස්සනවා..."

"හොඳයි..."

"අප්පච්චි කන්නෙපා... අපි නැම ගේන්නම්..."

ඔහු කෙතරම් හොඳ දරුවෙක්ද... මේ නම් දෙවියන්ගෙම වැඩක් විය යුතුය.

"පු..තේ..."

"අප්පච්චි..."

"ම..ගේ ද..රු..වව බලාගන්න එකට පින්..."

ඔහු අත් දෙක එකතු කරද්දී සසංක තොල් පට තද කරගෙන වන්දනා දෙස බැලුවේය. ඇය බොඳ වූ දෙනෙත් බිමට බර කළාය.

"මා..යි පි..න් දෙන්න ඕන අප්පච්චී... මේ කෙල්ලව හදලා මට

SIHINA

දුන්නට..."

ඔහු කීවේ එපමණකි. ඊටත් පසු සසංක චන්දනාගේ සුරතින් ඇඹිව අල්ලාගෙන වාහනය වෙත ගියේය.

ඔහු ටික දුරක් වාහනය පැදවූයේ කතා බහකින් තොරවය. මාවතේ නිදහස් හරියකදී ඔහු වාහනය නවතා ඇය දෙස බැලුවේය. මදපිය ඇට තරම් කඳුළු ඒ ඇස්වල විය.

"මෙ..හෙ..ම අ..ඬ..න්..නේ..."

ඔහු උගුරෙන් මෙන් ඇසුවේය. කඳුළු වැටිණි.

"දැ..න්..නෑ දෙයියෝ ඇයි කිය..ලා.. කී පාරක් ඇඬුනද..."

"මගේද ඉන්නේ..."

"මා..ට බ..ය..න් නෑ.. ඒත්..."

"ඇයි..."

"මං වෙ..නු..වෙ..න්..නේ මෙ..හෙ..ම..."

කෙල්ලට මේ කිසිවක් දරාගන්නට බැරි බව ඔහු දනී. අහිංසක දුප්පත් කොල්ලෙක් වූ අසංකට ආදරය කළ ඇයට වූයේ සසංකව බාර ගන්නටය.

"තාත්තා එයාගේ ලේලිට හරි ආදරේ වෙනවා.., මගේ නංගීත් එයාගේ නැනට මටත් වඩා ආදරේ වෙයි..."

"මා..ට ඒ.. වා..ස..නා..ව තිබ්බොත් මං මේ අ..ත් දෙ..කි..න්..."

ඔහු ඇගේ දෑතම අල්ලා ගත්තේ ඇය ඒ දෑත් පෙන්වද්දීය.

"අපේ ගෙදරට අඩුව තිබ්බේ මේ අත්දෙක තමා... මොනවත් කරන්න ඕන නෑ... මේ අත් දෙක ගෙදරම තියන්න විතරයි ඕන..."

මේ දුප්පත් අත් දෙකේ ඒ තරම් බලයක් ඇත්ද...

"මං.. මො..නා..ද අ..සං..ක..යිගේ ගිහින් කිය..න්..නේ.. ම..ම..."

"ඔබා මොනවත් කියන්න ඕන නෑ.. මේ මූණ හැම දෙයක්ම



කියයි..."

"ඒත්.. මේවා නො..හො..ම..."

"මගේ තාත්තා.. නංගී.. එයාලා මාව හොඳට දන්නවා.."

"අ..නේ මං.. මොන දෙයියටද මේකට පින් දෙන්නද..."

සසංක කිසිවක් නොකියා ඇගේ හිස මඳව පිරිමැද්දේය. ඇය ඒ වමත ගෙන උණුසුම් දෙතොලින් සිප ගත්තාය.

"අපි යන්ද..."

"ම්.. පන්සල ගාවින් චූට්ටකට නතර කරලා යං නේද..."

"ඇ..යි..."

"මං පඬුරක් අරන් ආවා.. වාහනේ ඉන්න.. මං දුවලා ගිහින් ඒක ගැට ගහලා එන්නම්..."

සසංක කිසිවක් කීවේ නැත. ඔහු බෙල්ලන්විල පන්සල අසළ වාහනය නතර කළේය.

"දුවලා එන්නම් හොඳේ..."

ඇය වාහනයේ තුළම පාවහන් ගලවා ඉක්මන් ගමනින් පන්සලේ බෝ මළුව වෙත දිව ගියාය.

"මං වෙනුවෙන් නෙමේ බුදු හාමුදුරුවනේ.. එයා වෙනුවෙන් දුක් විඳින්න මට එක අවස්ථාවක් දෙන්න.. මේ ජීවිතේම.. එයාටයි එයාගේ දරුවොයි මේ ඇස් දෙක වගේ බලාගන්න මට වරම් දෙන්න... මට මහ සැපක් එපා..."

ඇය බෝ අත්තක පඬුර ගැට ගැසුවේ එසේ සිතාගෙනය. පඬුර ගැට ගසා මළුවේ දණ ඔබා වැන්ද ඇය පන්සලේ දල්වා තිබූ පහන් එළිය මැදින් යළිත් වාහනයට ආවාය.

"ය..න්..."

චන්දනා කීවේ ඇඟිලි තුඩින් ගත් පන්සලේ පහනේ තෙල් ටික



SIHINA

ඔහුගේ හිසකේ අතර තවරමිනි. දෙවියන් බලා ගෙන හුන්නේ ඔහුවය.

නිවස ළං ළං වෙද්දී චන්ද්‍රා හුස්ම ගත්තේ පවා අමාරුවෙනි. රන්තරු නිවසේ විශාල ගේට්ටුව අසළ වාහනය නතර වෙද්දී ඇගේ සුරත වැලුණේ ඔහුගේ වමත මතය.

"මෝ..හ නී..ර..ණ..ය..න් ආ..ව..න් මං.. බා..ර..ග..න්..න..වා ර..න්..ත..ර..න්.."

ඇය සීවේ වෙව්ලන සුරතින් ඔහුගේ වමත පිරිමදිමිනි.

"මං කැන්දන් එන කෙල්ලට එහෙම මේ ගෙදරින් යන්න වෙන්නෑ..."

ඔහුගේ වචන හදවතට වැටෙන්නේ සමන් මල් විලසිනි. ඔහු වාහනයේ නලාව නාද කළේය. කෙල්ල හිතින් අම්මාව යැද්දය.

සේවකයෙක් පැමිණ විශාල ගේට්ටුව දෙපසට විවර කළේය. රන්තරු නිවස විදුලි පහන් විසි තිස් ගණනක් දල්වාගෙන බලා උන්නේ අලුත් මනමාලිය පිළිගන්නටය.

විශාල රන්තරු නිවස දකිද්දී ඇයට සිහිවූයේ තම දුප්පත් පැල්පතය. "අනේ ඒ දුප්පත් ගෙදර කෙල්ලව මේ ගෙදර ලේලි විදිහට පිළිගනීද..." හිත තවමත් චකිතයෙනි.

සසංක වාහනය නතර කළේ රන්තරු නිවසේ කොන්ක්‍රීට් ගල් අල්ලා තිබූ මිදුලේය. ඇයට බැලුණේ නිවසේ දොරකඩ දෙසය. නැත... එහි කිසිවෙක් නැත.



SIHINA

# 28

ඔහු වාහනය ක්‍රියා විරහිත කොට ඇය දෙස බැලුවේය. කඳුළු නවතන්නට නම් දෙවියන්ටවත් හැකි නොවනු ඇත. ඇය වාහනයෙන් බහින්නට පවා බිය විය. ඔහු ඇගේ පැත්තෙන් පැමිණ වාහනයේ දොර විවර කළේය.

"බහින්න... මේ ඔයාගේ ගෙදර..."

එය කෙසේ නම් පිළිගන්නද... දෙවියන් ඒ තරම් දේවල් කරනවාද...

මිදුලේ බලා උන්නේ රන්තරු නිවසේ සේවකයන් දෙදෙනෙකි. ඒ ගුණපාලත් විමලාත්ය. ඔවුන් දෙදෙනාගේම දෑස් තිබුණේ පුංචි

මහත්තයා රන්තරු නිවසට කැන්දාගෙන ආ මනමාලිය වෙතය.

"මේ ගුණපාල... මේ විමලා... ගුණපාලයි විමලයි දන්නවද මේ කවුද කියලා..."

චන්ද්‍රනා ඔවුන් හා සිනාසුණේ දෙනෙත් පිසදමමිනි.

"පුංචි ම..හ..ත්..ත..යා මේ..."

"මං අඳුන්නලා දෙන්නම්.. තව ටිකකින් හොඳේ..."

"හොඳමයි පුංචි මහත්තයා..."

රන්තරු නිවසේ විශාල දොරවල් දෙක දෙපසට විවර වී තිබුණි. ඔහු පෝටිකෝවේදීම කෙල්ලගේ අත් අල්ලා ගත්තේය. ඔහු ඇයව නිවසට එක්කාගෙන ගියේ ගෙදරට මලක් අරගෙන යන්නාක් මෙනි.

කඳුළු දිගටම වැටුණි. ඔහු ඒවා නවත්වන්නට ගියේද නැත. දොරකඩදී ඔහු නැවතුණේය. රුසිරු මන්දිරයක් ඇයට පෙනුණේ බොඳ වූ දෙනෙත් අතරිනි.

"මේ පය තියන්නේ ඔයාගේ මහත්තයගේ ගෙදරට නෙමේ... ඔයාගේ ගෙදරට තේරුණාද..."

ඇයට ඒ කිසිවක් ඇසෙන්නේ නැත. ඔහු ඇගේ අතින් අල්ලාගෙනම නිවසේ ප්‍රධාන උළුවස්ස පැන්නේය.

"බුදු සරණයි..." ඇය යටි හිතින් මිමිණුවාය. ඇය දෙනෙත් නොඋස්සාම උන්නාය.

"ඔහොම ටි..කක් ඉන්න... මේ ගෙදරට එහෙම කෙනෙක්ව නිකං ගන්න බෑ..."

ඒ හඬින් චන්ද්‍රනාගේ සර්වාංගයම ඇවිලීගෙන ගියේය. ඇය දෑස් එසෙව්වේ කඳුළු පිරි දෙනෙතිනි.

ඉදිරියේ උන්නේ සසංකාය. ඇගේ මුහුණ පුරා වූයේ අහිංසක පැහැබර සිනහවකි. අයියා මේ ගෙදරට කැන්දන් එන්නේ ඇය බව සසංකා දැන උන්නාය. සසංකා හීන මැව්වේද අයියා මේ ගෙදරට





මේ වාගේම අහිංසක කෙල්ලෙක් ගෙනෙතැයි දුටුවා. එහෙත් අයියා කැන්දන් එන කෙල්ල මේ තරම්ම අහිංසක කෙල්ලෙක් වෙතැයි සසංකා කිසි දිනයක සිතුවේ නැත.

"මි..ස්.. ම..ම..."

චන්ද්‍රනාගේ දෑසින් නොනවත්වා කඳුළු ගලාගෙන එද්දී ඇය මොනවදෝ කියන්නට උත්සාහ කළාය. එහෙත් සසංකා ඇයව නැවැත්තුවාය. ඊටත් පසු ඇය චන්ද්‍රනා අසලටම ආවාය.

"ම..ම මිස් නෙමේ රත්තරනේ... ඔයාගේ චූටි නංගී... තේරුණාද..."

සසංකා කීවේ ඇගේ දෑස් තෙත්ව පැදිය. ඔහු දෑත් දෙපසට විහිදුවා චන්ද්‍රනාව වැළඳගත්තාය.

"මම මගේ රත්තරන් නැනාව අපේ ගෙදරට ආදරෙන් පිළිගන්නවා..."

සසංකා කීවේ කෙල්ලගේ දෙකොපුලම සිපගෙනය. චන්ද්‍රනාට අදහාගන්නට පවා බැරි විය.

"ඔයාව දැක්ක දවසෙම මට මේක හිතිච්ච එකයි පුදුම... අද අපේ අම්මා හිටියනම් එයයි ඔයාව මෙහෙම පිළිගන්නේ..."

සසංකා චන්ද්‍රනාගේ දෑතින්ම අල්ලා කීවේ සාලයේ කොනක ගසා තිබූ සසංකගේත් සසංකාගේත් අම්මාගේ ඡායාරූපය පෙන්නාය.

"ය..න්න.. එයාට ගිහින් වඳින්න... එයා මේ කොහේ හරි ඉඳන් ඔයා එනවා බලාගෙන ඉන්නවා..."

චන්ද්‍රනා මියගිය අම්මාගේ ඡායාරූපයට වැන්දේ දණ ඔබාය. "මේ අම්මත් මගේ අම්මා වගේම අපි දිහා බලාගෙන ඇති නම්.. නැත්නම් මේ තරම් පුදුම දේවල් කොහොම වෙනවද..." චන්ද්‍රනා සිතුවාය.

"මං වැරදි නෑ නේද චූටි..."

SIHINA

සසංකා නංගියෙන් ඇසුවේ මෘදුවය.

"ඔයා මේ ලෝකෙ ඉන්න හොඳම කෙනා ගෙනාන්ද කියලා හිතෙනවා..."

"එයාව හම්බවෙච්ච වෙලේ මටත් හිතුණේ එහෙමයි..."

වන්දනා ඔවුන් අතරට ආවේ සඳුළු පිසිමිනි.

"මෙහේ ආවාම මටත් මේ වගේ ලස්සනට සාරි අන්දන්න උගන්නන්න හො..දේ..."

සසංකා කීවේ කෙල්ලගේ සාරිය අතගාමිනි.

"මා..ව මෙ..හෙ..ට..."

නැත. ඇයට කියන්නට වචන පිටතට එන්නේ නැත. ඒවා උගුරේ සිරවී තිබුණි.

"මං තාත්තව එක්කගෙන එන්නම්... එයා නම් එයාගේ ලේලි පොඩ්ඩට හොඳට දන්නවනේ..."

"ඒ නිසාමයි මටත් බය..." වන්දනා හිත ඇතුලෙන් සිතුවාය. දෛවය සැම මොහොතකම යහපතම දෙන්නේ නැත.

"අ..නේ ර..ත්..ත..ර..න් මෙච්චර හොඳ නංගි කෙනෙක්..."

"මං බබාට කිව්වේ මේ ගෙදර හැමෝම එහෙමයි කියලා..."

"ම..ට මෙ..ක හා..ස්..ක..ම..ක් ව..ගේ දෙ..යියෝ..."

"හාස්කමක් නම්... ඔයාගේ ආදරේ හාස්කම..."

"අ..නේ ම..ගේ නෙමේ..."

සසංකා මුදුන්කොටුව මහතාගේ කාමරයට එද්දී ඔහු උන්නේ කාමරයේ ඇඳ මත පොතක් බලමිනි. කෙල්ල ගොස් ඔහුගේ ගෙළ වටා දෑතම යැව්වාය.

"තා..ත්..තේ..."



"ඒ පාර මොකද වුවි..."

"යන්..."

"කොහෙද..."

"පහළට..."

"ඇ..යි..."

"ඔයා ආස නැද්ද ඔයාගේ ලේලිගේ මූණ පොඩ්ඩ බලන්න. ම්..."

මුදුන්කොටුව මහතා පුදුමයෙන් සසංකා දෙස බැලුවේය.

"ලොකු පුතා ආවද..."

"ම්.. තනියෙන් නෙමේ... එයාගේ පණත් අරගෙන..."

ඔහුගේ මුහුණ පුරා සටහන් වූයේ පුදුමාකාර සිනාවකි.

"චූටි කෙල්ල දැක්කද..."

"ම්.. දැක්කා කතා කළා... ඉඹිබා... ඉඹගෙන ඉඹගෙන ගියා..."

"එච්චරටම කෙල්ල හොඳයි..."

"තාත්තා හිතන්නකෝ මටත් වඩා හොඳ දුවෙක් ඔයාට ලැබිලා කියලා..."

"අනේ..."

"ඇත්තමයි... අම්මා නැතිවෙච්ච දවසේ ඉඳලා මේ ගෙදර මොකක්දෝ අඩුවක් තිබ්බා... අද ඒ අඩුව සම්පූර්ණ උනා වගේ..."

"එ..ච්..චර.. පුතේ..."

"ඔයාගේ ලොකු පුතා මේ ගෙදරට අරගෙන ඇවිල්ලා තියෙන්නේ කෙල්ලෙක් නම් නෙමේ... පහනක්... පහළට ගිහින් බලන්න.. මුළු

SIHINA

ගේම එළියයි.."

මුණ පොඩි දුව මේ තරම් වර්ණනා කරන කෙල්ලව දැක බලා ගන්නට මුදුන්කොටුව මහතාටත් ආවේ පුදුමාකාර ආශාවකි.

"කාන්තා ඉන්දියාවේ බාරයක් වුණා කිව්වා නේද අයියයි මාවු ගැන කියලා.."

"ඔව් පුතේ.."

"එහෙනම් ඒ බාරේ ඉක්මනටම ඔප්පු කරන්න ඉන්දියාවේ යන්න වෙයි.."

"අ..නේ පුතේ.. මට මේ කෙල්ල බලාගන්න දෙන්නකෝ.."

සසංකා තොල් පට තද කරගෙන බලා උන්නාය. අවුරුදු ගණනාවක් පුරා කාන්තා රන්තරු එකේ වැඩියෙන්ම ආදරය කළ සේවිකාව අද මේ ගෙදර ලේලිය වී ආ බව ඔහු දැනගත් විට කුමක් වේවිදැයි සසංකා සිතුවාය.

ඇය පිහිට පැතුවේ අම්මාගෙනි. "අනේ අම්මේ මේ කෙල්ලවනම් මේ ගෙදරින් යවන්නෙපා... අයියව මයා වගේම මේ කෙල්ල බලා ගනී.." සසංකා සිතුවාය.

ඉහළ මාලයේ බැල්කනියට මුදුන්කොටුව මහතා පැමිණෙන්නම චන්ද්‍රා දෙනෙත් එසෙව්වාය. සහල රෝස පැහැගත් සාරියකින් සැරසී උන් යුවතියව හඳුනා ගන්නට මුදුන්කොටුව මහතාට වැඩි වේලා ගියේ නැත. ඔහුට එකවර කිසිවක් සිතා ගන්නට නොහැකි විය.

මුදුන්කොටුව මහතා බලා සිටිද්දීම චන්ද්‍රා කඳුළු වැගිරෙන දෙනෙත් සහිතව උඩු මහලට දුවගෙන ආවාය.

සසංකාත් සසංකත් බලා උන්නේ කුමකින් කුමක් වේදැයි සිතාගත නොහැකිවය. අඩි තුන හතරක පරතරයක් තිබියදී කෙල්ල දෙනෙත් එසෙව්වාය. ඇයට ඉකිබිඳ හැඬුණි.



"අ..නේ.. ස..ර්.. ම..ම.."

නැත. කිසිවක් පිටවෙන්නේ නැත. පපුවේ මිරිකී තරහකට ඉකියක් එනවා පමණි.

එහෙමම ඇය මුදුන්කොටුව මහතාගේ පය පාමුල වැටුණි. කඳුළු බැලූයේ සසංක දෙසය. සසංක බලා උන්නේ මඳ සිනහවක් සහිතව. "මේ තමා මයාගේ ලේලි..." ඒ දෙනෙත් කිව්වේ එලෙස කතාවක්.

"ම..ට.. ස..මා..වෙ..න්..න ස..ර්.. මං.. ස..ර්..ට මී..ස..ට වැ..ර..දි..ක් ක..ළේ නෑ.. අ..සං..ක අ..යියා.. මේ මං.. දැ..නං උන්..නෑ ස..ර්... අ..නේ මං.. ව..ර..ද..ක් ති..කා..ගෙ..න මෙ..හෙ..ම..

මුදුන්කොටුව මහතාගේ දෑසා ඇගේ පෙන් විය.

මේ තමාගේ පය පාමුල හඬා වැටෙන කෙල්ල කොතරම් හොඳ කෙල්ලෙක්ද කියා ඔහු දැනගෙන උන්නේය. දිනපතා කිරි වෙන් කරන හැකි හංස හදවතක් ඇයට තිබුණි. ඒ හදවතින් ඔහු මේ දුප්පත් කෙල්ලව තෝරාම් ගෙන තිබුණේ අදට පැහැන පාලකට පෙරය.

"ස..ම..ව බ..ණි..න්..න මේ.. ගෙ..ද..රි..න් බැ..හැලා එ..ළ..ව..න්..න මා..ම ඒ.. ත..ර..ම වැ..ර..දක් ක..ළේ.."

කෙල්ල අඬමින් කියද්දී සසංකාට ඇඬුණි. ඇය ඇඟිලි තුඩු වලින් දෙනෙත් මිරිකා ගත්තේ දෙවියන් සිහි කරමිනි.

"නැ..ගි..ටි..න්..න පුතේ.."

මුදුන්කොටුව මහතා කීවේය. එහෙත් ඇය ඔහුගේ දෙපා අල්ලාගෙන උන්නා මිසක නැගිට්ටේ නැත.

"මං.. ව..ර..ද..ක් ක..ළා කියලවත් ම..ට කිය..න්..න ස..ර්.."

ඇය කීවේ එහෙමය. සසංක බිත්තියට බරවී බලා උන්නේ කාන්තා දෙසය. නැත. ඔහු මේ අහිංසක ජීවිතය මේ ගෙදරින් පිට

SIHINA

නොකරන බව සශංක දනී. සාන්තා අතින් එවන් පවක් වෙන්නේ නැත.

"පුතේ.. නැ..හිටින්න..."

ඔහු පහත් වී කෙල්ලගේ උරහිස වලින් අල්ලා නැගිට්ටෙව්වේය.

"ඔයාලා ඉන්න.. මට මේ කෙල්ලත් එක්ක කතා කරන්න ඕන.. එන්න පුතේ මගේ කාමරේට..."

මුදන්කොටුව මහතා එසේ කියා හැරුණේය.



SIHINA

# 29

ඔහු ඔහුගේ කාමරයට ගියේ තම මියගිය බිරිඳව සිහිපත් කරවමිනි. "මේ දේවල් නෝනා දන්නවා නේද... පේනවා නේද අපේ ලොකු පුතා මේ ගෙදරට එක්කන් ආපු කෙල්ලව... නෝනා හිතන්නෙ මං මොනවා කරයි කියලද..."

කාමරයට ආ ඔහු ඇඳ මතින් ඉඳගෙන බලා උන්නේය. විවාහයක් බැඳීමක් යනු දෙදෙනෙකුගේ ජීවිත දෙකක් අතර සිදුවන පින්බරම බැඳීමය. එවන් බැඳීමකට මේ වන් පින්බර කෙල්ලෙක් තරම් හොඳ කෙනෙක් තවත් නැත. පුතෙක් මහ ගෙදරට ලේලියක් කැන්දාගෙන එනවා යනු දොළොස් මහේ පහනක් අරගෙන ඒමක් නම් මේ ඉන්නේ එවන් පහනක් බව මුදුන්කොටුව මහතා දනී.

මනුට මේ කෙල්ල ගැන අලුතින් කියන්නට දෙයක් නැත. එහෙත් මනුට පුදුම අවුරුදු දහයක් ඕස්ට්‍රේලියාව වැනි රටක ජීවත් වූ අනන්ත යුවතියන් දැක තිබූ තම ලොකු පුතා ජීවිතයේ ඉතිරි ටික යන්නට මේ දුප්පත් කෙල්ලව තෝරාගත් එක ගැනය.

"පුතත් තාත්තා වගේම තමයි... වෙනසක් නෑ..." කවුදෝ කොණෙකදෝ සිට එසේ කීවේය. මුදුන්කොටුව මහතාට ඒ හඬ අඳුනාගන්නට අමාරු නැත. ඒ හඬ එන්නේ අදින් විසි තිස් වසරකටත් පෙර තමා ආදරය කළ ගැහැණියගෙනි. තම මියගිය බිරිඳගේ ආත්මයෙනි.

මුදුන්කොටුව මහතාගේ කාමරයට යන්නට පෙර චන්ද්‍රනාට බැලුනේ සසංකා දෙසය. සසංක දෙසය.

"යන්න කෙල්ලේ... ඔයාව මගේ අයියට ලැබිලා ඉවරයි... බයවෙන්නෙපා... යන්න..."

චන්ද්‍රනාට කිසිවක් කියාගන්නට හැකි වූයේ නැත. ඇය සසංක දෙස බැලුවාය. ඔහුගේ දෙනෙත් වල වූයේ ළතෙත් බවකි.

කාමරයට ඇතුල් වූ කෙල්ල දෙස මුදුන්කොටුව මහතා ගොනත් පුරා බලා උන්නේය. වෙනදා මේ කෙල්ල රන්තරු එකේ තම කාර්යාල කාමරයට එද්දී තම හදවතට කොතරම් සහනයක් පැනසීමක් සතුටක් දැනුණිද කියා මුදුන්කොටුව මහතාට මතකය.

අද තමා ජීවිතයත් දෙන කුරු තම දොරකඩ බලා උන්නේ ඒ කෙල්ලය. තමා මේ මොහොතේම මේ කෙල්ලට මේ ගෙදරින් යන්නට කිවහොත් ඇය මේ මොහොතේම මේ ගෙදරින් පිටව යන බව මුදුන්කොටුව මහතා දනී.

"ස..ර්..."

ඇය කතා කළේ උගුරින් මෙනි. ඔහු ඇඳ මත ඉඳගෙනම මොහොතක් බලා උන්නේය.

"එ..න්..න පුතේ..."

කාමරයට කැඳවා ඔහු කියන්නට යන්නේ කුමක්ද... චන්ද්‍රනාට



කිසිවක් සිතා ගන්නට බැරි විය. ඇය පසෙකින් තෙතෙත් ... දැමීණ ඇඳ පාමුළ කුඩා දරුවෙක් සේ ... උන්නාය.

"පු..තා..ගේ තාත්තා ආවේ නැද්ද..."

"අ..ප්..ප..ච්..චි එ..න්..න උ..න්..නේ ස..ර් ඒ..ත්.."

"කමක් නෑ..."

එහෙත් ඔහු යමක් නොකියන්නේ ඇයි... මේ මිරිකී ඇය පපුවට සහනයක් එන්නේ එවිටය.

"පුතා සසංක ගැන දන්නවද... කොහොමද..."

චන්ද්‍රනා වචනයක්වත් කතා නොකර ... ඇඬෙයැයි ඇයට සිතුණි.

"මගේ ලොකු පුතාට ඔයා කොච්චර ආදරේද... මං..."

අනේ එය කියන්නේ කෙසේද... වචන වලින් ආදරය ගැන කියන්නට ඇය ඉගෙන ගෙන නැත.

"මං.. ඒ..යා වෙ..නු..වෙ..න් ඒ..යාගේ ස..තුට වෙනුවෙන් මු..ළු ජීවිතේ ද..නා..න් ස..ර්..."

"මං දන්නවා... ඔයා කියන්න ඕන නෑ... පුතාලගේ අම්මා නැතිවෙලා දැන් ගොඩක් කල්..."

"ඔ..ව් ස..ර්..."

"අම්මා මේ ළමයි දෙන්නට හැදුවේ මල් දෙකක් වගේ.."

ඒ ජීවිත දෙකෙන් මේ තරම් සුවඳ එන්නෙත් ඒ නිසාය.

"එයාලගේ අම්මා නිතරම ඒ දෙන්නට ඉගැන්නුවේ මනුස්සකම විතරයි... කකා ඉද්දිදී කවුරු හරි ආවොත් කන බත් පත පවා දෙන්න කියලා..."

"ඔ..ව් ස..ර්..."

"මං ඇත්තටම කියන්නද පුතේ..."

SHINA

"හා ස..ර්..."

"ලොකු පුතා කොච්චර හොඳ වුණත්.. එයා මේ ගෙදරට මයාව එක්ක එයි කියලා මං හිතුවේ නෑ..."

කෙල්ලගේ කඳුළු යළිත් අලුත් විය. ඔහු මේ කියන්නේ තමා කැන්දාගෙන ඒමෙන් ඔහු වැරදි දෙයක් කර ඇති බවද...

"ව..ර..ද..ක්.. වු..ණා..නා..ම් වු..ණේ මං.. අ..කි..න් ස..ර්.., එ..යා නෑ..හ ව..ර..ද..ක් හි..ත..න්..නෙ..පා... ඕ..න නම් එ..යා වෙ..නු..වෙ..න් මං..."

"ඇ..යි පුතාට මොනාද කරන්න පුළුවන්.."

දෑසට ඇල්පෙනිති තුඩවල් දහදාහකින් අනින්නාක් මෙනි. දෙවියනි එහෙම කො..හොම කියන්..න..ද...

"ඒ..යා..ට හො..ඳ..ක් වෙනව නම් සර්... එයාගෙ..න්..."

කෙල්ල එක තැනකට පැමිණ කතාව නතර කරයි. ඒ සැබෑ ආදරයක හැටිය. විහිළුවටවත් එවන් ආදරයක් ළය තබාගෙන ඉන්නා කෙනෙකුගේ මුවින් අව කැපෙන වදනක් පිටවෙන්නේ නැත.

"පුතාට පුළුවන්ද සසංක නැතුව ඒමත් වෙන්න..."

ජීවිතය වූ කල ඔහු නැතිව ජීවිතයක් නොහෙනන්ද...

"ඒ..ක කො..හො..ම කියන්..නද ස..ර් එ..යා..."

"ම..ට තේ..රෙ..නවා..."

"ඒත් ස..ර් ම..ම..."

"මං පුතාට කිව්වද සසංකගෙන් අයින් වෙන්න කියලා...."

මේ උතුම් මිනිසා එහෙම නොකියන බව ඇයද දැන උන්නාය. එහෙත් දෛවය මේ තරම් දෙයක් තමාට දෙයිද... මේ දුප්පත් කෙල්ලට...

"මං කිව්වේ සසංක මේ ගෙදරට මයාව එක්කගෙන එයි කියලා





හිතුවේ නෑ කියලා නේද..."

"ඔ..ව් ස..ර්... එ..යා එන්කන් එ..න්..න ඕ..න නැ..ති ත..ම ම.. ව..ගේ දු..ප්..ප..ත් කෙ..ල්..ලෙ..ක් නෙ..මේ..."

මුදුන්කොටුව මහතා ඔහුට උරුම දයාබර සිනාසෙමින් සිනාසුණේය.

"මට අතන තියෙන වතුර එක ගන්න..."

මුදුන්කොටුව මහතා කීවේය. ඇය ඉක්මනින් නැගිට ගොස් දෝතින්ම වතුර වීදුරුව ඔහු අත තැබුවේය. පසුව බාගයක් බී එය ඇය අත තැබුවේය.

"පුතාටත් තිබහයි නේද..."

ඇත්තටම වතුර කළයක් බොන්නට තරම් පිපාසයක් ඇය තුළ වියළී ගොස් ඇත් පැය බාගයකටත් වැඩිය.

"බොන්න පුතේ..."

"කම..ක් නෑ ස..ර්..."

"බොන්න..."

ඇය වතුර එක බීගෙන ගියේ ආශාවෙනි. මේ ජීවිතයේ බිවූ රසවත්ම වතුර එක බිව්වේ අදයැයි ඇයට සිතුණි.

"මීට අවුරුද්දකට විතර කලින් එක දවසක උදේම ලොකු පුතා රට ඉඳලා මට කතා කළා..."

ඔහු කතාවක් කියන්නාක් මෙන් දෙයක් කියන්නටගත්තේය.

"එදා සසංකගේ අම්මගේ දානෙ දවස.. මායි චූටි දුවයි පන්සලට හීලක් දීලා ආවේ..."

"ම..ට එ..දා ම..ත..කයි ස..ර්.."

චන්දනා පෙගුණු දෑස් පොඩිකර කීවාය.

"මතකයි..."

SIHINA

"ම.. සර් උදේ දාගෙන් ඉඳී ආප්ප ගෙනත් කාලා ඉතුරු ටික මට තන්න උන්නා..."

මුදුන්කොටුව මහතාට පුදුමය.

"ම.. එදා තමයි සසංක කතා කළේ.. එදා මං එයාට කිව්වා මේවා මටයි නංගිටයි තනියම කරන්න බෑ ගෙදරට හොඳ කෙල්ලෙක්ව එක්කගෙන එන්න කියලා..."

ඇය සියල්ල අසාගෙන බිම බලාගෙන උන්නාය.

"ලොකු පුතා එදා කිව්වේ මට හොඳ කෙල්ලෙක්ව තාත්තා බලන්න කියලා.. පුතා එහෙම කිව්වේ විහිළුවටම නෙමේ... මේ බලන්න පුතේ..."

ඇය දිගටම බිම බලාගෙන ඉඳිද්දී මුදුන්කොටුව මහතා ඇගේ හිස එසෙව්වේය. ඒ ඇස්වල කඳුළුය.

"එදා පුතා ෆෝන් එක තිබ්බ ගමන් ඔයා කාමරේට ආවා... මට අඩු සීනි ඉඟුරු ප්ලේන්ටියක් අරගෙන..."

මතකය. හැම දේම මතකය.

"ම..ත..ක..යි ස..ර්..."

"ම.. එදා මං පුතා දිහා ගොඩක් වෙලා බලන් හිටියා... ලස්සනට සාරියක් ඇඳන් ආපු හුරුබුහුටි කෙල්ලෙක් එදා හිටියේ... අද වගේම..යි... පුතා දන්නවද... එදා මං ඔයා දිහා බලන් මොනාද හිතුවේ කියලා..."

"නෑ..නෑ ස..ර්..."

"මට එදයි හිතුනේ මගේ කොල්ලට මේ වගේ කෙල්ලෙක් නම් හොඳට ගැළපෙයි කියලා..."

මුළු හුස්මම නතර වූවාක් වැනි විය. දෙව්යනි එසේ සිතන්නට මේ දුප්පත් ආත්මය සතුව තිබෙන්නේ මොනවාද...

"මා..ට පු..දුම ඒකයි පුතේ... මං එයාට කොච්චර කිව්වත් කියන් බුරුපු කෙල්ලවම මෙකා මේ ගෙදරට එක්කගෙන ආපු එක..."

"අ..නේ ස..ර් එ..හෙ..ම ම..ම."

නැත. ඉන් එහාට වචනයක් හෝ කතා කළ නොහැක. තුළ ඒ තරමටම හිර වී ඇත. චන්ද්‍රා එහෙමම වචනේ දෙන වැළඳගෙන ඇඬුවාය.

"ඔයාව පුතේ මේ ගෙදරට ගෙනාවේ අපි නෙමේ... නෙමේ... එ..යාගේ අම්මා... එයත් ඔයා වගේම අහිංසක ගැහැණියක්."

මුදුන්කොටුව මහතා ඒ හිස පිරිමදිමින් කීවේය.

මේ ප්‍රාතිහාර්යය සිදුවූයේ කෙසේද...

"ස..ර් මා..ට දූ..න්..න මේ නැ..ම දේ..ක..ට..ම ම.. මං මගේ ජීවි..තෙ..න්..ම මේ ගෙ..දර..ට නැ..ට..වෙ..න්..න..ම ස..ර්.. මං මං ව..ගේ කෙ..ල්..ලෙ..ක්..ව මෙ..හෙ..ම පි..ළි..ග..න්න..ට ස..ර්..ට මූ..ද බ..ට අ..ත්..වෙ..න්න ඕන..."

මුදුන්කොටුව මහතා ඇයව නැගිට්ටුවා තම පපුවට මිරිකා ගත්තේය. අද සිට තමාට දරුවන් දෙදෙනෙක් නොව තිදෙනෙක් ඉන්නවා යැයි ඔහුට සිතුණි.

"මේ.. බ..ල..න්..න පු..තේ.."

"මං මෙ..හෙ..ම හි..තු..වේ නෑ ස..ර්.. ම..ට.."

"ඔයා ඔහොම අඬන්නෙපා පුතේ..."

"ම..ට ස..ර්..."

තවමත් ඇයට මේ සිදුවූ කිසිවක් අදහා ගත නොහැක. මේ වහළ යට ඉන්නා ජීවිත තුනම කොතරම් උතුම් ජීවිත තුනක්දැයි ඇය දැන උන්නාය.

"අපි යන්..."

SIHINA

මුදුන්කොටුව මහතා කෙල්ලව කාමරයෙන් එළියට එක්කාගෙන ආවේ ඇගේ කරට අතක් දමාගෙනය.

සසංකත් සසංකාත් ඒ දෙස බලා උන්නේ පුදුමයෙනි. තාත්තා මේ කෙල්ලට ආදරේ බව සසංක දැන උන්නේය. එහෙත් අද ඇය මේ ගෙදරට ආවේ රන්තරු ආයතනයේ සේවිකාවක් ලෙස නොවේ. මේ ගෙදර ලේලියක් වෙන්නට ඉන්නා යුවතියක් ලෙසිනි.

මුදුන්කොටුව මහතා පැමිණ සසංකත් සසංකාත් ඉදිරියේ නැවතුණේය.

"ලොකු පුතා..."

මුදුන්කොටුව මහතා කතා කළේ මඳ හඬිනි. සසංකාත් සසංකත් ඔහු දෙස බැලුවේ පුදුමයෙනි.

"තා..ත්..තේ..."

"මේ කෙල්ල..."

ඔහු එසේ කියා කතාව නවත්වා චන්දනා දෙස බැලුවේය. ඇගේ දෙනෙතින් ගලන කඳුළු සට සට ගා ටයිල් පොළව මතට වැටෙමින් තිබුණි.

"මේ කෙල්ලව මේ ගෙදරට එක්කාගෙන ආවට ඔයාට පින්..."

ඒ කතාවට චන්දනා දෝතම මුවට තබා ගත්තේ ඇඬෙන්නට ආ නිසාය. සසංක අහිංසක සිනාවක් සහිතව ඇය දෙස බලා උන්නේය.

"තාත්තේ මං..."

සසංක මොනවදෝ කියන්නට යද්දී මුදුන්කොටුව මහතා එය නැවැත්වූවේය.

"පොඩි දූ..."

"තාත්තේ..."

"අයියා ඔයාව එක්කන් ආව නැතා ඔයාට හොඳද..."





සසංකා සිනාසුණාය.

"අ..යියා ක..ව..දාවි මේ වගේ කෙනෙක්ව මේ ගෙදරට එක්කන් එනවා කියලා මං දැනං උන්නා තාත්තේ... එයා මගේ නෑනා නෙමේ... ම..ගේ අක්කා..."

මුදුන්කොටුව මහතාට සිහිවූයේ තම මියගිය බිරිඳවය.

"අපි එහෙනම් ඉක්මනටම එයාව එක්කගෙන එමු.. අපි කෙල්ලගේ අප්පච්චිටත් කතා කරලා දිනයක් දා ගමු.."

හීන මෙතරම් ඉක්මනට සැබෑ වේ යැයි කෙසේ සිතන්නද.. කොහොම සිතන්නද...

"එ..හෙම හොඳයි නේද පුතේ..."

මුදුන්කොටුව මහතා ඇසුවේ චන්දනාගෙනි. ඇය කඳුළු පිරි දෙනෙතින් ඔහු දෙස බැලුවාය. "අනේ රත්තරන් මං මේවා කොහොම දරාගන්නද..."

"අපට නැකැත් බලන්න අම්මලා නම් නෑ නේද පුතේ.. ඔයාගේ අම්මත් නෑ... අනේ අම්මත් නෑ... එ..හෙම එකේ..."

"ඕං අයියගෙයි අක්කගෙයි කේන්දර අරන් ගිහින් නැකැත් බලන්නම් තාත්තේ..."

එසේ කීවේ සසංකාය.

"තා..ත්..තේ.. ටි..කක් ඉඳගන්නවද..."

සසංක කීවේය. මුදුන්කොටුව මහතා ඔහු දෙස බැලුවේ පුදුමයෙනි.

"ඇයි පුතේ..."

"නංගීත් ඉඳගන්න..."

මුදුන්කොටුව මහතා වාඩිවූයේ චන්දනාව තමා අසළම වාඩි කරවාගෙනය.



SIHINA

"තා..ත්තේ නංගිගේ වැඩත් කියෙනවනේ.."

"දැන් හෝනටයි මහත්තයටයි නංගිගේ වැඩ බලලා කරන්න පුළුවන්නේ.."

ඔහු එසේ කීවේ චන්දනා දෙසද බලාය. චන්දනා සසංකා හා සිනාසුණේ දෙනෙත් පියදමමිනි.

"ඔ..ව් තාත්තේ.. ඒත් මං කැමතියි නංගිගේ වැඩත් මේ එක්කම.."

සසංකා දිගටම බිම බලාගෙන උන්නාය. අයියා කියන්නට යන්නේ කුමක්දැයි ඇය දැනගෙන උන්නාය. ඇයට පුදුම අයියා මෙව්වා සිතා බලා කිරීමය.

"ඔ..ව් පුතේ.. තෙරෙනවානම් කොච්චර හොඳද... ඒත්.. අ..යි කො..හෙ..න්ද නංගිට.."

සසංක මනමාල සිනාවක් සහිතව තම නංගී දෙස බලා උන්නේය. ඔහු කරන්නට යන්නේ කුමක්දැයි චන්දනා පවා දැන උන්නේ නැත.

"නංගී කියන්න.."

සසංක කීවේ විහිළුවටය.

"මං.. දැ..න්..නෑ..."

මුදුන්කොටුව මහතාට මෙය ප්‍රහේලිකාවක් විය.

"ඇයි පුතේ.."

"තාත්තේ.. මං අපේ බබාට කෙනෙක්ව යෝජනා කරන්න කැමතියි... එයත් කැමති නම් තාත්තත් කැමති නම් අපි මේ වෙඩින් දෙකම එකට ගමු.."

සසංකාගේ ඇස්වල කඳුළුය. චන්දනා සිය අසුනින් නැගිට ඇය කරා ගියාය. සසංකා චන්දනාගේ උරතලයේ හිස ගසාගෙන ඇඬුවාය. ඒ හේතුවක් නැතුවය.





"කා..වු..ද පුතේ.."

"එයත් තාත්තා දන්නා කෙනෙක්.."

සසංක එසේ කියා තම ජංගම දුරකථනයෙන් අංකයක් එබුවේය.

"උඹ කොහෙද..."

ඔහු ඇසුවේ එයයි. චන්දනාට යමක් නිකමට සිතුණි.

ඔහු ගොත ගසමින් කීවේය. මුදුන්කොටුව මහතා දිගටම කොල්ලා දෙස බලා උන්නේය.

"තා..ත්..තේ.."

සසංක කතා කළේය.

"ර..න්..තරු එකේ වැඩ බාර දුන්නා... ඇස් දෙක වගේ බලාගත්තා... තා..ත්..තට හිතෙනවානම් ජීවිතයක් දුන්නත් මුට බාර දෙන්න පුළුවන් කියලා.."

රුවන්ගේ උගුර කට වියළිණි. දෙවියනී මේ සිදුවන්නේ කුමක්ද..?

එත්වරම සසංකාට ඉකිබිඳුණි. ආදරයේ ප්‍රථම හී සර පහරින් තුවාල වූ ලොව සැම කෙල්ලකුගේම හදවත මෙන් මේ කෙල්ලගේ හදවතද ආදර බරින් බරව ඇත.

"අ...නේ.."

චන්දනා කෙල්ලගේ හිස අතගාමින් ඇයව පපුවට නමාගෙන උන්නේය. කෙල්ලගේ වතේ ලේ පුපුරා දැනෙන තරම් ළංව උන් ඇය ගැන හදවතේ කවර කලකවත් ඇති නොවූ තරම් සොයුරු පෙමක් ඇවිලිණි.

"චූටි දූ.."

මුදුන්කොටුව මහතා කතා කළේය. කෙල්ල හිස එසෙව්වේ අඩමිනි. රුවන් බන්ධනාගාර ගත වෙන්නට මත්තෙන් මෙන්න කියා ඉන්නා රුදවියක් මෙන් අත් පහළට දමාගෙන උන්නේය.

මෙදෙය තීන්දු දෙන මොහොතට සාවධානව ඉඳිය යුතු අය

SIHINA

දුර්ලභය.

"තා..ත්..තේ..."

සසංකා කතා කළේ අඩමිනි.

"ජීවත් වෙන්න පුළුවන් කියලා හිතෙනවද..."

කෙල්ල හිස වැනුවේ අඩමිනි. රුවන් ඇය දෙස බලා උන්නේ පපුව හරහා කටු කම්බි පොටවල් ඇදෙන්නාක් වැනි වේදනාවක් දැනෙද්දීය.

"රුවන්..."

"අන්කල්..."

"මේ ගෙදර අපි හතර දෙනෙක් හිටියා... අද ඉඳලා හතරයි..."

"ඔ..ව් අන්කල්..."

"පුතා අවුරුදු දහයේ ඉඳලා මේ ගෙදරට එනවා... කොට කලිසමක් ඇඳගෙන..."

ඔහු බිම බලාගෙන හිස වැනුවේය.

"සසංක රට ගියා... ඊට් ඔයා ආවා... මේ ගෙදර වැඩ බලලා කළා... නේ..ද..."

කොල්ලා කතා කළේ නැත.

"ඔයා මේ ගෙදර අයගෙන් වැඩියෙන්ම ආදරේ කාටද..."

මුදුන්කොටුව මහතා ඇසුවේය. කෙල්ලව පපුවට තබාගෙන චන්ද්‍රා අසරණව ඔහු දෙස බලා උන්නේය.

"කියන්න..."

ඔහු වටේම බැලුවේය. සසංක... මුදුන්කොටුව මහතා... චන්ද්‍රා... සසංකා... හැම කෙනෙක් වටාම දෙනෙත් ගියේය.

"මං... අන්කල්..."





"ඔව්... වැඩියෙන්ම ආදරේ කාටද..."

"මේ... ගෙ..ද..ර තා..ම... මං..ගේ ජී..වි..තේ..ට..ම මං.. වැ..ඩි..යෙ..න්..ම ආ..ද..රේ..."

"තෑංකිව..."

ඔහු මුදුන්කොටුව මහතාගේ දෑස් දෙස බලාගෙනම කීවේය. කෙල්ලගේ හැඬුම් වැඩිවිය. ඔහුට ජීවිතේ පුරාම ඉඩ ආදරය කියන්නට වූයේ හැම කෙනෙක්ම මැද්දේය.

මුදුන්කොටුව මහතා සැමහන වේලාවක් බලා උන්නේය. කිසිවෙක් කතා කළේ නැත. මුළු නිවසම නිශ්චලය.

"ලොකු පුතේ..."

"තා..ත්..තේ..."

සසංක තාත්තාගේ දෑස් දෙසම බලා උන්නේය.

"මේ..ව..ච..ර ආදරේ තා..ම අපි කො..ල්..ලා..ට තෑංකිව දෙමු..."

ඔහු මෙතෙක් වෙලා උන් මුහුණේ රුව වෙනස් කර සිනාසී කීවේය. ඒවර ඇඩුණේ චන්ද්‍රාය.

රුමන් සසංක පිටුපසින් ඔහුගේ කාමරයට ගියේය. මේ ඉන්නේ මිනිසෙකු නොව දෙවියෙකු බව රුවන් දනී. අදින් වසර දහයකට දොළහකට ඉස්සරත් ඔහු එහෙමමය. මාළු පාන් එකක් අතට ගත්වනම සසංක එය හරි මැදින් දෙකට කැඩුවේය. භාගයක් ඔහුටය. ඉතිරි භාගය තමාටය.

"මම රට ඉඳිද්දිත් කන්න බර්ගර් එකක් ගත්තාම පරණ පුරුද්දට දෙකට කැඩෙනවා බං..."

සසංක රට සිට කතා කළ දවසකදී ඔහු කීවේය. කටුනායකින් සසංක බැස්ස මොහොතේ ඔහු තමාව බදාගෙන සැහෙන වේලාවක් උන් අයුරු රුවන් සිහි කළේය.

ලේ සුවඳ හඳුනාන්නේ සහෝදරයන් පමණක් යැයි සමහරු සිතති.



SIHINA

එහෙත් මේ වැනි උතුම් මිතුරන් එක බඩවැල කඩාගෙන ආ සහෝදරයන්ට වඩා උතුම්ය.

"ස..සා..."

කාමරයට ගිය පසු රුවන් සසංකට දණ ගසා වඳින්නට ගියේය. කොහොමත් ඔහුට වැන්දට පව් නැත.

"උ..ඹ..ට පි..ස්..සු..ද මැ..චං..."

සසංක ඔහුව දැතින්ම එසවීමට තෙත් වූ දෑස් හංගා ගනිමිනි.

"මැ..ට මේ දැ..න්..න හැ..ම දේකටම මං සසා උඹට..."

නැත. කියන්නට හිතනා දෙයක් ඔහුට කියවෙන්නේ නැත. අන්තිමට රුවන් ඇඬුවේය. පොඩි දරුවෙකු මෙන් ඉකිබිඳිමින් ඇඬුවේය.

මේ යාළුවන් දෙදෙනා දෙස දොරකඩ ඉඳ බලා උන් චන්ද්‍රනාගේ දෑස් තෙත් ගියේ පුදුමාකාර ලෙසිනි.

"කෙල්ලව හොඳට බලාගනින්... අම්ම නැති කෙල්ල..."

සසංක කීවේ දෑස් හංගාගෙනය. ඔහු කොතරම් උතුම් සහෝදරයෙක්ද... තමාට අද සත්තකයටම හිමි වුනේ ඔහුව නොවේද...

"මේ ජීවිතේ උඹලා එක්කම ගෙවනවා සසා... නංගිව විතරක් නෙමේ උඹව චන්ද්‍රනා නංගිව අන්කල්ව... උඹේ පැටව් ටික... ඒ ඔක්කොම මං බලාගන්නව සසා..."

රුවන් ඔහුගේ උරතලය මත පුරත තබා එය අසල්වූයේ සහෝදර ප්‍රේමයෙනි.

"මං උඹ ගැන දන්නවා... උඹ වගේ කෙනෙක් මගේ නංගිට ලැබුනේ ඒකිට පිනක් තිබ්බ නිසා..."

ඔහු කීවේ නිහතමානී ලෙසිනි. චන්ද්‍රනාගේ ඇඬුම්බර සුසුම් හඬක් දොරකඩින් ඇසී මිතුරන් දෙදෙනාම බැලුවෝය.

"ඒ..න්..න බබා..."





චන්ද්‍රනා කාමරයට ආවේ කඳුළු පිසදමමිනි.

"මගේ මස්සිනා හොඳයි නේද බබා..."

සසංක ඇසුවේ රුවන්ව පෙන්නාය.

"ඔව්.. ම..ගේ..ම රුවන් අයියත් ගිය ආත්මෙක මහා පිනක් කරලා ඇති.. මේ.. වගේ..."

චන්ද්‍රනාට ඇඬුණි. සසංක පුරත ඇගේ ඉඟ වටා යවා ඇයව ඔහු සමීපයට ගත්තේය.

"කවුරුවත් නොකරපු පිනක් මං කළේ..."

සසංක කීවේ ඇය දෙස බලා ආදරයෙනි.

"මේ වගේ කෙල්ලෙක් වෙන කාටද ලැබෙන්නේ... ඔහේ වෙලාවට සසංක අසංක වෙලා හරි එදා රත්තරං එකට ගියේ..."

ඔහුගේ වදන් වලට කඳුලින් මිසක වදමින් කෙසේ පිළිතුරු දෙන්නද...

සසංකා කාමරයට එබුනේ ඒ මොහොතේය. අඩලාම ඒ දෙනෙත් රතුව ඇත.

"මැ..ට මැ..ගේ ම..හ..ත්..ත..යව ටිකකට දෙනවද..."

ඇය කීවේ අසරණව සිනාසෙමිනි. සියල්ලන්ම ඇය දෙස බලා උන්නේ ආදරයෙනි.

"චුට්ටකින් එන්න අක්කේ... අපි කෑම හදමු..."

චන්ද්‍රනා ආශාවෙන් හිස වැනුවාය. රුවන් ගිය පසු කාමරයේ තනි වූයේ ඔවුන් දෙදෙනා පමණි. ඇය එවර නම් හිතේ හැටියට ඔහුගේ බඩ වටා දෑත් යවා ඔහුව තදින් තුරුල් කර ගත්තාය.

"කි..ස්..තු..න් කෝ..ටියක් දෙ..යියෝ එ..කතු වෙලා ම..ගේ දෙ..යියව මටම දුන්නා..."

චන්ද්‍රනා එසේ කීවේ ගැහෙමිනි. ඇය අනෙරත් නොමැතිව ඔහුගේ පපුව සිප ගත්තාය.



SIHINA

"නි..නා..ග..න්..නා..වත් බෑ මේ සතුට..."

තවමත් හදවත ඇත්තේ දෙවියේ මේ පුදුමාකාර තීරණයෙන් මත්වෙලාය. හදවතට දැනෙනා මේ සතුට සදාකාලික සතුටක් වේවායි ඇය පැතුවාය.

"මට නි..යෙන සතුටට මං උඹව ඉඹිනවොත් උඹ මැරෙයි..."

සසංක කීවේ ඒ මුහුණ දෙස්සටම ගනිමිනි. තමාට ලැබුණේ මලක් යැයි ඔහුට සිතුණි. දැන් දිවියම පුවදය.

"හැමදාම උදේටයි හවසටයි ලොකු සර්ගේ කකුල් දෙක ඉඹලා වැන්දත් මට මදි..."

"ඇ..යි..."

"එයාගේ රත්තරන් පුතාව මට දුන්නට... හීනෙකින්වත් එහෙම හිතුවේ නෑ..."

ඇගේ දෑස් වලින් ගැලූ කඳුළින් ඔහුගේ කමිසය තෙත්වී තිබුණි. ඒ කඳුළු වල උණුසුම ඔහුගේ පපුවට දැනුණේ පුදුමාකාර ලෙසිනි.

"ම..ගේ ජීවිතේ අද හැ..ම පැත්තකින්ම සම්පූර්ණයි... මට හොඳ වයිෆ් කෙනෙක් ලැබුණා... හොඳ මස්සිනා කෙනෙක් ලැබුණා..."

"ම..ගේ ජීවිතේ නම් ර..ත්..ත..රන් ආ..ත්ම භාණකට සම්පූර්ණයි..."

එහෙම හිතන ගැණියෙක් සමඟ පටන් ගන්නා ජීවිතය චින් බර එකක්ම වනු ඇත.

"සම්පූර්ණ වෙන්න ත..ව එක දෙයක් අඩුයි..."

ඇය කීවේ ඔහුගේ මුහුණ දෙස නොබලා ඒ පපුවේ හිස හොවාගෙනය.

"මොකක්ද ඒ..."

"මේ ව..ගේම ර..ත්ත..රන් පුතෙක් අපිට ඕන නේද..."

"ම.. මට හදලා දෙනවද..."





"තාත්ති උදව් කරනවනම් හදලා දෙන්නම්..."

"දැන් වුණත් උදව් කරන්නම්..."

ඔහු බලාපොරොත්තු නොවූ මොහොතක ඇයව දෝතින් වඩා ගත්තේය. කෙල්ල ඔහුගේ ගෙළේ එල්ලුනේ සිනාසෙමිනි.

"අ..නේ..."

"මලක් වගේ..."

"ම..ම.."

"ම..."

සසංක ඇයව ඇත්තටම මලක් මෙන් පෙම්බරව යහන මත තැබුවේය. වන්දනා තුවා වූ දෙනෙතින් ඔහු පපුවට වීත තුරු බලා උන්නාය.

"ම..ට දු..න්..න මේ සැපට මො..නාද ර..ත්..ත..ර..න් ම..ෙ..න් ඕන..."

ඇය ඇසුවේ ඔහුගේ මුහුණ දෙනෙත් අද්දරම සිඹිද්දිය.

"ම..ට දුන්න සැප දන්නවනම් ඔහොම කියන්නෑ..."

"සතුටක් කියලා දෙයක් තියෙනවයි කියලා දන්නෙත් මිය හම්බවුණාට පස්සේ දෙයියෝ..."

"මාත් එහෙම තමා..."

ඇය යහනින් ඉස්සී තුන් හතර වතාවක් ඒ මුහුණ සිප ගත්තාය.

"කවද්ද බඳින්න ඕන..."

ඔහු අසද්දී ඇය සිනාසුණාය.

"එ..හෙම හිතනකොටත් පපුවට මොනාද වෙනවා..."

"ලස්සන මනමාලියක් වෙයි..."

"ම... ඇත්තටම වෙයි... ලස්සන මහත්තයෙක් ළඟ ඉන්නකොට

SHINA

මොනා මනමාලිද ලස්සන නොවෙන්නේ..."

"නැතුත් බලන්න ඕන නෑ... තියෙන හොඳම ළඟම නැකතට බඳිමු..."

"ම.. කියන ඕන වෙලාවක මං එන්නම්..."

"අප්පච්චිව දාලා එන්න එපා... අප්පච්චිවත් අපි ගාවට ගමු..."

"එයා අඬයි.. පව්..."

දෙවියන් මේ දුප්පත් ජීවිතයට මේ තරම් කාරුණික වුයේ කෙසේද... සමහර විට මැරිච්ච අම්මා ඈගේ දුප්පත් දුව වෙනුවෙන් දෙවියන්ට මේ දුක කියන්නට ඇත.

ඔහු පහත් වුයේ ඈගේ දෙතොල් පට කෙලින්ම වාගේය. ඈගේ කොඳුල් දෙතොල් පට අතර ඔහුගේ ලවන් සිරගත වුයේ පුදුමාකාර ආදරයෙනි.

බාධා කරන්නට කිසිවෙක් නොවූ ඒ නිමේෂයේදී ලෝකයේ උන් වාසනාවන්තම පෙම්වතුන් යුගලය ඔවුන් වන්නට ඇත.

මුදුන්කොටුව මහතා කෙල්ලගේ ගෙදරට ඉරිදා උදේ එනවා යැයි කීවේය. දුප්පත් වුවද කෙල්ලගේ දෙමව්පියන් කෙල්ලව මලක් සේ හදා වඩා ඇත. ඒ නිසා ඒ ගෙදරට ගොඩවී කෙල්ලව පිළිවෙලකට ඈගේ අප්පච්චිගෙන් ඉල්ලිය යුතුය. මුදුන්කොටුව මහතා සිතුවේ එලෙසිනි. තමන්ගේ බලපුළුවන්කාර කමට කෙල්ලගේ අප්පච්චිව ගෙදරට ගෙන්නා එය කීම අසාධාරණ වැඩකි. හරි පිළිවෙල නම් මනමාලිගේ ගෙදරට මනමාලයාගේ දෙමව්පියන් යෑමය.

මේ පවුල් දෙකේම අම්මලා නැත. එහෙත් දරුවන්ගේ වැඩ කරද්දී ඒ අඩුව දරුවන්ට නොදැනෙන ලෙස කළ යුතුය.

මුදුන්කොටුව මහතා ගෙදර එනවා යැයි කියූ විට කෙල්ලට රජකම ලැබුණා වගේය. ඈය ඒ වෙනුවෙන් ගෙදර කෑම මේසයක් ලෑස්ති කරන්නට දුක් වින්දේ මඟුල් ගෙයකට මහන්සි වෙනවා වගේය.

"මං පුතාලගේ අප්පච්චිව හම්බ වෙන්න ඉරිදට එනවා..."





ඒ කතාවට එදා කෙල්ලගේ ඇස්වල කඳුළු පිරුණි. මේ කෙල්ල කොතරම් හොඳට හැදී ඇද්දැයි මුදුන්කොටුව මහතා දන්නේ මේ මඟුල් කතා කරන්නටත් පෙර සිටය. හොඳ ගෑනු දරුවෙක් මල් වැලකට සමානය. කොහේ එතුවද සුවඳය.

"එහෙනම් සර් බත් මුට්ටක් කාලා යන්නත් එක්කම එන්නකෝ.."

මුදුන්කොටුව මහතා තම ලේලිය දෙස බලා සිනාසුණේ මහ හඬිනි.

"මේ බලහල්ලකෝ වැඩක්.. මගේ ලේලි මට කතා කරන්නේ සර් කියලා..."

ඇය බිම බලාගෙන සිනාසුණාය.

"බත් මුට්ටක් කාලා මදි කෙල්ලේ.. ඔයාගේ ගෙදරින් හොඳට කාලා එන්න ඕන..."

මේ දෙව්වරුන් තමාගේ ජීවිතයට කොහොම ලැබුණාදැයි ඇය සිතුවාය.

"මට ඕන කොස් කම්බලා පොල් සම්බෝල හදලා හොඳ කරෝල කෑල්ලක් තෙල් දාලා..."

ඔහු කන්නට ආස එහෙම බව ඇයද දැන උන්නාය.

"ම..දි..තේ සර්.."

"ම... එහෙනම් ඒකට හොඳ සිරි හොද්දක්.."

"ම... කටලට ටිකකුත් හදන්නම්... තව පොලොස් මාළුවක්.."

මුදුන්කොටුව මහතා කෙල්ලගේ මුහුණ දෙස බලාගෙනම උන්නේය. තම ලොකු පුතා මේ කෙල්ලව කොහොම තේරුම් ගත්තාදැයි ඔහුට පුදුමය. "මට වගේම ඌටත් මනුස්සකම තේරෙනවා..." පසුව ඔහු සිතුවේය.

# 30

අද මුහුන්කොටුව මගහා එන දවසය. සසංක කෙල්ලට කතා කළේ පාන්දරමය. ඒ වෙද්දී ඇය මාළු ඇඹුල් තියල බැදුම පමණි. ඉන් ආවේ හොඳ සුවඳකි.

"අද මනමාලයෙක් කෙල්ලව බලන්න එනවා කියලා ආරංචියි..."

සුදු සිනාසී කීවේය. ඇය තෙත සුරත ගවුමේ බඳෙන් පිසදමමින් දුරකථනය අල්ලා ගෙන සිනාසුණාය.

"අපේ මනමාලයා මාව බලලා තියෙන්නේ..."

"ආ.. එහෙනම් බලන්න දෙයක් තව නෑ..."

"කි..යෙ..න..වා... එව්වා දැන්මම පෙන්නන්නෑ..."



දෙදෙනාම සිනාසුණෝ එකම හඬිනි.

"මොනාද කරන්නේ..."

"මට අ..ද හරි වැඩ ර..ත්තර..න්..."

"ඉතින් දාගෙන උයපන්... මං කිව්වනේ දෙකක් හදලම ඇති කියලා..."

"එහෙම කොහොමද දෙයියෝ මගේ ගෙදරට මගේ දෙයියෝ එනකොට..."

"අපි හවසට කොහේ හරි යං..."

"ම්... ම..ම..ත් පාළුවෙන් හිටියේ..."

"ඉතින් කිව්වේ නැත්තේ..."

"න..ව වු..ඩි..ට අවසනේ..."

"ඊට පස්සේ..."

"මං ළඟ සමන් දෙයියෝ ඉන්නවනේ... මං දැය වීසි කරලම ඉඹ ඉඹ ඉන්නේ..."

එහෙම කියද්දී කෙල්ලගේ ඇස්වල කඳුළත් මතුවී ඇත.

"ම්.. ගොඩක් මහන්සි නොවී ඉවර කරන්න... අපි දහය එකොළහ වෙද්දී එනවා..."

"හා.. මං තියන්නම්... පරිස්සමින් එන්න..."

කෙල්ල යළි කුස්සියට ආවේ දැස් පොඩි කරමිනි. අප්පච්චි ඇය දෙස බැලුවේ ආදරයත් අනුකම්පාවත් මුසුවූ දෙනෙතිනි.

"ගේ අස් කළාට පස්සේ හරි පින් පාටයි නේද අප්පච්චි..."

"ගෙට වඩා ඔයා පින් පාටයි මැණික..."

"යන්න ඔයා ගිහින් නාගෙන අර මං තියපු අලුත් සරමයි කමිසෙයි ඇඳගන්න..."

SHINA

කෙල්ලට පෙන්නන්නට ඉන්නේ මේ දුප්පත් අප්පච්චි පමණි.

"ඒ මහත්තයා මේ ගෙදරට එනවයි කිව්වහමත් හරි පුදුමයි පුතේ.."

"මට වඩා පුදුම නැද්ද අප්පච්චි සර්ගේ පුතා මට දෙන එක.."

කෙල්ල ඔහු ගැන කතා කරන්නේ සමනල කන්දම පසුව උඩ තියාගෙනය.

"කෑම උයලා ඉවර නැද්ද පුතේ.."

"ඇඹුල් තියල හරි.. කරවල බැදුමත් හරි.. පොළොස් එකත් හරි.. අඹ මාළුවත් හරි.. කිරි හොද්ද හදලා කොස් ටික තම්බලා කට්ලට් ටික බදින්න තියෙනවා.. බත උණුවෙන් තියනවා.."

"ඔයාගේ කෑම කෑවට පස්සේ සර් අදම එක්ක යයිද දන්නෑ.."

චන්ද්‍රා අප්පච්චි දෙස මොහොතක් දුකෙන් බලා උන්නාය.

"අ..ප්පච්චි දුකෙන් නෙමේ නේද ඉන්නේ.."

"අ..නේ පුතේ.. මම.. මේ ලෝකෙ සතුටින්ම ඉන්න අප්පච්චි දැන් මම.."

"මං ඔයාව අලා යන්නෑ... අපිත් එක්කම යං.."

කෙල්ල කීවේ අප්පච්චිගේ උරහලයට බරවීය.

"ඔයා කොහේ හිටියත් මං ළඟ මැණික... ඒක හිතන්නෙපා.."

"මං මෙච්චර ඉක්මනට යන්න හිතුවේ නෑ.."

"ඒත් මං හිතුවා.. පහන් පත්තු කර කර දෙයියන්ගෙන් ඉල්ලුවා.."

"ඒක තමා මට දෙයියෙක්ම එව්වේ.."

ඇසින් අලුත් කඳුළක් ගලාගෙන යද්දී ඇය කීවාය. අප්පච්චි කෙල්ලගේ හිස ඉඹගෙන ඉඹගෙන ගියේ ඔහුගේ දෙනෙත්ද තෙත්ව යද්දීය.



චන්ද්‍රාගේ ගෙදරට යන ගමනට මුදුන්කොටුව මහතා සමඟ සසංකත් සසංකාත් රුවනුත් එක්විය. තම ලේලිය ගෙදරට යන මේ ගමන ගැන මුදුන්කොටුව මහතා ඉන්නේ පුදුම ආවේගයකිනි. ඔහු ගෙදරින් එළියට බැස්සේ පවා රාහු කාලය පැන්නීමෙන් පසුවය.

ඔහු යන්නට පෙර තම බිරිඳගේ ඡායාරූපයට අලුත් සුදු මල් මාලයක්ද දැම්මේය. අද ඉන්නට තිබුණේ ඇයය. මුදුන්කොටුව මහතා තම බිරිඳගේ ගතිගුණ ගැන හොඳින් දැන උන්නේය.

සසංකා උදෙන්ම නිවසේ වැඩට ඉන්න කෙනා සමඟ එකතු වී කිරිබත් හැදුවාය. ඇත්තටම අද සුබ දවසකි. කාරණා දෙකක් නිසා සසංකා සතුටින් උන්නාය. එකක් මේ ගෙදරට ඇය වැනි කෙල්ලෙක් ලේලි වී ඒමය. අයියා කොහොම නැතත් කෙනෙක් කැන්දගෙන ඒ ඇයි සසංකා උන්නේ ඇත්තටම බියෙනි. ලෝකයේ ඉන්නා බොහෝ කෙල්ලන් සමඟ ජීවිතය බෙදා ගන්නට ඒවත් විය නොහැක.

මේ ගෙදරට ආ යුත්තේ මේ දේපොළ වලටත් රත්තරං එකටත් නොව මේ ගෙදර ඉන්නා අයට පණ මෙන් ආදරය කරන කෙල්ලෙකි. ඇය මේ ගෙදර එකෙනෙකුට පණ වුවත් දෙන්නට හැකි කෙල්ලෙකි. සසංකා චන්ද්‍රාව දුටු මොහොතේම ඇයට කෙල්ල ගැන පුදුම ආදරයක් ඇති විය.

"මේ මොනාද බබා.."

නංගී පාර්සල් දෙකක් වාහනයට දමද්දී සසංක ඇසුවේය. බර් පැහැ ගත් ඉන්දියන් සල්වාර් එකක් ඇඳ උන් සසංකා සිනාසුණාය.

"එහෙම අත වන වනා වගේ නැතුව බලන්න යන්න පුළුවන්ද.. මං ඊයේ ගිහින් එයාට තෑග්ගක් ගත්තා.. මේ ඒවා.."

සසංක සිනාසුණේ සැනසීමෙනි. ආදරයක් දැනිය යුත්තේ එක්කෙනෙකුට නොවේ. මනමාලියක් ගෙදරට කැන්දගෙන එද්දී ඒ ගෙදර බිත්ති වලට පවා ඒ රස්නය දැනිය යුතුය.



SIHINA

"මං ඔයාලා කවුරුවත් කෙල්ලට නුදුන්න තෑග්ගක් දෙනවා..."

මුදුන්කොටුව මහතා ඉදිරිපස අසුනේ සිට කීවේ සිනාසෙමිනි. සසංක තම පියා දෙස බැලුවේ පුදුමයෙනි.

"ඒ මොකක්ද තාත්තේ.."

සසංකා ඇසුවේ ආසාවෙනි. මේ ගෙදරට එන ලේලිට දෙයක් දෙනවාට මේ නැනාගේ කිසිම ඊර්ෂ්‍යාවක් නැත.

"ලබන සතියේ මං හතර දෙනාම ඉන්දියාවේ යවන්නයි ඉන්නේ..."

"මේ.. අ.පි හ..ත..ර දෙ..නා..ම..."

සසංකා පුදුමයෙන් ඇසුවේ පසෙක උන් රුවන්ගේ සුරතද අල්ලාගෙනය.

"ම්..."

"අ..නේ.. ෂෝක් නේද..."

රුවන්ගේ දෑස් තෙත් වී තිබුණි. තමාට ලැබුනේ කොතරම් හොඳ පවුලක්ද... මේ පළදෙන්නේ මේ ආත්මයේ කළ පින් නම් නොවේ.

"ඇ...යි ම්..."

සසංකා පිටුපස අසුනේ ඇය සමඟ උන් රුවන්ගේ අත මෘදුව අල්ලාගෙන ඇසුවාය.

"නෑ.. මු..කු..ත් නෑ.. නංගී..."

සසංකා රුවන් දෙස බලා උන්නේ ආදරය වැක්කෙරෙන දෙනෙත් වලිනි. මේ ගෙදරට එන කෙල්ල මෙන්ම බෑනා වී එන කොල්ලාද එක වාගේ අහිංසක යැයි සසංකාට සිතුණි.

"ලොකු පුතා කෙල්ලට පාස්පෝට් තියෙනවද..."

"නැතුව ඇති තාත්තේ.."



"පුතා ඔයාට තියෙනවද..."

මුදුන්කොටුව මහතා පසුපස හැරී රුවන් දෙස බලා ඇසුවේය. ඔහුගේ ඇස්වල වූ තෙත දැක මුදුන්කොටුව මහතාගේ පපුව ඇඹිලී ගියේය.

"මේ සැප සම්පත් මං දුක් විඳලා හැදුවේ මගේ කොල්ලටයි කෙල්ලටයි විතරක් සතුටින් ඉන්න නෙමෙයි පුතා.. ඒ කෙල්ලටයි කොල්ලටයි කවදහරි ආදරේ කරන උන් දෙන්නටත් එක්කයි.."

"සැප සම්පත් නෙමේ අ..න්..කල් මේ දු..න්න නැතම විතරක් ඇ..ති.."

රුවන්ගේ දෑසින් කඳුළු වැටුණි. සසංක [illegible] වනාවක් සතුටු විය.

"ඔයා මට නෙමේ ස්තූති කරන්න ඕන ඔයාගේ යාළුවට.. හොඳ මිනිස්සු අඳුන ගන්න ලොකු පුතාට ලොකු ඉවක් තියෙනවා.. ඒ ඉව එයාට ආවේ මගෙන් නෙමේ... එයාගේ අම්මගෙන්.. එයා හරි පුදුම කෙනෙක්..."

මුදුන්කොටුව මහතා සෑහෙන වේලා තම බිරිඳ ගැන කල්පනා කළේය.

"ඔයාලගේ වෙඩින් එකට කලින් අපි අම්මට පින් දීලා ලොකු දානයක් දෙමු... එයා අපේ ගෙදරම ආයෙ ඉපදෙන්න ඕන.."

සසංක මුදුන්කොටුව මහතා දෙස බලා උන්නේ අම්මාව සිහි වීමෙන් උපන් දුක ටිකක් හෝ නිවා ගන්නටය.

දාස්පෙතියා මල් සිටවූ ගුරු පාර අතරින් වාහනය ගොස් කෙල්ලගේ නිවසේ මිදුලේ වාහනය නතර විය. පුංචි උනත් පහන් පැලක් වැනි ගෙයකැයි ඔහුට සිතුණි.

"සිරියාවත්ත ගේ පොඩ්ඩ..."

ඔහු වාහනය තුළ ඉඳගෙනම කීවේය.

"මේ..මෙහෙට ආපු පළවෙනි දවසේ මටත් එහෙම හිතුණා තාත්තේ.. මං නෑන්දියේ බස් එකෙන් බැහැලා පයින් ආවේ..."

තම දරුවන් ආදරය වෙනුවෙන් කැපවීම කරන්නට දුන්නා දරුවන්ය. මුදුන්කොටුව මහතාට හිමු සැනසීම එනය.

ඇය පිරිස දැක මිදුලටම දුවගෙන ආවාය. කෙල්ල ඇඳ උන්නේ වාමි සායකුත් බ්ලවුස් එකකුත්ය. ඇය දුවගෙන විත් වැළි ඇතිරූ මිදුලේ දණ ඔබා මුදුන්කොටුව මහතාට වැන්දාය. ඔහු ඇයව දෑතින් ඔසවා ඉඹගත්තේ ආදරයෙනි. සසංක සියල්ල දෙස දෑත් බැඳගෙන බලා උන්නේය.

"මනමාලි එළියට දුවගෙන ආවනේ.. අපි හිතුවා මුලත් හෙප්පුව අරන් එයි කියලා..."

"අපිට කලින් මනමාලයා මනමාලි බලන්න මෙහේ ඇවිත්නේ.."

සසංකා කීවේ ඇගේ අත් අල්ලාගෙනමය.

"ය..න් ස..ර්.. අ..ප්..ප..ච්චි..."

මුදුන්කොටුව මහතා කෙල්ලගේ අප්පච්චිව දොරකඩින් දැක්කේය. කෙල්ල වගේම අහිංසක තාත්තා කෙනෙක්...

"අප්පච්චී මේ මගේ සර්.."

"සර් නෙමේනේ පුතේ.. තාත්තා.."

කෙල්ලගේ මුහුණ බිමට බර වූයේ සිනාවක්ද සමගිනි.

"මේ මගේ අප්පච්චී..."

"අනේ මෙහෙම දැක්කත් ඇති ලොකු මහත්තයෝ..."

අප්පච්චී දැන් එක්කොට මුදුන්කොටුව මහතාට ආචාර කරමින් කීවේය.

"එහෙම බැහැනේ බන්දන්න අප්පච්චියේ... අපි අපේ කෙල්ල වෙනුවෙන් කෙල්ලගේ ගෙදර නැවතිලා හරි ඉන්නවා..."

අප්පච්චිගේ පමණක් නොව ඇගේ පපුවද උණු විය.





"ෂා.. මේ පොඩ්ඩ හරි ලස්සනයි නේ පුතේ.. දවසක අපිත් මායි අප්පච්චියි මෙහේ ට්‍රිප් එකක් යන්න ඕන.."

"අප්පච්චී මේ සසංකගේ නංගී... මේ.."

"නංගිගේ පණ..."

රුවන්ව හඳුන්වා දෙන්නට යදී සසංක කීවේය. ඇය ඉන් කියන්නට මෙන් ඔහු දෙස බලා සිනාසුණාය.

"සර් එනවා කියලා පාන්දර කුනේ ඉඳලා ඇහැරිලා.."

අප්පච්චී කීවේය.

"මං ඊයෙත් මගේ දුවට මෙච්චර ආදරේ.."

අප්පච්චී ඔහු අසලින් ඉඳ ගොගෙන බිරටෙනම උන්නේය.

"ඉතින් අප්පච්චී මෙතන බාධි වෙන්නකෝ.. මේවා කතා කරන්න අපේ පවුල් දෙකේම අම්මලා නැහේ.. අපි දෙන්නා තමා කතා කරන්න ඕන..."

අප්පච්චිගේ ඇස්වල කඳුළුය.

"එ..යා..ට ලො..කු ම..හ..ත්..ත..යලා ව..ගේ දෙවි..වරු හ..මුවෙන්න ඇ..ත්..තේ ක..ර..පු පින් වලට තමා.."

අප්පච්චී කීවේ කඳුළු වැගිරෙද්දීය. මුදුන්කොටුව මහතා නැමිට ඔහුගේ උරහිසට සුරත තැබුවේය.

"ම..ට මේ කෙ..ල්..ලව කොච්චර වටිනවද කියලා අ..යියා දන්නේ නෑ..."

ඔහු පුදුම ආදරයකින් කීවේය. චන්දනා සසංකගේ ළඟටම වී හිඳ බිම බලා ගත්තාය. ඒ දෑස් කඳුළින් පෙඟී ගිය නිසාය.

"මේ කෙල්ල රන්තරු එකට ආපු දවසේ ඉඳලා මට මොකද්ද දැනුණා... සංසාර පුරුදු කියන ඒවා ඇත්ත කියලා මට හිතුනේ ලොකු පුතා දුවව අපේ ගෙදරට එක්කගෙන ආපු දවසේ.."



SIHINA

මුදුන්කොටුව මහතා කියන වචනයක් වචනයක් පාසා චන්ද්‍රනාගේ දෑස් තෙත් විය. ඇය තමා ළඟ උන් සසංකා දෙස බලා උන්නේ ඒ තෙත් වූ දෑසෙනි. මේ ආදරය නිකම්ම ආදරයක් නොවේ මහා ප්‍රාතිහාර්යයකි.

"මට මහ වුණේ මගේ කෙල්ලව විතරක් බලාගන්න කෙල්ලෙක් නෙමේ... මගේ දුවටයි මාවයි බලාගන්න කෙල්ලෙක්..."

මුදුන්කොටුව මහතා එසේ කියද්දී සසංකාද තෙත් වූ දෑසින් චන්ද්‍රනා දෙස බැලුවාය. නැනලා දෙන්නාම අද අඬන්නේ දුකට නොවේ. සතුටටය.

"එයා ලොකු මහත්තයව ඇස් දෙක වගේ බලාගනියි... කියෙන ආදරේ මං නේ දන්නේ..."

කෙල්ලගේ අප්පච්චී කීවේ ලෙන්ගතු හඬිනි.

"අපි හය දෙනාටයි මේ ගොල්ලෝ හදන දරුවන්ටයි දැන් ඉඳන් සැනසිල්ලේ ජීවත් වෙන්න පුළුවන්... එයාලත් වාසනාවන්තයි අපිත් වාසනාවන්තයි..."

සසංකට තම පියා ගැන පුදුමාකාර භක්තියක් ඇති විය. මුදල් කෝටි ගණන් අතගෑ ඔහු අද සතා කරන්නේ දෙවියෙකු මෙනි. එහෙම කාක්කලා මෙන්ම එවැනි මිනිසුන්ද නැත.

"අපි හිතුවේ දූලගේ අප්පච්චී මේ අම්මලා දෙන්නවම සිහි කරලා මෙයාලගේ වෙඩින් එකට කලින් ලොකු දානයක් දෙන්න..."

අප්පච්චී බලා උන්නේ භක්තියෙනි. අද මේ පැලට ආවේ දෙවියෙක් බව ඔහු දනී.

"පුතෙයි මගෙයි හිතේ ලොකු ආසාවක් තිබ්බා ලොකු මහත්තයා එහෙම දෙන්න..."

"අද දුවගේ අම්මා හිටියනම් මගේ පුතාට පුතෙක්ට වගේ සලකනවා වගේම තමා අපේ නෝනා හිටියනම් දුවටයි මේ පුතාටයි





මේ ළඟට ගන්නෙත්..."

මුදුන්කොටුව මහතා කීවේ රුවන් දෙසත් චන්ද්‍රනා දෙසත් බලාය.

"ම්..ට එයාව ඊයේ හීනෙන් පෙනුණා..."

අප්පච්චී කීවේ සියල්ලන් දෙස බලාය.

"මං.. සැ.ර්.. තේ.. මෙ..තන..ට ගේන්නද..."

"හා පුතේ..."

කෙල්ල ගියේ සසංකාවද අතකින් අල්ලාගෙනය. ඇය කුස්සියට සසංකාව එක්කාගෙන ගිය සැටියේ දෙකම්මුලම ඉඹියාය.

"අ..ද හරි ලස්සනයි... මී.. රාණි මුඛර්ජි වගේ... දැක්ක වෙලාවේ ඉඳලා ඉඹින්නමයි හිතුණේ..."

චන්ද්‍රනා කීවේ කෙල්ලගේ මුහුණ අතගාමිනි.

"මේ සල්වාර් එක ලස්සනද..."

"ම්... හ..රිම ලස්සනයි..."

"එහෙනම් ඇති... මං ඔයාටත් මේ පාටම එකක් ගන්නා... අන්න හොඳාත් ඇති..."

චන්ද්‍රනා තෙත් වූ දෑසින් තම නැනා දෙස බලා උන්නාය.

"ඔයා ගිය ආත්මේ ම..ගේ නං..ගිම වෙලා ඉන්න ඇ..ති..."

"ඇයි මේ ආත්මේ..."

සසංකා ඇසුවාය.

"මේ ආත්මේ මං ඔයාට ඒ ආත්මෙටත් වඩා ආදරෙයි... හිතාගන්න බෑ..."

"අපි අතර පුංචි හරි දුක් වෙන්නෙපා කියලයි මං පතන්නේ..."

නැනලා දෙන්නා යළිත් එකවර බදාගත්තෝය.

"ඉ..තින්..."



SIHINA

"මේ තමයි මගේ පුංචි කුස්සිය..."

"හෝස්.. මං මෙහෙම ඉඳගන්නද..."

"ම්.. සුරංගනාවියක් මගේ කුස්සියේ වාඩිවෙලා ඉන්නවා වගේ..."

කෙල්ලගේ වචන වලින් සසංකාගේ ළය පිරී යයි.

"දවසක මං එනවා මයත් එන්න මෙහේ දවසක් දෙකක් ඉඳලා යන්න..."

"අ..නේ..."

"ඇයි.."

"මං එහෙනම් පුංචි දේවතාවියකට වගේ මයාට සලකන්නේ..."

චන්දනා ඇය හැදූ කට්ලට් දිසියත් සැන්ඩ්විච්වස් දිසියත් වෙන වෙනම ට්‍රේ එකේ තැබුවාය. ඊටත් පසු කෙසෙල් ගෙඩින් තැබුවාය.

ඇය මුලින්ම ඇල්ලුවේ කෙල්ලටය.

"කට්ලට් නම් මාර සුවඳයි කෙල්ලේ..."

"කාලා බලන්න..."

සසංකා කට්ලට් එකක් කෑවාය. ඇත්තටම කෙල්ලගේ කෑම රසය.

"හ..රි..ම රසයි... ඉස්සර අපේ අම්මා හදන කට්ලට් වගේ... මින්න මං කියන්නෑ බලපං තාත්තා කාපු ගමන් කියයි..."

"යන්..."

ඇය ගොස් මුලින්ම ඇල්ලුවේ මුදුන්කොටුව මහතාටය.

"පුතත් මේ අප්පච්චි කියන්නේ මයා බැන්දට පස්සේ අප්පච්චිට අපේ අහ එන්න බෑ කියලා..."

මුදුන්කොටුව මහතා කීවේය. චන්දනා අප්පච්චි දෙස බලා සිනාසුණාය.





"අප්පච්චි මය කිව්වට මං තාත්තව එයාට දෙන්න බෑ..."

කෙල්ලගේ කතාවට මුදුන්කොටුව මහතා සිනාසුණේ ඇගු දෙස බලමිනි. චන්දනා සසංකටත් රුවන්ටත් කට්ලට් ඇල්ලුවේ කොල් පට මූව තුළට දමාගෙනය.

"අද මාව ගණන් ගන්නෙවත් නෑ මං.. බලන්නෙවත් නෑ මං දිහා..."

සසංක රුවන්ට කීවේ කෙල්ල දෙස බලමිනි.

"මූව මෙහෙම බලන් ඉඳලා බෑනේ තාංචි නේද..."

රුවන් කීවේය.

"මං ඉන්නේ ගෙට විතර නිවාඩු දාලා බලාගෙනයි ඉන්න..."

"බලං ඉන්නකොට වෙන වෙන ඒවා හිතෙනවා ඇති..."

කෙල්ල "හජ්" කියන්නට මෙන් කට ඇද කළාය.

"පුතේ කට්ලට් එක හරි රසයිනේ... ඉස්සර අම්මා හදන කට්ලට්වුත් මේ වගේ නේද චූටි දුව..."

චන්දනාට පුළුම සිතුණි. ඇය සසංකා දෙස බැලුවේත් සසංකා චන්දනා දෙස බැලුවේත් එක විටය. සසංකා හිස වැනුවේ "මං කිව්වේ නැද්ද" කියා කියන්නාක් මෙන්ය.

"තාත්තේ..."

සසංකා කතා කළාය.

"චූටි පුතේ..."

"දැන් අපේ අයියා අක්කව බැඳලා ගෙදර එක්කං ආවාම අක්කව කුස්සියට දාන්නම වෙනවා..."

"ඒකනම් ඇත්ත..."

"ඉතින් එහෙම අක්කට කියලා කෑම හදවා ගන්නකොට අක්කා හිතයිද දන්නෑ එයාව අපේ ගෙදර කුස්සි අම්මා කරලා කියලා..."

කෙල්ලගේ මුහුණ ආදරයෙන් බර විය. ඒ රත්නරත් ගෙදර කවුරු වුණත් මොකද... ඇයට හිතුණේ එහෙමය.

"කුස්සි කෑල්ල කපලා දුම්මම හරි.. එයා අපි තුන් හතර දෙනාව අපේ අම්මා වගේම බලා ගනී.."

සසංක කීවේ එකවරමය. වන්දනාට ඇඬුණි. සියල්ලන් ඉදිරියේ ඇය ඇඬුවාය.

ඇයව වැළඳගත්තේ සසංකාය. ඇයව අල්ලාගෙන සංසක බැලුවේ තම සොහොයුරා දෙසය. "ඇත්තටම මේ අම්මා තමයි.. අම්මගේ ආත්මේ අපේ ගෙදරට එන්නේ.." සසංකා තම සොයුරාට කීවේ දැසිනි.

"එයා එන්න තිබ්බේ පුතාලගේ අම්මා ඉන්න කාලේ... එහෙනම් අපි තෙමේ මෙහෙම බලන්න එන්නේ.."

මුදුන්කොටුව මහතා කීවේ ආදරයෙනි.

"දැන් අයියේ මේ කසාද දෙකම අපි එකටනේ ගන්නේ... ආලේ වෙඩින් එක වෙනමයි හෝම් කමිං එක වෙනමයි ගන්න ඕනා නෑ.. ඔක්කොටම අපි එකත් ගමු.. එහෙම නේද පුතා..."

මුදුන්කොටුව මහතා ඇසුවේ රුවන් දෙසද බලාය. ඔහු හිස වැනුවේ අහිංසක ලෙසිනි.

"හතරදෙනාම එකට ඉන්න නිසා මං කියන්නේ... අයියාගේ මෙයාගේ කියලා බෙදීමක් නෑ... හතර දෙනාම එකට ජීවත් වෙන්න ඕන... ලොකු පුතා නංගිව බලාගන්න විදිහටම රුවන් වන්දනාව බලා ගන්නත් ඕන... එක්කෙනෙක් බඩගින්නේ ඉද්දිදී අනිත් තුන්දෙනාම කන්න බෑ... කන්න ඕනෙත් නෑ..."

හතර දෙනාම අසා උන්නේ නෙත කඳුළු පිරී දැසිනි. සසංක වන්දනා දෙස බලා සිනාසුණේය.

"කාලෙකදී හිතෙයි බෙදිලා ජීවත් වෙන්න... ඒත් එක බඩවැල





තඩාගෙන ආපු නංගියි අයියයි මේ අහිංසක කෙල්ලයි කොල්ලයි එහෙම බෙදෙයි කියලා හිතන්නවත් බෑ... හිතන්නත් එපා.."

"ඒ..නෙ..ම වෙ..න්..නෑ තා..ත්..තේ..."

සසංක කීවේ අඬමින් මෙනි.

"මං දන්නවා... දරුවෙක් ලැබුණත් ඒ දරුවා ඔක්කොගෙම.. එක පවුලක දරුවෙක් කියලා නෑ... ඔක්කොම එකට ඒ දරුවව බලාගන්න ඕන..."

තමාගේ දරුවාට මෙවන් පවුලක් ලැබුණේ කෙසේදැයි අප්පච්චි සිතුවේ පුදුමයෙනි. හැමෝටම මෙවන් වාසනාවක් ලැබෙන්නේ නැත.

"ලොකුම දේ... මම වගේම මේ අප්පච්චිටත් හතර දෙනාම බලාගන්න ඕන.."

ඒ කතාවට අප්පච්චිගේ දෑස් වල කඳුළු පිරුණි. ඔහු බිම බලාගත්තේ දැස් තැවෙන්නට වූ නිසාය.

"එහෙනම් අයියේ අපි හොඳ දවසක් බලලා මේ වැඩ ඉවර කරමු..."

"ලොකු මහත්තයාගේ කැමැත්තක්... ඒ ගෙදරට ගොඩවෙන්නේ කවදද එදා ඉඳලා කෙල්ලගේ ජීවිතේ ගැන මං..ට බයක් නෑ..."

ඔහුගේ දෑස්වල කඳුළු මෙනි. සංසක පැමිණ අප්පච්චිගේ උරතලය මත සුරත තැබුවේය. අප්පච්චි ඔහුගේ සුරත අල්ලා ගත්තේ ආදරයෙනි.

"අපිව බලාග..න්..නා..ව වගේ ආදරෙන් ම..ගේ පු..තා දුවව බලා ගනී... එයා හරි වාසනාවන්තයි..."

වන්දනා බලා උන්නේ සසංක දෙසය. එය එහෙමම වන බව ඇය දනී. ආදරය කිරීම යනු රැකබලා ගැනීම බව බොහෝ පිරිමි දන්නේ නැත. ඒ අතින් ඔහු උතුම් කෙනෙකි.



SIHINA

"මං අයියේ මේ හතර දෙනාව ඉන්දියාවේ යවන්න ඉන්නේ.. බාරකුත් තියෙනවා මං වෙච්ච.. ඒක ගයාලගේ අතින්ම කරන්න ඕන.."

"ආ..හේ හොඳයි.. ලොකු මහත්තයත් ගියානම් හොඳනේ.."

"මං මිනින් අයියේ ආවේ.. මම පස්සේ අයියවත් එක්කන් යන්නම්.."

මුදන්කොටුව මහතා උන්නේ මිනිස්කම්වල මුදුනේය. ඔහු ජීවිතයේ අපේක්ෂා කළේ සතුටයි. එය ලබා ගන්නට නම් ආදරය ආදරය කරන අයට දිය යුතු බව ඔහු දැන උන්නේය.



SIHINA

# 31

කෙල්ල උන්නේ ඔහුගේ වතටම බරවීය. අත මුහුදේ කෙළවර හිරු අවසන් වතාවට ලෝකය දෙස රහසේ බලමින් සුසුමේ ගිලෙමින් උන්නේය. චන්ද්‍රනාත් සසංකත් උන්නේ කළුගං මෝය අසබඩ සුන්දර වෙරළ තීරයේය. ඔහු කෙල්ලව එක්කාගෙන මේ හවස ආවේ හිතට ඒ තරම්ම සතුටක් නිවනක් දැනෙනා නිසාය.

උස පොල් රුප්පාව උඩින් ගොම්මන් අන්ධකාරය ටිකෙන් ටික වැටෙමින් තිබුණි. ඔවුන් උන්නේ ඒ පොල් රුප්පාව යට තැනූ සිමෙන්ති බංකුවකය. පොල් තුරු පත් අතරින් එන සිහිසලත්... සාගරය දෙසින් එන සුළඟේ සිසිලසත් මඳ සීතලක් ඇති කරවීය.

ඇය උත්තේ ඔහුගේ උරහිසද සිඹිමින් එයටම බැරිය. හදවතට මේ දැනෙන සතුට වදනකින් දෙකකින් හෝ වදන් වැලකින් වුව විස්තර කළ නොහැක. ඒ තරම් දැඩිය.

වෙරළබඩ දුම්රිය මාර්ගය දිගේ සළානම දෙදරවමින් රැඟුණු කුමාරි දුම්රිය ඇදී ගියේය. ඇය ඔයට මෙන් ඔහුට තවත් තුරුල් වූවාය.

"අද කෙල්ල ගොඩ වෙලාද... ම්..."

"මං.. හො..ඩ..වෙ..ලා..."

ඔහුගේ වතින් එන මේ පිවිතුරු සුවඳට ඇය ආසය. එය විඳිද්දී හිතෙන්නේ තනා ඔහකින් තොරව එයම විඳගෙන ඉන්නටය.

"අ..පි ර..වෙනකල් මේ..හෙම ඉමු..."

"ඉමු.. ඕනනම් ඊටත් ඉමු..."

"කැ..ම..ත් නෑ... මං ඉන්නම්..."

"එ..හෙම හොඳ නැහේ චූටි බබාට එහෙම කරන්න..."

ඔහු කීවේ ආදරයෙන් ඇගේ බඳ වටා හුරත යවාය.

"චූ..ටි බ..බා..ට මොනාද කරන්නේ... ම්..."

"මුකුත් නෑ..."

"ම..ට රෑට නි..න්ද යන්නෙත් නෑ... සු..දුම් දැ..ක..ත්..."

"ඒ වෙලාවට..."

"කෝටි එකක් හදන් හිමි කල්පනා කර කර ඉන්නවා..."

"මොනා ගැනද..."

ඔහු අහන්නේ ඔහුගේ දෙතොල අද්දරම ඇති ඇගේ හිස් මුදුන සිඹිමිනි.

"ම..ගේ ර..ත්තරන් ගැන... වෙන මොනා ගැන කල්පනා කරන්නද..."



"දැන් ඉන්දියාවේ යනවනේ... එතකොට මං ළඟ..."

"මන්... මං නංගිගේ කාමරේ..."

කෙල්ල කීවේ හුරතලයෙනි.

"හරි.. එහෙම කරමු..."

"අ..නේ... මා..ව මැරෙයි..."

ඇය ඔහුගේ කමිසය අතරින් හුරත යවා පපුව පිරිමදිමින් කීවාය.

නොගැඹුරු වෙරළ තීරයට කඩා වැටී තිබුණේ සීත් සිරි පාට සඳ එළියකි. ඒ සඳ එළිය වෙරළ වැළඳගන්නා මුහුදු රළ මතින් උපදින සීත් පෙන මතට පවා වැටී තිබුණි.

පසොළොස්වක හෙට බව චන්දනා දන්නේ එවිටය. ඇය තවත් ටිකක් ඔහුගේ ඇඟට ළං විය... මේ ආත්ම භවය නිමා වෙන තුරු මෙහෙම ඉන්නට ලැබෙනවා නොවේදැයි හිතෙද්දී හදවතට දැනෙන නිවනේ කිසිත් නැත.

"එත් ම..ට බොරුවක් කිව්ව එක කොච්චර හොඳද..."

ඇය සිනහෙන් මෙන් මිමිණුවාය.

"ඇ..යි ම්..."

"එහෙම නොකළනම් මං..."

"සසංකට ආදරේ කරන්නේ නෑ කියලද කියන්නේ..."

"ඉ..හි..න් මං.. බ..ය..වෙයි..නේ..."

"අපිව මවලා තියෙන්නේ අපට..."

"හ..රි..ය..ටම කොහොමද දන්නේ ම්..."

"එහෙම හිතුණේ කොහොමද ඇත්තටම ආ..."

"මාත් ඒක තමයි අහන්නේ..."

ඇය ඇස් පියාගෙනම ඇසුවාය. ඔහුගේ ළයෙන් එන ලේ පුසුම් පවා ඇයට දැනෙයි. ඒ ලේ මේ තරම් රස්නේ ඇයි...



SIHINA

"ගල පෙරළෙන් හිටියා.. ඒ..හෙම නං ඇතුළට ගිහිල්ලා නෑ..."

"ඔ.. දන්නවා... රන්කරු එකේ පොඩි ත්ලාන් කෙල්ලෙක් ගැන හිතුණා.."

"ඒ..හෙ..ම හිතුණ එක කො..චි..චර හො..ද..ද.. අද ජීවිතේ කොච්චර උ..ස්සහද.."

ඇයට පුදුම ඔහු මේවා කියන එකය. තමා මේ හිතාගන්නටවත් බැරි තරම් කදින් කුරුල් වී උන්නේ රන්කරු එකේ ප්‍රධානියාටය. තමා එහි කොතරම් පුංචි සේවිකාවක්ද.. මෙහෙම වූයේ කෙසේදැයි එදා සිට කී වරක් සිතුවාද... එහෙත් හිතෙන්නේම නැත.

"දෙයියන්ගෙන් එක එක ඒවා ඉල්ලුවාම..."

"ම්.."

ඔහු කතා කරන්නේ ඇගේ හිස සිඹිමින්මය.

"ඔ..හො..ම ඉඹින්නේ පුංචි බබාලව.. පූලව තාත්තලා ඉඹින්නේ.."

ඇය කියන්න ගිය දේ නොසිතා වෙන දෙයක් කීවාය. ඔහුගේ පහස හිස් මුදුනට දැනෙද්දී ඇයට හිතෙන්නේ එහෙමය.

"මගේ දූගේ පුවද තමා මේ..."

"දූවෙක්වද ආස..."

"ම්.."

"පුතෙක් ආවොත්.."

"ඊගාවට දූවෙක් හදමු.."

හීන... ඒවා තව දුරටත් හීන නොවන බව හිතෙද්දී හදවතට වෙන්නේ මොනවාද...

"මොනවද ඉතින් කියන්න ගියේ... දෙයියන්ගෙන් දෙයක් ඉල්ලුවාම.."

"ම්.. එහෙම ඉල්ලුවාම.. දෙයියෝ හොඳනම් දෙනවලුනේ..."





"මැණිකට මොනාද ලැබුණේ..."

"ගොඩක් දුප්පත්.. පුදුම ඒක නොවේ..."

"එහෙනම්..."

"මගෙ පූජා වට්ටි මක්කොම අරගෙන..."

"ඉතින්..."

"දෙයියොම මං ගාවට ආපු එක..."

කෙල්ලට ඔය ටික කියද්දී ඇඬුණි. ඇය ඔහුගේ ළය බදාගෙන ඇත්තටම පුංචි දුවෙකු මෙන් හැඬුවාය.

"ම..ට මේ ස..තු..ට දරා..ග..න්..න බෑ.. ර..න්..ක..ර..න්.. බෑ.."

ඇගේ කඳුළු ඔහුගේ ළය මත ගලා ගියේය. සසංක ඒ හිස දෝතටම ගත්තේය.

"මමත් අඩනවා දැන් ඉතින්..."

"ඒ..වි..තේ ම..හ පු..දු..ම දෙය..ක් ර..න්කරන්... මේ.. අ..ත් දෙ..ක මේ මූ..ණ.. මේ පපුව... ඒ ඔ..ක්කොම.. මේ.. දුප්පත් කෙ..ල්ලගේ කියලා කො..හො..ම හිතන්නද..."

වත්සලා ඒ පපුවට හිස තබාගෙන සැහෙන වේලාවක් ඇඬුවාය. ඔහුගේ දෑස්ද තෙත් වී තිබුණි. ඈත සමුදුරේ කෙළවර යන ඔරුවක පුංචි එළියක් වෙත ඔහුගේ බොඳවූ දෑස් යොමු වී තිබුණි.

"ඒ..වි..තේ මේ සැනසීම මෙච්චර අඩු වයසින් ද..නෙ..න් නෑ බබා... අපි මේ සැනසීම් ඇරෙන්න ඕන දෙයක් දන් දෙමු.."

"ම්.. මා..ව කා..ට..ව..ත් දෙ..න්..නෑ නේ..ද..."

ඇය ඇහුවේ ඔහුගේ ගෙළ අද්දර සිපගනිමිනි.

"දෙයියො එහෙම කරන්නෑ... මේ දෙයියන්ගේ දේවල්නේ..."

"ඇ..ත්..ත..ටම ඔ..යා දෙයියෙක් ර..න්ක..රන්.. ඒක ඔයාට තේරෙන්නෑ... ම..ට..යි මේ මටයි තේරෙන්නේ දෙයියෝ..."

ඇය කීවේ නැගිට ඔහුගේ නළලෙහි මුදුන සිප ගනිමිනි.

"මට..ත් වඩා වාසනාවන්ත ම..ගේ දරුවෝ..."


චන්දනා කීවේ ඔහුගේ මුහුණම තම ළයට තබා වැළඳගනිමිනි. ජීවිතයේ හිමි වූ උතුමම ගැහැණියගේ ළයේ සුවඳ ඔහුට තදින්ම දැනුණි.

**නිමි.**

SIHIN

සීත පතන් බිමක ගලා ගිය
අමරණීය ආදර කතාව
**"සපු"**
1, 2, 3, 4, 5, 6 කොටස්
දැන් පිටවී ඇත.

# රන්තරු



සිහින් මේ කොයේ නම් අහනන්නද..
රන්තරු ආයතනයට බැඳුණු දා සිට
මොකක්දෝ ඇදීමක් එයට තිබුණි.
අද ඒ ඇදීම වෙනදාට වඩා දුර්වලනොවූ ඇත.
"නා..මෑ.. ඕ.. දීනා නො..මා..ණා ඉන්නේ ඇ..යි.."
"ම.. ම..ට නෑ..කි වෙ..යි.. නේ..ද.. මෙ..නෙ..ම.."
කෙල්ලගේ හිතේ නලියන බිය සසංකා
හොඳින් තේරුම් ගෙන උන්නේය.
එවැනි බියක් දැනීම සාධාරණය.
සසංකා ඇගේ අත් දෙකින්ම අල්ලාගෙන
මුහුණට එබුණේය.
"ෂ..ස්..සෙ..ල්ලා [illegible] සමාව දෙනවා නේ..ද..."
ඔහුගේ හඬ ආයේ [illegible] වූවය. ඔහුගේ හුස්මක
[illegible] ඇගේ වම් කම්මුලට තදින් දැනුණි. දෙවියන් [illegible] දෙයක් කරන්නට හිතුවේ
ඇයි.. දන් මදක එකතු කරන්නට පුරුවන් වූ දා සිට දෙවියන්ට මල් පිදූ බව ඇත්තය.
එහෙත් මේ තරම් දෙයක් ඔබ එගන්සේ උන්නේ ඇයි..
"මං.. මේ..ක නො..නො..ම හිතා..ග..ත්..තා..ද.. මං ලොකු ස..ර්ට ම..ගේ අප්පච්චිට ප..ගේ
ආදරෙයි අසං..කා..යි..යේ... මං ර..න්තරු එකටත් ඒ..වගේම ආදරෙයි..."
"සසං..කා..ව..."
ඇය කතා නොකර බිම බලාගෙන උන්නාය.
චන්දනාගේ දෑස් පලාගෙන මෙන් කඳුළු වැගිරෙන්නට විය.

## සුජීව ප්‍රසන්න ආරච්චි

SIHIN